273 වන කාණ්ඩය - 9 වන කලාපය
தொகுதி 273 - இல. 9
Volume 273 - No. 9

2019 අගෝස්තු 08 වන බ්‍රහස්පතින්දා
2019 ஓகஸ்ட் 08, வியாழக்கிழமை
Thursday, 08th August, 2019

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
    පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කටයුතු මාධ්‍යයට විවෘත කිරීම

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
    ගුවන් සමාගම්වලට ලබාදෙන සහන

**සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත:**
    පළමුවන වර කියවන ලදී.

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත:**
    නියෝග

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**
    அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழுக் கூட்டங்களில் ஊடகங்களுக்கு அனுமதி

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**
    விமான நிறுவனங்களுக்கு வழங்கப்பட்ட சலுகைகள்

**மதுவரி (திருத்தம்) சட்டமூலம்:**
    முதன் முறை மதிப்பிடப்பட்டது

**இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சட்டம்:**
    கட்டளைகள்

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
    Opening of COPE Proceedings to Media

SECTORAL OVERSIGHTCOMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
    Concessions Granted to Airlines

EXCISE (AMENDMENT) BILL:
    Read the First time

SRI LANKA EXPORT DEVELOPMENT ACT:
    Orders

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2019 අගෝස්තු 08වන බ්‍රහස්පතින්දා***

*2019 ஓகஸ்ட் 08, வியாழக்கிழமை*

*Thursday, 08th August, 2019*

**පූ.භා.10.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.

The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කටයුතු මාධ්‍යයට විවෘත කිරීම
### அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழுக் கூட்டங்களில் ஊடகங்களுக்கு அனுமதி
### OPENING OF COPE PROCEEDINGS TO MEDIA

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු සංකීර්ණයේ, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා කාමර අංක 05හි සවි කරන ලද විකාශන ගුණත්වයෙන් යුතු කැමරා පද්ධතිය භාරදීම සනිටුහන් කිරීම පිළිබඳ උත්සවය, 2019 අගෝස්තු 09 වැනි සිකුරාදා අපර භාග 2.00 සිට අපර භාග 2.30 දක්වා කාරක සභා කාමර අංක 05දී පැවැත්වෙන අතර, ඉන් පසු පවත්වනු ලබන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීම් මාධ්‍යයට විවෘත කරන බව මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි. මෙහිදී මාධ්‍ය වග කීමෙන් යුතුව කටයුතු කරනු ඇතැයි මම හුදෙක්ම බලාපොරොත්තු වෙමි. පාර්ලිමේන්තු ක්‍රියාදාමය තුළ මෙය තවත් ඉදිරි පියවරක් බව මා සඳහන් කරන්නට කැමැතියි.

මේ අවස්ථාවට සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වය බලාපොරොත්තු වෙනවා.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017.07.01 සිට 2017.09.30 දක්වා කාලයට අදාළව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් 2019.01.24 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ පළමුවැනි වාර්තාවේ මුදල් අමාත්‍යාංශයේ, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ ජාතික අය වැය දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා වෙනුවෙන්, 2017 වර්ෂය සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද, "1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ගරු කථානායකතුමනි, අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද, "ශ්‍රම වාසනා අරමුදල (සංශෝධන) පනත් කෙටුම්පත" සහ "පඩිපාලක සභා (සංශෝධන) පනත් කෙටුම්පත" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

ගරු කථානායකතුමනි, ඔබතුමා විසින් නිවේදනය කරන ලද, කාරක සභා රැස්වීම් මාධ්‍යයට විවෘත කිරීම ගැන අපි ඉතා සතුටට පත් වනවා. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා ඇතුළු ඒ කණ්ඩායමේ ඒ කාර්යයන් මාධ්‍යයට විවෘත කිරීම මා ඉතා අගය කරනවා. ඒ වාගේම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ආංශික අධීක්ෂණ කාරක සභාවල රැස්වීම් මාධ්‍යයට විවෘත කිරීමත් ටිකෙන් ටික කර දෙන්න

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ]

කියලා. එය ඉතා වටිනවා. ආංශික අධීක්ෂණ කාරක සභාවල ස්වභාවය රටම දැනගත යුතුයි, ගරු කථානායකතුමනි. ඔබතුමා ඒ ගැනත් අවධානය යොමු කරනවා නම් ඉතා වටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැනට ඒ ගැන අවධානය යොමු කර තිබෙනවා. අපි පිළිවෙළින්, එකින් එක ගෙන එන්නට බලාපොරොත්තු වෙනවා.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
Hon. Speaker, I present the two following petitions:

1. A petition from Mr. M.M..M. Hanifa of CEB Road, Mawadichchena, Valaichenai; and
2. A petition from Mr. Sinnathamby Elayathamby of Old Trincomalee - Batticaloa Main Road, Mutur 7.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 - 53/'18 - (1), ගරු හේෂා විතානගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 - 101/'18 - (1), ගරු දයාසිරි ජයසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

### ඌන සංවර්ධිත ගම්මාන සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය: ඌව පළාත
### குறை விருத்திக் கிராம அபிவிருத்திக் கருத்திட்டம்: ஊவா மாகாணம்
### PROJECT TO DEVELOP UNDERDEVELOPED VILLAGES: UVA PROVINCE

156/'18

**3. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ඌව පළාත් ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඌව පළාතේ ඌන සංවර්ධිත ගම්මාන සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් දියත් කර තිබේද;
(ii) එසේ නම්, එම ව්‍යාපෘතියේ අරමුණු කවරේද;
(iii) දැනට එම ව්‍යාපෘතියට තෝරාගෙන ඇති ගම්මාන කවරේද;
(iv) මේ වනවිට එම එක් එක් ගම්මානය දියුණු කිරීමට ආරම්භ කර ඇති ව්‍යාපෘති කවරේද;
(v) අදාළ ව්‍යාපෘති සඳහා ටෙන්ඩර් ලබාගත් පුද්ගලයන්ගේ නම්, ලිපිනයන් හා ගෙවන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;
(vi) ටෙන්ඩර් ලබාදීමේදී අනුගමනය කර ඇති ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஊவா மாகாண முதலமைச்சரினால் ஊவா மாகாணத்தின் குறை அபிவிருத்திக் கிராமங்களை அபிவிருத்தி செய்வதற்கான கருத்திட்டமொன்று முன்னெடுக்கப்பட்டுள்ளதா;
(ii) ஆமெனில், அக்கருத்திட்டத்தின் நோக்கங்கள் யாவை;
(iii) தற்போது இக்கருத்திட்டத்துக்கு தெரிவு செய்யப்பட்டுள்ள கிராமங்களின் பெயர்கள் யாவை;
(iv) தற்போது மேற்படி ஒவ்வொரு கிராமத்தையும் அபிவிருத்தி செய்வதற்காக ஆரம்பிக்கப் பட்டுள்ள கருத்திட்டங்கள் யாவை;
(v) குறித்த கருத்திட்டங்களுக்கான கேள்விப் பத்திரங்களைப் பெற்றுக்கொண்ட ஆட்களின் பெயர்கள், முகவரிகள் மற்றும் செலுத்தப்பட்ட பணத் தொகைகள் ஆகியவற்றை வெவ்வேறாக சமர்ப்பிப்பாரா;
(vi) கேள்விப்பத்திரங்கள் வழங்கும்போது கடைப் பிடிக்கப்பட்ட முறையியல் யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government :

(a) Will he inform this House -
(i) whether the Chief Minister of the Uva Province has launched a project to develop underdeveloped villages of the Uva Province;
(ii) if so, of the objectives of the aforementioned project;
(iii) the names of the villages which have been selected for the project up to now;
(iv) the projects which have already been launched to develop each of the aforesaid villages;
(v) whether he will submit separately the names and addresses of the persons who obtained tenders for the aforementioned projects together with the amounts of money paid; and
(vi) the methodology adopted to grant tenders?

(b ) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන තුළ හා එවැනි ගම්මාන යා කරන මාර්ග සංවර්ධනය කිරීම, නාගරික හා උප නාගරික වෙළෙඳ පොළ වෙත යොමු කරන ග්‍රාමීය නිෂ්පාදන ප්‍රමාණය ඉහළ නැංවීම, කෘෂි නිෂ්පාදන ප්‍රවාහනයේදී සිදුවන, පසු අස්වනු හානිය අවම කිරීම හා එම ගම්මානවල ජීවත්වන දරුවන් හට පෞද්ගලික හා රාජ්‍ය ආයතනයන් මඟින් අධ්‍යාපන අවස්ථාවන්ට ප්‍රවේශ වීමේ ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම, නිවාස තනා ගැනීම සඳහා අමු ද්‍රව්‍ය ප්‍රවාහනය පහසු කරවීම මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ.

(iii) පල්ලේකිරුව, උඩකිරුව, මීගහයාය, වෙහෙරගල, පැල්වත්ත, අඹගස්දෝව, අක්කරසීය, කුමාරතැන්න, කහටරුප්ප, වැල්ගොල්ල, ඇල්ලේඅරාව, පීස්සගම, නමුණුකුල, කිතල්ඇල්ල, නාවුල්ල, නහවිලවත්ත, වෙල්සි, බැද්දේවෙල, අඹදන්ඩෙගම, දඹගොල්ල, විහාරගලපතන, ක්‍රෙග්වත්ත, පිං අරාව පතන, ලියන්ගහවෙල, ලුණුවත්ත, නහකඩිය, පොල්ගස්වත්ත, මාරගහ-ඇල්ල, ගඩාදෙහිගොල්ල, කොළොන්ගස්පිටිය, මඩුගස්තලාව, මාවුස්සාගොල්ල, අලුත්වෙලගම, කොටුගහතැන්න, අත්තනගොල්ල, ස්වින්ටන් පාස්රෝස්, කෙහෙල්අත්තරාව, වැටකේවැව, සූරියගොඩ, අරවාකුඹුර, කින්නරබෝව, ඇතුන්දැමුවාව, කොට්ටල්බැද්ද, නාරංගස්වත්ත, මහතැන්න, උඩකන්ද, බෙරාමඩ, අලුත්තරම, බෙලගන්වැව, පොටාවයාය, විරාණගම, ඌවතිස්සගම, කරාඩුගල, හෙවෙල්වත්ත, අඹවත්ත, දොඩම්ගොඩ, මාගන්දනමුල්ල, දෙගල්අරාව, වටමඩ, තලගහවත්ත, පුහුල්කොටුව, වෙහෙරගල, වාසිපන, මීගහයාය, මිල්ලගහවත්ත, පහන්සිළුගම, ඉඹුල්ගොඩ, කෝට්ටගොඩ, පහළ කඳුරුගමුව, ගෝවුස්ස, ලියන්ගොල්ල, මාතැටිල්ල, බෙලිපොල, මධුරගම, කිරින්ද වලස්බැද්ද, දියනිල්ලදෝව, නාගොල්ල, බැද්දේකුඹුර, අක්කර 53 කැටවත්ත, මීරියබැද්ද, දඹේවෙල, මාළිගාතැන්න, උඩුවර 06 කණුව, මැටිගහතැන්න බකිණිලන්ද, කරගස්තැන්න, කුරුකුදේගම, කැන්දගොල්ල, ගල උඩ 10 කණුව, වැරැල්ලගොල්ල, වැල්කැලේ, ඇල්ලන්ද, ආඩිගල, පන්නලවෙල, බෝපිටිය, ඇල්හේන්පිටිය, උඩගම, රොටලවෙල, ගිනිගත්ගල, ඕතුඹේවත්ත, බඹරගලවත්ත, ගැරඩි ඇල්ල, මොණරුංගල කමත්ගොඩ, ගොඩුන්න, දික්පිටිය, පුස්සැල්ලාකන්ද, පිටපොල, වත්තේකැලේ, දරගල, සපුගොල්ල, යහලඅරාව, මිල්ලවත්ත, අඹේගොඩ, වැලිබිස්ස, සීලතැන්න, දඹගස්මණ්ඩිය, ඇකිරියන්කුඹුර, කෙසෙල්පොත, දෙහිගම, හෙට්ටිපොළ, ලියන්ගහවෙල, විහාරමුල්ල, හුලංදාව, මාගන්දනමුල්ල, මදුරුකැටිය, ඇත්තලාමුල්ල, රනුගල්ල, පරගස්මංකඩ, නිල්ගල, පුහුල්කොටුව, කනේගලමුල්ල, හබරත්තාව, කිරිඉබ්බන්ආර, හම්බේගමුව ජනපදය, ඔබ්බේගොඩ, ඉඳිගස්ඇල්ල, පිටමාරුව ආදී ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනයට (මෙම ගම්මානවලට ප්‍රවේශ පහසුකම් සැපයීමට අදාළව) අදාළ ක්‍රියාකාරකම් හඳුනාගෙන ඇත.

(iv) ඇමුණුම 01 යටතේ දක්වා ඇත. ඇමුණුම 01 **සභාගත*** කරමි.

(v) ඇමුණුම 02 යටතේ දක්වා ඇත. ඇමුණුම 02**සභාගත*** කරමි.

(vi) රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර ඇත. ඇමුණුම 02හි එක් එක් කර්මාන්තවල සඳහන් කර ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, පිළිතුර සැපයීම ගැන.

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. (අ) (iii) ප්‍රශ්නයට දී ඇති පිළිතුරෙහි සඳහන් වෙනවා, විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන තුළ හා එවැනි ගම්මාන යා කරන මාර්ග සංවර්ධනය කිරීම සහ ඒ ගම්මානවල සිටින විශේෂ අවශ්‍යතා සහිත කණ්ඩායම්වලට පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කිරීම මේ ව්‍යාපෘතියේ අරමුණු බව. ඒ තේමාව සහ මාතෘකාව යටතේ මේ මුදල යොදවනවා. නමුත් ගරු අමාත්‍යතුමනි, ඒ ව්‍යාපෘතිය සඳහා ගම්මාන රාශියක් තෝරා ගත්තාට, ඒ ගම්මානවලින් ගම්මාන කිහිපයකට තමයි මේ ප්‍රතිපාදන වෙන් වෙන්නේ කියලා මං දන්නවා. ඒ ගැන මා පැහැදිලිව කියන්න ඕනෑ. ඔබතුමා කිව්වා, ඒ සම්බන්ධයෙන් අදාළ ඇමුණුම් සභාගත කරනවා කියලා. එය දීර්ඝ ලේඛනයක් වෙන්න ඇති. ඒ තුළ ගම්මාන රාශියක් සඳහන් වුණත්, එයින් ගම්මාන 3කට හෝ ගම්මාන 4කට තමයි මේ මුදල වෙන්වෙලා තිබෙන්නේ. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ පසුගිය කාලයේ මා ඒ තොරතුරු ඉල්ලා තිබුණා. නමුත් ගරු ඇමතිතුමනි, විශේෂ අවශ්‍යතා තිබෙන උදවියට තිබෙන අපහසුතාව මහ හරවා ගැනීම කියන කාරණය පෙන්වා දීලා, මේ මුදල් සම්භාරය වියදම් කරලා තිබෙන්නේ හුදෙක්ම දේශපාලන අවශ්‍යතා සහ තමන්ගේ පෞද්ගලික අවශ්‍යතා සඳහාය කියන කාරණය අපි දිගින්-දිගටම පෙන්වා දුන්නා. උදාහරණයක් වශයෙන්, කිතල්ඇල්ල කියන ගම්මානය තුළ පිහිටා තිබෙන සමහර දේශපාලන නායකයන්ගේ වෙළෙඳ ව්‍යාපාරවලට ප්‍රවිෂ්ට වීම සඳහා අවශ්‍ය මං මාවත්, ඒ ව්‍යාපාරවලට අවශ්‍ය ජල පහසුකම් සහ අනිකුත් පොදු පහසුකම් සඳහා තමයි රජයේ මේ මුදල් වියදම් කරන්නේ.

ගරු කථානායකතුමනි, ඊයේ අපි පෙන්වා දුන්නා ඔහුට විරුද්ධව දඬුවම් දෙන්න විගණකාධිපතිවරයාටත් බැහැ කියන කාරණය. මම හිතන හැටියට අපි දිගින් දිගටම මේ ගැන කථා කරලා වැඩක් වෙන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, මම ඉල්ලීමක් කරනවා, මේ කරුණු අදාළ අමාත්‍යාංශයට යොමු කරන්න කියලා. පළාත් සභාවට මධ්‍යම රජයෙන් දෙන මුදලින් ඔවුන් කරන්නේ කොන්ත්‍රාත් කිරීමයි. ඒ අය උපයාගෙන වැඩ කරන්නේ නැහැ, අපි දෙන මුදලින් තමයි වැඩ කරන්නේ. නමුත් ප්‍රායෝගිකව මුදල් ලබා ගැනීම වෙනුවෙන් විවධ මාතෘකා යොදලා, ඒ මාතෘකාවල අන්තර්ගතය පෙන්වා දුන්නත්, මේ මුදල වෙන්වෙලා තියෙන්නේ වෙනත් කාරණයකට බව අපි කියනවා. ගරු ඇමතිතුමනි, මේ ගැන සොයා බලා කටයුතු කරනවාද කියන කාරණය තමයි දැන ගන්නට ඕනෑ.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, එතුමාගේ අදහස අපි පළාත් පාලන ඇමතිතුමා වෙත යොමු කරනවා. හැබැයි, ගරු මන්ත්‍රීතුමනි, පසුබිම් වාර්තාවේ නම් සඳහන් වෙනවා, 2018 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කළ බැවින් 2019දී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මකවීම සඳහා රුපියල් මිලියන 300ක් මුදල් කොමිෂන් සභාව විසින් ගෙව්වා කියලා. විශේෂයෙන්ම මෙම ගම්මානවලට ප්‍රවේශ පහසුකම් ලබාදීම එම ජනතාවගේ ආර්ථික සංවර්ධනයට ප්‍රබල සාධකයක් වුණා කියන අදහස තමයි අමාත්‍යාංශයේ තිබෙන්නේ. ඔබතුමාගේ අදහස ගැන අපි ඇමතිතුමා දැනුවත් කරන්නම්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

කිතල්ඇල්ල ගමට ගියා නම් ඒ සාර්ථකභාවය බලා ගන්න පුළුවන්, තට්ටු හතක මහල් ගොඩනැගිල්ලට ප්‍රවිෂ්ට මාර්ගය හදලා තිබෙන්නේ මොන සල්ලිවලින්ද කියලා. ගරු ඇමතිතුමනි, විශේෂ අවශ්‍යතා තියෙන ගම්මානවල අපේ අසරණ ජනතාව සඳහා මේ මුදල් ප්‍රායෝගිකව වියදම් කළ යුතු බවට යෝජනාවක් කරනවා, අමාත්‍යාංශයට. ඇත්තටම මේ උදවිය ඔවුන්ගේ කුසලතා තුළින් යම් යම් ආර්ථික ශක්තියක් ගොඩනගා ගන්න පුළුවන් විවිධ දේවල් නිර්මාණය කරනවා. ඉතින් ඒ නිර්මාණවලට වෙළෙඳ පොළක් හඳුන්වා දෙන්න පුළුවන් නම්, ඒ නිෂ්පාදන විවිධාංගීකරණය හදලා දෙන්න පුළුවන් නම් මම හිතනවා ඒ කණ්ඩායමට මීට වඩා ලොකු සහනයක් වේවි කියලා. මොකද, දැවැන්ත මුදලක් තමයි ඒ සඳහා යොදවන්නේ. එහෙම කළොත් විශේෂ කුසලතා තිබෙන ඒ අසරණ කණ්ඩායම්වලට ස්ව ශක්තියෙන් නැඟී සිටින්න පුළුවන් වෙනවා. දෙපා අහිමි වූ, යම් යම් අවයව අහිමි වූ පුද්ගලයන් කෙසේ හෝ ඔවුන්ගේ දක්ෂතා මත යම් යම් නිෂ්පාදන කරනවා. එක පැත්තකින් කණ්ඩායම් ගණනාවක් එකම නිෂ්පාදනය කළාම නිෂ්පාදන අතිරික්තයක් ඇති වනවා. ඒ නිසා විවිධ නිෂ්පාදන කරන්න අවස්ථාවකුත්, ඒ නිෂ්පාදන ප්‍රමිතියෙන්, ගුණාත්මකභාවයෙන් යුතුව නිෂ්පාදනය කරන වැඩ පිළිවෙළකුත්, වෙළෙඳ පොළ හඳුන්වා දීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළකුත් යෝජනා කරනවා නම් මම හිතනවා මීට වඩා ප්‍රායෝගිකව ලොකු සහනයක්, උපකාරයක් ඒ අයට සිද්ධ වනවා කියලා. එතකොට ඒ පළාතත් ආර්ථිකමය වශයෙන් ගොඩ නඟන්න පුළුවන්. ඒ වැඩ පිළිවෙළ සඳහා අමාත්‍යාංශය ඉදිරියේදී කටයුතු කරනවාද කියන ප්‍රශ්නය මා අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඒ සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශය දැනුවත් කරන්නම්

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, පැහැදිලි කර ගැනීමක් කර ගන්න තිබෙනවා. ඇමතිවරයා වෙනුවෙන් ප්‍රධාන සංවිධායකතුමා පිළිතුරක් දෙන්න සූදානම් නම් මම ඒ කරුණ අහන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග අනුව නම් ප්‍රශ්නය අහපු අයට පමණයි අවස්ථාව තිබෙන්නේ. නමුත්, අමාත්‍යවරයාගේ කැමැත්ත, එකඟත්වය මත අහන්න පුළුවන්.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
වේලාව තිබෙනවා නම්, කාරණය අහන්න. අදාළ අයට යොමු කරලා ඔබතුමාට උත්තරය ලිඛිතව දෙන්න පුළුවන්. අපි දැන් එහෙම ක්‍රමයක් අනුගමනය කරනවා.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
පළාත් පාලන ආයතනවලට හිමි විය යුතු මුද්දර ගාස්තු පළාත් සභාව විසින් ලබා නොදීම නිසා බරපතළ ගැටලුවක් මතු වෙලා තිබෙනවා. දකුණු පළාත ප්‍රමුඛ මේ රටේ පළාත් කීපයක ඉතා බරපතළ විධියට මේ ප්‍රශ්නය තිබෙනවා. ගරු කථානායකතුමනි, මෙතැන තිබෙන ඉතාම අනතුරුදායක තත්ත්වය තමයි, cadre එකේ නැති පත්වීම් දීලා, -පත්වීම් දහස් ගණනක් දීලා- ඒ අයට වැටුප් ගෙවන්නට භාණ්ඩාගාරය සල්ලි අනුමත කරන්නේ නැති වෙනකොට මේ පළාත් පාලන ආයතනවලට මුද්දර ගාස්තු වශයෙන් වෙන්වෙලා තිබෙන මුදලින් ඒ සේවක පඩි ගෙවන්නට කටයුතු කරනවා, දකුණු පළාත් සභාව ඇතුළු ආයතන. චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා ඇතුළුව පළාත් පාලන ආයතනවල සභාපතිවරුන් ලෙස සිටි අය රාශියක් මේ ගරු සභාවේ ඉන්නවා.

මේක බරපතළ ප්‍රශ්නයක් ගරු ඇමතිතුමනි. ඒකේ බරපතළකම මේකයි ගරු ඇමතිතුමනි. අවුරුදු දෙකකට පස්සේ මේ මුදල් නැවත භාණ්ඩාගාරයට යනවා. ඒ සභාව යුඑන්පී වෙන්න පුළුවන්, ශ්‍රී ලංකා වෙන්න පුළුවන්, පොහොට්ටුවේ වෙන්න පුළුවන්. නමුත්, ඒ සභාවට කිසිලෙසකින් මේ මුදල් නැවත ලැබෙන්නේ නැහැ. මේ කරන්නේ බරපතළ විධියට ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික දේවල් උල්ලංඝනය කිරීමක් ගරු ඇමතිතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන අවධානය යොමු කරන එක හොඳයි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඇමතිතුමාට ඒ කාරණය දැනුම් දෙන්න කලින් පොඩි පැහැදිලි කර ගැනීමක් කර ගන්නට ඕනෑ.

කොයි පළාත් සභාද, ප්‍රාදේශීය සභාද? රැකියා දීලා තිබෙන්නේ ඒවායින්ද?

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
සියලු පළාත් පාලන ආයතනවල මේ අර්බුදය තිබෙනවා. දකුණු පළාතේ විතරක් නොවෙයි වයඹ පළාත තුළත් මේ ප්‍රශ්නය තිබෙනවා. පළාත් කීපයකම මේ ප්‍රශ්නය තිබෙනවා ගරු ඇමතිතුමනි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඔබතුමන්ලාගේ පාලනය යටතේ තිබෙන ඒවාට?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා, ඔබතුමාට ප්‍රශ්නයක් තිබෙනවාද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මේ කාරණයට සම්බන්ධ දෙයක් පැහැදිලි කරන්නට කැමැතියි.

මේක සාම්ප්‍රදායිකව වෙන දෙයක්. මොන ආණ්ඩුව තිබුණත් පළාත් පාලන ආයතනයේ නියෝජිතයාට පනතින් ලැබිලා තිබෙන අයිතියක් මේක. පනතකින් ලැබෙන්නට තිබෙන වරප්‍රසාදයක් අහිමි කරන්නට බැහැ. එතකොට නීතිය උල්ලංඝනය වෙනවා. හැම ප්‍රධාන ඇමතිවරයාම කොයි කාලයේත් මේ දේ කරනවා ගරු කථානායකතුමනි. අපි පළාත් පාලන ආයතන නියෝජනය කළා. අපටත් ඒවාට මුහුණ දෙන්නට වුණා 2011 ඉඳන් 2014 දක්වා. එවකට සිටි පාලකයන් මේ මුදල් දුන්නේ නැහැ. නමුත් දෙන්න බැරි වෙන්න විධියක් නැහැ. මේක පනත අනුව හිමි විය යුතු මුදලක්. ඒකත් උල්ලංඝනය කරනවා. ඒකට අවශ්‍ය නීතිමය තත්ත්වය තිබියදීත් දිගින් දිගටම මෙසේ කිරීම පිළිබඳව ගරු කථානායකතුමනි, ඔබතුමා මැදිහත්වෙලා යම් තීන්දුවක් ගත්තා නම් මේ පළාත් පාලන ආයතනවලට සක්‍රියව තමන්ගේ වැඩ පිළිවෙළ කර ගන්නට පුළුවන්.

ඒ වාගේම, අද කුණු ප්‍රශ්නය තිබෙනවා. ඒ කුණු ප්‍රශ්න විසඳන්න යොදවන්න පුළුවන් මුදල් පළාත් සභාවේ හිරවෙලා තිබෙන්නේ. ඒ හිමිවිය යුතු මුදල පළාත් පාලන ආයතනවලට දෙන්නේ නැහැ. ඒ නිසා අපේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන්නේ වැදගත් කාරණයක් කියලා මා හිතනවා. පළාත් පාලන ආයතනවලට තනියෙන් නැඟිටින්න පුළුවන් වැඩ පිළිවෙළ තිබෙන්නේ ඒ මුදල් යෙදවීමෙන්. ඒවාත් වැළැක්වූවාම, පළාත් පාලන ආයතන ගොඩ යන්නේ නැහැ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක වැදගත් ප්‍රශ්නයක්. ගරු ඇමතිතුමනි, මේ කාරණය හුඟක් කාලයක් තිස්සේ වෙච්ච දෙයක්. ඒ නිසා ඒ ගැන අවධානය යොමු කිරීම යෝග්‍යයි කියා මාත් කල්පනා කරනවා.

ප්‍රශ්න අංක 4 - 271/'18 - (1), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 - 374/'18 - (1), ගරු වේලු කුමාර් මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 6 - 502/'19 - (1), ගරු ජයන්ත සමරවීර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 7 - 578/'19 - (1), ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 13 - 837/'19 - (1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

## වියළි මිරිස් නිෂ්පාදනය: විස්තර
### செத்தல் மிளகாய் உற்பத்தி: விபரம்
### DRIED CHILIE PRODUCTION: DETAILS

880/'19

**14. ගරු එස්.සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික පරිභෝජනය සඳහා අවශ්‍ය වියළි මිරිස් ප්‍රමාණය කොපමණද;

(ii) එම ප්‍රමාණය සපුරා ගනු ලබන ආකාරය කවරේද;

(iii) දේශීය නිෂ්පාදනයෙන් පමණක් අවශ්‍ය මිරිස් ප්‍රමාණය ලබා ගත නොහැකි බව පිළිගන්නේද;

(iv) වර්ෂ 2013 සිට 2018 දක්වා දේශීය වශයෙන් වගා කරන ලද මිරිස් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) වර්ෂ 2013 සිට 2017 දක්වා වෙළෙඳ පොළට සැපයූ දේශීය වියළි මිරිස් ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම කාලය තුළ සැපයුමේ අඩුවීමක් හෝ වැඩිවීමක් පෙන්නුම් කරන්නේද;

(iii) අඩුවීමක් නම්, එය වර්ධනය කරගැනීමට පියවර ගන්නේද;

(iv) වැඩිවීමක් නම්, එය වැඩි දුරටත් දියුණු කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கிராமியப் பொருளாதார அலுவல்கள், நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் வருடாந்த நுகர்வுக்காக தேவைப்படும் செத்தல் மிளகாயின் அளவு யாது;

(ii) அந்த அளவு நிறைவு செய்யப்படும் விதம் யாது;

(iii) உள்நாட்டு உற்பத்தியாளர்களிடமிருந்து மட்டும் தேவையான மிளகாயின் அளவினைப் பெற்றுக்கொள்ள முடியாதென்பதை ஏற்றுக்கொள்வாரா;

(iv) 2013 தொடக்கம் 2018 ஆம் ஆண்டு வரை தேசிய அளவில் பயிரிடப்பட்ட மிளகாயின் அளவு ஓவ்வோராண்டு ரீதியாக தனித்தனியாக எவ்வளவு;

என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) 2013 தொடக்கம் 2017 ஆம் ஆண்டு வரை சந்தைக்கு அனுப்பப்பட்ட உள்நாட்டு செத்தல் மிளகாயின் அளவு ஒவ்வொரு ஆண்டின் அடிப்படையில் வெவ்வேறாக யாதென்பதையும்;

(ii) அக்காலப்பகுதியில் வழங்கலில் வீழ்ச்சி அல்லது அதிகரிப்பு ஏற்பட்டுள்ளதா என்பதையும்;

(iii) வீழ்ச்சி ஏற்பட்டிருப்பின், வழங்கலை அதிகரிக்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(iv) அதிகரிப்பு ஏற்பட்டிருப்பின், அதை மேலும் விருத்தி செய்ய நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Rural Economic Affairs, Irrigation and Fisheries and Aquatic Resources Development:

(a) Will he inform this House-

(i) the quantity of dried chilies required for the annual consumption in Sri Lanka;

[ගරු එස්.සී. මුතුකුමාරණ මහතා]

(ii) the manner in which the aforesaid quantity of dried chilies is obtained;

(iii) whether he accepts the fact that the required quantity of dried chilies cannot be obtained only from local produce; and

(iv) the quantity of chilies cultivated in the country in each year during the period from the year 2013 up to 2018, separately?

(b) Will he inform this House-

(i) the quantity of locally produced chilies provided to the market in each year during the period from the year 2013 up to 2017, separately;

(ii) whether a decline or an increase in the supply is indicated during this period of time;

(iii) if there is a decline, whether action will be taken to increase the supply; and

(iv) if there is an increase, whether action will be taken to further improve the supply?

(c) If not, why?

**ගරු පී. හැරිසන් මහතා (කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. ஹரிசன் - கமத்தொழில், கிராமியப் பொருளாதார அலுவல்கள், நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரகவள மூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. P. Harrison - Minister of Agriculture, Rural Economic Affairs, Irrigation and Fisheries and Aquatic Resources Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මෙට්‍රික්ටොන් 55,811ක් පමණ වේ.

(ii) වාර්ෂික පරිභෝජනයෙන් සියයට 12ක් පමණ නිෂ්පාදනය කරන අතර සියයට 88ක් පමණ ආනයනය කරනු ලැබේ.

(iii) ඔව්.

(iv) ඔව්.

| වර්ෂය | මහ (ටොන්) | යල (ටොන්) | වාර්ෂික (ටොන්) |
|---|---|---|---|
| 2013 | 49,663 | 22,357 | 72,020 |
| 2014 | 51,648 | 20,119 | 71,767 |
| 2015 | 42,831 | 20,035 | 62,866 |
| 2016 | 50,717 | 21,594 | 72,311 |
| 2017 | 30,690 | 21,137 | 51,827 |
| 2018 | 50,289 | 28,714 | 79,003 |

(ආ) (i)

| වර්ෂය | දේශීය වියළි මිරිස් නිෂ්පාදනය (ටොන්) |
|---|---|
| 2013 | 10,379 |
| 2014 | 8,518 |
| 2015 | 5,508 |
| 2016 | 5,045 |
| 2017 | 5,009 |
| 2018 | 4,449 |

(ii) අඩුවීමක් ඇත.

(iii) ඔව්.

(iv) වාර්ෂිකව දේශීය පරිභෝජනය සඳහා අවශ්‍ය වියළි මිරිස් ප්‍රමාණය ලබා ගැනීමට හැකි ආකාරයට බෝග වගා සැලැස්මක් මත කටයුතු කිරීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. වාර්ෂිකව අවශ්‍ය වන ප්‍රමාණයෙන් දැනටමත් සපයා ගනු ලබන්නේ 12%ක් පමණ වන නිසා දිගුකාලීන සැලැස්මක් මත දේශීය පරිභෝජනයට අවශ්‍ය වියළි මිරිස් ප්‍රමාණය සපයා ගැනීමට සැලසුම් කිරීමේදී අනවශ්‍ය අතිරික්තයක් ඇති වීම පාලනය කර ගත හැකිය.

(ඇ) අදාළ නොවේ.

**ගරු එස්.සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ ඉලක්කම් අනුව වගා බිම් ප්‍රමාණය ක්‍රමානුකූලව වැඩි වෙලා තිබෙනවා. නමුත්, මට පෙනෙන ආකාරයට වියළි මිරිස් නිෂ්පාදනය ක්‍රමානුකූලව අඩු වීමක් පෙන්නුම් කරනවා. අපට දේශීය වශයෙන් වෙළෙඳ පොළට යවන්න පුළුවන් වුණේ අවශ්‍යතාවෙන් සියයට 12යි. සියයට 88ක විතර ප්‍රමාණයක් තවදුරටත් නිෂ්පාදනය කරන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. පසු ගිය ආණ්ඩුව කාලය තුළත්, ඔබතුමන්ලාගේ ආණ්ඩු කාලය තුළත් වියළි මිරිස් නිෂ්පාදනය වැඩි කිරීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් දකින්න නැහැ. ගොවියා මිරිස් වගාවෙන් අයින් වෙන්න බලපාන ප්‍රධානම කාරණය, පාලනය කළ නොහැකි කොළ කොඩවීමේ රෝගය ඇති වී තිබීමයි. කොළ කොඩවීමේ රෝගය මර්දනය කිරීම සඳහා විශේෂ වැඩ පිළිවෙළක් පිළිබඳව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වෙලා තිබෙනවාද?

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, මිරිස් වගාව අඩු වීමට බලපාන හේතු අතරින් ප්‍රධානම එකක් තමයි, මිරිස් වගාවට වැළඳෙන කොළ කොඩවීමේ රෝගය. එම රෝගය මර්දනය සඳහා ඉන්දියාව ආදි රටවල විස අධික බෙහෙත් වර්ග පාවිච්චි කරනවා. එහෙත්, අපි ඒවා තහනම් කරපු නිසා එම ප්‍රශ්නයෙන් ගැලවීමට හැකියාවක් ලැබුණේ නැහැ. සාමාන්‍යයෙන් අමු මිරිස් කිලෝවක මිල රුපියල්

200ත් 300ත් අතර ගණනක හැම වෙලේම තිබෙනවා. ඒ නිසා අමු මිරිස්වලට ගොවීන් වැඩියෙන් නැඹුරු වෙනවා. වියළි මිරිස් කිලෝ එකක් රුපියල් 200ත් 300ත් අතර ගණනකට ඉන්දියාවෙන් ගෙන එනවා. අමු මිරිස් කිලෝ 5ක් විතර අවශ්‍ය වෙනවා, වියළි මිරිස් කිලෝ එකක් හදන්න. ඉතින්, ගොවියා පුළුවන් තරම් නැඹුරු වෙන්නේ අමු මිරිස් වගාවට පෙළඹෙන්නයි. අවශ්‍ය වියළි මිරිස් ප්‍රමාණය නිෂ්පාදය කර ගැනීමේ දී අපට ඒකත් ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. එතුමා දැන් මගෙන් ඇහුවා, කොළ කොඩවීමේ රෝගයට ඔරොත්තු දෙන බෝග වර්ග හදලා තිබෙනවාද කියලා. දැනටමත් මහඉලුප්පල්ලම කෘෂි පර්යේෂණ ආයතනය මේ කොළ කොඩවීමේ රෝගයට ඔරොත්තු දෙන දෙමුහුන් වර්ගයේ මිරිස් නිෂ්පාදනය කරලා තිබෙනවා. දැන් කිසි භයක් නැතිව ගොවීන්ට ඒවා වගා කරන්න හැකියාව තිබෙනවා.

**ගරු එස්.සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අපේ ප්‍රදේශයේ ඇමතිවරයකු වන ඔබතුමා මේ සම්බන්ධයෙන් ප්‍රායෝගිකව අත්දැකීම් ලබලා ඇති කියලා මම හිතනවා. මේවා ගැන පරීක්ෂණ ක්ෂේත්‍රයේදී නියම ප්‍රතිඵල ආවාට, ගොවි බිමට ගියාම ඒ ප්‍රතිඵලය දකින්න නැහැ. අපේ අත්දැකීම් අනුව ඒ ප්‍රතිඵල අඩුයි. මගේ දැනීමේ හැටියට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත් උත්සාහ ගන්නේ වැඩිපුර අමු මිරිස් වගාව ඉස්සරහට ගෙන එන්නයි. වියළි මිරිස් වගාව සම්බන්ධයෙන් නම්, මිරිස් වගාව වට කරලා යම්කිසි ආවරණයක් සැදීම පිළිබඳව සාමාන්‍යයෙන් ගොවීන් අත්දැකීම් ලබලා තිබෙනවා. මිරිස් වගා කරන ගොවීන්ට ඒ සඳහා යටිතල පහසුකම් ලබා දුන්නොත් අපට වියළි මිරිස් වගාව මීට වඩා ඉදිරියට ගෙනයන්න පුළුවන් නේද?

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, එතුමා හොඳ ප්‍රශ්නයක් ඇහුවේ. ඊයේ ප්‍රශ්නයක් අහලා තිබුණා, කෘෂි කර්මාන්තය වෙනුවෙන් මුදල් වියදම් කිරීම අඩු කරලා තිබෙනවාද කියලා. මම කියන්න කැමැතියි, ලෝක බැංකු ව්‍යාපෘතියක් යටතේ වට ආවරණ ඇතිව මිරිස් වගා කිරීම සඳහා ආධාර ලබා දීමට දැනටමත් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවි පවුල් 50කට වැඩි ප්‍රමාණයක් තෝරා ගෙන තිබෙන බව. මම ඔබතුමාටත් ආරාධනා කරනවා, ඒවා නැරඹීම සඳහා මාත් එක්කම යන්න එන්න කියලා. ඒ වාගේම, තවත් ඒ සඳහා උනන්දුවක් දක්වන ගොවීන් ඉන්නවා නම් ඒ අයට අවශ්‍ය උදව් උපකාර කරන්න අපට හැකියාවක් තිබෙනවා.

**ගරු එස්.සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පැහැදිලි කර ගැනීමක්ද?

**ගරු එස්.සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
ඔව්, ගරු කථානායකතුමනි, පැහැදිලි කර ගැනීමක්.

ගරු ඇමතිතුමනි, ඔබතුමාත් මේ සම්බන්ධයෙන් කරුණු සොයා ගන්න ඇති. මම කිව්වා, අපේ ප්‍රදේශයේ ගොවීන් පිරිසක් සාගින්නෙන් පීඩාවට පත්වෙලා සිටිනවා කියලා. මාත්, ඔබතුමාත් මහජන නියෝජිතයන් හැටියට ජීවත්වන ප්‍රදේශයක ගොවීන් පීඩාවට පත්වෙලා සිටින නිසායි මම මේ ඉල්ලීම කරන්නේ. වර්ෂාව නැති නිසා ඒ ගොවීන් පීඩාවට පත් වෙලා ඉන්නවා. ඒ නිසා එම ගොවීන්ගේ ශ්‍රමයත් ලබාගෙන, ඔවුන්ට ජීවත්වීම සඳහා යම්කිසි විධියක සහනාධාර වැඩ පිළිවෙළක් ඉතා කඩිනමින් සකස් කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලනවා. ඔබතුමා කෘෂිකර්ම අමාත්‍යවරයා; ගොවීන්ගේ අමාත්‍යවරයා. ඔබතුමා ගොවීන්ගේ අමාත්‍යවරයා විධියට ගොවීන්ගේ ප්‍රශ්නවලට ඇහුම්කන් දෙන්න ඕනෑ. "ඒක මට අයිති නැහැ" කියලා කියන්න එපා. ඒක ගොවීන්ගේ ප්‍රශ්නයක්. ඔබතුමා කැබිනට් ඇමතිවරයෙක්; වග කිවයුතු ඇමතිවරයෙක්; අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන මහජන නියෝජිතයෙක්. මේ සඳහා රජය පැත්තෙන් යම් වැඩ පිළිවෙළක් ඉතා ඉක්මනින් කිරීමට ඔබතුමන්ලා උනන්දු වෙනවාද කියලායි මම අහන්නේ.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමාටත් මම ස්තුති කරන්නට ඕනෑ. මොකද, ගල්කන්දේ පුරාණ රජමහ විහාරස්ථාන භූමියටත් මෙතුමා සඳහන් කළ, වගාව සඳහා අවශ්‍ය දැල් ආවරණයක් ඉල්ලා තිබුණා. ඔබතුමා කියපු පරිදි මා එය ලබා දෙන්නට කටයුතු කළාය කියන එකත් මම මේ අවස්ථාවේ දී කියන්නට ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි ගරු අමාත්‍යතුමනි.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ඒ වාගේම එතුමා කිව්වා, මහවැලි ප්‍රදේශවල සහනාධාර වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා. අපි ඒ සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමා දැනටමත් දැනුවත් කරලා තිබෙනවා. එම ගොවීන් සඳහා සහනාධාර වැඩ පිළිවෙළකට යන්න ඔබතුමාත්, මාත් -අපි දෙදෙනාම- කථා කරපු විධියට යම් මැදිහත්වීමක් කරලා, අවශ්‍ය කටයුතු සකස් කරනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, දැන් ඇමතිතුමා කිව්වා සහනාධාර වැඩසටහනක් ගැන. ඔබතුමා දන්නවා, එක කලාපයක කොටසක් තිබෙනවා, කිසිසේත්ම වතුර දීලා නැති. තව පළාතක් තිබෙනවා, වතුර ලබා දීලා තිබුණාට අවශ්‍ය ප්‍රමාණයට වතුර ලැබිලා නැති.

මේ නිසා ගොවීන් විශාල දුෂ්කරතාවකට මුහුණ දී සිටිනවා. මොකද, ඔවුන්ගේ එකම ජීවනෝපාය මාර්ගය ගොවිතැනයි. එයින් ලැබෙන ආදායමින් තමයි ඔවුන් ජීවත් වෙන්නේ. දැන් ඒක ඇහිරිලා තිබෙනවා. තඹුත්තේගම ප්‍රදේශයේ ගොවි ජනතාව මේ වෙනුවෙන් සාධාරණයක් ඉල්ලා, විශාල උද්ඝෝෂණයක්, උපවාසයක් කරන හැටි මම දැක්කා. ඔවුන් එවැනි විශාල මැදිහත් වීමක් කරමින් සිටිනවා. ඒක ඔබතුමාත් දන්නවා.

ගරු ඇමතිතුමනි, යම් සාධාරණ සහනාධාර මුදලක් -වන්දියක් - මාස්පතා ලබා දෙන්න කියන එක ඔවුන්ගේ එක ඉල්ලීමක්. හැබැයි, වියළි ආහාර මල්ලක් ලබාදෙන්න තමයි දැන් යෝජනා වෙමින් තිබෙන්නේ. ගරු කථානායකතුමනි, ඔවුන්ගේ මූලික ප්‍රශ්නය ආහාර නැතිකම -කන්න බොන්න නැතිකම- විතරක්

[ගරු අනුර දිසානායක මහතා]

නොවෙයි. බෙහෙත් ගැනීම, දරුවන්ට ඉගැන්වීම වැනි අනෙකුත් අවශ්‍යතා සඳහාත් මුදල් නැති ප්‍රශ්නයකට ඔවුන් මුහුණ දී සිටිනවා. ජනාධිපතිතුමා සමඟත් මේ ගැන කථා කළා කියලා ඔබතුමා දැන් කිව්වා. එම ගොවි ජනතාවගේ මේ සාධාරණ ප්‍රශ්නය ගැන අවධානය යොමු කර, ඉතා ඉක්මනින් තීන්දුවක් අරගෙන, ඒ අයට විසඳුමක් ලබා දෙන්න කියලා තමයි මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, එතුමාගේ ප්‍රශ්නයට පිළිතුරක් දෙනවාද?

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ඔව්. එතුමාත් මහවැලි කලාපයේ ගොවියෙක්, ගරු කථානායකතුමනි. එම නිසා ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාගේ ඉල්ලීමත් මම අවධානයට ගත්තා. සහනාධාර අවශ්‍යද කියලා මම එතුමාගෙන් ඇහුවා. එතුමා කිව්වා, ඕනෑ කියලා. ඒ ගැනත් සලකා බලා ඒ කටයුත්ත කරන්න අප ලැහැස්තියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, අතපසුවීමකින් අංක 8 සිට 12 දක්වා ප්‍රශ්න මඟහැරී තිබෙනවා. ඒ නිසා දැන් නැවත ඒ ප්‍රශ්න ඇසීමට අවස්ථාව ලබා දෙනවා.

ප්‍රශ්න අංක 8 - 604/'18 - (1), ගරු වාසුදේව නානායක්කාර මහතා -[සභා ගර්භය තුළ නැත.]

ප්‍රශ්න අංක 9 -611/'18- (1), ගරු ආනන්ද අලුත්ගමගේ මහතා. [සභා ගර්භය තුළ නැත.]

## කන්තලේ නගරයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයිති භූමියේ පිහිටි ව්‍යාපාරික ස්ථාන: බදු අය කිරීම
## கந்தளாய் நகரத்தில் நீர்ப்பாசன திணைக்களத்துக்குரிய காணியிலுள்ள வியாபார நிலையங்கள்: வரி அறவீடு
## BUSINESS ESTABLISHMENTS IN LAND BELONGING TO IRRIGATION DEPARTMENT IN KANTALE TOWN: COLLECTION OF TAXES

657/'18

**10.** **ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කන්තලේ නගරයේ වාරිමාර්ග යාන්ත්‍රික වැඩපොළ අසල සිට සම්පත් බැංකුව පිහිටා ඇති ස්ථානය දක්වා වූ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් භූමියේ ව්‍යාපාරික ස්ථාන පවත්වාගෙන යනු ලබන පුද්ගලයන්ගේ නම, ලිපිනය, එම එක් එක් පුද්ගලයා විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරය සහ ඔවුන් එම ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම එක් එක් ව්‍යාපාරික භූමිය වෙනුවෙන් බදු හෝ වෙනයම් අය කිරීමක් සිදු කරන්නේ නම්, ඒ කෙසේද;

(iii) එම අයකිරීම් සිදු කිරීම ආරම්භ කරන ලද දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கிராமியப் பொருளாதார அலுவல்கள், நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கந்தளாய் நகரத்தின் நீர்ப்பாசன எந்திரவியல் வேலைத்தளத்திற்கு அருகில் இருந்து சம்பத் வங்கி அமைந்துள்ள இடம் வரையிலான நீர்ப்பாசன திணைக்களத்துக்குரிய காணியில் வியாபார நிலையங்ளை நடாத்திச் செல்லும் நபர்களது பெயர், விலாசம், அந்த ஒவ்வொரு நபர்களாலும் நடாத்திச் செல்லும் வியாபாரங்கள் மற்றும் அவர்கள் அந்த வியாபாரத்தை நடாத்திச் செல்கின்ற காலப்பகுதி என்பன வெவ்வேறாக யாதென்பதையும்;

(ii) அந்த ஒவ்வொரு வியாபார காணிகளுக்காக வரிகள் அல்லது வேறு ஏதேனும் அறவீடு மேற்கொள்ளப்படுவதாயின், அது எவ்வாறென்பதையும்;

(iii) அந்த அறவீடுகளை மேற்கொள்ள ஆரம்பிக்கப் பட்ட திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Rural Economic Affairs, Irrigation and Fisheries and Aquatic Resources Development:

(a) Will he inform this House-

(i) the names of the persons who maintain business establishments in the land belonging to Irrigation Department situated between the Irrigation Mechanical Workshop and the Sampath Bank in the Kantale Town along with their addresses, the business run by each businessman and the period of time they have been running the aforesaid businesses, separately;

(ii) if taxes or any other charges are collected for the land in which each business establishment is situated, the manner in which it is done; and

(iii) the day on which it was commenced to collect the aforesaid charges?

(b) If not why?

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ව්‍යාපාරික ස්ථාන පවත්වාගෙන යනු ලබන මෙම ඉඩම් කොටස වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුව භාවිත කරන භූමියක් නොවේ. එම නිසා ව්‍යාපාර පවත්වා ගෙන යනු ලබන ආයතන හෝ පුද්ගලයන් පිළිබඳ තොරතුරු වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතුව නොමැති නිසා ඉදිරිපත් කළ නොහැකිය.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු ඇමතිතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න පෙර, ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. නියඟය නිසා ලංකාවේ ලක්ෂ හතක පමණ ජනතාවක් පීඩා විඳිනවා කියලා පුවත් පත්වල පළවෙලා තිබෙනවා මා දැක්කා. මා නියෝජනය කරන ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පුද්ගලයන් 36,000ක් අද වන විට මේ නියඟය නිසා පීඩාවට පත් වෙලා ඉන්නවා. ඒ සංඛ්‍යාව තව වැඩි වෙන්නත් පුළුවන්. ඒ අය පිළිබඳවත් ඔබතුමන්ලාගේ අවධානය යොමු වෙන්න ඕනෑ. අද වන විට අපේ පළාතේ හැම වැවකම වතුර සිඳී ගොස් තිබෙනවා. පොළොන්නරුව, අනුරාධපුර, මුලතිව් කියන දිස්ත්‍රික්ක ඇතුළුව උතුර, නැඟෙනහිර සහ උතුරු මැද පළාත්වල ප්‍රදේශ රැසක එම තත්ත්වය තිබෙනවා. ඒ පිළිබඳව අවධානය යොමු කරන්න, ගරු ඇමතිතුමනි.

දැන් මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්නම්. වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත්, ජනරංජන වැවට යන පාරේ මහවැලි සිත්තාරු පාලමට ඉහළින් සූරියපුර, සමඟිපුර, සමනල පාලම යන ප්‍රදේශවල පවුල් 500ක් හා කින්නියා සූරංගල් දක්වා සිටින සියලු පවුල් හා කුඹුරු අක්කර 10,000ක් පමණ ගංවතුරෙන් ආරක්ෂා කිරීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් අතීතයේ ගංවතුර ආරක්ෂණ වේල්ලක් සාදා තිබෙනවා. 2014 වර්ෂය වන විට මෙම බැම්ම සේදී යැමට ලක් වුණා, ගරු ඇමතිතුමනි. ගොවි සංවිධාන විසින් එවකට සිටි වාරිමාර්ග ඉංජිනේරුවරුන්ට මේ බව දැනුම් දුන්නා. ඒ වන විට එම බැම්ම මීටර් 5ක් පමණ තමයි සේදී තිබුණේ. එම බැම්ම තවදුරටත් කඩා වැටෙන්නේ නැහැ කියලා එවකට සිටි ඉංජිනේරුවන් පැවසුවත්, මහවැලි ගඟ පිටාර ගැලීමෙන් මීටර් 20ක පමණ ප්‍රමාණයක් එක දවසින් කඩා වැටුණා. ගම්වාසීන් එම ස්ථාන ඉටි කොළවලින් වසා ආරක්ෂා කළා. මේ සිද්ධිය රූපවාහිනියේ පෙන්වූවා; පුවත් පත්වලත් පළ වුණා.

මෙම ස්ථානයේ sheet piles දමා බැම්ම ප්‍රතිසංස්කරණය කිරීමට එවකට සිටි රජය 'ආදම්බාවා' කියන සමාගමට කොන්ත්‍රාත් එකක් ලබා දීලා තිබුණා. ඉන්පසු නැවත වතාවක් ඒ බැම්ම තවත් මීටර් 100ක් පමණ කැඩී ගියා. 2015දී ආණ්ඩු මාරුවක් සිද්ධ වුණා. ඉන් පසුව, මෙම ක්‍රමය සාර්ථක නොවන බව වාරිමාර්ග ඉංජිනේරුවන් විසින් පවසා ඒ කටයුතු නතර කළා.

අද වන විට මෙම බැම්ම මීටර් 280ක් පමණ කැඩිලා තිබෙනවා. පසුගිය අවුරුදු 5 තුළ මහවැලි ගඟේ විශාල ජල ගැල්මක් සිදු වුණේ නැහැ. නමුත්, ඉදිරියේදී ඇතිවන වර්ෂාපතනය හේතුකොටගෙන මෙම ගම්මාන ගංවතුරට යටවෙලා, ගේ දොර, ඉඩම් කඩම්, හරකා බාන කියන සියල්ල විනාශ වී විශාල ව්‍යසනයක් ඇති වෙන්න පුළුවන්. එම නිසා කඩිනම් කටයුත්තක් සේ සලකා මේ බැම්ම ප්‍රතිසංස්කරණය නොකළහොත්, මෙම ගම්මානවල ජීවත් වන ජනතාවගේ ජීවිත අහිමිවීමේ වගකීම වාරිමාර්ග දෙපාර්තමේන්තුවටත්, ආපදා කළමනාකරණ අමාත්‍යාංශයටත්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියටත් භාරගන්න සිද්ධ වනවා, ගරු ඇමතිතුමනි.

මේ බැම්ම හදන්නේ නැතිව, මේ සිද්ධිය දඩමීමා කර ගෙන භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ සභාපතිවරයා නීති විරෝධී අන්දමින් දැන් එතැන වැලි ගොඩදැමීමට පටන් ගෙන තිබෙනවා. මෙම ස්ථානය ප්‍රසිද්ධ අලි මංකඩක්. සෝමාවතිය පැත්තෙන් එන අලි එතැනින් තමයි අනික් පැත්තට ගොඩවෙන්නේ. නීති-රීති උල්ලංඝනය කරමින් දැන් මෙම ස්ථානයේ වැලි ගොඩ දමනවා. මේ බැම්ම සම්පූර්ණයෙන්ම ගැලවී ගියොත් මිනිස් ජීවිත විශාල සංඛ්‍යාවක් විනාශ වේවි, ගරු ඇමතිතුමනි. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව රටේ තිබෙන නීතිය අනුව මේ ගැන කටයුතු කරන්න ඕනෑ. මුලින්ම, මේ වැලි ගොඩ දැමීම නවතා බැම්ම ප්‍රතිසංස්කරණය කරන්න. අවශ්‍ය නම්, වනජීවී නීති-රීති උල්ලංඝනය නොකරමින්, පාලමේ සිට කිලෝමීටරයකට පහළින් මේ දේවල් සිදුකළාට ප්‍රදේශයේ ජනතාවගේ විරෝධතාවක් නැහැ, ගරු ඇමතිතුමනි.

අද වන විට මෙම බැම්මේ තත්ත්වය පිළිබඳව ඔබතුමා වාර්තාවක් ලබාගෙන නැත්නම් ඒ වාර්තාව ලබා ගන්න. බැම්ම ප්‍රතිසංස්කරණය කළ යුත්තේ ඇත්ත වශයෙන්ම වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අධීක්ෂණය යටතේ බැවින් මේ පිළිබඳව ඇස්තමේන්තුවක් සකස් කරලා තිබෙනවාද කියලා අපි දන්නේ නැහැ. ඒ ගැන ඔබතුමා හොයලා බලන්න. මෙම වැලි නිධිය නීති විරෝධීව ගොඩදමන එක නතර කරන්න කටයුතු කරන්න. මෙම බැම්මට හානි වන්නේ මෙම වැලි නිධිය නිසා නම් පමණක්, රටේ තිබෙන නීතිය අනුව ඒ වැලි ගන්නවාට මහජනතාවගේ කිසිම විරුද්ධත්වයක් නැහැ. ඒ නිසා මම විශේෂයෙන් ඔබතුමාගෙන් මේ ඉල්ලීම කරනවා. මේ කාර්යයට භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ සභාපතිවරයා විසින් නිසි අවසර ලබාගෙන නැහැ.

උතුරු පළාතේ මන්ත්‍රීවරයෙකු අහපු ප්‍රශ්නයකට දීපු පිළිතුරකදී ගරු අගමැතිතුමා ඊයේ ප්‍රකාශ කළා, වනජීවී කලාප තුළ එහෙම අවිධිමත් ක්‍රියාකාරකම් කරන්නේ නැහැ කියලා. කෝටි 90ක වැලි තිබෙනවා කියලා හිතාගෙන තමයි හිතාමතාම මේ බැම්ම හදන්න ඕනෑය කියලා, එය දඩමීමා කරගෙන කටයුතු කරන්නේ. බැම්ම හදන්නේ නැතුව වැලි අරගන්න කටයුතු කරනවා. ගරු ඇමතිතුමනි, වාරි මාර්ග විෂය භාර ඇමතිතුමා හැටියට ඔබතුමා තමයි මේ අවසරය ලබා දෙනවා නම් දෙන්න ඕනෑ. මගේ දැනුම හැටියට, වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා එවැනි අවසරයක් දීලා නැහැ.

ගරු ඇමතිතුමාත්, ගරු අගමැතිවරයාත් මේ ගරු සභාවේ ඉන්න නිසා මේ කාරණය කියන්න ඕනෑ. මේ බැම්ම ප්‍රතිසංස්කරණය කරලා අවශ්‍ය නම් නීත්‍යානුකූලව වැලි ගන්න ඉඩ දෙන්න කටයුතු කරන්න කියලා ඉල්ලීමක් කරනවා. ඒ වාගේම අපේ ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමාත් මේ කාරණය පිළිබඳව ජනතාව දැනුවත් කරලා තිබෙනවා. මේ වැලි අනවසර විධියට, EIA එකක්වත් ගන්නේ නැතුව ගොඩදමන එක ගැන CID එකට නැත්නම් FCID එකට පරීක්ෂණයක් කරන්න භාර දෙන්න. මෙය වංචාවක් නිසා ඒක නතර කරලා, නීත්‍යානුකූලව ඒ කටයුත්ත කරලා බැම්ම හදලා දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, සුසන්ත පුංචිනිලමේ මැතිතුමා කියපු කාරණය සත්‍ය කාරණයක්. ගොවීන්ගේ වගා ආරක්ෂාව වෙනුවෙන් බැම්මක් ඉදිකරලා තිබුණා. හැබැයි, මේ අනවසර වැලි කැණීම් නිසා මේ බැම්ම දිගින් දිගටම හේදීගෙන ගිය නිසා තමයි එතැන ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙන්නේ. වාරිමාර්ග දෙපාර්තමේන්තුව හැටියට අපි අවස්ථා ගණනාවකදී මේ ස්ථානය තහනම් කළත්, විවිධ බලපෑම් මත මේ වැලි කැණීම් සිදු වෙනවා. විශේෂයෙන්ම වනජීවී හා වන සංරක්ෂණ සහ පරිසර විෂය අතිගරු ජනාධිපතිතුමා යටතේ තිබෙන බැවින් ඒ ගැන එතුමා

[ගරු පී. හැරිසන් මහතා]

දැනුවත් කරන්න අපි කටයුතු කරන්නම්. ඒ අදාළ ආයතන සම්බන්ධ වෙලා ඉන්නවා නම්, ඒ අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනවා කියලාත් ඔබතුමාට දැනුම් දෙනවා.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
මේක මහා වංචාවක්. ඊයේ-පෙරේදා සිට යම් යම් පුද්ගලයන්ගේ බලතල උපයෝගි කරගෙන නිලධාරින් බිය වද්දා බලහත්කාරයෙන් හා අනවසරයෙන් මේ කරන කටයුත්ත නවතා, පළමුව බැම්ම හදන්න පටන්ගත යුතුයි. ගරු ඇමතිතුමනි, රටේ තිබෙන නීතියට අනුව කටයුතු කරන්න ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් මේ කරුණ පොලිස්පතිවරයාට හෝ FCID එකට යොමු කරන්න. මෙය රජයේ දේපළ අමු අමුවේ කොල්ල කෑමක්. පරිසරය රකින අමාත්‍යාංශයක සභාපතිවරයෙක් ඒ වාගේ දේවල් කරනවා නම්, ඒක බොහොම වැරදියි, ලජ්ජයි. එහෙම කරන්න එපා කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සන්දිත් සමරසිංහ මහතා**
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා, ඔබතුමාට කථා කරන්න අවශ්‍ය මේ කරුණ සම්බන්ධයෙන්ද?

**ගරු සන්දිත් සමරසිංහ මහතා**
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)
ගරු කථානායකතුමනි, සුසන්ත පුංචිනිලමේ මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කළ නිසායි මම මේ කාරණය කියන්නේ. අපි ඒ ස්ථානය ගැන පර්යේෂණ කරන්න කමිටුවක් පත් කර තිබුණා. ඒ කමිටුව රැස් නොකර තමයි ඒ දේ කරන්නේ. ඒ කමිටුවට වනජීවී එකෙනුත්, පරිසර අධිකාරියෙනුත්, GSMB එකෙනුත් නිලධාරින් පත් කර තිබෙනවා. පළමුව මේ බැම්ම බැඳිය යුතුයි. හැබැයි, ඒක කරන්නේ නැතුව GSMB එකේ සභාපතිවරයාට ඕනෑ හැටියට තමයි ඒ ක්‍රියාවලිය කරගෙන යන්නේ. ඒ නිසා එතැන පාරිසරික වශයෙන් ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. එම නිසා වහාම එය නැවැත්වුවොත් හොඳයි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඒ ගැන අවධානය යොමු කරන්න.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
හොඳයි, ගරු කථානායකතුමනි.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ගරු කථානායකතුමනි, මගේ ඊළඟ අතුරු ප්‍රශ්නය.

ගරු ඇමතිතුමනි, මම මේ කියන කාරණය ඔබතුමාට මීට පෙරත් මතක් කළා. මම නැවත වතාවක් ඔබතුමාට මෙය මතක් කර දෙන්නේ, අපේ දිස්ත්‍රික්කයේ ජීවත් වන සිංහල, දෙමළ, මුස්ලිම් ගොවි ජනතාවට යහපතක් වෙයි කියන චේතනාවෙන්.

ගරු ඇමතිතුමනි, ඔබතුමා සවුදි අරාබි රජයේ ආධාර යටතේ "කළුගඟ" කියලා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනවා. කන්තලේ කළුගඟ කියලා ගඟක් නැහැ. කළුගඟ ගලා යන්නේ, රත්නපුර සහ ඇලහැර ප්‍රදේශවල. නමුත් "කළුගඟ ව්‍යාපෘතිය" කියලා නමක් දමාගෙන තිබෙනවා. එම ව්‍යාපෘතියට ජලය ගන්න යන්නේ ජනරංජන වැවෙන්. ජනරංජන වැවෙන් වතුර අරගෙන කරන්න යන්නේ, කින්නියා ප්‍රදේශයේ මාස් කන්නයේ අක්කර 3,000ක් වගා කරන්නයි. හැබැයි, ඒ මුදල් ඔබතුමා පාවිච්චි කළොත් කින්නියාවට පමණක් යල මහ දෙකන්නය අක්කර 7,000ක් පමණ වගා කරන්න ජලය ලබා දිය හැකියි. මහවැලි ගඟ පල්ලියගොඩැල්ල, කල්ඉරිප්පුව යන ස්ථානයේදී දෙකට බෙදෙනවා. එතැන අතු ගංගාවක් තිබෙනවා. ඒකට ජනවහරේ කියන්නේ, හීං ගඟ කියලා. ඒ ස්ථානයේ සිට ඇළක් කපලා එම ඇළ මාර්ගයෙන් වාන් ඇළට ජලය ගෙන එන්න පුළුවන්. වාන් ඇළට ඉහළින් තිබෙන කුඩා වැව් 30කට පමණ මෙමඟින් ජලය ලබා දෙන්න පුළුවන්, ගරු ඇමතිතුමනි. වාන් ඇළට මෙම ඇළ මාර්ගයෙන් ජලය ලබා දීමෙන්, කන්තලේ වැවෙන් දැනට ජලය ලබා දී වැඩ කරන කුඹුරුවලින් සියයට 40ක ප්‍රමාණයට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළොත් ජලය ලබා දෙන්න පුළුවන්. මෙම ක්‍රමය මඟින් කින්නියාවේ පමණක් යල මහ දෙකන්නයට අක්කර 7,000කට පමණ ජලය ලබා දෙන්න පුළුවන්. කන්නියා, මනිරාසකුලම් වැව පුළුල් කරලා සෑහෙන ජලයක් මෙහි ගබඩා කරගත හැකියි. මෙමඟින් කෘෂි කර්මාන්තයට පමණක් නොව, දිස්ත්‍රික්කයට අවශ්‍ය කරන පානීය ජලය අවුරුද්ද පුරාවටම ලබා දීමට හැකියාවක් තිබෙනවා.

සීනි කර්මාන්තශාලා භූමිය අසලින් මෙම ඇළ ඇදෙන නිසා, ඒ සීනි කර්මාන්තශාලාවේ වැඩත් පටන් ගන්න පුළුවන් නම් 20,000කට පමණ සෘජුව සහ වක්‍රව රැකියා ලබා දීමේ හැකියාවක් ලැබෙනවා, ගරු ඇමතිතුමනි. ඒ වාගේම, මෙම වැව් ඒ කාලයේ හදලා තිබෙන්නේ එල්ලංගා කියන cascade ක්‍රමයටයි. ඒ නිසා කොරොංගුපඤ්ඤන් කියන වැවට ජලය ලබා දීමට හැකියාව තිබෙනවා.

ඊට අමතරව, අපේ ගරු ජනාධිපතිතුමාගේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය කොට්ඨාසයේ වඩිගවැව, මීගස්වැව, බෙබි වැව යන ගම්මානවලටද මේ ව්‍යාපෘතිය නිසා ජලය ලබා දීමට හැකියාව ලැබෙනවා. ගොවීන් කියන ක්‍රමයට ඒ වැඩ කළොත්, ඒ මුදලින්ම අවශ්‍ය දේ කරන්නට අපට හැකියාව ලැබෙනවා, ගරු ඇමතිතුමනි.

ඒ නිසා ලංකා මුදලින් රුපියල් මිලියන අටදහසක් වියදම් කරලා කින්නියාවල අක්කර 3,000කට පමණක් ජනරංජන වැවෙන් වතුර ලබා දීමට යෑම නවත්වා, මේ කියන කාරණය පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඔබතුමාගෙන් විශේෂයෙන් ඉල්ලා සිටිනවා. ඉංජිනේරුවන් කියන දේ විතරක්ම අහන්නේ නැතිව, ඒ ගම්වල ජීවත් වන ජනතාවගේ තිබෙන අත් දැකීම් අනුව, ඒ පිළිබඳව ඒ අයගෙන් අසා දැනගත හැකියි. ඒ වාගේම, ඔබතුමා අපට රැස්වීමක් ලබා දීලා මේ කටයුත්ත කරන්න පුළුවන් නම් ගොවි ජනතාවට මහත් සහනයක් ඇති වෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු ඇමතිතුමනි, ඒ ඉල්ලීමත් සලකා බලන්න.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, කළුගඟ ව්‍යාපෘතිය අවුරුදු ගණනාවක් තිස්සේ feasibility study එකක් කරලා සිදු කළ ව්‍යාපෘතියක්. ඒ සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන දැන් ලැබිලා තිබෙනවා. එතුමා කියපු විධියට, ජනරංජන වැවෙන් tunnel එකක් හරහා කෙළින්ම කින්නියාවලට ඒ ජලය ගෙන යනවා කියලා පසුගිය කාලයේ ගොවීන් අතර මතයක් තිබුණා. ඒ වාගේම, ඒ ප්‍රදේශයේ ජනතාව තුළත් එවැනි කුතුහලයක් තිබුණා. නමුත්, එහෙම දෙයක් වෙන්නේ නැහැ. කින්නියාවලට යනකල් මහ දෙපස තිබෙන සියලු වැව්වලට ජලය දීලා තමයි කින්නියාවලට ජලය ගෙන යන්නේ. ඒ නිසා කාටවත් ඒ ගැන භය වෙන්න දෙයක් නැහැ. ජනරංජන වැවෙන් කින්නියාවලට -ඒ අක්කර 3,000ට- ජලය ගෙන යැමේදී, ඒ මහ දෙපස තිබෙන සියලු වැව්වලට වතුර දීලා තමයි ගෙන යන්නේ. ඒ සම්බන්ධයෙන් ඉංජිනේරුවරුන්ගේ වාර්තා ගන්නවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළ දෙවැනි අදියර අලුත් යෝජනාවක් හැටියට ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඔබතුමාත්, අපේ සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමාත්, ඒ වාගේම ඒ ප්‍රදේශයේ ගොවි සංවිධානත් -අපි සැමදෙනාම- එකතු වෙලා අදාළ නිලධාරින් ගෙනැල්ලා සාකච්ඡා කරලා, ඒ වතුර ගැනීම පිළිබඳව අවධානය යොමු කරලා, අලුත් ව්‍යාපෘතියක් හැටියට ඒ ව්‍යාපෘතිය පටන් ගන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒක හොඳ විසඳුමක්. .

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු ඇමතිතුමනි, දෙවැනි යෝජනා ක්‍රමය යටතේ හෝ මේ පිළිබඳව අවධානය යොමු කරන්නට කැමැතිවීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ගරු ඇමතිතුමනි, සවුදි අරාබි රජයෙන් ලැබිලා තිබෙන ආධාර යටතේ පළමුවැනි අදියර තුළින් කින්නියාවල අක්කර 3,000කට ජලය ලබා දීම සම්බන්ධයෙන් අපේ විරුද්ධත්වයක් නැහැ.

මේ අක්කර ගණන 7,000 දක්වා වැඩි කරනවාය කියන්නේ කින්නියාවලට විතරක් නොවෙයි, දෙමළ ජනතාවට පවා, සිංහල ජනතාවට පවා යහපතක් වෙනවා කියන එකයි. මේ වියදම් කරන මුදලින්ම ඒක කරන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමනි, ඒ ගැන සාකච්ඡාවක් කරන්න. එය වඩාත් හොඳයි.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ඔව්. ළඟ දිනයක් ලබා දෙන්න ඇමතිතුමාට පුළුවන් නම්, ඒ ගොවි ජනතාවත්, අපේ සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමාත්, අපිත් එකතුවෙලා මේ කාරණය පිළිබඳව සාකච්ඡා කරන්න පුළුවන්. මා හිතන හැටියට එය මට වඩා ඔබතුමන්ලාට වටිනවාය කියලා මා විශ්වාස කරනවා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ලබන සතියේම දිනයක් මා ලබා දෙන්නම්. එදිනට ඔබතුමාත්, සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමාත්, ගොවි සංවිධානත්, අපිත් එකතුවෙලා, නිලධාරීනුත් ගෙන්වා ඒ පිළිබඳව සාකච්ඡා කරමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 11 -750/'19- (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මැතිතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

## රජයේ ඉදිකිරීම් සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්: විස්තර
## அரசாங்க நிர்மாணிப்புக்காகப் பதிவுசெய்த ஒப்பந்தக்காரர்கள்: விபரம்
## REGISTERED CONTRACTORS FOR GOVERNMENT CONSTRUCTIONS: DETAILS

775/'19

**12.ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දිවයින තුළ රජයේ ඉදිකිරීම් සිදුකිරීම සඳහා හඳුනාගත් වෘත්තීය සුදුසුකම් ලත් ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් ක්ෂේත්‍රයේ ඉදිකිරීම් සිදුකිරීමට එම කොන්ත්‍රාත්කරුවන් සතු විය යුතු මූලික වෘත්තීය සුදුසුකම් කවරේද;

(iii) රජයේ ඉදිකිරීම් වෙනුවෙන් 2018 වර්ෂය තුළ රජයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා ඇති මුළු මුදල කොපමණද;

(iv) රජයේ ඉදිකිරීම් වෙනුවෙන් 2018 වර්ෂය සඳහා රජයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීමට ඉතිරිව ඇති මුදල කොපමණද;

(v) අදාළ ගෙවීම් සිදු කිරීම ප්‍රමාද වීම තුළින් එම ක්ෂේත්‍රයන්හි නියැලෙන කොන්ත්‍රාත්කරුවන් දැඩි මූල්‍ය අපහසුතාවට ලක්වන බවත්; ඒ හේතුවෙන් ඔවුන්ගේ ව්‍යාපාරික කටයුතු බිඳ වැටීම ජාතික ආර්ථිකයට අහිතකර අන්දමින් බලපාන බවත් පිළිගන්නේද;

(vi) අදාළ කොන්ත්‍රාත්කරුවන්ට එම හිඟ මුදල් ගෙවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள், பொருளாதார அலுவல்கள், மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு மாகாண அபிவிருத்தி மற்றும் இளைஞர் அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) நாட்டில் அரசாங்க நிர்மாணிப்புகளை மேற் கொள்வதற்காக அடையாளம் காணப்பட்ட தொழில்வாண்மைத் தகைமைகளைக்கொண்ட பதிவுசெய்யப்பட்ட ஒப்பந்தக்காரர்களின் எண்ணிக்கை எவ்வளவு;

[ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා]

(ii) ஒவ்வொரு துறையிலும் நிர்மாணிப்புகளை மேற்கொள்ள மேற்படி ஒப்பந்தக்காரர்களிடம் இருக்கவேண்டிய அடிப்படை தொழில் வாண்மைத் தகைமைகள் யாவை;

(iii) அரசாங்க நிர்மாணிப்புகளுக்காக 2018ஆம் ஆண்டில் அரசாங்க நிர்மாணிப்பு ஒப்பந்தக் காரர்களுக்கு செலுத்தியுள்ள மொத்த பணத்தொகை எவ்வளவு;

(iv) அரசாங்க நிர்மாணிப்புகளுக்காக 2018ஆம் ஆண்டுக்காக அரசாங்க நிர்மாணிப்பு ஒப்பந்தக் காரர்களுக்கு செலுத்த எஞ்சியுள்ள மொத்த பணத்தொகை எவ்வளவு;

(v) சம்பந்தப்பட்ட கொடுப்பனவுகள் மேற்கொள் ளப்படுவது தாமதித்ததன்மூலமாக அத்துறைகளில் ஈடுபட்டுள்ள ஒப்பந்தக்காரர்கள் கடுமையான நிதி வசதியீனத்திற்கு இலக்காகின் றனரென்பதையும்; அதன்காரணமாக அவர் களின் தொழில்முயற்சி நடவடிக்கைகள் சீரழிதல் நாட்டின் பொருளாதாரத்திற்கு பாதகமான தாக்கங்களை ஏற்படுத்துகின்றதென்பதையும் ஏற்றுக்கொள்கிறாரா;

(vi) சம்பந்தப்பட்ட ஒப்பந்தக்காரர்களுக்கு மேற்படி நிலுவைத் தொகைகள் செலுத்தப்படும் திகதி யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

( ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation, Northern Province Development and Youth Affairs:

(a) Will he inform this House-

(i) the number of professionally qualified registered contractors identified for carrying out the constructions of the Government in the Island;

(ii) the basic professional qualifications that the said contractors should possess to carry out constructions in the respective fields;

(iii) the total amount paid to the Government contractors in the year 2018 for the constructions of the Government;

(iv) the amount that remains to be paid to the Government contractors for the year 2018 for the constructions of the Government;

(v) whether he acknowledges that the contractors engaged in the said field experience severe financial constraints owing to the delay in making the relevant payments and the resultant collapse of their business activities has a detrimental impact on the national economy; and

(vi) the date on which the relevant contractors will be paid the said amounts in arrears?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම ඒ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ප්‍රධාන කොන්ත්‍රාත්කරුවන් - 4,167 (හාරදහස් එකසිය හැටහතයි)

විශේෂිත ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් - 245 (දෙසිය හතළිස්පහයි)

(ii) 1. අදාළ ක්ෂේත්‍රය තුළ ආසන්න වශයෙන් වසර 5ක කාලයක් තුළදී නිම කර ඇති විශාලතම ව්‍යාපෘතියේ වටිනාකම හා පසුගිය වසර 5 තුළ ඉදිකිරීම් පිරිවැටුම

2. මූල්‍යමය හැකියාව

3. තාක්ෂණික හැකියාව
3.1 වෘත්තීමය කාර්ය මණ්ඩලය
3.2 අධීක්ෂණ කාර්ය මණ්ඩලය
තවද,

4. ඉහළ ශ්‍රේණි සඳහා
- ISO වැනි පද්ධති කළමනාකරණයක් සතුවීම.
- ඉදිකිරීම් කාර්යය සුරක්ෂිතතාව හා වෘත්තීමය සෞඛ්‍ය ආරක්ෂණ නිලධාරීන් (Occupational Safety and Health Officer) බවද සැලකිල්ලට ගනු ලැබේ.
හෝ

5. ඉදිකිරීම් සංවර්ධන අධිකාරියේ වර්ගීකරණයට අනුව ලියා පදිංචි වීම සහ පශ්චාත් පළපුරුද්ද ලබා තිබිය යුතුය.

6. කොන්ත්‍රාත්වල වටිනාකම අනුව ඉදිකිරීම් සංවර්ධන අධිකාරියේ ලියා පදිංචිය අනුව කොන්ත්‍රාත්කරුවන් විසින් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(iii) ඇමුණුම 01 (තීරය 1) හි දැක්වේ.

(iv) ඇමුණුම 01 (II තීරය) හි දැක්වේ.

***ඇමුණුම 01***

| නම | ගෙවූ මුදල (රුපියල්) I තීරය | ගෙවිය යුතු මුදල (රුපියල්) I I තීරය |
|---|---|---|
| මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | 19,457,090,415.00 | 9,362,229,755.80 |
| ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව | 41,053,752.79 | - |
| නාගරික සංවර්ධන අධිකාරිය | 1,570,370,000.00 | - |
| ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව | 1,016,528,625.98 | - |

(v) නැත.

ඉදිකිරීම් ටෙන්ඩර් පිළිබඳ සම්මත ලේඛනයට (SBD - 01/02) අනුව ගෙවීම් සඳහා නිශ්චිත කාලයක් දක්වා ඇත. මෙහිදී කොන්ත්‍රාත්කරු ව්‍යාපෘතියට අදාළව බිල්පත, ඉදිකිරීම සිදු කරමින් යන විට කොටස් වශයෙන් ඉදිරිපත් කරන අතර අදාළ ඉංජිනේරුවරයා විසින් සහතික කරන ලද එම බිල්පත් දින 21ක් ඇතුළත අදාළ සේවායෝජකයා වෙත ඉදිරිපත් කළ යුතු වේ. ඒ අනුව එම සහතික කරන ලද දිනයේ සිට දින 14ක් ඇතුළතදී සේවායෝජකයා විසින් ගෙවීම සිදු කළ යුතු වේ.

(vi) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මම අහන්නේ බොහොම කෙටි ප්‍රශ්නයක්. 2018 වසරට කොපමණ මුදලක් ගෙවන්න තිබෙනවාද? මම හිතන්නේ ඉලක්කම් ප්‍රමාණයක් විතරයි එහි තිබෙන්නේ. 2018 වසර සඳහා කොපමණ මුදලක් ගෙවලා තියෙනවාද? ඒ වාගේම (iv) වන ප්‍රශ්නයෙන් මා අහන්නේ තව කොච්චර ගෙවන්න තිබෙනවාද කියලායි. මට ඒ පිළිබඳව දැන ගන්න ඕනෑ, මගේ ඉතිරි ප්‍රශ්නවලට යන්න නම්. මම හිතන්නේ ඇමතිතුමා සභාගත කළ පිළිතුරේ තිබෙන ගණනවත් කිව්වොත් ඊළඟ ප්‍රශ්නයට මට යන්න පුළුවන්.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඇමුණුම 01හි තිබෙන්නේ මෙන්න මෙහෙමයි. මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයට රුපියල් 19,457,090,415.00යි; ගෙවිය යුතු මුදල රුපියල් 9,362,229,755.80යි, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුදල රුපියල් 41,053,752.79 යි, නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු මුදල රුපියල් 1,570,370,000.00 යි, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට රුපියල් 1,016,528,625.98 යි. ඒ විධියට තමයි ඇමුණුමේ තිබෙන්නේ.

වැඩිදුර පැහැදිලි කිරීමක් අවශ්‍ය නම්, පැහැදිලි උත්තරයක් ලිඛිතව ඔබතුමාට දෙන්න පුළුවන්.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

2018 වසරේ තව ගෙවන්න කොච්චර හිඟ මුදලක් තියෙනවාද කියන කාරණය සඳහන්ව නැද්ද ගරු ඇමතිතුමා? රුපියල් මිලියන 9,362ක් තිබෙන බව සඳහන් වුණා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගෙවිය යුතු මුදලකුත් සඳහන් කරලා තියෙනවා, රුපියල් මිලියන 9,362.22ක් වශයෙන්.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

2018 වසරටද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

2018 වසරට වෙන්න ඕනෑ. මොකද, ඔබතුමා අහලා තිබෙන්නේ එහෙමයි. නමුත් මෙහි 2018 කියා සඳහන් කරලා නැහැ.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

ගරු ඇමතිතුමනි, එතකොට මාර්ග ඇතුළු සියලු රජයේ ඉදිකිරීම්වලට අදාළව 2018ට කොච්චර මුදලක් ගෙව්වාද?

දැන් 2019 අගෝස්තු මාසයටත් ඇවිල්ලා තිබෙනවා. ගෙව්වා වාගේ තව දෙතුන්ගුණයක මුදලක් රජයේ කොන්ත්‍රාත්කරුවන්ට ආණ්ඩුව ගෙවන්න තිබෙනවා. මේ වෙද්දී අපේ ගරු කථානායකතුමා ඉන්න මීරිගම පැත්තේ මධ්‍යම අධිවේගී මාර්ගය හදනවා. මේ වෙද්දී ඒ ඉඩම්වලට ගෙවලාත් නැහැ. සමහර ඉදිකිරීම් සමාගම් ඇවිල්ලා භාගෙට වැඩ පටන්අරගෙන තිබෙනවා. ඒ ගොල්ලන්ගේ advance එකවත් තවම හරියට ලැබිලා නැහැ. එතකොට නිකම් නටබුන් වාගේ පොඩි කොන්ක්‍රීට් කැලි හදාගෙන, රජයේ ඉදිකිරීම් සියල්ල නැවතිලා තිබෙනවා, පල්ලේවෙල, මීරිගම, පස්යාල, වේයන්ගොඩ මේ ආදී ප්‍රදේශවල. ඒක ජන ජීවිතයට ලොකු ගැටලුවක්, ලොකු ප්‍රශ්නයක්. ඔබතුමා ඒ විෂය ගැන දන්නේ නැති නිසා ඔබතුමාට උත්තර දෙන්න බැරුව ඇති. ඒ නිසා අපි අතුරු ප්‍රශ්න අහන එකේ තේරුමක් නැහැ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

අතුරු ප්‍රශ්න ඇහුවොත්, අපි සතියකින් ඔබතුමාට පිළිතුර දැනුම් දෙනවා.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

පසුගිය වකවානුවේ, දැනට මාසයකට වාගේ ඉහතදී ඔබතුමන්ලා පරිපූරක ඇස්තමේන්තුවකින් මේ ඉදිකිරීම් සඳහා ගෙවන්න බිලියන 65ක් පාර්ලිමේන්තුවෙන් අනුමත කර ගත්තා. එතකොට, ඒ අනුමත කර ගත්තු මුදල්වලින් මොකක්ද කෙරෙන්නේ කියන එක ගැන හරි විස්තරයක් නැහැ. අපි දන්නා විධියට දැන් කොන්ත්‍රාත්කරුවන් බලාගෙන ඉන්නවා, ඒ අනුමත කර ගත්තු මුදල්වලින් හෝ ඒ අයට මුදල් ලැබේවි කියලා. මේ වෙද්දී දකුණු අධිවේගී මාර්ගයේ කෙළවර ඉවර කර ගන්න බැරිව නවත්වා දමා තිබෙනවා. ඒ වාගේම, මධ්‍යම අධිවේගී මාර්ගයේ කඩවත දක්වා කොටස එහෙම පිටින්ම නැවතිලා තිබෙනවා. ඒ මාර්ග භාවිත කරන ජනතාවට විශාල ගැටලු තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අතුරු ප්‍රශ්න අහන්න. ගරු ඇමතිතුමා පොරොන්දු වුණා නේ, සතියකින් පිළිතුරු ලබා දෙන්නම් කියලා.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය තමයි එතුමා ඉදිරිපත් කරපු සංඛ්‍යාලේඛනවලට අනුව තව කොච්චර ගෙවන්න තිබෙනවාද කියන එක. එතුමා ඒ විස්තර දුන්නා නම් ඇති.

අවසාන වශයෙන් අහන්නේ දැන් මීරිගම ප්‍රදේශයේ තිබෙන ගැටලුව නිසා-

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
2018ට අදාළ විස්තර ටික තමයි මම දැන් සභාගත කළේ.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
හොඳයි. 2019, මේ අවුරුද්දේ දැනට මාස අටක් ගත වෙලා ඉවරයි. 2018 අවුරුද්දේ ඒවාට තව ගෙවන්නත් තිබෙනවා. මේවා කවදා ද ගෙවා ඉවර කරන්න පුළුවන් කියන එකයි මගේ ප්‍රශ්නය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නම් ගරු ඇමතිතුමනි, ඒ ප්‍රශ්න අදාළ ඇමතිතුමාට යොමු කරලා සතියකින් පිළිතුරක් ලබා දෙන්න.

## චිත්‍රපට සංරක්ෂණය: පුහුණුව
திரைப்படப் பாதுகாப்பு: பயிற்சி
CONSERVATION OF FILMS: TRAINING

837/'19

**13. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් චිත්‍රපට සංරක්ෂණය සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(ii) ඒ අනුව සංරක්ෂණය කර ඇති චිත්‍රපට සංඛ්‍යාව කොපමණද;

(iii) එම අංශයේ නිලධාරින්ට හා සේවකයන්ට චිත්‍රපට සංරක්ෂණය සඳහා විදේශ පුහුණුව ලබාදෙන්නේද;

(iv) එසේ නම්, විදේශ පුහුණුව සඳහා යොමු කරනු ලබන ආයතන කවරේද;

(v) පසුගිය කාලය තුළ විදේශ පුහුණුව ලබාදී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணத்துறை மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய சுவடிக்கூடத் திணைக்களம் திரைப் படங்களைப் பாதுகாப்பதற்கான வேலைத் திட்டமொன்று செயற்படுத்துகின்றதா என்பதையும்;

(ii) அதற்கமைய பாதுகாக்கப்பட்டுள்ள திரைப் படங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) மேற்படி பிரிவின் அலுவலருக்கு மற்றும் ஊழியர்களுக்கு திரைப்படங்களை பாதுகாப்பது தொடர்பான வெளிநாட்டுப் பயிற்சி வழங்கப்படுகின்றதா என்பதையும்;

(iv) ஆமெனில், வெளிநாட்டுப் பயிற்சிக்காக அனுப் பப்படுகின்ற நிறுவனங்கள் யாவையென் பதையும்;

(v) கடந்த காலத்தில் வெளிநாட்டுப் பயிற்சி வழங்கப்பட்டுள்ள நபர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

அவர்இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Cultural Affairs:

(a) Will he inform this House-

(i) whether a plan of action is implemented by the Department of National Archives to conserve films;

(ii) the number of films that have been conserved according to that;

(iii) whether the officers and the employees of that section are provided with foreign training relating to conservation of films;

(iv) if so, the institutions to which the persons have been referred for foreign training; and

(v) the number of persons who have been provided with foreign training recently?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) 378 යි.

(iii) ඔව්.

(iv) ඉන්දීය චිත්‍රපට උරුමය පදනම (Film Heritage Foundation)

(v) චිත්‍රපට සංරක්ෂණය පිළිබඳ විදේශ පුහුණුව ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව 5යි.

(ආ) අදාළ නොවේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මේකයි. ඔබතුමාත් කාලයක් චිත්‍රපට සංස්ථාව භාරව සිටි නිසා මේකට උත්තරයක් දෙන්න පුළුවන් වේවි. මේ චිත්‍රපට සංරක්ෂණය කියන විෂය, ජාතික චිත්‍රපට සංස්ථාවත් කරනවා. ඒ වාගේම ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවත් ඒක කරනවාය කියනවා. චිත්‍රපට සංරක්ෂණය කියන්නේ ඉතාම වැදගත් විෂයක් බව ඔබතුමා දන්නවා. චිත්‍රපටය වාණිජ එකක් වුණත්, කලාත්මක එකක් වුණත්, ලාභ ලැබුවත්, පාඩු ලැබුවත්, දවසක් දෙකක් දිව්වත් ඒ චිත්‍රපටය වර්තමානයට නොවෙයි, අනාගතය සඳහා වැදගත්. හැබැයි, චිත්‍රපට සංස්ථාව තුළත් චිත්‍රපට සංරක්ෂණය සඳහා විධිමත් වැඩ පිළිවෙළක්, අංශයක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව මේ කර්තව්‍ය පවරා ගත්තාට, මා දන්නා හැටියට චිත්‍රපට සංරක්ෂණය සඳහා එතැන ප්‍රමාණවත් පහසුකම් නැහැ.

ඒ නිසා අමාත්‍යාංශ මට්ටමින් නොව, ආණ්ඩුවක් හැටියට මේ කාර්යයට ඔබතුමන්ලා ගන්නා පියවර මොකක්ද? 1956 වර්ෂයේදී 'රේඛාව' හදපු වෙලාවේ සිට ලෙස්ටර් ජේම්ස් පීරිස් මහත්මයා ඉල්ලුවේත් චිත්‍රපට සංරක්ෂණය කරන්න කියලායි. චිත්‍රපට හදනතෙක්ද, මිය යන මොහොත තෙක්ද එතුමාගේ බලාපොරොත්තුව තිබුණේ මේක. එම නිසා අඩු තරමින් ඒ ඉල්ලීම ඉටු කිරීම සඳහාවත්, චිත්‍රපට සංරක්ෂණයට ආණ්ඩුව ගන්නා වැඩ පිළිවෙළ මොකක්ද කියලා දැන ගන්න කැමැතියි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ඉතා වැදගත් ප්‍රශ්නයක් එතුමා නඟන්නේ. ලෙස්ටර් ජේම්ස් පීරිස් මැතිතුමාගේ කාලයේත්, සියලු කලාකරුවෝත් කරන ඉල්ලීමක් මේක. අපට මතකයි, මේ කටයුත්ත සඳහා එක්තරා අවස්ථාවකදී අය වැයෙන් පවා මුදල් වෙන් කර ගැනීම සිදු කළ බව. මේ විෂය ක්ෂේත්‍රය දැන් සජිත් ප්‍රේමදාස මැතිතුමා යටතට භාරවෙලා තිබෙනවා. ඒ සඳහා එතුමාගේ විශේෂ වැඩ පිළිවෙළක් තිබෙන බව අපි දැක්කා, එතුමා අවස්ථා කීපයකදීම සඳහන් කළ දේවලින්. ඔබතුමාට වග කිව යුතු පිළිතුරක් අදාළ විෂය භාර ඇමතිවරයාගෙන්ම ලබා දෙන්න කටයුතු කරන්නම්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ඒ වාගේම මම ඔබතුමාගේ මාර්ගයෙන් ඇමතිතුමාට යොමු කරලා දැනගන්නට කැමැතියි, චිත්‍රපට සංස්ථාවේත්, ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේත් මේ වන විට සංරක්ෂණය කරලා තිබෙන චිත්‍රපට මොනවාද කියලා පාර්ලිමේන්තුවට වාර්තාවක් ලබා ගන්නට පුළුවන්ද කියලා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
හොඳයි, ඒ ප්‍රශ්නය ඇමතිතුමාට යොමු කරන්නම්.

## ඩබ්. එච්. එම්. කරුණාතිලක බණ්ඩා මහතා : අනුග්‍රාහක අරමුදලේ හිමිකම
### திரு. டபிள்யூ. எச். எம் கருணாதிலக்க பண்டா: அனுசரணை நிதிய உரிமை
### MR. W. H. M. KARUNATHILAKA BANDA: ENTITLEMENT FROM "SPONSORS FUND"

967/'19

**15. ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පොලිස් දෙපාර්තමේන්තුව විසින් `අනුග්‍රාහක අරමුදල' නමින් අරමුදලක් පවත්වාගෙන ගිය බවත්;

(ii) එම අරමුදල සඳහා සේවයේ නියුක්ත නිලධාරින්ගේ වැටුපෙන් මුදල් අයකර ගත් බවත්;

(iii) මහනුවර, අම්පිටියේ, ගාල්තැන්න පාරේ, අංක 08 හි පදිංචි හිටපු පොලිස් පරීක්ෂක ඩබ්. එච්. එම්. කරුණාතිලක බණ්ඩා මහතා දැනට වසර 07 කට පෙර විශ්‍රාම ගත් අවස්ථාවේදී මෙම අරමුදලින් ඔහුට හිමි මුදල අයදුම් කරමින් ලේඛන භාර දී ඇතත්, මෙතෙක් ගෙවීම් කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කරුණාතිලක බණ්ඩා මහතාගෙන් අය කරගෙන ඇති රුපියල් 12,328/-ක මුදල ආපසු ඒ මහතාට ගෙවීමට කටයුතු කරන්නේද;

(ii) වසර ගණනාවක් රඳවාගත් මෙම මුදල වෙනුවෙන් පොලියක් ගෙවන්නේද;

(iii) එසේ නම්, එම ගෙවීම් සිදු කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள், பொருளாதார அலுவல்கள், மீள் குடியேற்றம் மற்றும் புனர்வாழ்வு, வட மாகாண அபிவிருத்தி மற்றும் இளைஞர் விவகார அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) பொலிஸ் திணைக்களத்தினால் "அனுசரணை நிதியம்" எனும் பெயரில் நிதியமொன்று பேணப்பட்டதென்பதையும்;

(ii) மேற்படி நிதியத்துக்கு சேவையிலுள்ள உத்தியோகத்தர்களின் சம்பளத்திலிருந்து ஒரு தொகை அறவிடப்பட்டதென்பதையும்;

(iii) கண்டி, அம்பிடிய, கல்தென்ன வீதி, 08 ஆம் இலக்க விலாசத்தில் வசிக்கும் முன்னாள் பொலிஸ் பரிசோதகர் திரு டபி. எச். எம் கருணாதிலக்க பண்டா 07 ஆண்டுகளுக்கு முன்னர் ஓய்வு பெறுகையில் இந் நிதியத்திலுள்ள தமக்குரிய தொகையை கோரி விண்ணப்பித்து அதற்கான ஆவணங்களையும் சமர்ப்பித்துள்ள போதிலும், இது வரை அத்தொகை செலுத்தப்படவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) திரு கருணாதிலக்க பண்டாவிடமிருந்து அறவிடப்பட்ட ரூ. 12,328/- தொகையினை இவருக்கு மீள செலுத்துவதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(ii) பல ஆண்டுகளாக நிறுத்தி வைக்கப்பட்ட இத் தொகைக்கு வட்டித் தொகை செலுத்தப்படுமா என்பதையும்;

(iii) ஆமெனில், அது எப்பொழுதுசெலுத்தப்படும் என்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

( இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation, Northern Province Development and Youth Affairs:

(a) Is he aware that-

(i) the Police Department maintained a fund called " Sponsors Fund";

(ii) the fund was raised with the money drawn from the salaries of the employed officers; and

[ගරු බිමල් රත්නායක මහතා]

(iii) even though Mr. W.H.M Karunathilaka Banda, retired Police Inspector of No. 08, Galthenna Road, Ampitiya, Kandy who got his retirement seven years back, had submitted documents requesting the amount he is entitled to from the fund, no payment has been made until now?

(b) Will he also inform this House-

(i) whether measures will be taken to refund Rs. 12,328 that had been deducted from Mr. Karunathilaka Banda's salary;

(ii) whether an interest will be paid on this amount which had been retained for a number of years; and

(iii) if so, the date on which the payment will be made?

(c) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

1989.03.01 දිනට පෙර ශ්‍රී ලංකා පොලිස් සේවයට බැඳුණු පොලිස් කොස්තාපල් තනතුරේ සිට ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුර දක්වා වූ නිලධාරින් ගෙන් පමණක් මුදල් අය කරනු ලැබේ.

(iii) ඩබ්ලිව්.එච්.එම්. කරුණාතිලක බණ්ඩා නිලධාරියා වෙත 2018.08.13 දින රුපියල් 12,328.00ක මුදලක් ගෙවීම් කර ඇත.

(ආ) (i) ඩබ්ලිව්.එච්.එම්. කරුණාතිලක බණ්ඩා නිලධාරියා ගෙන් රුපියල් 2,226.00ක මුදලක් අය කරගෙන තිබූ අතර, දායක මුදල් ප්‍රතිලාභ ලෙස රුපියල් 12,328.00ක මුදලක් ගෙවීම් කර ඇත.

(ii) මෙම අය කර ගැනීම් සඳහා පොලී මුදල් ගෙවනු නොලබන අතර, දායක මුදල් ප්‍රතිලාභ පමණක් ගෙවනු ලැබේ.

(iii) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ඇත්තටම පාර්ලිමේන්තුවට මේ ප්‍රශ්න ඉදිරිපත් වීමේ කාලයත් සමඟයි මේ ගැටලුව තිබෙන්නේ. දැන් මේ ප්‍රශ්නය විසඳිලායි තිබෙන්නේ. තිබෙන ප්‍රශ්නය මේකයි. අපි පාර්ලිමේන්තුවට ප්‍රශ්නයක් ඉදිරිපත් කළාම, ඒ සඳහා පිළිතුර ලබා දීමට යන විශාල කාලය නිසා සමහර ප්‍රශ්නවලට අදාළ, -දැන් මේ උත්තරය ලැබුණු නිසා හොඳයි- පුද්ගලයන් මැරිලාත් ඉවරයි, ඔබතුමන්ලා උත්තර දෙන විට. ඒ නිසා මීට වඩා ඉක්මනින් පිළිතුරු ලබා දීමේ ක්‍රමවේදයක් අවශ්‍යයි.

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මෙය පොලීසිය සම්බන්ධ කරුණක් නිසායි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරන ගරු කථානායකතුමාට මම ඉදිරිපත් කරන්නේ. ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නා පරිදි මීට දින කිහිපයකට කලින් උදේ වරුවක ජනමාධ්‍යවලින් වාර්තා කළා, පොලිස් කොමිසම මඟින් එක්තරා නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් මාරු කළා කියලා. ඊට පැයකට-දෙකකට පසුව නැවත වාර්තා කළා, පොලිස් කොමිසම ගත් එම තීරණය අවලංගු කළා කියලා. මම මේ ප්‍රශ්නය ඔබතුමාට යොමු කරන්නේ, මාත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයකු වශයෙන් කටයුතු කරන නිසායි. දැන් මිනිසුන් අපෙන් පවා ප්‍රශ්න කරනවා, උදේ ගත්ත තීන්දුව ඊට පසුව පැයකින්-දෙකකින් වෙනස් වෙන්නේ, දේශපාලන බලපෑම් නිසාද කියලා. එම සභාවේ සභාපති වශයෙන් කටයුතු කරන ඔබතුමාට සහ සාමාජිකයන් වශයෙන් කටයුතු කරන අපටත් ප්‍රශ්නයක් තිබෙනවා, අප පත් කරන ලද පුද්ගලයන් නේද, දැන් මේ විධියට කටයුතු කරන්නේ කියලා. ඒ නිසා මම මේ අවස්ථාවේදී ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. පොලිස් කොමිසම ගන්නා තීරණ, කිසිම වග විභාගයකින් තොරව, වගකීමකින් තොරව ගන්නා බව තමයි පෙනෙන්නේ. එම නිසා මම මෙතැනදී මතු කළ මේ නිශ්චිත කරුණ සහ ඊට අදාළ වෙච්ච කරුණු සම්බන්ධව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපතිවරයා වශයෙන් ඔබතුමා පොලිස් කොමිසමේ සභාපතිවරයාගෙන් වාර්තාවක් ගෙන්වා ගෙන, ඒකට බලපෑ කාරණය කුමක්ද කියලා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, එම කරුණ සම්බන්ධයෙන් ඔබතුමා වාගේම, පසුගිය දින කිහිපය තුළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, ප්‍රදේශයේ මහා සංඝ රත්නය ඇතුළු පාර්ශ්ව කීපයකින්ම අදහස් ප්‍රකාශ කළා. ඒ අනුව මාත්, පොලිස් කොමිසමේ සභාපතිතුමාත්, පොලිස්පතිවරයාත් ඒ ගැන අවධානය යොමු කළා. ඒ අය ඊයේ-පෙරේදා සාකච්ඡා කරලා යම්කිසි එකඟත්වයකට ආවා. මා හිතන විධියට ඒ නිසා ඔය ප්‍රශ්නය විසඳෙයි; වාර්තාවක් ලැබෙයි. හෙට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව රැස් වෙනවා. එතකොට මට මේ කරුණ ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ අනුව මෙම ගැටලුව විසඳාගන්න පුළුවන් කියලා මා විශ්වාස කරනවා. ඒ වාගේම තීරණය වෙනස් කිරීම සම්බන්ධවත් මා කියා තිබෙනවා. සාමාන්‍යයෙන් ගන්න තීරණය එකවර වෙනස් කරන එක හොඳ නැහැ. ඒකෙන් වැරදි හැඟීමක් ඇති වෙන බවත් මා පෙන්වා දීලා තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මම ඔබතුමා මාර්ගයෙන් නීතිය හා සාමය අමාත්‍යාංශය භාර අමාත්‍යවරයාට මෙම ප්‍රශ්නය යොමු කරනවා. මේ වනවිට පොලීසියේ සේවය කරන සංඥා ක්‍රියාකරුවන් -wireless telegraph operators- සම්බන්ධ ගැටලුවක් පැන නැඟී තිබෙනවා. රටේ පොලිස් ස්ථාන 60ක පමණ මේ සේවාව ක්‍රියාත්මක වෙනවා; නිලධාරින් 100ක් විතර එතැන ඉන්නවා. මේක ඇත්තටම සුනාමි ව්‍යසනය ඇති වුණු වේලාවේත් අපේ රටට වැදගත් වෙච්ච සේවයක්. නියෝජ්‍ය පොලිස්පති වික්‍රමසිංහ මහත්මයා ප්‍රවාහන සහ සන්නිවේදන අංශය භාරව සිටි

කාලයේ මේ ක්ෂේත්‍රය සංවර්ධනය කරන්න යෝජනා ඉදිරිපත් කර තිබෙනවා.

හැබැයි, මේ සංඥා මධ්‍යස්ථානවල ඉන්න අයට ඒ උපකරණත් බාර දීලා, normal සේවාවට යන්න කියලා දැන් උපදෙස් ලැබිලා තිබෙනවා. මේක ත්‍රිවිධ හමුදාවේත් තවම පාවිච්චි වනවා. මගේ දැනුමේ හැටියට නම් කරන්න ඕනෑකම තිබෙන්නේ තාක්ෂණික උපකරණ දියුණු කරලා, මේ සේවාව පවත්වාගෙන යෑමයි. ඒ නිසා මෙන්න මේ පොලිස් නිලධාරින් ඉදිරිපත් කරන ගැටලුව සම්බන්ධයෙන් ඔබතුමා හරහා ඇමතිවරයාගේ අවධානය යොමු කරවනවා. Normal dutiesවලට assign කරන්නේ නැතිව මේ අය පවත්වාගෙන යන සේවාව සංවර්ධනය කරන්න පියවර ගන්න කියලා මා ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, එහෙම නම් ආරක්ෂක අමාත්‍යාංශයට මේ කාරණය යොමු කරන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
විෂයය බාර ඇමතිවරයා හැටියට අතිගරු ජනාධිපතිතුමාගේ අවධානයට මා මේ කාරණය යොමු කරවනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

## "පුරනැගුම" යටතේ සංවර්ධනය කළ සෞඛ්‍ය මධ්‍යස්ථාන: විස්තර
## "புரநெகும" நிகழ்ச்சித்திட்டத்தின்கீழ் அபிவிருத்தி செய்யப்பட்ட சுகாதார நிலையங்கள்: விபரம்
## HEALTH CENTRES DEVELOPED UNDER "PURANEGUMA" PROJECT: DETAILS

53/'18

**1. ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ගරු හේෂා විතානගේ මහතා වෙනුවට)**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - மாண்புமிகு ஹேசா விதானகே சார்பாக)
(The Hon. Susantha Punchinilame on behalf of the Hon. Hesha Withanage)

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) යහපාලන රජය බලයට පත් වූ දින සිට අද දක්වා පළාත් සභා, පළාත් පාලන අමාත්‍යාංශයේ "පුරනැගුම" වැඩසටහන යටතේ සංවර්ධනය කරනු ලැබූ සෞඛ්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් හා ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) ඌව පළාතේ සෞඛ්‍ය මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය යටතේ මෙතෙක් ගෙන ඇති සහ ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நல்லாட்சி அரசாங்கம் பதவியேற்ற திகதி தொடக்கம் இற்றைவரை மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சின் "புரநெகும" நிகழ்ச்சித்திட்டத்தின் கீழ் அபிவிருத்தி செய்யப் பட்ட சுகாதார நிலையங்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii) இவற்றின் பெயர்கள் மற்றும் இதற்காக செலவிடப்பட்ட தொகை எவ்வளவென் பதையும்;

(iii) ஊவா மாகாணத்தில் சுகாதார நிலையங்களை அபிவிருத்தி செய்வதற்கு இக்கருத்திட்டத்தின் கீழ் இற்றைவரையில் மேற்கொள்ளப்பட்டுள்ள மற்றும் எதிர்காலத்தில் மேற்கொள்ளப்படவுள்ள வழிமுறைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government:

(a) Will he inform this House-

(i) the number of health centres developed under the "Puraneguma" Programme implemented under the Ministry of Provincial Councils and Local Government from the commencement of the 'Good Governance' governing system up to date;

(ii) their names and the expenditure borne; and

(iii) the steps so far taken and the steps that will be taken in future under this project for the development of health centres in the Uva Province?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) සෞඛ්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව 28කි.

(ii) ඇමුණුම* බලන්න.
වැය කරන ලද මුදල - රුපියල් මිලියන 174.43

(iii) මෙම ව්‍යාපෘති යටතේ බදුල්ල, හල්දුම්මුල්ල හා රිදීමාලියද්ද යන ප්‍රාදේශීය සභාවල සෞඛ්‍ය මධ්‍යස්ථානයන්හි යටිතල පහසුකම් සංවර්ධනය කර ඇත. ඉදිරියේදී ඌව පළාත තුළ වකුගඩු රෝග නිවාරණය සඳහා ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ඇත. නව සෞඛ්‍ය මධ්‍යස්ථාන ඉදිකිරීමට හෝ පවත්නා මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීමට මෙතෙක් යෝජනා වී නොමැත.

(ආ) පිළිතුරු සපයා ඇත.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 - 101/'18 - (1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ගරු කථානායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ප්‍රතිසංස්කරණය කරන ලද වාරිමාර්ග: බදුල්ල දිස්ත්‍රික්කය
## புனரமைக்கப்பட்ட நீர்ப்பாசனத் திட்டங்கள்: பதுளை மாவட்டம்
## RENOVATED IRRIGATION SCHEMES: BADULLA DISTRICT

271/'18

**4. ගරු නිමල් ලාන්සා මහතා (ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு நிமல் லான்சா - மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக)
(The Hon. Nimal Lanza on behalf of the Hon. R.M. Padma Udhayashantha Gunasekera)
කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස් හෝ වැලි සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබා ගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கிராமியப் பொருளாதார அலுவல்கள், நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015, 2016 மற்றும் 2017 ஆம் ஆண்டுகளில் பதுளை மாவட்டத்தில் புனரமைக்கப்பட்ட சிறிய, மத்திய மற்றும் பாரிய அளவிலான நீர்ப்பாசனத் திட்டங்கள் யாவையென்பதையும்;

(ii) ஒவ்வொரு புனரமைப்புப் பணிக்காகவும் மதிப்பிடப்பட்ட பணத்தொகை தனித்தனியாக எவ்வளவென்பதையும்;

(iii) மேற்படி புனரமைப்புப் பணிகளுக்காக கேள்விப் பத்திரங்கள் கோரப்பட்டனவா என்பதையும்;

(iv) ஆமெனில், அக் கேள்விப் பத்திரங்களைப் பெற்றுக்கொண்ட ஒப்பந்தகாரர்களின் பட்டிய லொன்றை சமர்ப்பிப்பாரா என்பதையும்;

(v) மேற்படி ஒவ்வொரு வருடத்துக்கும் ஏற்புடைய தான புனரமைப்புப் பணிகளின் பௌதீக மற்றும் நிதிசார் முன்னேற்றம் தனித்தனியாக யாதென் பதையும்;

(vi) மேற்படி புனரமைப்புப் பணிகளுக்கான சாத்தியக்கூறு ஆய்வு, சுற்றாடல் மற்றும் பொறியியல் அறிக்கைகளை சமர்ப்பிப்பாரா என்பதையும்;

(vii) மேற்படி புனரமைப்புப் பணிகளின் போது அகற்றப்பட்ட வண்டல் படிவு, மண் அல்லது மணலுக்காக கேள்விப் பத்திரங்கள் கோரப் பட்டனவா என்பதையும்;

(viii) ஆமெனில், அக் கேள்விப் பத்திரங்களை பெற்றுக்கொண்ட ஒப்பந்தகாரர்களின் பட்டிய லொன்றை சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Rural Economic Affairs, Irrigation and Fisheries and Aquatic Resources Development:

(a) Will he inform this House-

(i) the minor, medium and major-scale irrigation schemes renovated in Badulla District in the years 2015, 2016 and 2017;

(ii) the estimated amount for each renovation work, separately;

(iii) whether tenders were called for the said renovation work;

(iv) if so, whether a list of names of the contractors who obtained those tenders will be submitted;

(v) the physical and financial progress of the renovation work of that contract with relevance to each of the aforesaid years;

(vi) whether the feasibility study, environmental and engineering reports relevant to that renovation work will be submitted;

(vii) whether tenders were called for the silt, soil or sand removed in renovation work; and

(viii) if so, whether a list of names of the contractors who obtained those tenders will be submitted?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) සුළු පරිමාණ වාරිමාර්ග

| වර්ෂය | සුළු පරිමාණ වාරිමාර්ග |
|---|---|
| 2015 | සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය |
| 2016 | වැව් ප්‍රතිසංස්කරණය |
| | නිර්මිත ඉදිකිරීම් |
| | වාරි ඇළ ප්‍රතිසංස්කරණය |
| | ජලාපවාහන පද්ධති/ඇළ මාර්ග වැඩිදියුණු කිරීම |
| | එල්ලංගා ප්‍රතිසංස්කරණය |
| | සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය |
| 2017 | ඇළ යටි ගං සංවර්ධනය |
| | ඇළ මාර්ග වැඩිදියුණු කිරීම |
| | යටි ගං සංවර්ධනය |

සුළු වාරිමාර්ග ව්‍යාපාර වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් පාලනය නොවේ. නමුත් 2015, 2016, 2017 වසරවලදී සුළු වාරිමාර්ග විසි අටක (28) (ඇමුණුම 01)* වාරිමාර්ග පද්ධති නිර්මිත ඉදිකිරීම් සහ මුලස්ථායි වැඩ ප්‍රතිසංස්කරණය, කෘෂි මාර්ග නඩත්තු කටයුතු, ඇළ මාර්ග වැඩිදියුණු කිරීම් කටයුතු, දෙපාර්තමේන්තු ඉඩම් හා අනෙකුත් වත්කම් ආරක්ෂා කර ගැනීම සිදු කර ඇත.

මධ්‍යම පරිමාණ වාරිමාර්ග - 2015, 2016, 2017 වසරවල දී විලකන්ඩිය වැව මධ්‍ය වාරිමාර්ග ව්‍යාපාරයේ වාරිමාර්ග පද්ධති මෙහෙයුම් හා නඩත්තු, නිර්මිත ඉදිකිරීම් සහ මුලස්ථායි වැඩ ප්‍රතිසංස්කරණය, කෘෂි මාර්ග නඩත්තු කටයුතු, ඇළ මාර්ග වැඩිදියුණු කිරීම් කටයුතු, දෙපාර්තමේන්තු ඉඩම් හා අනෙකුත් වත්කම් ආරක්ෂා කර ගැනීම, ගංවතුර හානි අලුත්වැඩියාවන් සිදු කර ඇත.

මහා පරිමාණ වාරිමාර්ග - 2015, 2016, 2017 වසරවල දී සොරබොර වැව මහා වාරිමාර්ග ව්‍යාපාරයේ වාරිමාර්ග පද්ධති මෙහෙයුම් හා නඩත්තු, නිර්මිත ඉදිකිරීම සහ මුලස්ථායි වැඩ ප්‍රතිසංස්කරණය, කෘෂි මාර්ග නඩත්තු කටයුතු, ඇල මාර්ග වැඩි දියුණු කිරීම් කටයුතු, දෙපාර්තමේන්තු ඉඩම් හා අනෙකුත් වත්කම් ආරක්ෂා කර ගැනීම, ගංවතුර හානි අලුත්වැඩියාවන් සිදු කර ඇත.

(ii)

| වර්ෂය | සුළු පරිමාණ වාරිමාර්ග | ඇස්තමේන්තු මුදල (රු.) | මුළු ඇස්තමේන්තු මුදල (රු.) |
|---|---|---|---|
| 2015 | සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය | 75,383,460.00 | 75,383,460.00 |
| 2016 | වැව් ප්‍රතිසංස්කරණය | 1,309,000.00 | 136,659,800.00 |
| | නිර්මිත ඉදිකිරීම | 5,430,000.00 | |
| | වාරි ඇළ ප්‍රතිසංස්කරණය | 39,172,900.00 | |
| | ජලාපවාහන පද්ධති/ඇල මාර්ග වැඩිදියුණු කිරීම | 2,815,000.00 | |
| | එල්ලංගා ප්‍රතිසංස්කරණය | 8,463,000.00 | |
| | සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය | 79,469,900.00 | |
| 2017 | ඇළ යටි ගං සංවර්ධනය | 25,037,000.00 | 36,014,000.00 |
| | ඇළ මාර්ග වැඩිදියුණු කිරීම | 9,707,000.00 | |
| | යටි ගං සංවර්ධනය | 1,270,000.00 | |
| 2015, 2016, 2017 වසර සඳහා මුළු ඇස්තමේන්තු මුදල (රු.) | | | 248,057,260.00 |

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කළ සුළු වාරිමාර්ග ව්‍යාපාර 28 සඳහා ඇස්තමේන්තුගත මුදල

| වර්ෂය | සුළු පරිමාණ වාරිමාර්ග | ඇස්තමේන්තු මුදල (රු.) | මුළු ඇස්තමේන්තු මුදල (රු.) |
|---|---|---|---|
| 2015 | දෙපාර්තමේන්තු රක්ෂිත හා ඉඩම් ආරක්ෂා කිරීම | 395,581.00 | 15,792,348.00 |
| | ප්‍රධාන සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතු | 13,039,337.00 | |
| | කෘෂි මාර්ග නඩත්තු කිරීම | 2,357,430.00 | |
| 2016 | දෙපාර්තමේන්තු රක්ෂිත හා ඉඩම් ආරක්ෂා කිරීම | 249,781.00 | 1,447,389.00 |
| | ප්‍රධාන සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතු | 49,278.00 | |
| | කෘෂි මාර්ග නඩත්තු කිරීම | 1,148,330.00 | |
| 2017 | ප්‍රධාන සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතු | 12,357,613.00 | 12,534,360.00 |
| | ඇල මාර්ග වැඩි දියුණු කිරීම | 176,747.00 | |
| 2015, 2016, 2017 වසර සඳහා මුළු ඇස්තමේන්තු මුදල (රු.) | | | 29,774,097.00 |

| වර්ෂය | මධ්‍යම පරිමාණ වාරිමාර්ග | ඇස්තමේන්තු මුදල (රු.) | මුළු ඇස්තමේන්තු මුදල (රු.) |
|---|---|---|---|
| 2015 | මෙහෙයුම් හා නඩත්තු | 12,405,701.00 | 184,755,529.00 |
| | ගංවතුර හානි අලුත්වැඩියාවන් | 237,575.00 | |
| | දෙපාර්තමේන්තු රක්ෂිත හා ඉඩම් ආරක්ෂා කිරීම | 1,069,915.00 | |
| | ප්‍රධාන සහ මධ්‍යම පරිමාණ ව්‍යාපාරවල අත්‍යවශ්‍ය පුනරුත්ථාපන කටයුතු | 140,305,114.00 | |
| | කෘෂි මාර්ග නඩත්තු කිරීම | 1,772,045.00 | |
| | ඇල මාර්ග වැඩි දියුණු කිරීම | 28,965,179.00 | |
| 2016 | මෙහෙයුම් හා නඩත්තු | 13,801,132.00 | 143,256,989.00 |
| | ගංවතුර හානි අලුත්වැඩියාවන් | 6,931,077.00 | |
| | දෙපාර්තමේන්තු රක්ෂිත හා ඉඩම් ආරක්ෂා කිරීම | 1,085,429.00 | |
| | ප්‍රධාන සහ මධ්‍යම පරිමාණ ව්‍යාපාරවල අත්‍යවශ්‍ය පුනරුත්ථාපන කටයුතු | 85,118,602.00 | |
| | කෘෂි මාර්ග නඩත්තු කිරීම | 1,331,190.00 | |
| | ඇල මාර්ග වැඩි දියුණු කිරීම | 34,989,559.00 | |
| 2017 | මෙහෙයුම් හා නඩත්තු | 15,390,676.00 | 58,596,931.00 |
| | ගංවතුර හානි අලුත්වැඩියාවන් | 3,810,332.00 | |
| | දෙපාර්තමේන්තු රක්ෂිත හා ඉඩම් ආරක්ෂා කිරීම | 781,324.00 | |
| | ප්‍රධාන සහ මධ්‍යම පරිමාණ ව්‍යාපාරවල අත්‍යවශ්‍ය පුනරුත්ථාපන කටයුතු | 26,667,016.00 | |
| | කෘෂි මාර්ග නඩත්තු කිරීම | 1,782,895.00 | |
| | ඇල මාර්ග වැඩි දියුණු කිරීම | 10,164,688.00 | |
| 2015, 2016, 2017 වසර සඳහා මුළු ඇස්තමේන්තු මුදල (රු.) | | | 386,609,449.00 |

| වර්ෂය | මහා පරිමාණ වාරිමාර්ග | ඇස්තමේන්තු මුදල (රු.) | මුළු ඇස්තමේන්තු මුදල (රු.) |
|---|---|---|---|
| 2015 | මෙහෙයුම් හා නඩත්තු | 6,584,599.00 | 122,045,229.00 |
| | ගංවතුර හානි අලුත්වැඩියාවන් | 736,253.00 | |
| | ප්‍රධාන සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අත්‍යවශ්‍ය පුනරුත්ථාපන කටයුතු | 35,482,137.00 | |
| | ඇල මාර්ග වැඩි දියුණු කිරීම | 79,242,240.00 | |
| 2016 | මෙහෙයුම් හා නඩත්තු | 17,164,418.00 | 63,281,520.00 |
| | ගංවතුර හානි අලුත්වැඩියාවන් | 1,694,697.00 | |
| | දෙපාර්තමේන්තු රක්ෂිත හා ඉඩම් ආරක්ෂා කිරීම | 103,150.00 | |
| | ප්‍රධාන සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අත්‍යවශ්‍ය පුනරුත්ථාපන කටයුතු | 15,115,031.00 | |
| | ඇල මාර්ග වැඩි දියුණු කිරීම | 29,204,224.00 | |
| 2017 | මෙහෙයුම් හා නඩත්තු | 11,646,924.00 | 67,965,475.00 |
| | ගංවතුර හානි අලුත්වැඩියාවන් | 4,083,721.00 | |
| | දෙපාර්තමේන්තු රක්ෂිත හා ඉඩම් ආරක්ෂා කිරීම | 105,859.00 | |
| | ප්‍රධාන සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අත්‍යවශ්‍ය පුනරුත්ථාපන කටයුතු | 22,681,411.00 | |
| | ඇල මාර්ග වැඩි දියුණු කිරීම | 29,447,560.00 | |
| 2015, 2016, 2017 වසර සඳහා මුළු ඇස්තමේන්තු මුදල (රු.) | | | 253,292,224.00 |

***[මෙම පිළිතුර පුස්තකාලයේ ද තබා ඇත.]***
*[இந்த விடை நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]*
*[This reply is also placed in the Library.]*

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(iii)

සුළු පරිමාණ වාරිමාර්ග - ක්‍රියාත්මක කරන ලද රුපියල් මිලියන 05ට අඩු ව්‍යාපෘති සෘජු කොන්ත්‍රාත් ලෙස අදාළ ගොවි සංවිධාන වෙත පවරා ඉටු කරන ලද අතර ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අදාළ දිස්ත්‍රික්කයන් වෙත ලබා දෙන අතර දිස්ත්‍රික් භාර නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරු විසින් අදාළ කොන්ත්‍රාත් පිරිනමනු ලැබේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු වූ සුළු, මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග ව්‍යාපාර 30න් තෝරා ගත් ව්‍යාපාර 14ක් වෙනුවෙන් ටෙන්ඩර් කැඳවා ඇත.

(iv) සුළු පරිමාණ වාරිමාර්ග - ඉදිරිපත් කළ හැක.

මධ්‍ය හා මහා පරිමාණ වාරිමාර්ග - ඔව් (ඇමුණුම 02)*

(v) සුළු පරිමාණ වාරිමාර්ග

| වර්ෂය | වියදම (රු.) | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | වැඩ අවසන් | අවිච්ඡේද |
| 2015 | 66,626,166.71 | 88.38 | 100 | - |
| 2016 | 82,754,637.05 | 60.55 | 137 | - |
| 2017 | 31,285,065.85 | 86.86 | 23 | 3 |

මහා හා මධ්‍ය - පරිමාණ වාරිමාර්ග සියලුම කාර්යයන් වෙන් කරන ලද ප්‍රතිපාදන යටතේ අවසන් කර ඇති අතර භෞතික හා මූල්‍ය ප්‍රගතිය 100% වේ.

(vi)

සුළු පරිමාණ වාරිමාර්ග - අදාළ නොවේ.

මධ්‍ය පරිමාණ වාරිමාර්ග - විලකන්ඩිය වැව අලුතින්ම ඉදි කිරීමට තෝරා ගෙන ඇත. ඒ සඳහා ශක්‍යතා අධ්‍යයන වාර්තා සකස් කර ඇත.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු වූ සුළු හා මහා පරිමාණ වාරිමාර්ග -

දැනට පවතින ව්‍යාපාරවල ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන හා අලුත්වැඩියා කිරීම් කටයුතු සඳහා ශක්‍යතා අධ්‍යයන වාර්තා සකස් කිරීම අවශ්‍ය නොවේ. සියලු කාර්යයන් සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනයක් සිදු කර සැලසුම් කිරීමෙන් අනතුරුව ඇස්තමේන්තු සකස් කර ඇත.

(vii) නැත.

(viii) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

---

* *පුස්තකාලයේ තබා ඇත.*

* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

## රොක්වුඩ් වතුයායේ විශ්‍රාමික කම්කරුවන්: ඊපීඑෆ්, ඊටීඑෆ් සහ විශ්‍රාම පාරිතෝෂික

## ரொக்வூட் தோட்ட ஓய்வுபெற்ற தொழிலாளர்: ஈ.பீ.எவ்., ஈ.ரீ.எவ். மற்றும் பணிக்கொடை

RETIRED ESTATE WORKERS OF ROCKWOOD ESTATE: EPF, ETF AND PENSION GRATUITY

374/'18

**5. ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ගරු වේලු කුමාර් මහතා වෙනුවට)**

(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - மாண்புமிகு வேலு குமார் சார்பாக )

(The Hon. Susantha Punchinilame on behalf of the Hon. Velu Kumar)

රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු රොක්වුඩ් වතුයායේ 2002 වර්ෂයේදී සේවය කරන ලද වතු කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2000 සිට 2015 දක්වා මෙම වතුයායේ සේවය කර විශ්‍රාම ගැන්වූ පිරිමි සහ කාන්තා වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ විශ්‍රාම ගැන්වූ කම්කරුවන් අතරින් මේ වනවිටත් සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකය ගෙවා නොමැති කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කම්කරුවාගේ නම, සාමාජික අංකය, සේවක අර්ථසාධක අරමුදල්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකයේ හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

அரச தொழில் முயற்சிகள், மலைநாட்டு மரபுரிமைகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மக்கள் தோட்ட அபிவிருத்திச் சபைக்குச் சொந்தமான ரொக்வூட் தோட்டத்தில் 2002 ஆம் ஆண்டில் தொழில் புரிந்த தோட்டத் தொழிலாளர் களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) 2000 முதல் 2015 ஆம் ஆண்டு வரை இத் தோட்டத்தில் தொழில் புரிந்து ஓய்வெடுக்கச் செய்யப்பட்ட ஆண் மற்றும் பெண் தோட்டத் தொழிலாளர்களின் எண்ணிக்கை தனித்தனியாக யாது என்பதையும்;

(iii) அவ்வாறு ஓய்வெடுக்கச் செய்யப்பட்ட தொழிலாளர்களில் இன்றளவில் ஊழியர் சேமலாப நிதி, ஊழியர் நம்பிக்கை பொறுப்பு நிதி மற்றும் ஓய்வூதியப் பணிக்கொடை செலுத்தப் படாத தொழிலாளர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) அவ்வாறான தொழிலாளர் ஒவ்வொருவரினதும் பெயர், அங்கத்தவர் இலக்கம், ஊழியர் சேமலாப நிதி, ஊழியர் நம்பிக்கைப் பொறுப்பு நிதி மற்றும் பணிக்கொடை ஊதியத்தின் நிலுவை தனித்தனி யாக யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Enterprise, Kandyan Heritage and Kandy Development :

(a) Will he inform this House-

(i) the number of estate workers who served in 2002 in the Rockwood Estate that belonged to Janatha Estate Development Board;

(ii) separately, the number of male and female estate workers who went on retirement from 2000 - 2015 after serving in this estate;

(iii) the number of retired workers out of the aforesaid labourers who have not been paid Employees Provident Fund (EPF), Employees Trust Fund (ETF) and Pension Gratuity; and

(iv) the name of each of the aforesaid worker, the membership number and the amount due from the EPF, ETF and Pension Gratuity separately?

(b) If not, why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள், மலைநாட்டு மரபுரிமைகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise, Kandyan Heritage and Kandy Development and Leader of the House)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) වතු කම්කරුවන් 504.

(ii)

| වර්ෂය | පිරිමි සංඛ්‍යාව | ගැහැනු සංඛ්‍යාව | කම්කරුවන් ගණන |
|---|---|---|---|
| 2000 | 0 | 6 | 6 |
| 2001 | 2 | 10 | 12 |
| 2002 | 6 | 7 | 13 |
| 2003 | 2 | 9 | 11 |
| 2004 | 6 | 11 | 17 |
| 2005 | 7 | 20 | 27 |
| 2006 | 5 | 9 | 14 |
| 2007 | 16 | 18 | 34 |
| 2008 | 6 | 3 | 9 |
| 2009 | 5 | 7 | 12 |
| 2010 | 10 | 13 | 23 |
| 2011 | 2 | 8 | 10 |
| 2012 | 11 | 12 | 23 |
| 2013 | 16 | 14 | 30 |
| 2014 | 7 | 12 | 19 |
| 2015 | 7 | 11 | 18 |
| Total | 108 | 170 | 278 |

(iii) සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (ETF) = 0
සේවක අර්ථ සාධක අරමුදල් (EPF) = 246
විශ්‍රාම පාරිතෝෂිතය (Gratuity) = 276

(iv) කරුණාකර ඇමුණුම* බලන්න.

(ආ) අදාළ නොවේ.

## නාවල, පිඹුරු අංක 41/SLLRDC දරන ඉඩම: අයිතිය

நாவலயில் அமைந்துள்ள 41/SLLRDC ஆம் இலக்க வரைபடக் காணி: உரிமம்
LAND BEARING PLAN NO. 41/SLLRDC IN NAWALA: OWNERSHIP

502/'19

**6. ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ගරු ජයන්ත සමරවීර මහතා වෙනුවට)**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - மாண்புமிகு ஜயந்த சமரவீர சார்பாக)
(The Hon. Susantha Punchinilame on behalf of the Hon. Jayantha Samaraweera)
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මහ කොළඹ ගං වතුර පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත පවරා ගනු ලැබූ ජල රක්ෂිත ප්‍රදේශවලට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එසේ පවරා ගනු ලැබූ ඉඩම් විකුණා තිබේ නම්, එම ප්‍රමාණය කොපමණද;

(iii) නාවල, කිරිමණ්ඩල මාවතේ පිහිටි පිඹුරුපත් අංක 41/SLLRDC දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට අයත් ඉඩම විකිණීමට පෙර දීර්ඝ කාලීන බදු පදනම මත පවරා දීමට කටයුතු කර තිබේද;

(iv) එම ඉඩම පෙර අයිතිකරුවන්ගෙන් පවරා ගනු ලැබූ පදනම කවරේද;

(v) ඉඩම පවරා ගැනීමේදී ඉඩම හිමිකරුට වන්දි ගෙවීමක් සිදු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ, නම් ඒ මන්ද?

மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பாரிய கொழும்பு வெள்ளப் பெருக்கத்தினைக் கட்டுப்படுத்துவதற்காக இலங்கை காணி மீட்பு மற்றும் அபிவிருத்தி கூட்டுத்தாபனத்துக்கு சுவீகரிக்கப்பட்டுள்ள நீரேந்து பிரதேசங்களுக்கு உரித்தான காணிகளின் பரப்பளவு யாது;

(ii) அவ்வாறு சுவீகரிக்கப்பட்டுள்ள காணிகள் விற்பனை செய்யப்பட்டிருப்பின், அதன் பரப்பளவு யாது;

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සුසන්ත පුංචිනිලමේ මහතා]

(iii) நாவல, கிரிமண்டல வீதியில் அமைந்துள்ள 41/ SLLRDC ஆம் இலக்க வரைபடத்தைக் கொண்ட இலங்கை காணி மீட்பு மற்றும் அபிவிருத்தி கூட்டுத்தாபனத்துக்கு உரித்தான காணியை விற்பதற்கு முன்னர், நீண்ட கால குத்தகை அடிப்படையில் வழங்குவதற்கான நடவடிக்கை மேற்கொள்ளப்பட்டுள்ளதா;

(iv) மேற்படி காணி முந்திய உரிமையாளர்களிட மிருந்து சுவீகரிக்கப்பட்டதன் அடிப்படை யாது;

(v) காணிகளை சுவீகரிக்கையில் காணி உரிமை யாளருக்கு நஷ்டஈடு வழங்கப்பட்டுள்ளதா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Megapolis and Western Development :

(a) Will he inform this House-

(i) the total extent of lands belonging to water reservation areas that were acquired by Sri Lanka Land Reclamation and Development Corporation for controlling floods in the Greater Colombo Area;

(ii) if lands that were acquired for that purpose have been sold, the extent of lands that have been sold;

(iii) whether action has been taken to transfer, on long-term lease basis, the land in Kirimandala Mawatha, Nawala, plan No. 41/SLLRDC, belonging to Sri Lanka Land Reclamation and Development Corporation before the land is sold;

(iv) the basis on which the aforesaid land was acquired from its previous owners; and

(v) whether compensation was paid to the owner of the land when that land was acquired?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මහ කොළඹ ගංවතුර පාලනය කිරීමේ හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ජල රක්ෂිතය ලෙස ආසන්න වශයෙන් අක්කර දහසක් පමණ රජය වෙත පවරාගෙන ඇති අතර, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත පවරා ගැනීමක් සිදු කර නැත.

(ii) රජයට අත්කර ගත් එවැනි ඉඩම් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව මඟින් විකුණා නොමැත.

(iii) මෙය රජය සතු ඉඩමකි. මෙතෙක් මෙම ඉඩම විකිණීමක් හෝ දීර්ඝ කාලීන බදු පදනම මත මෙතෙක් පැවරීමක් සිදු කර නොමැත.

(iv) මෙම ඉඩමේ මුල් අයිතිකරු රජය වේ. ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ 2 වගන්තිය යටතේ ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ ප්‍රදේශයක් ලෙස

ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශය තුළ පිහිටි පිඹුරු අංක 41/ SLLRDC දරන ඉඩම සංස්ථා පනතේ 3(ආ) 1 වගන්තිය යටතේ සංස්ථාව වෙත පවරා ඇත.

(v) මෙම ඉඩමේ මුල් හිමිකරු රජය බැවින් වන්දි ගෙවීමක් සිදු කර නොමැත. කෙසේ වුවද, අදාළ දේපළ විකිණීමෙන් හෝ බදු දීමෙන් ලැබෙන ආදායමෙන් සංස්ථාව විසින් සංවර්ධනය සඳහා දරන ලද පිරිවැය අඩු කර ඉතිරි ප්‍රමාණය ඒකාබද්ධ අරමුදල වෙත බැර කෙරේ.

(ආ) අදාළ නොවේ.

## සූර්යබල නිෂ්පාදනය: සහන ණය
## சூரிய மின்வலு உற்பத்தி: சலுகைக் கடன்
## SOLAR POWER GENERATION: CONCESSIONARY LOANS

578/'19

**7. ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා වෙනුවට)**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - மாண்புமிகு துஷார இந்துனில் அமரசேன சார்பாக)
(The Hon. Susantha Punchinilame on behalf of the Hon. Thushara Indunil Amarasena)

විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සූර්යබල නිෂ්පාදනයන් සඳහා රජය විසින් සහන ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබේද;

(ii) එම වැඩ පිළිවෙළ යටතේ පාරිභෝගිකයන්ට ලබා දෙන ණය සඳහා ගෙවිය යුතු පොලී ප්‍රතිශතය කොපමණද;

(iii) මෙම වැඩ පිළිවෙළ යටතේ එක් එක් බැංකුව විසින් පාරිභෝගිකයන් වෙත ලබා දී ඇති ණය ප්‍රමාණය සහ එම ණය මුදල්වල එකතුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரிசக்தி மற்றும் தொழில்துறை அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சூரிய மின்வலு உற்பத்திக்கு அரசாங்கத்தினால் சலுகை கடன் திட்டமொன்று செயற்படுத்தப் பட்டுள்ளதா என்பதையும்;

(ii) மேற்படி வேலைத்திட்டத்தின் கீழ் வாடிக் கையாளர்களுக்கு வழங்கப்படும் கடன்களுக்கு செலுத்த வேண்டிய வட்டி வீதம் எவ்வளவென்பதையும்;

(iii) இந்த வேலைத்திட்டத்தின் கீழ் ஒவ்வொரு வங்கியினாலும் வாடிக்கையாளர்களுக்கு வழங்கப்பட்டுள்ள கடன் தொகை மற்றும் அக் கடன் தொகையின் முழுமொத்தம் எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power, Energy and Business Development :

(a) Will he inform this House-

(i) whether the Government has implemented a concessionary loan scheme for solar power generation;

(ii) the percentage at which interest will have to be paid for loans provided to customers under that course of action; and

(iii) the sums of loans that have been granted to customers by each bank separately under this course of action and the total of such loans?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) සූර්ය පැනල මඟින් විදුලිය ජනනය කිරීම සඳහා රජය විසින් "රිවි බල සවි"නමින් සහන පොලී ණය යෝජනා ක්‍රමයක් 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කර ඇත.

එමෙන්ම ආසියානු සංවර්ධන බැංකුව මඟින් ලබා ගත් ඇමෙරිකානු ඩොලර් මිලියන 50ක ණය උපයෝගී කරගෙන සූර්ය විදුලි ජනනය සඳහා ආයෝජනය කරන විදුලි පාරිභෝගිකයන්ට ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වේ.

(ii) මෙම වැඩ පිළිවෙළ යටතේ ඕනෑම ගෘහස්ථ විදුලි පාරිභෝගිකයෙකුට මෙම ව්‍යාපෘතිය සඳහා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුම්ගත වී ඇති රජයේ හෝ පෞද්ගලික බැංකුවකින් ණය ලබා ගත හැකි අතර, එම ණය මුදලෙන් රුපියල් 350,000/-ක් සඳහා 6.75%ක අඩු පොලී පහසුකම යටතේ පාරිභෝගිකයා වෙත සලසා තිබිණ. එහිදී සඵල පොලී අනුපාතය 13.50%ක් වන අතර, පොලියේ ඉතිරි 6.75% රජය විසින් දරනු ලැබේ.

එමෙන්ම මේ වනවිට ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ලබා ගත් ඇමෙරිකානු ඩොලර් මිලියන 50ක ණය ආධාර යටතේ, විදුලි පාරිභෝගිකයන්ට කිලෝවොට් 50 දක්වා ස්ථාපිත ධාරිතාවක් සහිත සූර්ය ජනන පද්ධති තම පරිශ්‍රවල වහල මත සවිකර ගැනීම සඳහා 8%ක වාර්ෂික පොලී අනුපාතිකයකට ණය මුදලක් ලබා දෙනු ලැබේ. එහිදී එක් සූර්ය ජනන පද්ධතියක් සඳහා වියදම රුපියල් මිලියන 1.5ක් නොඉක්මවන්නේ නම් සමස්ත පිරිවැය ණය මුදල ලෙස ලබා ගත හැකි අතර, එක් පද්ධතියක් සඳහා වියදම රුපියල් මිලියන 1.5 ඉක්මවන්නේ නම් සමස්ත පිරිවැයෙන් 80%ක් ණය මුදල ලෙස ලබා ගත හැක. ණය ආපසු අයකර ගැනීමේ කාලය වසර 10කි.

(iii) සූර්යබල විදුලි නිෂ්පාදනය සඳහා "රිවි බල සවි" ණය යෝජනා ක්‍රමය යටතේ එක් එක් බැංකුව විසින් 2018.03.22 දින වනවිට පාරිභෝගිකයන් වෙත පහත දැක්වෙන පරිදි ණය මුදල් ලබා දී ඇත.

| | බැංකුව | ලබා දී ඇති ණය ප්‍රමාණය | ලබා දී ඇති ණය මුදල (රු.මි.) |
|---|---|---|---|
| 1 | ලංකා බැංකුව | 198 | 68.3 |
| 2 | මහජන බැංකුව | 152 | 52.2 |
| 3 | හැටන් නැෂනල් බැංකුව | 17 | 6.0 |
| 4 | කොමර්ෂල් බැංකුව | 04 | 1.4 |
| 5 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 04 | 1.4 |
| 6 | සම්පත් බැංකුව | 02 | 0.7 |
| 7 | ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව | 01 | 0.35 |
| 8 | ඩීඑෆ්සීසී බැංකුව | 01 | 0.35 |
| | එකතුව | 379 | 130.7 |

සූර්යබල විදුලි නිෂ්පාදනය සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර ණය යෝජනා ක්‍රමය යටතේ එක් එක් බැංකුව විසින් 2019.03.28 දින වනවිට පාරිභෝගිකයන් වෙත පහත දැක්වෙන පරිදි ණය මුදල් ලබා දී ඇත.

| | බැංකුව | ලබා දී ඇති ණය ප්‍රමාණය | ලබා දී ඇති ණය මුදල (රු.මි.) |
|---|---|---|---|
| 1 | මහජන බැංකුව | 34 | 47.3 |
| 2 | හැටන් නැෂනල් බැංකුව | 105 | 228.7 |
| 3 | කොමර්ෂල් බැංකුව | 75 | 101.5 |
| 4 | ලංකා බැංකුව | 58 | 56.5 |
| 5 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 02 | 2.2 |
| 6 | ඩීඑෆ්සීසී බැංකුව | 14 | 31.0 |
| 7 | සම්පත් බැංකුව | 69 | 87.5 |
| 8 | සෙලාන් බැංකුව | 30 | 51.8 |
| 9 | නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 02 | 1.7 |
| 10 | ජාතික සංවර්ධන බැංකුව | 10 | 33.3 |
| | එකතුව | 399 | 641.5 |

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 8 - 604/'18 - (1), ගරු වාසුදේව නානායක්කාර මහතා.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු කථානායකතුමනි, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## මහනුවර දිස්ත්‍රික්කයේ ඇති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ඉඩම්: ව්‍යාපෘති විස්තර
கண்டி மாவட்டத்தில் காணி மறுசீரமைப்பு ஆணைக்குழுவிற்குச் சொந்தமான காணி: கருத்திட்ட விபரம்
LANDS BELONGING TO LAND REFORM COMMISSION IN KANDY DISTRICT: PROJECT DETAILS

611/'18

**9. ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ගරු ආනන්ද අලුත්ගමගේ මහතා වෙනුවට)**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - மாண்புமிகு ஆனந்த அளுத்கமகே சார்பாக)
(The Hon. Susantha Punchinilame on behalf of the Hon. Ananda Aluthgamage)

ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

[ගරු සුසන්ත පුංචිනිලමේ මහතා]

(අ) මහනුවර දිස්ත්‍රික්කය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම්වල ප්‍රමාණයන් සහ නාමයන් වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) වර්ෂ 2005 සිට 2017 දක්වා කාලය තුළ මහනුවර දිස්ත්‍රික්කය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ව්‍යාපෘති සිදු කිරීම සඳහා බදු පදනම යටතේ ලබා දී ඇති සියලු ඉඩම්වල නාමය, ප්‍රමාණය හා එම ඉඩම් පිහිටි ස්ථාන වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) දැනට සක්‍රිය මට්ටමේ පවතින ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) වසර 3කට වඩා වැඩි කාලයක් ගත වී ඇති, යෝජිත ව්‍යාපෘති කවරේද;

(iv) මෙතෙක් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අපොහොසත්ව ඇති ඉඩම් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් බදු පදනම යටතේ මහනුවර දිස්ත්‍රික්කය තුළ ලබා දී ඇති ඉඩම් බොහොමයක අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීමෙන් ඵලදායී කාර්යයකට යෙදවීමට හැකිව තිබූ එම ඉඩම් අවභාවිතයට ලක්ව ඇති බව එතුමා පිළිගන්නේද;

(ii) මෙතෙක් ව්‍යාපෘති සිදු කර නොමැති ඉඩම් නැවත කොමිෂන් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) கண்டி மாவட்டத்தில், காணி மறுசீரமைப்பு ஆணைக்குழுவிற்கு சொந்தமாக உள்ள காணிகளின் அளவும் பெயர்களும் வெவ்வேறாக யாவை என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) 2005 தொடக்கம் 2017 ஆம் ஆண்டு வரையான காலப்பகுதியில் கண்டி மாவட்டத்தில் காணி மறுசீரமைப்பு ஆணைக்குழுவினால் பல்வேறு கருத்திட்டங்களுக்கு குத்தகை அடிப்படையில் வழங்கப்பட்டுள்ள சகல காணிகளினதும் பெயர்கள், அளவு மற்றும் காணி அமைந்துள்ள இடங்கள் வெவ்வேறாக யாவை என்பதையும்;

(ii) இன்றளவில் இயங்குநிலையிலுள்ள கருத்திட்டங் களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(iii) 03 ஆண்டுகளுக்கு மேல் கடந்துள்ள, உத்தேச கருத்திட்டங்கள் யாவை என்பதையும்;

(iv) இதுவரை கருத்திட்டங்களை செயற்படுத்த தவறியுள்ள காணிகளின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) காணி மறுசீரமைப்பு ஆணைக்குழுவினால் குத்தகை அடிப்படையில் கண்டி மாவட்டத்தில் வழங்கப்பட்டுள்ள அநேகமான காணிகளில் கருத்திட்டங்கள் ஆரம்பிக்கப்படாத காரணத் தினால் பயன்மிக்க பணியொன்றுக்கு பயன்படுத்த கூடியதாக இருந்த அக் காணிகள் தவறாக பயன்படுத்தப்பட்டுள்ளதென்பதை அவர் ஏற்றுக்கொள்கின்றாரா என்பதையும்;

(ii) இதுவரை கருத்திட்டங்கள் மேற்கொள்ளப்படாத காணிகளை மீள ஆணைக்குழுவிற்கு சுவீகரிப் பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Lands and Parliamentary Reforms:

(a) Will he state the names and extents of lands in Kandy District that belong to the Land Reform Commission, separately?

(b) Will he inform this House-

(i) the names, extents and the locations of the lands in Kandy District belonging to the Land Reform Commission that have been given on lease basis to implement projects from 2005 to 2017;

(ii) the number of projects that are progressing;

(iii) the proposed projects which are over three years old; and

(iv) the number of lands on which projects have not been commenced yet?

(c) Will he also inform this House-

(i) whether he admits that those lands in Kandy District which belong to the Land Reform Commission which should have been used for a productive purpose have been misused as the relevant projects have not been carried out in most of those lands; and

(ii) whether arrangements will be made to take over those lands in which the projects have not yet been implemented?

(d) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) ඔව්. ඇමුණුම 1හි* සඳහන් කර ඇත.

(ආ) (i) ඇමුණුම 2හි* දක්වා ඇත.

(ii) සක්‍රිය ව්‍යාපෘති සංඛ්‍යාව 60කි. (ඇමුණුම 2හි දක්වා ඇත.)

(iii) වසර 3කට වඩා වැඩි කාලයක් ගත වී ඇති යෝජිත ව්‍යාපෘති 62කි. (ඇමුණුම 3හි* දක්වා ඇත.)

(iv) මෙතෙක් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී ඇති ඉඩම් සංඛ්‍යාව 28කි. (ඇමුණුම 4හි* දක්වා ඇත.)

(ඇ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් බදු දී ඇති බොහෝ ඉඩම් අවභාවිතයට ලක් වී ඇති බව පිළිනොගනී. එසේ වුවද, බදුකර නිකුත් කිරීමේ අරමුණින් ඉඩම්වල භුක්තිය බාර දී ඇති නමුත් එම ඉඩම්වල ඉදිරි කටයුතු සිදු නොකළ අවස්ථා සඳහා පහත පරිදි ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

2002 - 2004 කාල සීමාවේදී ව්‍යාපෘති සඳහා භුක්තිය බාර දුන් ඉඩම්වලට අදාළව ව්‍යාපෘති 16ක් අංක අමප/04/0693/001/015 හා 2004.06.30 දිනැති කැබිනට් තීරණයකින් අවලංගු කර ඇත. එම ඉඩම්වල භුක්තිය බාර ගැනීමට අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

අනුමත ව්‍යාපෘති සඳහා ලබා දුන් ඉඩම් යෝජිත කාර්යයෙන් තොරව යොදා ගත් අවස්ථා සඳහා බදු ගිවිසුම් අවලංගු කිරීමට නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

මෙතෙක් ව්‍යාපෘති සිදු කර නොමැති ඉඩම් නැවත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පවරා ගැනීම සඳහා අදාළ ක්ෂේත්‍ර වාර්තා ලබා ගනිමින් ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

(ii) ඔව්. ඉහත (ඇ) (i)හි පරිදි ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

(ඈ) අදාළ නොවේ.

## ශ්‍රී ලංකා පුරවැසිකම ලබා ගත් ඉන්දියානු සම්භවයක් ඇති පුද්ගලයන් : විස්තර
## இலங்கைப் பிரஜாவுரிமை பெற்ற இந்திய வம்சாவளியினர்: விபரம்
## PERSONS OF INDIAN ORIGIN WITH SRI LANKAN CITIZENSHIP: DETAILS

750/'19

**11. ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා වෙනුවට)**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில சார்பாக )
(The Hon. Susantha Punchinilame on behalf of the Udaya Prabhath Gammanpila)

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 1948 සිට 1995 දක්වා ශ්‍රී ලංකාවේ පදිංචි වී සිටි මෙරට පුරවැසිභාවය ලබා ගත් මෑත ඉන්දියානු සම්භවයක් (Recent Indian Origin) ඇති පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව කොපමණද;

(ii) වර්ෂ 1948 සිට 1995 දක්වා සිරිමා - ශාස්ත්‍රී ගිවිසුම යටතේ ඉන්දියානු පුරවැසිකම ලබා හෝ ලබා ගැනීමට ඉන්දියාව බලා පිටත් වී ගිය මෙරට පදිංචි වී සිටි මෑත ඉන්දියානු සම්භවයක් ඇති පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iii) වර්ෂ 1948 සිට 1995 දක්වා ශ්‍රී ලංකාවේ පදිංචි වී සිටි ශ්‍රී ලංකා පුරවැසිකම ලබා ගත් ඉන්දියානු පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) වර්ෂ 1948 සිට 1995 දක්වා ශ්‍රී ලංකාවේ පදිංචි වී සිට ඉන්දියානු පුරවැසිකම ලබාගෙන හෝ ලබා ගැනීම සඳහා ඉන්දියාවට පිටත්වී ගිය පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளக, உள்நாட்டலுவல்கள் மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1948 தொடக்கம் 1995 ஆம் ஆண்டு வரையிலான காலப்பகுதியில் இலங்கையில் குடியிருந்து இந்நாட்டில் பிரஜாவுரிமையைப் பெற்றுக்கொண்டுள்ள அண்மைக்கால இந்திய வம்சாவளியைக் கொண்ட (Recent Indian Origin) நபர்களின் எண்ணிக்கை ஒவ்வொரு ஆண்டின் பிரகாரம் எத்தனை என்பதையும்;

(ii) 1948 தொடக்கம் 1995 ஆம் ஆண்டு வரை சிறிமா - சாஸ்திரி ஒப்பந்தத்தின் கீழ் இந்திய பிரஜாவுரிமையைப் பெற்று அல்லது பெற்றுக் கொள்வதற்காக இந்தியாவை நோக்கிச் சென்ற இந்நாட்டில் குடியிருந்த அண்மைக்கால இந்திய வம்சாவளியைக் கொண்ட நபர்களின் எண்ணிக்கை ஒவ்வொரு ஆண்டின் பிரகாரம் எத்தனை என்பதையும்;

(iii) 1948 தொடக்கம் 1995 ஆம் ஆண்டு வரை இலங்கையில் குடியிருந்து இலங்கை பிரஜாவுரிமையைப் பெற்றுக்கொண்ட இந்தியர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iv) 1948 தொடக்கம் 1995 ஆம் ஆண்டு வரை இலங்கையில் குடியிருந்து இந்திய பிரஜா உரிமையைப் பெற்றுக்கொண்டு அல்லது பெற்றுக்கொள்வதற்காக இந்தியாவுக்குச் சென்ற நபர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

( ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government :

(a) Will he inform this House-

(i) in respect of each year separately, the number of persons of recent Indian origin who resided in Sri Lanka from 1948 to 1995 and obtained citizenship of this country;

(ii) in respect of each year for the period from 1948 to 1995, the number of persons of recent Indian origin who went to India after obtaining the Indian citizenship or to obtain the Indian citizenship under the Sirima-Shasthri Agreement;

(iii) the number of Indians who resided in Sri Lanka from 1948 to 1995 and obtained the citizenship of Sri Lanka; and

(iv) the number of persons who resided in Sri Lanka from 1948 to 1995 and went to India after obtaining the Indian citizenship or to obtain the Indian citizenship?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) වර්ෂ 1948 සිට [1949 අංක 03 දරන පනත/ 1967 අංක 14 දරන පනත/1988 අංක 39 (විශේෂ විධිවිධාන) පනත අනුව] ශ්‍රී ලංකාවේ පදිංචි වී සිටි ඉන්දියානු ජාතිකයින් සඳහා මෙරට පුරවැසිභාවය ලබා දී ඇත.

එක් එක් පනතට අදාළව ඉදිරිපත් කරන ලද කොන්දේසිවල සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති ඉන්දියානු පුද්ගලයින් වෙත ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ලබා දී ඇතත්, එසේ

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

පුරවැසිභාවය ලබා දෙන ලද අය පිළිබඳ සටහන් කර ඇති ලේඛනවල ඔවුන් මැත ඉන්දියානු සම්භවයක් ඇති හෝ එසේ නොවන අය ලෙස වර්ග කර සටහන් කර නොමැත.

පනත් අනුව පුරවැසිභාවය ලබා දෙන ලද පුද්ගලයින් සංඛ්‍යාව දෙපාර්තමේන්තු දත්ත පද්ධතියේ සටහන් කර ඇතත් එම සංඛ්‍යා වර්ෂ වශයෙන් වෙන් වෙන් ලෙස සටහන් වී නැත. එක් එක් ගිවිසුම අනුව ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ලබා දෙන ලද පුද්ගලයින් පිළිබඳ තොරතුරු පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | ගිවිසුම | ඉන්දියානු පුද්ගලයින් ගණන |
|---|---|---|
| 01 | 1949 අංක 03 දරන පනත | 134,320 |
| 02 | 1967 අංක 14 දරන පනත | 343,985 |
| 03 | 1988 අංක 39 (විශේෂ විධිවිධාන) පනත | 43,850 |
| | එකතුව | 522,155 |

(ii) සිරිමා ශාස්ත්‍රී ගිවිසුම ක්‍රියාවට නංවා ඇත්තේ 1967 වර්ෂයේදීය. 1967 අංක 14 දරන ඉන්දු ලංකා ගිවිසුම (සිරිමා ශාස්ත්‍රී ගිවිසුම) මඟින් ඉන්දියානුවන් 600,000 නැවත ඉන්දියාවට යැවීමට තීරණය වී ඇත. එයින් 94,000ක් ඉන්දියාවට යෑම ප්‍රතික්ෂේප කර ඇති අතර, ඉතිරි 506,000 පුද්ගලයින් අතරින් 342,000ක පමණ පිරිසක් 1983 දක්වා කාලය තුළ ආපසු ඉන්දියාවට යවා ඇත. එසේ යවන ලද පුද්ගලයින් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු එක් එක් වර්ෂය අනුව දෙපාර්තමේන්තු දත්ත පද්ධතියේ සටහන් කර නොමැත.

(iii) වර්ෂ 1948 සිට කලින් කල පනවන ලද ගිවිසුම් අනුව ශ්‍රී ලංකාවේ පදිංචිව සිටි ශ්‍රී ලංකාවේ පුරවැසිකම ලබා ගත් ඉන්දියානු පුද්ගලයින් පිළිබඳ තොරතුරු පහතින් දක්වා ඇත.

| අනු අංකය | ගිවිසුම | ඉන්දියානු පුද්ගලයින් ගණන |
|---|---|---|
| 01 | 1949 අංක 03 දරන පනත | 134,320 |
| 02 | 1967 අංක 14 දරන පනත | 343,985 |
| 03 | 1988 අංක 39 (විශේෂ විධිවිධාන) පනත | 43,850 |
| | එකතුව | 522,155 |

(iv) 1948 සිට 1963 දක්වා ඉන්දියානු පුරවැසිකම ලබාගෙන හෝ ලබා ගැනීමට ඉන්දියාව බලා පිටත් වී ගිය මෙරට පදිංචිව සිටි ඉන්දියානු පුරවැසියන් සංඛ්‍යාව පිළිබඳ එවකට පාර්ලිමේන්තුවේ පවත්වන ලද ප්‍රකාශයක පහත සඳහන් පරිදි තොරතුරු සඳහන් කර ඇත.

| අනු අංකය | වර්ෂය | ඉන්දියාවට පිටත් වී ගිය පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | 1948 | 3,281 |
| 02 | 1949 | 2,415 |
| 03 | 1950 | 4,717 |
| 04 | 1951 | 12,000 |
| 05 | 1953 | 9,323 |
| 06 | 1954 | 13,377 |
| 07 | 1955 | 22,871 |
| 08 | 1956 | 15,985 |
| 09 | 1963 | 7,357 |

1967 වසරේ සිරිමා ශාස්ත්‍රී ගිවිසුම ක්‍රියාවට නැංවීමත් සමඟ 342,000ක පමණ පිරිසක් වර්ෂ 1967 සිට 1983 දක්වා කාලය තුළ ආපසු ඉන්දියාවට යවා ඇත. එසේ යවන ලද පුද්ගලයින් ගණන වර්ෂ අනුව වෙන් වෙන් වශයෙන් දැක්වීමේ හැකියාවක් නැත.

1988 අංක 39 දරන අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත අනුව එම කාල වකවානුව තුළ 80,000ක පුද්ගලයන් ප්‍රමාණයක් ඉන්දියාවට යැවීමට නියමිතව තිබුණි. නමුත් 1983 වර්ෂයේ මෙරට ඇති වූ කලබලකාරී තත්ත්වය හේතුවෙන් ඉන්දියාව බලා ප්‍රවාහනය කරන මඟී නැව් සේවාව අත්හිටුවන ලද බැවින් එම පුද්ගලයින් තවදුරටත් ලංකාවේ රැඳී සිට ඇත.

මීට අමතරව වර්ෂ 1983 සිට 2009 දක්වා ලංකාවේ පැවති අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් විවිධ නිල නොවන ක්‍රම උපයෝගී කර ගනිමින් ලංකාවේ පුද්ගලයන් ඉන්දියාවට ගොස් ඇති නමුත්, එසේ ගිය පුද්ගලයින් පිළිබඳ සංඛ්‍යාත්මක තොරතුරු ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සතුව නොමැත.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු අනුර දිසානායක මැතිතුමා.

**ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - State Minister of Transport and Civil Aviation)

ස්ථාවර නියෝග 27(2) යටතේ මීට කලින් ප්‍රශ්නයක් යොමු කරලා තිබුණා නේද? ඒ ගැනද කථා කරන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

නැහැ, ස්ථාවර නියෝග 27(2) යටතේ අද යොමු කරපු ප්‍රශ්නය. ඒක අහන්න, ගරු අනුර දිසානායක මැතිතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

කලින් අහපු ප්‍රශ්නයත් වැදගත්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

වැදගත් ඒ පිළිතුරනේ?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඔව්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒ පිළිතුර දෙන්න පුළුවන්, ඔබතුමා මේ ප්‍රශ්නය ඇහුවාට පසුව.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මීට කලිනුත් මම ඔබතුමාගේ අවධානයට මේ කාරණය යොමු කළා. අහපු ප්‍රශ්න ගොඩක් තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ අහපු ඒවාට පිළිතුරු දෙන්නේ නැහැ. දැන් මොකක්ද කරන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට මෙතැනදී කාරණයක් කියන්න තිබෙනවා. වගකීමක් ඇතිව ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා ඇමතිතුමන්ලාට ඒ ප්‍රශ්න යොමු කළාම සතියක් ඇතුළත පිළිතුරු ලැබෙනවා. මම ඒවා ගැන හොයා බලනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, නමුත් මාස තුනකට වඩා ප්‍රමාද වෙච්ච ඒවාත් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්නද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ, මේ ප්‍රශ්නවලට ලබා දෙන උත්තරවල ප්‍රමාද.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මෙතුමා සඳහන් කරන්නේ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න පිළිබඳවයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අදාළ අමාත්‍යවරුන්ට දැනුම් දුන්නා කියලා ඔබතුමාත් කිව්වා. මොන ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්න කියලා මොන ඇමතිවරයාටද දැනුම් දුන්නේ කියලා මම ගරු සභානායකතුමා ගෙන් දැනගන්න කැමතියි. පිළිතුරු පමා කරලා තිබෙන්නේ කවුද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඇමතිවරයාගේ නම් හෙළි කරන්න බැහැ. නමුත් ඒ විධියේ ප්‍රශ්න නවයක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ප්‍රශ්න නවයට පිළිතුරු ලබා දීම ඉක්මන් කරමු නේද ගරු සභානායකතුමා?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ප්‍රශ්න නවයක් තිබෙනවා උත්තර දෙන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කවුද ඒ ඇමතිවරු නව දෙනා?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ප්‍රශ්න නවයක් තිබෙනවා, ගරු කථානායකතුමනි. ඔබතුමා තමයි මේ කටයුතු මෙහෙය වන්නේ, මම නොවෙයි. ඔබතුමාට පුළුවන් ඇමතිවරයාට විරුද්ධව යම්කිසි පියවරක් ගන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට ඒ නම් ටික දෙන්න. මම කථා කරන්නම්. මම පෞද්ගලිකව කථා කරන්නම්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මම නිශ්චිත වශයෙන් අමාත්‍යවරයාගේ නම අසා තිබෙනවා. එතුමා මෙතැනදී උත්තරය නොවෙයි, අඩුම තරමින් ඇමතිවරයාගේ නමවත් කියන්න බැහැයි කියනවා නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අනවශ්‍ය විධියට අනවශ්‍ය ප්‍රශ්න ඇති කරන්න ඕනෑ නැහැ. නමුත් ප්‍රශ්න නවයක් තිබෙනවා පිළිතුරු දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා මට ඒ නව දෙනාගේ නම් දෙන්න. මම පෞද්ගලිකව ඒ ගැන කථා කරන්නම් ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, කොහොමත් ඒක අනවශ්‍ය ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. කවුද උත්තර නොදුන් ඇමතිවරු කියලා පාර්ලිමේන්තුවට කියන්න බැරි නම්, කොහොමද ඒක අනවශ්‍ය ප්‍රශ්නයක් වෙන්නේ? අපි කාටද කියන්නේ ඒක?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ප්‍රශ්නයක් අහන්න -[බාධා කිරීමක්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ප්‍රශ්න අහලා තිබෙන්නේ. මම දැන් නිශ්චිත වශයෙන් ප්‍රශ්නයක් අහනවා. සභානායකතුමාගෙන්-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා අහලා නැහැ, උත්තර නොදුන් ඇමතිවරුන්ගේ නම්?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ඊළඟ දවසේ මම ගරු සභානායකතුමාගෙන් ප්‍රශ්නයක් අහනවා, ස්ථාවර නියෝග 27/2

[ගරු අනුර දිසානායක මහතා]

යටතේ මෙතෙක් මම අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලබා නොදුන් අමාත්‍යවරු කවුද කියලා. එසේ විධිමත්ව ඇසුවොත් ගරු සභානායකතුමා ඒ නම් කියනවා ද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා විධිමත්ව ප්‍රශ්නයක් ඇසුවොත් මම කියන්න එපායැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ප්‍රශ්නය හරි. ඒ ගැටලුව දැන් හරිනේ. දැන් ඔබතුමා අද අසන ප්‍රශ්නය අහන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ඒ අනුව උත්තර නොදුන් ඇමතිවරු ගැන දැනගන්නත් විශේෂයෙන් ප්‍රශ්නයක් අහන්න ඕනෑද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ. නැහැ. එතුමා මට ඒ list එක දෙනවානේ ගරු මන්ත්‍රීතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මට සහ රටේ ජනතාවට මේ කරුණු දැන ගන්න ඕනෑ. ඇමතිවරුන්ට වාහන දීලා තිබෙනවා. ඇමතිවරුන්ට අවශ්‍ය පහසුකම් දීලා තිබෙනවා. ඇමතිවරු සියලුදෙනාම මහජන මුදල්වලින් නඩත්තු වෙනවා. අපි ප්‍රශ්නයක් ඇහුවාම ඇවිල්ලා උත්තර දෙන්න බැරිනම්, ඒ ඇමතිවරයා කවුද කියලා දැනගන්න ජනතාවට අයිතියක් නැද්ද? එතුමන්ලා නඩත්තු වෙන්නේ මහජනයාගේ ධනයෙන්නේ. එම නිසා මහජනයාට දැන ගන්නට අයිතියක් තිබෙනවා, එතුමන්ලා පාර්ලිමේන්තුවට ඇවිල්ලා ප්‍රශ්නවලට පිළිතුරු දෙනවාද නැද්ද කියලා. එම නිසා ගරු කථානායකතුමනි, කවුද ඒ ඇමතිවරු නව දෙනා කියලා ඔබතුමා පාර්ලිමේන්තුවට කියන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ඔබතුමා සභානායකතුමාගෙන් ඒ නම් ටික අරගෙන හෙට පාර්ලිමේන්තුවට කියන්න.

ගරු සභානායකතුමා මේ දවස්වල පොඩ්ඩක් upset. එතුමා මධ්‍යම පළාතට ජනාධිපතිකම බලාපොරොත්තු වෙන නිසා, ඒ ලබා දෙන පිළිතුරෙන් ඒ නව දෙනා upset යයි කියලා හිතනවා. එම නිසා ඔබතුමා-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එතුමන්ලා පාර්ලිමේන්තු සම්ප්‍රදායය ගැන කථා කරනවා. කවුද පාර්ලිමේන්තුවට බෝම්බ ගැහුවේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් අපි දවසේ වැඩකටයුතුවලට යමු ගරු මන්ත්‍රීතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, අපි නිශ්චිත ප්‍රශ්නයක් අහන්නේ. නමුත් මාස තුනක් විතර වෙනවා, ඒ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නේ නැතිව. අඩුම තරමින් පිළිතුරු නොදෙන ඒ ඇමතිවරුන්ගේ නම් ටික කියන්න බැරිනම් මොන සම්ප්‍රදායක්ද ඒක? ඔබතුමා ඒ ගැන ද කථා කරන්නේ? මම අහන්නේ එච්චරයි. මම අහන්නේ එතුමන්ලා උත්තර නොදෙන්නේ ඇයි? ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග යටතේ අපි ප්‍රශ්න අහනවා. අදාළ අමාත්‍යවරු පාර්ලිමේන්තුවට ඇවිත් ඒවාට උත්තර දෙන්න ඕනෑ. උත්තර දෙන්නේ නැත්නම්, අඩුම තරමින් උත්තර දෙන්නේ නැති ඇමතිවරයා කවුද කියලා කියන්න ඕනෑ. ඒකත් කියන්න බැරි නම්?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ තොරතුරු අපි ලබා දෙන්නම්. ගරු මන්ත්‍රීතුමා, ස්ථාවර නියෝග 27/2 යටතේ අද ප්‍රශ්නයට යමු දැන්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මේ ප්‍රශ්නයට උත්තර දෙනවා නේද ගරු අශෝක් අබේසිංහ රාජ්‍ය අමාත්‍යතුමා?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ප්‍රශ්නය ඇහුවාට පස්සේ එතුමා උත්තර දෙයි.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### ගුවන් සමාගම්වලට ලබාදෙන සහන
### விமான நிறுவனங்களுக்கு வழங்கப்பட்ட சலுகைகள்
### CONCESSIONS GRANTED TO AIRLINES

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27/2 යටතේ නඟනු ලබන ප්‍රශ්නය මෙයයි.

ගුවන් තොටුපළ තුළ ගුවන් සේවා සඳහා සපයන භූමි මෙහෙයුම් සේවා ගාස්තු අඩු කිරීම ඇතුළු තවත් සහන ගුවන් සමාගම්වලට ලබා දීම ආශ්‍රිතව පැන නැඟී ඇති ගැටලු පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

සංචාරක ක්ෂේත්‍රය යළි නඟා සිටුවීම සඳහා යැයි කියමින් ආණ්ඩුව විසින් ගන්නා ලද කැබිනට් තීරණයක් අනුව ශ්‍රී ලන්කන් සමාගම විසින් වෙනත් ගුවන් සේවා සඳහා සපයනු ලබන භූමි

මෙහෙයුම් - ground handling - සේවා ගාස්තු 2019 අගෝස්තු 01වැනි දින සිට මාස 06ක කාලයක් සඳහා අඩු කරන මෙන් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දන්වා තිබෙනවා. එසේම ගුවන් සමාගම්වල යානා සඳහා සහන මිලට ඉන්ධන හා ලිහිසි තෙල් සැපයීමටද තවත් බදු සහන ලබා දීමටද ආණ්ඩුව පියවර ගෙන තිබෙනවා.

ගරු කථානායකතුමනි, සංචාරක අංශ පුනර්ජීවනය කිරීම කියලා කාරණයක් 2019 න්‍යාය පත්‍රයේ විෂය අංක 72 යටතේ කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර තිබෙනවා. කැබිනට් මණ්ඩලයේ ඒ තීන්දුවත් මා සතුව තිබෙනවා.

මෙම සහන සැලසීම් සිදු කර ඇත්තේ කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි භූමි මෙහෙයුම් සේවා ගාස්තු අධික බවට උපකල්පනයෙන් යුතුව සහ මෙම සහන සැලසීමෙන් සංචාරක ක්ෂේත්‍රයට රුකුලක් වනු ඇති බවට වන උපකල්පනයෙන් යුතුවයි. නමුත් මෙම තීරණය කිසිසේත්ම මේ කියන ප්‍රතිලාභ ලබා දෙන තීරණයක් නොවන බවට ඉතා සවිස්තරාත්මක වාර්තාවක් මා ළඟ තිබෙනවා. එහෙත්, මෙම කරුණු දෙකම කිසිදු පදනමකින් තොර අදහසක් බවත් එමගින් රජයට විශාල මුදලක් අහිමි වීම පමණක් සිදුවනු ඇති බවත් අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥයන් විසින් පෙන්වා දෙනු ලබනවා.

මෙම භූමි සේවා ගාස්තු අඩු කිරීම සහ සලසනු ලබන අනෙකුත් සහනවල වාසිය හිමි වන්නේ ගුවන් මගීන්ට නොවෙයි. ඔබතුමා ඒක දන්නවා. මෙයින් ටිකට් පතට කිසිදු බලපෑමක් වෙන්නේ නැහැ. ඒ වාසිය හිමිවන්නේ ගුවන් සමාගම්වලටයි. ගුවන් සමාගම්වලට ලබාදෙන සහනයක් ගුවන් මගීන් ගෙන්වා ගැනීම සඳහා හේතු සාධක වෙන්නේ කෙසේද කියන එක අපි දැන ගත යුතුව තිබෙනවා. මොකද, අඩුම තරමින් මෙම සහනය ලබා දෙනවා නම් ටිකට්වල මිල අඩු කිරීමක් පිළිබඳවත් එකඟතාවයකට ආ යුතුව තිබෙනවා. සමාගමට ලාභය ලබා දෙනවා ගරු කථානායකතුමනි, මගීන් ගෙන්වා ගැනීම සඳහා. නමුත් මගීන්ගේ ටිකට් පතට කිසි සහනයක් ලැබෙන්නේ නැහැ මේ සහනය ලබා දීම නිසා.

එසේම මෙම සහනය ලබන ගුවන් සමාගම් ශ්‍රී ලංකාව වෙත කෙරෙන මෙහෙයුම්වලදී ආසන ධාරිතාව ඉහළ නැංවීමට හෝ ගුවන් ටිකට් පත් ගාස්තු අඩු කිරීම පිළිබඳ කිසිදු පොරොන්දුවක් රජයට ලබා දී නැහැ. ඒ නිසා ලංකාවට සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම වෙනුවෙන් මෙමගින් කිසිදු පිටුවහලක් ලැබෙන්නේද නැහැ.

ඒ වෙනුවට, භූමි සේවා ගාස්තු අඩු කිරීම හේතුවෙන් පමණක් රජය සතු ශ්‍රීලංකන් ගුවන් සමාගමට මාසයකට ඩොලර් 710,000ක පමණ ආදායමක් අහිමි වීමටත්, මුළු මාස 06ක කාලය තුළ ඩොලර් මිලියන 4.3ක් (රුපියල්වලින් ගත්තොත්, කෝටි 77.6කට වැඩි මුදලක්) අහිමි වීමටත් නියමිතයි.

එසේම පාස්කු ඉරිදා එල්ල වූ ප්‍රහාරයෙන් අනතුරුව මගී ඉල්ලුමෙහි අඩු වීම මෙතෙක් යථා තත්ත්වයට පැමිණ නොමැති නිසා මෙම තීරණය හේතුවෙන් ශ්‍රීලංකන් ගුවන් සමාගමට මසකට ඩොලර් ලක්ෂ 8 බැගින් මාස 06ක කාලයට ඩොලර් ලක්ෂ 48ක පාඩුවක් සිදුවිය හැකි බවට ගණන් බලා තිබෙනවා. මේ, සහන මිලට තෙල් ලබා දීමෙන් වන පාඩුවට අමතරවයි.

ගරු කථානායකතුමනි, ඊට අමතරව, තෙල් සංස්ථාව විශාල පාඩු ලබද්දී, තෙල් සංස්ථාව ජනතාව වෙත විශාල බරක් දමමින් තෙල් මිල වැඩි කරද්දී, ගුවන් සමාගම්වල ගුවන් යානා සඳහා අවශ්‍ය වන ඉන්ධන මිල අඩු කරන්න කියා තෙල් සංස්ථාව දැනුවත් කිරීම සඳහා මේ කැබිනට් මණ්ඩලයම තීරණයක් ගෙන තිබෙනවා. එම ඉදිරිපත් කරපු කැබිනට් පත්‍රිකාවේ පිටපතක් මා ළඟ තිබෙනවා

විශේෂයෙන් ශ්‍රීලංකන් ගුවන් සමාගම භූමි මෙහෙයුම් සේවා ගාස්තු 2008 වසරෙන් පසුව ඉහළ නංවා නොමැති තත්ත්වයක් තුළ 2016 වසරේ දී විවිධ ගුවන් සේවා සමාගම් සඳහා ලබා දෙන මිල ගණන් නැවත සමාලෝචනය කර තිබුණා. වැඩි කිරීමක් කළේ නැහැ. 2016 වසරේදී කළේ මිල ගණන් නැවත සමාලෝචනයට ලක් කිරීමයි. ඇතැම් ගුවන් සේවා සමාගම් විසින් භුක්ති විඳින අසාධාරණ සහන ඉවත් කර මෙහෙයුම් කරන ලද වාර ගණන මත වට්ටම් ලබා දීමේ පිළිවෙතක් ශ්‍රීලංකන් ගුවන් සමාගම විසින් අනුගමනය කරනු ලැබුවා. ඒ අනුව Air India සහ Singapore Airlines සේවාවල සියයට 18කින්ද, Saudi Arabian Airlines සියයට 15කින් ද, Turkish Airlines සියයට 13කින්ද, Korean Air සියයට 8කින් ද, Emirates සියයට 4කින් ද ගාස්තු ඉහළ දමා තිබූ අතර, Etihad Airways සියයට 4කින් ද, Qatar Airways සහ Air China සියයට 5කින් ද, AirAsia සහ Malaysia Airlines සියයට 6කින් ද, Air Arabia සියයට 10කින් ද ගාස්තු පහළ දමා තිබුණා. ගුවන් සේවා බහුතරයක ගාස්තු වෙනස් වී තිබුණේ නැහැ. මේ තත්ත්වය තුළ භූමි මෙහෙයුම් සේවා ගාස්තු අඩු කිරීමේ හදිසි අවශ්‍යතාවක්ද තිබුණේ නැහැ. නිදසුනක් ලෙස යෝජිත මිල අඩු කිරීම මඟින් Emirates ගුවන් සේවයට එක් ගමන් වාරයක් සඳහා ඩොලර් 1,200ක මිල අඩු වීමක් ලැබීමට නියමිතයි. නමුත් Emirates ගුවන් සේවය ඔවුන්ම පාලනය කරන ගුවන් තොටුපොළට SriLankan Airlines ගුවන් යානයක් ගියාම ඩොලර් 5,118ක් අය කරනු ලබනවා. හැබැයි, ඔවුන්ට අපි විශාල සහනයක් ලබා දෙනවා. ගරු කථානායකතුමනි, ගුවන් සමාගම්වලට විශාල සහනයක් ලබා දෙන්න අපි සැලසුම් කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මෙය මුළුමනින්ම සමාගම් වෙත ලබා දෙන ලාභයක් පමණයි. ගුවන් සේවයේ වර්ධනය සඳහා කිසිදු හිතකර තත්ත්වයක් නැති වාතාවරණයක් තුළ, මෙවැනි සමාගම් වෙත මෙවැනි ලාභයක් ලබා දීමේදී කුමන වර්ගයේ යටි ගනුදෙනු සිද්ධ වුණාද කියන සැකය පවා දැන් පැන නඟිනවා.

මේ තත්ත්වය තුළ පැන නඟින පහත ගැටලුවලට ගරු ඇමතිතුමා පිළිතුරු ලබා දෙනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

1. ගුවන් සමාගම් සඳහා සහන ලබාදීම මඟින් සංචාරක ගුවන් මගීන්ට සහන සැලසෙන බවට තීරණය කළේ කවුරුන් විසින්ද? ඒ කවර කරුණු පදනම් කරගෙන ද?
2. ගුවන් සමාගම් විසින් ලංකාව වෙත තම ගුවන් යානා එවීම සඳහා සහන ඉල්ලා තිබිණිද? ඒ ගොල්ලන් සහන ඉල්ලා තිබෙනවා ද?
3. රජය මඟින් ලබා දෙන සහන අනුව ශ්‍රී ලංකාව වෙත පැමිණීමට හා පිටත්වීමට අදාළ ගුවන් ටිකට් පත් මිල අඩු කරන බවට එම සමාගම්වල එකඟතාවක් තිබේද?
4. භූමි සේවා ගාස්තු අඩු කිරීම හේතුවෙන් ශ්‍රීලන්කන් ගුවන් සමාගමට අදාළ කාලය තුළ සිදු වන ආදායම් අහිමිවීම කොපමණද? එම පාඩුව ආණ්ඩුව විසින් පියවනු ලබන්නේද?
5. ගුවන් සමාගම් සඳහා සහන මිලට ඉන්ධන ලබා දීමෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සිදු වන පාඩුව කොපමණද?
6. සංචාරක ගුවන් මගීන් ආකර්ෂණය කර ගැනීම සඳහා ප්‍රායෝගික වැඩ පිළිවෙළක් ආණ්ඩුව සතුව තිබේ ද?

ගරු කථානායකතුමනි, මේ නිසා විශේෂයෙන්ම විශාල පාඩුවක් ලබන SriLankan Airlines ආයතනයට තවත් මූල්‍ය බරක් ඇතුළත් කරමින් මේ යෝජනාව අනුමත කර ගැනීම සඳහාත්, මේ යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහාත් විශේෂයෙන්ම අග්‍රාමාත්‍යවරයාගේ මැදිහත්වීම සහ භූමිකාව කුමක්ද කියලා මා දැනගන්න කැමැතියි.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ගරු කථානායකතුමනි, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා විසින් ඊයේ 27 (2) යටතේ ඉදිරිපත් කරන ලද ප්‍රශ්නය ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට ලැබුණේ අද උදේ. කෙසේ වෙතත්, මෙතුමාගේ ප්‍රශ්නයේ බහුතරයක් අහලා තිබෙන්නේ ශ්‍රීලන්කන් ගුවන් සේවය පිළිබඳ කරුණු. ශ්‍රීලන්කන් ගුවන් සේවය අයත් වන්නේ මුදල් අමාත්‍යාංශයට. මුදල් රාජ්‍ය අමාත්‍යවරයා විධියට කටයුතු කරන්නේ ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා. ඒ නිසා අද උදේ අපි එම ප්‍රශ්නය මුදල් අමාත්‍යාංශයට යොමු කළා. හෙට දවසේ ඒකට සවිස්තරාත්මක උත්තරයක් ලැබෙනවා කිව්වා.

ගරු කථානායකතුමනි, කෙසේ වෙතත් සාමාන්‍යයෙන් අපේ කලාපය ගත්තාම මෙම අය කිරීම්, මේ රටට ඇතුළුවීමේ ගාස්තුව අපේ රටේ තමයි වැඩියෙන්ම තිබෙන්නේ. පාස්කු ඉරිදා ප්‍රහාරයත් සමඟ මැයි මාසයේ පමණක් ගුවන් යානා 1,000ක් අවලංගු කරනු ලැබුවා. ගුවන් යානයක් අවලංගු කිරීම තුළ සෘජු අලාභය ඩොලර් 11,000යි. වක්‍ර අලාභය ඩොලර් 49,500යි. ඒ නිසා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතිව සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා වැඩ පිළිවෙළක් තමයි මේ සකස් කළේ. ඒ පිළිබඳව සවිස්තරාත්මක උත්තරයක් හෙට මුදල් රාජ්‍ය ඇමතිතුමා ඔබතුමාට ලබාදෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අනුර දිසානායක මැතිතුමනි, ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා පාර්ලිමේන්තුවේ ඉල්ලීම පිට පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරුන්ට ඊයේ ආරාධනය කරලා තිබුණා SriLankan Airlines restructuring programme එක ගැන කථා කරන්න. ඒ ගැන ඔබතුමන්ලා දැනුවත් කරලා තිබුණා. මාත් එයට සහභාගි වුණා. මම හිතන විධියට එතැනදී හුඟක් අදහස් ප්‍රකාශ කරන්න පුළුවන් වුණා. හුඟක් කරුණු පැහැදිලි කර ගත්තා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

එම නිලධාරින්ගෙන්, සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ප්‍රශ්න විමසන්න අයිතියක් තිබෙනවා. ඒ සාකච්ඡාව හොඳයි. නමුත් ගරු කථානායකතුමනි, අධ්‍යක්ෂ මණ්ඩලයේත් පාලනයකින් තොරව තමයි මේ කාරණය සිදුවී තිබෙන්නේ. ගරු කථානායකතුමනි, මා වගකීමෙන් කියනවා, SriLankan Airlines එකේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ තීන්දුවට එකඟ නැහැ. මොකද ඔවුන් දන්නවා, ඔවුන්ට විශාල පාඩුවක් සිද්ධ වෙන බව. ඒ නිසා තමයි මෙම ප්‍රශ්නය ඉදිරිපත් කරන්න කියලා, විශේෂයෙන්ම SriLankan Airlines ආයතනයට වග කිවයුතු කණ්ඩායම් විසින් අප වෙත යොමු කර තිබෙන්නේ. මෙය දේශපාලන අධිකාරිය විසින් ගනු ලැබූ තීන්දුවක්. ඒ නිසා අධ්‍යක්ෂ මණ්ඩලයෙන් මේ ගැන ප්‍රශ්න කිරීමෙන් එලක් නැහැ කියලායි මා හිතන්නේ. මේ ගැන ප්‍රශ්න කළ යුතු වන්නේ දේශපාලන අධිකාරියෙන්. මා විශ්වාස කරන විධියට දේශපාලන අධිකාරියෙනුත් වැඩියෙන්ම ප්‍රශ්න කළ යුතු වන්නේ අග්‍රාමාත්‍යවරයාගෙන්. ඒ නිසා තමයි ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඊයේ වැඩියෙන්ම සාකච්ඡා වුණේ SriLankan Airlines restructuring programme එක ගැන. මම හිතන විධියට එහිදී බොහෝ වැදගත් අදහස් හුවමාරු කර ගත්තා. ඒ සඳහා සහභාගි වීම මට වුණත් බොහෝ ප්‍රයෝජනවත් වුණා. [බාධා කිරීමක්] Yes, Hon. Member?

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, பாராளுமன்ற நிலையியற் கட்டளை 27(2)இன் கீழ் நான் கேட்ட 5 கேள்விகளுக்கு இதுவரை எந்தப் பதிலும் கிடைக்கவில்லை. அதில், ஜனாதிபதி வேட்பாளராக வரவிருக்கின்ற கௌரவ சஜித் பிரேமதாஸ அவர்களிடம் இரண்டு கேள்விகள், கௌரவ வஜிர அபேவர்தன அவர்களிடம் ஒரு கேள்வி என 5 கேள்விகளுக்கு எனக்கு இதுவரை பதில் கிடைக்கவில்லை.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, අද මේ ගැන කථා වුණා. ගරු සභානායකතුමාත් කරුණු පැහැදිලි කළා. ඉතින් ඒ අනුව අදාළ අමාත්‍යවරුන්ට දැනුම් දෙනවා ඉක්මනින් පිළිතුරු දෙන්න කියලා. Hon. Douglas Devananda, it was discussed just before you came in.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

நன்றி.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත
### மதுவரி (திருத்தம்) சட்டமூலம்
### EXCISE (AMENDMENT) BILL

"(52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***පිළිගන්වන ලද්දේ මුදල් අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.***

***2019 අගෝස්තු 20 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*நிதி அமைச்சர் சார்பாக மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2019 ஓகஸ்ட் 20, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டு மெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Minister of Finance; to be read a Second time upon Tuesday, 20th August, 2019 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.*

## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත: නියෝගය
## இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சட்டம்: கட்டளை
## SRI LANKA EXPORT DEVELOPMENT ACT: ORDER

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)

Hon. Speaker, on behalf of the Minister of Development Strategies and International Trade, I move,

"That the Order made by the Minister of Development Strategies and International Trade under Section 14(2) of the Sri Lanka Export Development Act, No. 40 of 1979 relating to Cess and published in the Gazette Extraordinary No. 2113/3 of 05th March 2019, which was presented on 27.06.2019, be approved.

(Cabinet approval signified.)"

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Then, the Hon. Nalin Bandara Jayamaha to start the Debate.

[පූ.භා.11.43]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා (සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ - அபிவிருத்தி உபாயமுறைகள் மற்றும் சர்வதேச வர்த்தக பிரதி அமைச்சர்)
(The Hon. Nalin Bandara Jayamaha - Deputy Minister of Development Strategies and International Trade)

ගරු කථානායකතුමනි. අපනයන සංවර්ධන පනත යටතේ නියෝග තුනක් ගැන සාකච්ඡා කරන මෙම අවස්ථාවේ දී වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වනවා.

සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා මේ වන විට විදේශගත වෙලායි සිටින්නේ. එතුමා මේ අවස්ථාවේ නොමැති වුණත්, මේ ක්ෂේත්‍රය තුළ අප ලබා ඇති ප්‍රගතිය දැන් මා කියන්නම්. විශේෂයෙන්ම, අපේ අපනයන සංවර්ධන මණ්ඩලය හරහා රටේ දළ ජාතික නිෂ්පාදනයට විශාල දායකත්වයක් ලබාදෙන්න පුළුවන් වුණා. පසුගිය අවුරුදු හතරක පමණ කෙටි කාලය තුළ, අපේ අපනයන වැඩි කිරීමට විශාල දායකත්වයක් ලබාදෙන්න අපට පුළුවන් වුණා. ඒ ගැන අපි සතුටු වෙනවා. අපේ අපනයනකරුවන්ට අවශ්‍ය සහයෝගය හා ශක්තිය ලබා දීම, ඒ සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු කිරීම, නව අපනයනකරුවන් හඳුනා ගැනීම වැනි වැඩ කටයුතු රාශියක් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය හරහා සිදු වෙනවා. “2000 New Exporters" වැඩසටහන යටතේ, නව අපනයනකරුවන් 2,000ක් හඳුනා ගැනීමටත්, අපේ රටේ සිටින ව්‍යවසායකයන් සෘජු අපනයනකරුවන් බවට පත් කිරීම සඳහාත් අපි දිස්ත්‍රික් මට්ටමින් වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා. දැනට අපි නව අපනයනකරුවන් 800කට වැඩි ප්‍රමාණයක් හඳුනාගෙන තිබෙනවා. ඔවුන්ට අවශ්‍ය වෙළෙඳ පොළ නිර්මාණය කරදීලා, ඒ අවශ්‍ය සහයෝගය ලබා දෙන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. "One Village - One Product", එහෙම නැත්නම් "ලොවක් දිනන ගමක්" කියන වැඩසටහන යටතේ ගම්මාන ගණනාවක් හඳුනාගෙන, ඒ ගම්මානවල ගොවීන්ට සහ අනිකුත් නිෂ්පාදකයන්ට අවශ්‍ය පහසුකම් ලබාදීලා, ඔවුන්ට සෘජු අපනයන වෙළෙඳ පොළක් හඳුන්වා දී තිබෙනවා.

ඊළඟට, 2018 වසරේ මුල් කාර්තුවට සාපේක්ෂව 2019 වසරේ මුල් කාර්තුවේ වෙළෙඳ අපනයනවල සියයට 5.7ක වර්ධනයකුත්, සේවා අපනයනවල සියයට 27.1ක වර්ධනයකුත් අත්පත් කරගන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. ඒ අනුව, 2018-2019 වසරවල මුල් කාර්තුවල සමස්ත අපනයනය ඩොලර් මිලියන 7,584.4 සිට ඩොලර් මිලියන 8,441.7 දක්වා සියයට 11.3කින්, වර්ධනය කර ගන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. ඒක විශාල වර්ධනයක්. අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කරගත හැක්කේ අපනයන තුළින්ය කියලා විශ්වාස කරන රජයක් විධියට අපට ඒ ඉලක්කවලට යන්න පුළුවන් වෙලා තිබෙනවා.

ඊළඟට, 2015 වර්ෂයේ සිට අපේ විදේශ විනිමය ඉපැයීම් වැඩි වී ඇත්තේ කෙසේද කියා බලමු. 2015දී අපේ ඇඟලුම් ක්ෂේත්‍රයේ තිබුණේ, ඩොලර් මිලියන 4,802ක අගයක්. 2018 වනවිට එය ඩොලර් මිලියන 5,300 දක්වා සියයට 9.63කින් වැඩි කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා.

මේ රජය බලයට පත් වනවිට තිබුණු ප්‍රධානම ප්‍රශ්නය තමයි, අපේ රටට GSP සහනය අහිමි වී තිබීම. ගරු අගමැතිතුමාගේ මැදිහත් වීම මත, පසුගිය කෙටි කාලය ඇතුළත නැවත GSP සහනය ලබා ගැනීමට අපට පුළුවන් වුණා. පසුගිය අවුරුදු හතරක පමණ කාලය තුළදී අපේ අපනයන ක්ෂේත්‍රයේ සියයට 9.63ක වර්ධනයක් අත්පත් කර ගැනීම සඳහා ඒ සහනයත් හේතු වුණා කියලා මම විශ්වාස කරනවා.

අපේ රබර් ආශ්‍රිත කර්මාන්ත ක්ෂේත්‍රයේ සියයට 2.68ක වර්ධනයක් සහ coconut ආශ්‍රිත නිෂ්පාදනවල සියයට 8.96ක සැලකිය යුතු වර්ධනයක් තිබෙනවා. ඊළඟට, දියමන්ති, මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ සියයට 18.35ක වර්ධනයක් අත්පත් කර ගැනීමට අපට පුළුවන් වෙලා තිබෙනවා. Food and beverage ක්ෂේත්‍රයේ සියයට 9.85ක වර්ධනයක්, seafood අපනයනවලින් සියයට 7.65ක වර්ධනයක්, විසිතුරු මත්ස්‍ය අපනයනයෙන් සියයට එකක වර්ධනයක් අත් කර ගැනීමටත් අපට හැකි වෙලා තිබෙනවා.

අපි පසුගිය කාලයේ විශේෂයෙන් පලතුරු අපනයනය දිරිමත් කර තිබෙනවා. ගරු කථානායකතුමනි, එම අංශයේ සියයට 39.46ක වර්ධනයක් අත්පත් කර ගන්න අපට පුළුවන් වුණා. ඒ වාගේම, විසිතුරු මල් අපනයන ක්ෂේත්‍රයේත් සියයට 5.77ක වර්ධනයක් අත්පත් කරගන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. 2015 වර්ෂයේ අපේ සමස්ත අපනයන ආදායම ඩොලර් මිලියන 10,547යි. 2018 වන විට අපට මෙම ප්‍රමාණය ඩොලර් මිලියන 11,890ක් දක්වා වර්ධනය කරගන්න හැකි වුණා. මෙය සැලකිය යුතු වර්ධනයක්.

ගරු කථානායකතුමනි, අපනයන සේවාවල වර්ධනය ගත්තොත්, විශේෂයෙන් අපේ තොරතුරු තාක්ෂණය ආශ්‍රිත ව්‍යාපාරවල සහ පරිගණක ක්ෂේත්‍රයේ ව්‍යාපාරවල - ICT/BPM - සියයට 62.19ක වර්ධනයක් සිදුවී තිබෙනවා. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සියයට 30කට වැඩි වර්ධනයක් සහ මූල්‍ය සේවාවල සියයට 63ක වර්ධනයක් සිදුවී තිබෙනවා. ඒ වාගේම, ප්‍රවාහන ඉපැයීම්වල සියයට 9.36ක වර්ධනයක් සිදු වී තිබෙනවා. ඒ අනුව, සමස්ත සේවා අපනයන ක්ෂේත්‍රයේ සියයට 27.13ක වර්ධනයක් අත්පත් කර ගැනීමට අපට පුළුවන් වෙලා තිබෙනවා. රටක් විධියට ඉදිරියට යන්න නම්, අපේ අපනයන වර්ධනය කිරීම ඉතාම වැදගත් බව ඔබතුමාත් නිතර කියන කාරණයක් නේ. විශේෂයෙන් මේ ක්ෂේත්‍රය පිළිබඳ හොඳ අත්දැකීම් තිබෙන කෙනකු විධියට ඔබතුමාටත් මේ වර්ධනය පිළිබඳ සතුටු වෙන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, මෙම වසරේ මැයි මාසයේදී ක්ෂේත්‍ර දෙකක වාර්තාගත අපනයනයක් සටහන් කරන්න අපට පුළුවන් වුණා.

විශේෂයෙන්ම, 2018 වර්ෂයේ මැයි මාසය වන විටත් අපේ ඇඟලුම් ක්ෂේත්‍රයෙන් ඩොලර් මිලියන 397ක අපනයන ආදායමක් තමයි තිබුණේ. නමුත්, මේ වර්ෂයේ මැයි මාසයේදී අපට එම ක්ෂේත්‍රයෙන් ඩොලර් මිලියන 423ක ආදායමක් ලබා ගන්න පුළුවන් වුණා. ඊළඟට, පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදනවල අපනයන ආදායම ඩොලර් මිලියන 48 සිට 57 දක්වා වර්ධනය කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා. අපේ ඉලක්ක සමඟ ඉස්සරහට ගිහිල්ලා, අනාගතයේදී අපේ අපනයන මීට වඩා ඉදිරියට ගෙන

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

යන්න පුළුවන් වෙයි කියා අපි විශ්වාස කරනවා. අපේ අමාත්‍යාංශය ඒ සඳහා අවශ්‍ය සියලු ශක්තිය ලබාදෙනවා. අපේ ගරු මලික් සමරවික්‍රම ඇමතිතුමා, අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපතිතුමිය ඇතුළු සියලුදෙනාම එකමුතුවෙන් ඒ කටයුතු කරනවා. අපේ අමාත්‍යාංශය දළ ජාතික නිෂ්පාදනයට දැක්වූ දායකත්වයත් එක්ක බලනකොට තමයි මෙහි සැබෑ තත්ත්වය පිළිබිඹු වෙන්නේ, ගරු කථානායකතුමනි.

දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට ගත්තාම, 2015 වර්ෂයේදී අපේ අපනයනය 16.7යි. 2018 වර්ෂය වනවිට අපට එය සියයට 18 දක්වා වර්ධනය කර ගන්න පුළුවන් වුණා. අපේ මේ වැඩ පිළිවෙළත් එක්ක 2022 වසර වන විට මේ ප්‍රමාණය සියයට 22ක් දක්වා වැඩි කර ගන්න පුළුවන් වෙයි කියා අපි විශ්වාස කරනවා. අපේ අපනයන මීට වඩා හොඳ තත්ත්වයක තිබුණු බව අප දන්නවා. මට මතක විධියට, 2004 පමණ වන විට අපේ අපනයන සියයට 30ක සීමාවේ තිබුණා. හැබැයි, 2014, 2015 වර්ෂ වන විට මේ ප්‍රමාණය සියයට 12ට, 13ට පල්ලම් බැස්සා. රාජපක්ෂ පාලන සමයේදී, ඒ ආණ්ඩුව අපේ අපනයනවලට දැක්වූ දායකත්වය කොහොමද කියලා අපට හොඳට මතකයි නේ. අපට ඒ සම්බන්ධයෙන් කිසිසේත්ම සෑහීමකට පත්වෙන්න බැහැ. එය ඉතාම අඩු අගයකයි තිබුණේ. එම නිසා ඒ කාලයේදී අපේ අපනයන ආදායම භාගෙට භාගයකින් පහත වැටුණා.

විශේෂයෙන්ම එළවලුවලින් අපට ඩොලර් මිලියන 39.46ක ආදායමක් ලබන්න පුළුවන් වුණා. ඊළඟට, පලතුරුවලිනුත් අපට සියයට 4.71ක පමණ අගයක ආදායමක් ලබන්න පුළුවන් වුණා. ගරු කථානායකතුමනි, රටක් විධියට ඉස්සරහට යන්න නම්, අපේ අපනයන සංවර්ධනය කළ යුතුයි. ඒ ඉලක්කය ඇතිව අපේ රජය කටයුතු කරමින් ඉන්න බව මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම, අපේ රට කෘෂි කාර්මික රටක් බව අපි දන්නවා. අද ලෝකයේ තිබෙන ආහාර පරිභෝජනයත් එක්ක අපි කටයුතු කළොත් ආසියාවේ, දකුණු ආසියාවේ, විශේෂයෙන්ම මැද පෙරදිග වාගේ රටවලට විශාල වශයෙන් එළවලු, පලතුරු හා අනෙකුත් ආහාර ද්‍රව්‍ය අපනයනය කරන්න අවශ්‍ය වටපිටාව අපට නිර්මාණය වෙනවා. අපි ඒ ගැනත් වැඩි අවධානයක් යොමු කරලා තිබෙනවා.

බෝට්ටු නිෂ්පාදනය ගැන අපි දැඩි අවධානයක් යොමු කරලා තිබෙනවා. රට වටේටම මුහුද තිබෙන රටක් විධියට, ආසියාවේ කේන්ද්‍රීය ස්ථානයක -සමුද්‍රීය කේන්ද්‍රස්ථානයක- පිහිටි රටක් හැටියට බෝට්ටු නිෂ්පාදනය සඳහා අපි වැඩි අවධානය යොමු කරලා තිබෙනවා. ඒ සඳහා තරගකාරී නිෂ්පාදකයන් පිරිසක්, ආයෝජකයන් පිරිසක් කටයුතු කරමින් ඉන්නවා. ඉදිරියේදී අපේ රට කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් බවට පත් කර ගන්න බෝට්ටු නිෂ්පාදනය මඟින් පුළුවන් වෙයි කියලා විශ්වාස කරනවා. මාස කිහිපයකට කලින් cable-laying vessel එකක් යවන්න අපට පුළුවන් වුණා. ඔබතුමා ඒක දැක්කා. ජපානය වාගේ ලෝකයේ අංක එකේ නැව් නිෂ්පාදනය කරන රටකටත් අපේ නිෂ්පාදනයක් අපනයනය කරන්න අපට පුළුවන් වුණා. විශේෂයෙන්ම ලංකා රජයටත්, ජපාන සමාගමටත් කොටස් හිමි සමාගමක් වන Colombo Dockyard PLC එකට -කීර්තිමත් සමාගමක් විධියට- පුළුවන් වුණා, ඉතාම උසස් තත්ත්වයේ තාක්ෂණයකින් හෙබි cables එළන නෞකාවක් අපනයනය කරන්න. මේ ක්ෂේත්‍රයේ වර්ධනය වෙනුවෙන් ඒකත් විශාල ජයග්‍රහණයක් විධියට විශ්වාස කරනවා.

අපට තවදුරටත් රටක් විධියට දියුණු වෙන්න නම් ආනයන - අපනයන පරතරය අඩු කරගැනීම ඉතාම වැදගත්. අපේ ආනයන - අපනයන පරතරය අපේ රටට ගැළපෙන මට්ටමක නොවෙයි තිබෙන්නේ. නමුත් අපි මේ පරතරය පුළුවන් තරම් අඩු කරන්න කටයුතු කළොත් අපි විශ්වාස කරනවා, අපට රටක් විධියට ඉදිරියට ගමන් කරන්න පුළුවන් වෙයි කියලා. අපි මේ අවුරුදු තුනහමාර, හතර ඇතුළත ඉතාම වටිනා තීන්දු - තීරණ අරගෙන මේ රට ඉස්සරහට අරගෙන යන්න අවශ්‍ය කටයුතු කරමින් ඉන්නවා. අපි දැන් ඉතාම තීරණාත්මක මොහොතකයි ඉන්නේ, ඉතාම වැදගත් සන්ධිස්ථානයකයි ඉන්නේ.

ගරු කථානායකතුමනි, මේ අවුරුද්දේ තව මාස කිහිපයකින් - ගඩාක් වෙලාවට නොවැම්බර් මාසයේ අග- අපට සිදු වෙනවා, ජනාධිපතිවරණයකට මුහුණ දෙන්න. අපට අද පෙනෙනවා, නොයෙක් අය ගැන කථා වෙන බව. ඔබතුමා ගැනත් කථා වෙනවා. අපට ඒ ගැන සන්තෝෂයි. ඒ කෙසේ වෙතත් අපට පෙනෙනවා, එක්සත් ජාතික පක්ෂයේ කථා වෙන අය අතරත්, අනෙක් පැත්තේ කථා වෙන අය අතරත් ලොකු වෙනසක්. එක්සත් ජාතික පක්ෂයේ කථා වෙන නම් කිහිපය අතර එක පවුලක අය නොවෙයි ඉන්නේ. බොහොම උගත්, බුද්ධිමත්, පළපුරුද්දක් තිබෙන චරිත ගණනාවක් ගැන කථා වෙනවා. නමුත් අනෙක් පැත්තේ කථා වෙන්නේ එකම පවුලේ තුන්, හතර දෙනෙක් ගැන විතරයි. මම දැක්කා, ප්‍රතිපක්ෂයේ මන්ත්‍රීවරුන් කියනවා, එතුමන්ලා ගරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට ඒ සඳහා තීරණය ගැනීමේ අයිතිය දීලා තිබෙනවා කියලා. ඒකෙන්ම පෙනෙනවා, නැවත ඒකාධිපති පාලනයක අවශ්‍යතාව ඒ ගොල්ලන්ට තිබෙන බව. අපේ පැත්තේ එහෙම එකක් නැහැ. අපි සාමූහිකව රැස්වෙලා, - [බාධා කිරීමක්] කෘත්‍යාධිකාරී මණ්ඩලය වෙන්න පුළුවන්, පාර්ලිමේන්තු කණ්ඩායම වෙන්න පුළුවන් අපි සාමූහිකව රැස් වෙලා තමයි තීන්දු - තීරණ ගන්නේ. [බාධා කිරීමක්] ජනාධිපති අපේක්ෂකයා නම් කරන්නවත්, ජනාධිපතිවරයෙක් පත් කරන්නවත් කාටවත් තනි බලයක් දීලා නැහැ. නමුත් අනෙක් පැත්තේ තනි පුද්ගලයෙකුට ඒ ජනාධිපති අපේක්ෂකයා නම් කරන්න දීලා තිබෙන බව අපට පෙනෙනවා. [බාධා කිරීමක්] ඒක ගැන-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි අපනයනය ගැන කථා කරමු.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ඒ ගැන කථා කරන කොට අපට පෙනෙන්නේ මොකක්ද? මේ රටට නැවත ඒකාධිපතිවාදය අවශ්‍ය නැහැ කියලා මුළු රටම කියනවා. ඒ ගොල්ලන් උත්සාහ කරනවා, පවුල්වාදය තුළින් එක තැනකට බලය කේන්ද්‍රගත කරන්න. [බාධා කිරීමක්] අපට කිසි ප්‍රශ්නයක් නැහැ. අපට තේරෙනවා, කලබල වෙලා ඉන්න බව. මේ අවුරුදු හතරහමාර තුළ ජනාධිපති තනතුර එක්සත් ජාතික පක්ෂයට නොවෙයි තිබුණේ. ඒ වාගේම ගරු ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමාගෙන් පස්සේ කුමන - කුමන හේතු නිසා හෝ ජනාධිපති තනතුර අපේ පක්ෂයට අහිමි වුණා. ඒක නිසා අපට හොඳ අවස්ථාවක් උදා වෙලා තිබෙනවා, ඒ තනතුර එක්සත් ජාතික පක්ෂයට ගන්න. ඒ වාගේම රටේ පාක්ෂිකයන්ගේ ලොකු උනන්දුවක් තිබෙනවා, මෙවර එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයෙක් ඉදිරිපත් කළ යුතුයි කියලා. එක්සත් ජාතික පක්ෂයෙන් ඉදිරිපත් කරන අපේක්ෂකයා අනිවාර්යයෙන් ජයග්‍රහණය කරන්න පුළුවන් තත්ත්වයට නිර්මාණය කර ගැනීමේ හැකියාවත් අපට තිබෙනවා.

2015දී මහින්ද රාජපක්ෂ මැතිතුමා පරාජය කරන්න අපට පුළුවන් වුණා නම්, මෙවර අපට එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයෙක් ජනාධිපති කරන එක ප්‍රශ්නයක් නොවෙයි. පසුගිය අවුරුද්දේ නොවැම්බර් වනතෙක් -අවුරුදු තුනහමාරක්- අපට ආණ්ඩු බලය තිබුණේ භාගයයි -කැබිනට් මණ්ඩලයේ බලය භාගයයි- තිබුණේ. ජනාධිපතිවරයා මුල් කාලයේ අප සමඟ සහයෝගයෙන් කටයුතු කළත්, දැන් තිබෙන තත්ත්වය එච්චර ශුභවාදී නැහැ. අපට පළාත් සභා බලය තිබුණේ නැහැ. එවැනි තත්ත්වයක් මත තමයි ගරු කථානායකතුමනි, අපි විශාල වැඩ කොටසක් කළේ. ඉතා කෙටි කාලයක් ඇතුළත මේ රටේ දැවැන්ත වෙනසක් සිද්ධ වුණ බව අපි දන්නවා. විශේෂයෙන්ම සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තාම, අධ්‍යාපන ක්ෂේත්‍රය ගත්තාම විශාල දියුණුවක් තිබෙනවා. ග්‍රාමීය සංවර්ධනය ගත්තාම, "ගම්පෙරළිය" වැඩසටහනට විශාල මුදලක් වෙන් කරලා, ඒ යටතේ ගමේ ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක වන අවධියක් මේක. අද ගම්වල මිනිසුන් කියනවා, මෙවැනි සංවර්ධනයක් කවදාවත් ගමට ලැබුණේ නැහැ කියලා. එතුමන්ලාට බලය තිබුණ කාලයේ හම්බන්තොටට තමයි පුළුවන් තරම් කළේ. නැත්නම් තමන්ගේ නම පුම්බා ගන්න ව්‍යාපෘතියක් හෝ දෙකක් කළා මිසක්, රටේ ප්‍රමුඛතාව අනුව වැඩ කළේ නැහැ; ගමේ සංවර්ධනයට මුල් තැන දුන්නෙත් නැහැ. නමුත් අපි රටේ ප්‍රමුඛතාවට අවධානය යොමු කරලා තිබෙනවා, ගමේ සංවර්ධනයට මුල් තැන දීලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අද අපි සමාජ විෂමතාව නැති කරලා තිබෙනවා. එකම ගමේ ඉන්න සිරියාවතී අක්කාගේ ආදායමත් එකයි. ඊට අල්ලපු ගෙදර ඉන්න සුමනාවතී අක්කාගේ ආදායමත් එකයි. හැබැයි, සිරියාවතී අක්කාට සමෘද්ධිය හම්බ වෙනවා. සුමනාවතී අක්කාට සමෘද්ධිය හම්බ වෙන්නේ නැහැ. එකම ගමේ, එකම ආදායම් තත්ත්වයක් තිබෙන පවුල් දෙකකට දේශපාලන හේතුන් මත විෂම විධියට තමයි එදා සැලකිල්ල ලැබුණේ. අපි ඒ විෂමතාව නැති කළා. මෙතෙක් කල් අසාධාරණයට ලක් වූ ලක්ෂ 6කට සාධාරණය ඉෂ්ට කරන්න අපට පුළුවන් වුණා. එය සිදු කරන්නත් පුළුවන් වුණේ, ජාතික ආණ්ඩුවෙන් ගැලවිලා එක්සත් ජාතික පක්ෂයේ ඇමතිවරයෙක් සමෘද්ධි අමාත්‍යාංශය ගත්තාට පස්සෙයි. ඉතා කෙටි කාලයක් ඇතුළත අපට ඒ සාධාරණය ඉෂ්ට කරන්න පුළුවන් වුණා.

ඊයේ අපට පුළුවන් වුණා, දේශපාලන පළිගැනීම්වලට ලක් වූ එක්සත් ජාතික පක්ෂයේ විශාල පිරිසකට සාධාරණය ඉෂ්ට කරන්න. ඒ අතරේ මිය ගිය එක්සත් ජාතික පාක්ෂිකයන්ගේ පවුලවල සාමාජිකයන්ද හිටියා. ඒ අතීතය අපට අමතක වෙලා නැහැ. දේශපාලන හේතු මත ඝාතන, ගිනි තැබීම්, මංකොල්ල කෑම් හා දේපළ විනාශ කිරීම් සිදු වුණා. එම පවුල්වල තුවාල ලබපු සාමාජිකයෝ අපි දැක්කා. අපට පුළුවන් වුණා ඒ විශාල පිරිසකට සාධාරණය ඉෂ්ට කරන්න. මේ කෙටි කාලය තුළ අපි විශාල වැඩ කටයුත්තක් කළා.

විශේෂයෙන්ම පසුගිය "දවස් 52 මංකොල්ලය" අද ගොඩක් අයට අමතක වෙලා. ඒ මංකොල්ලයෙන් පස්සේ නැවත බලයට ආපු අපට විශාල වැඩ කොටසක් කරගෙන යන්න පුළුවන් වුණා. ඒ ගම්පෙරළිය වැඩසටහනින් වෙන්න පුළුවන්, සමෘද්ධියෙන් වෙන්න පුළුවන්, සුවසැරිය සේවාවෙන් වෙන්න පුළුවන්. අද රටේ ජනතාවගේ ආකර්ෂණයට ලක් වුණු ප්‍රධානම සේවාව තමයි, සුවසැරිය. ඒ සම්බන්ධව ගරු හර්ෂ ද සිල්වා මැතිතුමාට මම ස්තුතිවන්ත වනවා. කිසිවෙකුට හෝ පුළුවන්ද සුවසැරිය සේවාව විවේචනය කරන්න? කාටවත් ඒක විවේචනය කරන්න බැහැ. සුවසැරිය සේවාව ආරම්භ කරද්දී ප්‍රති පක්ෂවල අය කිව්වේ මොනවාද කියලා අපට මතකයි. ඉන්දියානු ව්‍යාප්තවාදය ගැන කිව්වා; ඉන්දියාවේ රෝ ඔත්තු සේවාව ගැන කිව්වා; ඉන්දියාවේ සේවකයෝ එනවා කිව්වා. සුවසැරිය තමයි අද මේ රට තුළ ව්‍යාප්ත වුණු හොඳම සේවාව. ගම් නියම්ගම්වල සහ නගරයේ ව්‍යාප්ත වුණු හොඳම සේවාව. එය හොඳම මහජන සේවාව බව අපි විශ්වාස කරනවා. ඒ වාගේ වැඩ කොටසක් අපට කරන්න පුළුවන් වුණා.

ඊළඟට, රාජ්‍ය සේවයේ වැටුප් වැඩි කිරීම ගනිමු. අද රාජ්‍ය සේවකයන්ගේ වැටුප දෙගුණයක් කර තිබෙනවා. කෙටි කාලයක් තුළ අපට එවැනි වැඩ කරන්න පුළුවන් වුණේ ශක්තිමත් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් කැබිනට් මණ්ඩලය ඇතුළේ ක්‍රියාත්මක වුණු නිසා. ඒ නිසා අපි විශ්වාස කරනවා, මේ කරගෙන යන විධියට ඉස්සරහට වැඩ කරගෙන යන්න පුළුවන් තත්ත්වයක් 2019 ජනාධිපතිවරණයෙන් පස්සේ අපට නිර්මාණය කර ගන්න පුළුවන් වෙයි කියලා. මොකද අපි දන්නවා අද ඒ අය විශාල අර්බුදයක සිටින බව. දැන් අපේ කුමාර වෙල්ගම මන්ත්‍රීතුමන්ලා වාගේ බොහොම කෘතහස්ත දේශපාලනඥයන් පවුල්වාදයට, ඒකාධිපතිවාදයට හා වහල්වාදයට විරුද්ධව නැඟිටලා තිබෙනවා. 11 වැනි දා එතුමන්ලාගේ අපේක්ෂකයා නම් කරනවා කියා තිබෙනවා. ඒක කර ගන්න පුළුවන් වෙයිද කියලා අපි දන්නේ නැහැ. අපි දැක්කා මැතිනිය - [බාධා කිරීම්] හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මැතිනිය ගැනත් කියැවෙනවා අපි දැක්කා. අන්තිමට මැතිනිය කරළියට එයිද දන්නෙත් නැහැ. කවුරු කරළියට ආවත් අර්බුදයක්. මැතිනිය කරළියට ආවාත් අර්බුදයක්, ඇමෙරිකාවේ පුරවැසිභාවය ඉවත් කරගෙන ලංකාවට ඇවිල්ලා ඉන්න ගෝඨාභය මහත්තයා කරළියට ආවත් අර්බුදයක්, බැසිල් රාජපක්ෂ මහත්තයා කරළියට ආවත් අර්බුදයක්. කවුරු කරළියට ආවාත් අර්බුදයක් තමයි එතැන තිබෙන්නේ. හැබැයි, අපේ එහෙම අර්බුදයක් නැහැ. ගරු කථානායකතුමනි, කවුරු නම් කළත් අපි සියලුදෙනාම සාමූහිකව කටයුතු කරන්න සූදානමින් තමයි ඉන්නේ. ඔබතුමා, අගමැතිතුමා හා සජිත් ප්‍රේමදාස මැතිතුමා ඇතුළු අපි සියලුදෙනාම සාමූහිකව වැඩ කරන්න පුළුවන් පිරිසක්.

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන විවාදයක් කරන්න බැහැ ගරු මන්ත්‍රීතුමනි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත වෙලාව අවසන්. කථාව අවසන් කරන්න.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ඒ නිසා 2019 ජනාධිපතිවරණයේදී සියයට 100ක් නොවෙයි, සියයට 1000ක්ම අපට විශ්වාසයි, එක්සත් ජාතික පක්ෂය නම් කරන එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයා අනිවාර්යයෙන් ම ජයග්‍රහණය කරන බවට. ඒ බව කියමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා.

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නිමල් ලාන්සා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය මොකක්ද?

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
ගරු කථානායකතුමනි, මා විවාදයක් කරනවා නොවෙයි. පසුගිය 31වැනි දා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමාගෙන් මම ප්‍රශ්නයක් ඇහුවා. එතුමා කිව්වා, එය ඔබතුමාට යොමු කර උත්තරයක් දෙනවා කියලා. මා එදා මතු කළ ප්‍රශ්නය පිළිබඳව ඔබතුමාගේ මතය මොකක්ද කියලායි මම ඔබතුමාගෙන් අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට ඒ ප්‍රශ්නය හම්බ වුණේ නැහැ. මම පසුව සොයා බලා කියන්නම්. [බාධා කිරීමක්]

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
එහෙනම්, මම දැන් ඔබතුමාගෙන් අහන්නම්. පසුගිය 31 වැනි දා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට ඒ ප්‍රශ්නය හම්බ වුණේ නැහැ. මම සොයා බලා කියන්නම්. හොඳයි.[බාධා කිරීමක්] මොකක්ද?

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
ගරු කථානායකතුමනි, විනාඩියක් දෙන්න. මේක ඔබතුමාගේ ගෞරවය පිළිබඳව ප්‍රශ්නයක්. ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා කිව්වා, මේ රටේ තිබෙන දූෂිතම ආයතනය පාර්ලිමේන්තුව කියලා. එහෙම කියපුවාම ඔබතුමාටයි, අපටයි, සියලුදෙනාටම ඒක අදාළ වෙනවා. එතුමා දූෂණය සම්බන්ධයෙන් කිව්වේ, මේ laptops දීලා තිබෙන්නේ පගාවක් විධියට කියලා. ඒ නිසා ගරු කථානායකතුමනි, ඔබතුමා එය නිවැරැදි කරන්න. මොකද, එය ඔබතුමාටත් හොඳ නැහැ; අපටත් හොඳ නැහැ. මේ laptops ටික අපට හම්බ වෙලා තිබෙන්නේ මේ පාර්ලිමේන්තුවේ මුදල්වලින් නම් අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, එතුමා කියන විධියට වෙනත් ආකාරයකට නම් ලැබිලා තිබෙන්නේ, අපේ ඒවා ඉවත් කරන්න කියලා ඉල්ලනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක එතුමාගේ පෞද්ගලික මතය. මීට කලිනුත් අපේ පාර්ලිමේන්තුවට විවිධ පාර්ලිමේන්තුවලින් තෑගි ලැබුණා. මේකත් අපට චීන පාර්ලිමේන්තුවෙන් ලැබුණු පරිත්‍යාගයක්. මීට අවුරුදු පහකට, හයකට කලිනුත් ඒ විධියට ලැබුණා. ඔබතුමා ඒකට අකමැති නම්, ඒක ඉවත් කරන්න පුළුවන්.

හැබැයි, මේ පාර්ලිමේන්තුව දූෂිතයි කියලා ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා කීම සම්බන්ධයෙන් මම කනගාටු වෙනවා. එහෙම නම්, එතුමා ඒ තුළ රැඳී සිටිය යුතුත් නැහැ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා.

[අ.භා.12.04]

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ ඉදිරිපත් කරන නියෝග සම්බන්ධයෙන් වචන කිහිපයක් කථා කරන්නට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

මේ අපනයන ගැන අද අපි කොන්දේසි හදලා දෙන්නේ, මේ නිදහස් කිරීම් කරලා දෙන්නේ අපේ රටේ යහපතටද, නැත්නම් වෙළෙන්දන්ගේ යහපතටද? ඒක තමයි අපට තිබෙන ගැටලුව. මේ ආණ්ඩුව මෙපමණ කාලයක් කරගෙන ආපු වැඩ පිළිවෙළ දිහා බැලුවාම, මේක රටේ යහපතට වඩා පෞද්ගලික අංශයට, වෙළෙන්දන්ට යහපත් වන විධියට, ලාභ ලෝභ ලැබෙන විධියට තමයි කටයුතු කළේ. ඒ නිසා මේ නියෝග අපි දකින්නේත් මේ ආණ්ඩුව ගෙන යන එක්තරා දූෂිත වැඩ පිළිවෙළක තවත් එක පියවරක් හැටියටයි.

සුළු අපනයන භෝග ගැන කථා කරනකොට, අපේ නියෝජ්‍ය ඇමතිතුමා මොනවාද කථා කළේ කියලා මා දන්නේ නැහැ. එතුමා කථා කළේ, ඇඟලුම් කම්හල් ගැන, එළවලු අපනයනය ගැන, නැව් හදන එක ගැන. ඒවා ගැන කථා කරන එක නොවෙයි කළ යුත්තේ. ගරු කථානායකතුමනි, අපේ රටේ සාම්ප්‍රදායික අපනයන භාණ්ඩ තිබුණා. තේ, රබර්, පොල් විතරක් නොවෙයි, වෙනත් භාණ්ඩත් තිබුණා. කුරුඳු තිබුණා, ගම්මිරිස් තිබුණා. මේවා තමයි අපේ රටේ ගැමියාට, ගමේ මිනිසුන්ට ආදායම ලැබුණු දේවල්; ආදායම ලැබුණු ක්‍රම. අද ඒවා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සම්පූර්ණයෙන්ම විනාශ කර තිබෙනවා. ඒ ආයතනයෙන් කළ දෙයක් නැහැ.

ගරු කථානායකතුමනි, අපනයන සංවර්ධන මණ්ඩලයේ දැනට සිටින සභාපතිනිය ගැන තමුන්නාන්සේත් දන්නවා ඇති. එතුමියගෙන් මේ ආයතනයට කිසිම සේවයක් සිද්ධ වූ බවක් පෙනෙන්න නැහැ. එතුමියගේ ස්වාමිපුරුෂයා ගරු ඇමතිතුමාත් එක්ක රගර් සෙල්ලම් කළා. ඒක තමයි තිබෙන සුදුසුකම. එහෙම නැතිව, මේ කාල සීමාව තුළ එතුමිය අපනයන සංවර්ධන මණ්ඩලයේ දියුණුවට කිසිම සේවයක් කරලා නැහැ. මෙපමණ කාලයක් අපනයන සංවර්ධන වැඩසටහන යටතේ අපේ ව්‍යාපාරිකයන්ට පිට රට seminarsවලට යන්න, එහෙම නැත්නම් ප්‍රදර්ශනවලට සහභාගි වෙන්න අවස්ථාව තිබුණා; ඒ පහසුකම් තිබුණා. ඒවා සම්පූර්ණයෙන්ම මෙතුමිය ඉවත් කළා. ඒ නිසා අපේ අපනයන දියුණුව අද එහෙමපිටින් අඩාල වෙලා තිබෙනවා. අද කුරුඳුවලට මොකද වෙලා තිබෙන්නේ ගරු ඇමතිතුමනි? කුරුඳු කිලෝ එකක මිල රුපියල් දහසකින් පහළට බැස්සා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, නිලධාරින්ට චෝදනා කිරීමේදී ප්‍රවේශම් වෙන්න ඕනෑ. මොකද, ඒක සාධාරණ නැහැ.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
අපි කියන්නේ, අපට ඇති වන හැඟීම, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා එසේ කිව්වත්, අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපතිතුමිය 1992දීත් ඒ ස්ථානයේ වැඩ කරපු කෙනෙක්.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඒක මම දන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම පෞද්ගලිකව එතුමිය ගැන දන්නවා.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඔබතුමා වාගේම මාත් පෞද්ගලිකව එතුමිය දන්නවා. නමුත්, මේ කාල සීමාව තුළ එතුමියගෙන් කිසිම සේවයක් සිදු වුණේ නැහැ කියන එකයි මම කියන්නේ.

අපේ රටේ ප්‍රධාන නිෂ්පාදනයක් හැටියට තමයි කුරුඳු නිෂ්පාදනය තිබෙන්නේ. අපේ ගම් පළාත්වල මනුෂ්‍යයෝ ජීවත් වෙන්නේ ඒ සල්ලිවලින්. මේ වෙනකොට රුපියල් දහසකින් ඒ මිල බැහැලා තිබෙනවා. එහෙම මිල බැස්සේ පිට රට ඒ මිල බැහැලා නොවෙයි. ඒ විධියට මිල බැස්සේ, අපේ රට ඇතුළේ ව්‍යාපාරිකයන් කිහිපපොළක් අතර ඇති වුණු අරගළයක් නිසායි. එක්කෙනෙකුට එක්කෙනෙක් අඩුවට offer කරනවා. එතකොට මිල බහිනවා.

දිගින්-දිගටම මිල බැස්සා. ශ්‍රී ලංකා අපනයන සංවර්ධනය මණ්ඩලය ඒ සම්බන්ධයෙන් මොකක්ද, කළේ? කරපු දෙයක් නැහැ. නමුත් කරන්න ඕනෑ තරම් දේවල් තිබෙනවා.

ගරු කථානායකතුමනි, ලෝකයේ තිබෙන කුරුඳුවලින් හොඳම කුරුඳු තිබෙන්නේ මේ රටේ තමයි. මේ කුරුඳු සඳහා තිබෙන ඉල්ලුම නැති වෙන්නේ නැහැ; මිල බහින්නේ නැහැ. ඒ තරමට කුරුඳුවලට තිබෙන ඉල්ලුම එන්න-එන්නම වැඩි වෙනවා. ඔබතුමාට මතක ඇති, එක් අවස්ථාවක අපි සවුදි අරාබියට ගියාම එහිදී අපට තේ දුන්නේ කුරුඳු මිශ්‍ර කරලායි. අපි ඒ සම්බන්ධයෙන් ඇහුවාම කිව්වේ, කොලෙස්ටරෝල් නැති කරන්න පුළුවන් බලයක් කුරුඳුවල තිබෙනවා කියලායි. එහිදී අපේ කුරුඳු අපට පෙව්වා, තේවලට මිශ්‍ර කරලා, "Cinnamon Tea" කියලා. මෙහි තිබෙන විශේෂය මොකක්ද කියලා ඇහුවාම ඒ ගොල්ලෝ කිව්වේ, කුරුඳු කියන්නේ ශරීරයේ කොලෙස්ටරෝල් පාලනය කරන්න පුළුවන් ඖෂධයක් කියලායි. ඉතින්, අපි කුරුඳු market කරන්නේ නැත්තේ ඇයි? අපි මෙය ප්‍රයෝජනයට ගන්නේ නැත්තේ ඇයි? කුරුඳු මිල බහින්න ඉඩ ඇරලා තිබෙන්නේ ඇයි? කුරුඳු කුණු කොල්ලයට විකුණන්න ඉඩ ඇරලා තිබෙන්නේ ඇයි? මේකයි අපි අහන ප්‍රශ්නය. ගරු කථානායකතුමනි, නියම කරන මිලට අඩුවෙන් විකුණන්න බැහැයි කියලා අඩු වශයෙන් floor price එකක් නියම කිරීම සඳහා අද තීන්දුවක් ගන්නයි තිබෙන්නේ. ගරු කථානායකතුමනි, තව මාස තුනකින් මේ ඉල්ලුම තවත් වැඩි වෙනවා. මොකද, නත්තල් කාලය, winter කාලය එනකොට ලෝක වෙළෙඳ පොළේ අපේ කුරුඳුවලට තිබෙන ඉල්ලුම වැඩි වෙනවා. එතකොට මිල වැඩි වෙනවා. ඒකෙන් ප්‍රයෝජන ගන්න නම්, මේ වෙලාවේ, මේ දැන් හෝ හෙට හෝ floor price එකක් introduce කරන්න වෙනවා. එහෙම introduce කළොත් විතරයි මේකෙන් ගැලවෙන්න පුළුවන් වෙන්නේ. එහෙම නැත්නම් අද වෙළෙන්දෝ තරගය නිසා ඒ ගොල්ලන්ට ඕනෑ හැටියට කටයුතු කරගෙන යනවා. අද ආණ්ඩුවේ පාලනයකුත් නැහැ, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය කරන කෙහෙල් මලකුත් නැහැ. වෙළෙන්දන්ට ඕනෑ විධියට කටයුතු කරගෙන යන්න ඉඩ දෙනවා.

ගරු කථානායකතුමනි, ගම්මිරිස්වලට කළ දේ දැක්කාද? කොටින්ම කියනවා නම් ගම්මිරිස් කැවා; ජාතියටම ගම්මිරිස් කැව්වා; සම්පූර්ණයෙන්ම ඒ ව්‍යාපාරය විනාශ කළා. දයා ගමගේ ඇමතිතුමා ප්‍රසිද්ධියේ ජාතියට ප්‍රකාශ කළා, මම ගම්මිරිස් කිලෝග්‍රෑම් එකකට රුපියල් 900ක සහතික මිලක් දෙනවා කියලා. මේ මහත්වරුන්ට පුළුවන් නම් අද ගමට යන්න කියන්න, මේ ඇමතිවරුන්ට ගම්වලට යන්න කියන්න, මොකද වෙන්නේ කියලා බලන්න. ගම්මිරිස් නිෂ්පාදනය කරන ප්‍රදේශයකට හෙට, අනිද්දාට තිබෙන ජනාධිපතිවරණ රැස්වීමකට දයා ගමගේ ඇමතිතුමා එක්කගෙන යන්නකෝ. පුළුවන් නම් ඒ ප්‍රදේශයට ගිහින්, එතුමාගේ පක්ෂයට ඡන්දය දෙන්නය කියලා එතුමාට කථාවක් කරලා එන්න කියන්න. එතුමාට පුළුවන් නම් ඇඹිලිපිටිය පැත්තට, පනාමුරේ පැත්තට ගිහින්, අපි තමුන්නාන්සේලාට විශාල සේවයක් කරලා තිබෙනවා. ඒ නිසා අලියාට ඡන්දය දෙන්න කියලා ගම්මිරිස් නිෂ්පාදනය කරන ගොවීන් අමතා දයා ගමගේ ඇමතිතුමාට කථාවක් කරන්න කියන්න. කුරුඳු නිෂ්පාදනය කරන ප්‍රදේශවලට ගිහින්, අපි කුරුඳුවලට හොඳ මිලක් දුන්නා. අපි කුරුඳුවලට හොඳ සේවයක් කරලා තිබෙනවා. අපි කුරුඳු දියුණු කරලා තිබෙනවා. අපි කුරුඳු වවලා තිබෙනවා කියලා ඇමතිවරුන්ට කියන්න කියලා කියන්න. මේවා කියලා පුළුවන් නම් අලියාට ඡන්දය ගන්න කියන්න. ගොරකා නිෂ්පාදනය කරන අය ළඟට ගිහින් කථා කරන්න. අපි ගොරකා මිල වැඩි කරලා තිබෙනවා. ගොරකාවලින් අලුත් නිෂ්පාදන හදලා තිබෙනවා. අපි ගොරකා අපනයනය කරනවා. ඒ නිසා හොඳ මිලක් ලැබෙනවා. ඒ නිසා තමුන්නාන්සේලාට හොඳ ආදායමක් දැන් ලැබෙනවා කියලා, ඔවුන් ළඟට ගිහින් ඡන්දය ඉල්ලන්න කියන්න.

ඊළඟට කරුංකා ගැන කාරණයක් කියන්න ඕනෑ. කරුංකාවලට සිදු වුණු දේ ගැන කථා කරන්න වුවමනාවක් නැහැ. ගම්මිරිස් සහ කරුංකා යන දෙකටම එකම දේ තමයි සිද්ධ වුණේ. නමුත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය මේ ගැන කිසි දෙයක් කළේ නැහැ. ඒකයි මා කිව්වේ, මේ උදවියගෙන් අපට වැඩක් නැහැයි කියලා.

මෙය ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්. මේ උදවිය මේ ගැන කථා කරන්නේ නැත්තේ ඇයි? මේ උදවිය මේවා ගැන කටයුතු කරන්නේ නැත්තේ ඇයි? මේවා අපේ රටේ සාම්ප්‍රදායික අපනයන; අපට තිබුණු ඉතා වටිනා අපනයනයන්. මේ විධියට මාස 6ක් ඇතුළත කුරුඳු කිලෝග්‍රෑම් එකක මිල රුපියල් 1,000කින් අඩු වුණාම එය විශාල පාඩුවක්. එතකොට මේ වගාව පවත්වාගෙන යන්න බැරිවෙනවා. මේ වගාවලින් මේ මිනිස්සු ඉවත් වෙනවා. එහෙම නොවෙන්න නම් අඩු වශයෙන් තාවකාලික පියවරක් වශයෙන් හෝ floor price එකක් දෙන්න කියන්න. ඒක තමයි මෙයට තිබෙන විසඳුම. ඒ විසඳුම දුන්නොත් මේ නත්තල් කාලයට තිබෙන ඉල්ලුමෙන්වත් ප්‍රයෝජනයක් ගන්න පුළුවන් වෙයි. එහෙම නැති වුණොත් අපේ රටට දෙවියන්ගේම පිහිටයි. මේ ව්‍යාපාරය සම්පූර්ණයෙන් නැති වන තුරු ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයත්, මේ නිලධාරි මහත්වරුනුත් බලාගෙන ඉන්නවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු මන්ත්‍රීතුමනි, ඒකට මා පිළිතුරක් දෙන්නද?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
හොඳයි.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු මන්ත්‍රීතුමනි, මා හිතන හැටියට මීට මාස කිහිපයකට කලින් ගම්මිරිස් ප්‍රතිඅපනයනය කිරීම අපේ අමාත්‍යාංශයෙන් නතර කරලා තිබෙනවා. ඒ වාගේම කියන්න ඕනෑ, අද ඉදිරිපත් කර

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

තිබෙන ගැසට් නිවේදන තුනම මුදල් අමාත්‍යාංශයේ නියෝග ක්‍රියාත්මක කිරීමක් බව. නමුත් එය ක්‍රියාත්මක විය යුත්තේ, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ විධිවිධාන යටතේ නිසා තමයි අපේ අමාත්‍යාංශය විසින් මේ ගැසට් නිවේදන ඉදිරිපත් කරනු ලැබුවේ. අපි දන්නවා, විශේෂයෙන් ගම්මිරිස් ප්‍රතිඅපනයනය කිරීම හරහා විශාල මාෆියාවක් ක්‍රියාත්මක වුණා කියලා. නමුත් මේ තත්ත්වය අවබෝධ කරගෙන ඒ තත්ත්වය නතර කරන්න අවශ්‍ය කටයුතු කරන්නට මීට මාස කිහිපයකට කලින් අපේ ඇමතිතුමාට පුළුවන් වුණා.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

අශ්වයා ගියාට පස්සේ ඉස්තාලය වැහුවා! ඒක නේ ඔබතුමා කියන්නේ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ඔය අශ්වයා යන්න පටන් ගත්තේ 2015ට කලින් ඉඳන්. ඔබතුමන්ලාගේ කාලයේ ඉඳන්.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

අශ්වයා ගියාට පස්සේ ඉස්තාලය වැහුවා! [බාධා කිරීමක්]

ගරු කථානායකතුමනි, එතුමා එහෙමවත් පියවරක් ගත්ත එක ගැන මම සතුටු වෙනවා. අනික් ඒවාටත් ඔය වාගේ මොනවා හරි පියවරක් ඉක්මනින් ගන්න. විශේෂයෙන් කුරුඳුවලට. අද කුරුඳු ගැන රටේ විශාල ප්‍රශ්නයක් තියෙනවා. කුරුඳු වගාකරන මිනිස්සු සම්පූර්ණයෙන් ඒ වගාවෙන් ඉවත් වෙනවා. ගම්මිරිස් ගැන කථා කරපු එක හොඳයි. අපේ ගරු සභානායකතුමාත් දන්නවා, ගම්මිරිස් නිසා මොන තරම් ප්‍රශ්නවලට නුවර පළාත්වල මනුෂ්‍යයන් මුහුණ දීලා තිබෙනවාද කියලා. ඒ හා සමාන ප්‍රශ්නයක් තමයි දකුණු පළාතේ මිනිස්සුන්ට කුරුඳු වගාව සම්බන්ධයෙන් තිබෙන්නේ. අපේ ගම්වලට ගියාම ඒ මනුෂ්‍යයෝ අපෙන් අහනවා, මොකක්ද මේකට කරන්නේ, ඇයි, තමුන්නාන්සේලා මේ වෙනුවෙන් කථා කරන්නේ නැත්තේ, ඇයි, මේක ආණ්ඩුවට කියන්නේ නැත්තේ කියලා. අපි අද මේ ආණ්ඩුවට කියනවා, මේ සඳහා අවශ්‍ය පියවර ගන්න කියලා. වහාම අවම මිලක් - floor price - දාලා මේ තත්ත්වය නතර කරන්න. එච්චර විතරක් නොවෙයි, මේවා අඩුවෙන් offer කරපු උදවියට දඬ ගහන්න. ඒ උදවියගේ බඩේ වාසිය සඳහා මේ රටේ මිලට වැඩිය අඩුවෙන් offer කළා නම්, ඒකට අවශ්‍ය දඬුවම දෙන්න. ඒගොල්ලන්ගේ අපනයන බලපත්‍ර cancel කරලා දාන්න. ඒ වාගේ පියවර ගන්න අපේ අපනයන සංවර්ධන මණ්ඩලයට බැරි නම්, මේ නියෝග ගෙනිහින් ළිපේ දාන්න; ඒවා හොඳයි දරමිටියකට: ඒකෙන් ඇති වැඩක් නැහැ. අපේ රටේ මේ වැවිලි අපනයන කටයුතු සම්බන්ධයෙන් තිබෙන ගැටලුවලට මුහුණ දෙන්න බැරි නම්, ඒ සංවර්ධන කටයුතු කරන්න බැරි නම්, ඔය කෙහෙම්මල් අපනයන සංවර්ධන මණ්ඩලයෙන් ඇති වැඩක් නැහැ. ඒ ගොල්ලන් කරන සංවර්ධනයක් නැහැ කියන එක තමයි මට කියන්න තියෙන්නේ. ගරු කථානායකතුමනි, අපි හරි හිතේ අමාරුවෙන් මේ ප්‍රශ්නය ගැන කථා කරන්නේ. අපට මේක විශාල ප්‍රශ්නයක්. අපට අපේ ගම්වලට යන්න බැහැ. තමුන්නාන්සේලාගේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට විතරක් නොවෙයි, විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් මිනිස්සු බණිනවා, මොකද, තමුන්නාන්සේලා මේ ගැන සද්ද නැත්තේ; කථා කරන්නේ නැත්තේ කියලා. ඒ නිසා මේක අපට ඇති බරපතළම ගැටලුවක් හැටියටයි අපි අද දකින්නේ.

ගරු කථානායකතුමනි, නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, garment industry එක සියයට 18කින් වැඩි වුණා, fruit exports සියයට 39කින් වැඩි වුණා කියලා. මොකක්ද මේකේ volume එක? මේ ප්‍රමාණය කොච්චරද? කුරුඳුවලින් අපි උපයන මුදලත්, මේ සාම්ප්‍රදායික නොවන කුඩා අපනයනවලින් උපයන මුදලත් බැලුවාම මොන තරම් වෙනසක් තියෙනවාද? කුරුඳු කිලෝවකින් රුපියල් 1,000ක් නැති වුණා කිව්වාම කොච්චර මුදලක් අපට අහිමි වෙනවාද? මේ ඔක්කෝම විදේශ විනිමය. මේ නැති වෙන්නේ පිටරටවලින් අපට ගන්න තියෙන සල්ලි. මේ වෙනුවෙන් කටයුතු කරන්න බැරි නම්, අපනයන සංවර්ධන මණ්ඩලයෙන් ඇති වැඩේ මොකක්ද? මේ නියෝග හදලා දෙන්නේ මොකටද? මේ නියෝග අනුමත කර දීමෙන් ඇති වැඩක් තිබෙනවාද? මේ ගොල්ලන්ගෙන් වෙච්ච සේවයක් තිබෙනවාද? යම් යම් කාලවල අපනයන සංවර්ධන මණ්ඩලයෙන් සේවයක් සිද්ධ වුණා. විශාල වැඩ කොටසක් කළා. නමුත් දැන් කෙරෙන්නේ නැහැ කියන එකයි මම කියන්නේ. දැන් මොකුත්ම කෙරෙන්නේ නැහැ. මේ අපනයන සංවර්ධන මණ්ඩලයෙන් විශාල වැඩ කොටසක් කළා. ඒ කාලයේ අපනයන සංවර්ධන මණ්ඩලයේ හිටපු සභාපතිවරු, හිටපු නිලධාරි මහත්වරු හුඟක් වැඩ කළා. එහෙම වැඩ කරපු නිසා තමයි අද මේ ආයතන මේ විධියට පවතින්නේ. ඒ නිසා තමයි කුරුඳු කර්මාන්තය දියුණු වුණේ. මේ ආයතනය වැඩ කරපු නිසා තමයි අනික් අපනයන සංවර්ධන වැඩකටයුතු සංවර්ධනය වුණේ. නමුත් අද මේ වෙනකොට ඒ කිසිදෙයක් කෙරෙන්නේ නැහැ.

පොල් ආශ්‍රිත ද්‍රව්‍යවල අපනයනය වැඩි වුණා කිව්වා. තමුන්නාන්සේ මට කියන්න අද පොල් ගෙඩියක් කීයද කියලා? පොල් නිෂ්පාදනය කරන මිනිසුන්ට රුපියල් 20ට පොල් ගෙඩියක් දෙන්න පුළුවන්. අද පොල් ගෙඩියක් විකුණන්න පුළුවන් මිල රුපියල් 20යි. නමුත් පොල් ගහක පොල් කඩන්න රුපියල් 100ක් දෙන්න ඕනෑ. ගෙඩියක් තිබුණත් රුපියල් 100ක් දෙන්න ඕනෑ. ගෙඩි වල්ලක් තිබුණත් රුපියල් 100ක් දෙන්න ඕනෑ, පොල් කඩන්න විතරක්. එතකොට කොහොමද, මේ අය මේ කර්මාන්තය ගෙනියන්නේ? වැවිලි කර්මාන්තය සම්පූර්ණයෙන් අඩපණවෙලා.

ගරු කථානායකතුමනි, තේ ගැන මම කියන්න යන්නේ නැහැ. තේ ගැන මේ ගොල්ලන්ට කියලා වැඩක් නැහැ නේ. අපනයන සංවර්ධන මණ්ඩලය තේ ගැන කථා කරන්නේ නැහැ නේ. නමුත් තේ මිලත් එහෙමයි. මේ රටේ කෘෂිකර්මාන්තයේ යෙදිලා ජීවත් වුණු සියලුදෙනා දැන් අපහසුවට පත් වෙලා. අපි ජීවත් වුණේ කෘෂිකර්මාන්තයෙන්. අපි ජීවත් වෙන්නෙත් කෘෂිකර්මාන්තයෙන්. මේ ක්ෂේත්‍රයේ වෙන හැම වෙනසක්ම අපට දැඩි ලෙස දැනෙනවා. අද පොල් ගෙඩියක් විකුණා ගන්න බැරි නම්, තේ දළු කිලෝ එකක මිල රුපියල් 75ට බැහැලා නම්, මේ රටේ කෘෂි අපනයනය දියුණු වුණා, රටේ වගාව දියුණු වුණා, වැවිලි කර්මාන්තය දියුණු වුණා කියලා කියන්නේ කොහොමද? වැවිලි කර්මාන්ත ඇමතිතුමා මේ ගැන කථා කරන්නේවත් නැහැ. එතුමා ඒ ගැන දන්නවා ද දන්නෙත් නැහැ. එහෙම දෙයක් රටේ තිබෙනවාද කියලාවත් දන්නවාද දන්නේ නැහැ. පොල් ගෙඩියක් රුපියල් 20යි කියලා වැවිලි කර්මාන්ත ඇමතිතුමා දන්නවාද දන්නේ නැහැ ගරු කථානායකතුමනි. පොඩ්ඩක් අහලා බලන්න, එතුමා දන්නවාද කියලා. අමු තේ දලු කිලෝ එකක මිල රුපියල් 75ට බැහැලායි තිබෙන්නේ.

ඊළඟට, දැන් රබර් කපන්නේ නැහැ, කපලා වැඩක් නැති නිසා. රබර් කපන්න මහන්සි වීමේ තේරුමක් නැහැ. ඒක තමුන්නාන්සේත් දන්නවා. දැන් රබර් ගලවනවා, දරට. රබර් විකුණනවාට වඩා දර විකුණන එක ලාභයි. මේකයි ඇත්ත තත්ත්වය. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන්, සුළු අපනයන භෝග සංවර්ධන මණ්ඩලයෙන් මේ වෙනුවෙන් යමක් කෙරෙන්නේ නැත්නම්, දෙයියනේ! අපි වෙන කාටද මේක කියන්නේ? මොකක්ද මේ රටට වෙන්න යන්නේ?

නියෝජ්‍ය ඇමතිතුමා ජනාධිපතිවරණය ගැන කථා කළා. එතුමාට මේ අංශය ගැන වෙන කථා කරන්න දෙයක් නැතිවද කොහෙද. ගරු කථානායකතුමනි, ඔබතුමා කිව්වා ඒ ගැන කථා කරන්න එපා, අපනයන ගැන කථා කරන්න කියලා. අපනයන ගැන කථා කරන්න දෙයක් නැහැ. ඒකයි ඇත්ත. මොනවා කථා කරන්නද? ඔය මොනවා හෝ කියලා, ඊට පස්සේ, ඒක තව මොකක් හෝ කාරණාවක එල්ලලා, ජනාධිපති අපේක්ෂකත්වය පිළිබඳව තිබෙන ප්‍රශ්නය ගැන කථා කරලා මේ විවාදය ඉවර කරන්නයි තිබෙන්නේ. ඒකනේ මේ කළේ. රටට ඒකෙන් ඇති වැඩක් නැහැ. මේ නියෝග සම්මත කළාට, මේවාට අදාළ ආයතනවලින් ජනතාවට කිසිම සේවයක් සිද්ධ වෙන්නේ නැහැ. මේ බඩු භාණ්ඩවල මිල උච්චාවචනයට මේවා විසඳුමක් නොවෙයි. මේවායින් මොනවාවත් වෙන්නේ නැහැ. ඒකයි මම කියන්නේ මේ නියෝගවලින් පලක් නැහැ කියලා. අද තිබෙන විසඳුම නියෝග ගෙන ඒම නොවෙයි. අද මේ වගා පවත්වා ගෙන යන්න බැහැ. ඒවායින් ප්‍රමාණවත් ආදායමක් මේ රටට ලැබෙන්නේ නැහැ. එන්න එන්න මිල අවම වෙනවා; පහත වැටෙනවා. ඒ නිසා මම අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපතිතුමියට කියන්නේ, මැදිහත් වෙලා ඒකට මොනවා හෝ කරන්න කියලායි. මේ නියෝග ගෙන ඒමෙන් ගන්න පුළුවන් ලාභයක් නැහැ. ව්‍යාපාර වෙළෙඳ පොළ දියුණු කර ගන්න, අලුත් වෙළෙඳ පොළවල් හොයන්න, ඊළඟට, niche market එකක් තිබෙන තැන්වලින් ප්‍රයෝජන ගන්න කටයුතු කරන්න ඕනෑ. දැන් කුරුඳුවලට තිබෙන්නේ හොඳ niche market එකක්. නමුත් ඒක අපි ප්‍රයෝජනයට ගන්නේ නැහැ. ඒක ඔක්කෝම වෙළෙන්දන්ට කරගන්න අත හැරලායි තිබෙන්නේ. ඒ මිනිසුන්ට හම්බ කර ගන්නයි දීලා තිබෙන්නේ. අපි අපනයන සංවර්ධන මණ්ඩලයෙන් බලාපොරොත්තු වන්නේ, කුරුඳු පැළ ටිකක් බෙදන එකවත්, ඒකට පොහොර ටිකක් දෙන එකවත් විතරක් නොවෙයි. ඒකනේ මේ පසුගිය කාලයේ කළේ. ඒක නොවෙයි, අපි ඉල්ලන්නේ. අපි ඉල්ලන්නේ මේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි කරන්න කියලායි; හොඳ වෙළෙඳ පොළක් හොයා දෙන්න කියලායි; ඒ කටයුතු කරන වෙළෙඳුන්ට, අපනයනකරුවන්ට උදව් කරන්න කියලායි. අවංකවම ඒ මිනිසුන් ලෝකයේ රටවල්වලට ගිහිල්ලා අලුත් දැනුම ලබා ගන්නවා විතරක් නොවෙයි, ඒ අලුත් දැනුම මේ රටට ගෙනැල්ලා ඒකෙන් ප්‍රයෝජන ගන්න ඕනෑ. අද මේ වෙළෙන්දෝ දෙදෙනකු, තුන්දෙනකු අතරේ නේ මේ ව්‍යාපාරය යන්නේ. ඒ ගොල්ලන්නේ මේ සේරම manipulate කරන්නේ. මේ manipulation එක නිසානේ, price එක වැටෙන්නේ. ඒකට මැදිහත් වෙන්න බැරි නම් අපනයන සංවර්ධන මණ්ඩලයෙන් ඇති වැඩේ මොකක්ද? ඒකයි අපි අහන්නේ. ඒ නිසා මේ වෙලාවේ මේ කටයුතු කරන්න කරුණාකර, මැදිහත් වෙන්න කියලා අපි ඒ නිලධාරි මහත්ම මහත්මීන්ගෙන් ඉල්ලා සිටිනවා. මේ ප්‍රශ්නයට ගත යුතු පියවර එයයි. දැනට floor price එකක් දෙන්න. වැරදි විධියට offer කරපු සියලු දෙනාට දඬුවම් කරන්න. ඒ ගොල්ලන්ගේ බලපත්‍ර අවලංගු කරන්න. මේ අපනයන සංවර්ධන මණ්ඩලයට ඒ විධියේ තීරණ ගන්න බැරි නම්, අපේ රට කොහේද යන්නේ? නිසි තීරණ ගන්න උදවිය තමයි ඒකට අවශ්‍ය වෙන්නේ. අපේ රට බේරා ගන්න නම්, අපේ රටේ මේ ව්‍යාපාර රැක ගන්න නම්, අපි මේ ගැටලුවලට මුහුණ දෙන්න නම් එවැනි වැඩ පිළිවෙළක් අපට කරන්න වෙනවා. එහෙම කළේ නැත්නම්, මේ නියෝග පැනවීමෙන් විතරක් මේ දේ කරන්න බැහැ. මේ නියෝග අපි සම්මත කරලා දෙනවා. ඊට පස්සේ ඒවාත් අර විධියටම තිබෙනවා. ඒකෙන් තවත් කවුරු හරි රිංගනවා. රිංගලා ඒකෙනුත් තව කීයක් හෝ කොටා ගන්නවා. ඒක තමයි අද ව්‍යාපාරය වෙලා තිබෙන්නේ.

නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, ගම්මිරිස් ප්‍රතිඅපනයනය නතර කළාය කියලා. ඒක හොඳයි. ගම්මිරිස් ප්‍රතිඅපනයනය නතර කරපු එකට අපි කැමැතියි. ඒක අපි අනුමත කරනවා. ඒක කරන්න තිබුණේ, දැනට අවුරුදු තුනකට, හතරකට කලින්. එහෙම කළේ නැහැ. ඒ වෙනුවට, අපේ සමහර නායකයෝත් මේ වෙළඳාමට බැස්සා. ඒකයි වුණේ. සමහර නායකයන්ගේ සමාගම් එහෙමත් ඒ හොර වෙළෙඳාමට බැස්සා. ඒ ගොල්ලනුත් යම්කිසි මුදලක් ඒකෙන් උපයා ගන්න උත්සාහ කළා. එහෙම කරන්න ගිහිල්ලා තමයි මේ වැඬේ අවුල් වුණේ. අද අනෙක් අංශවලට වෙන්නෙත් ඒකයි. කුරුඳුවලට වෙන්නෙත් ඒකයි.

තේ ගැන අපි කථා කරන්නේත් නැහැ. මම කලින් කිව්වා වාගේ තේ කර්මාන්තය සම්පූර්ණයෙන් විනාශ වුණේ බාල තේ නිසායි. ඔබතුමා දන්නවා, මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. අපි සියලුදෙනාටම වැඩියෙන් අපේ ගරු සාගල රත්නායක ඇමතිතුමාට තේ ගැන හොඳ අවබෝධයක් තිබෙනවා. අද මොනවාද වෙලා තිබෙන්නේ? ඇයි මේ වැරදි නිවැරදි කරන්න හදන්නේ නැත්තේ? ඇයි මේ ගැන සොයන්නේ නැත්තේ? බාල තේ, කොහේ හෝ තිබෙන කසළ තේ ගෙනැල්ලා කලවම් කරලා විකුණන එකද අපි දන්න තේ වෙළෙඳාම? ඒකයි අපි අහන්නේ. අපේ රට ඉතාම ඉහළ, ගුණාත්මක අතින් ඉතාම ඉහළ තේ නිෂ්පාදනය කළ රටක්. අපේ තේ සන්නාමය තරම් වචනයක් ලෝකයේ කොහේවත් තිබුණේ නැහැ. නමුත් අපි ඒක විනාශ කර ගත්තා. ඒකට අපනයන සංවර්ධන මණ්ඩලයත් වග කියන්නට ඕනෑ කියන එකයි මම කියන්නේ. මේ වැඩ පිළිවෙළ සාර්ථක කර ගන්න නම් නියම තීරණ ගන්නට පුළුවන් නායකත්වයක් අවශ්‍යයි, ගරු කථානායකතුමනි. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ගරු ගාමිණී විජිත් විජයමුනි සොයිසා මැතිතුමා. අපි පස්වරු 12.30ට දිවා භෝජනය සඳහා සභාවේ කටයුතු අත්හිටුවිය යුතුව තිබෙනවා. අවශ්‍ය නම් දිවා භෝජනයට පෙර තව විනාඩි 2ක පමණ කාලයක් වැඩිපුර ලබා ගැනීමට සභාවේ අවසරය පතනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

අපි එකඟ වුණා මේ නියෝග සම්මත කිරීමේ කටයුතු ඉක්මනින් අවසන් කරන්නට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

නමුත් දිවා භෝජනය සඳහා සභාවේ කටයුතු නවත්වන්නට තිබෙනවා නේ?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

අපි සභාවේ කටයුතු නවත්වන්නේ නැතිව පස්වරු 1.00 වෙනකම් යමු. මම හිතන විධියට අද වැඩිය කථිකයෝ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

නැහැ, ඉන්නවා. ගරු සභානායකතුමනි, කථිකයන් ගොඩක් දැන් ඇවිල්ලා ඉන්නවා. ඒ නිසා 1.00ට ඉවර කරන්න බැහැ. මම හිතන විධියට පස්වරු 3.00වත් වෙයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, ඔබතුමා කැමැති විධියකට කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒ විධියට කටයුතු කරමු. නැත්නම් හොඳ නැහැ නේ. අවශ්‍ය නම්, දිවා භෝජනයට පෙර වැඩිපුර විනාඩි දෙකක් ලබා ගැනීම සඳහා සභාවේ අවසරය පතනවා. Does the House agree?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මැතිතුමා කථා කරන්න.

[අ.භා.12.24]

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ගරු කථානායකතුමනි, කථිකයන් නැත්නම් අපට කථා කරන්නට වැඩි වේලාවක් දෙන්න. මොකද, මේක අපේ රටේ ජාතික ආර්ථිකයට වැදගත් මාතෘකාවක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කථිකයන් ඉන්නවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ඉන්නවාද? එහෙම නම් ප්‍රශ්නයක් නැහැ.

ගරු කථානායකතුමනි, මේක අපේ ජාතික ආර්ථිකයට ඉතා වැදගත් මාතෘකාවක්. ආනයනය, අපනයනය, වෙළෙඳ ශේෂයේ, ගෙවුම් ශේෂයේ හිඟය, ප්‍රතිඅපනයනය, අගය දාමය එකතු කිරීම වාගේ ලොකු ලොකු වචන දාගෙන අපි මේ සභාව ඇතුළේ කථා කළාට, සැබෑවට මේ වචන බිමේ පැළවෙනකොට මේ පාර්ලිමේන්තුවත්, රජයේ නිලධාරිනුත් කුමන තීරණ ගත්තත් ගරු කථානායකතුමනි, "හිඟන්නාගේ පාත්තරේට හෙනහුරා වැටුණා වාගේ" වැඩක් තමයි වෙලා තිබෙන්නේ. මේක මේ අද ඊයේ, මේ ආණ්ඩුව නිසාම වෙච්ච දෙයක් නොවෙයි. දිගින් දිගටම මේ දේ සිද්ධ වුණා; මේ දේ කළා. අපි හිතනවා අහිංසක ගොවියාට කුරුඳු පැළේ නිකම් දුන්නාම, තේ පැළේට සියයට 50ක සහනාධාරයක් දුන්නාම, ගම්මිරිස් පැළේ නිකම් දුන්නාම ඔක්කොම හරි කියලා. නමුත්, භූමිය, ශ්‍රමය, ජලය බොහොම අමාරුවෙන් කළමනාකරණය කරලා, දුක් විඳලා තමයි මේ රටේ ගොවි ජනතාව මේ නිෂ්පාදන කරන්නේ.

ගරු කථානායකතුමනි, මේ රත්තරන් පොළොවේ වැවෙන දේවලට ලෝකයේ ඉහළ මිලක් තිබෙනවා. අපේ රටේ යෝගට් එකට, අපේ රටේ ගම්මිරිස් ටිකට, අපේ රටේ කුරුඳු ටිකට, අපේ රටේ කොකෝවාවලට, අපේ රටේ තේ ටිකට ඉහළ මිලක් තිබෙනවා. අපේ රට වටේම මුහුද තිබෙනවා. නමුත් මාළු පිට රටින් ගෙනැල්ලා ප්‍රතිඅපනයනය කරනවා. ගරු කථානායකතුමනි, අපේ රටේ කිවුල්දිය මත්ස්‍ය ව්‍යාපාරය තිබෙනවා; මිරිදිය මත්ස්‍ය ව්‍යාපාරය තිබෙනවා; කරදිය මත්ස්‍ය ව්‍යාපාරය තිබෙනවා. ඒ වාගේම අපට කළපු තිබෙනවා; වැව් තිබෙනවා. නමුත් අද අපි සැමන් පිට රටින් ගෙනෙනවා. මාළු පිට රටින් ගෙනැල්ලා ප්‍රතිඅපනයනය කරනවා. අර අහිංසක ධීවරයා අල්ලාගෙන එන මාළු ටික විකුණා ගන්න බැරි වෙන විධියට ඒ මාළු ටික මේ වෙළෙඳ පොළට දමනවා. මේවායේ කළමනාකරණයක් නැහැ. රජයකට ව්‍යාපාර කරන්නට බැහැ. රජයක් ඉන්නේ ප්‍රතිපත්ති සකස් කරන්න. නිවැරදි ප්‍රතිපත්ති ගැන සාකච්ඡා කරලා, ඒ ප්‍රතිපත්ති තීරණය කරන්නයි.

ගරු කථානායකතුමනි, මේවාට අපට මහ ලොකු මැජික් එකක් ඕනෑ නැහැ. අපි සහල්වලින් ස්වයං පෝෂිතයි කියනවා. නමුත්, දැන් සංචාරක හෝටල්වලට සහල් පිට රටින් ගේනවා. එහෙම නම් ඒ සහල් මේ රටේ නිෂ්පාදනය කරන්නට බැරි ඇයි? වැව් 35,000ක් තිබෙන රටක් මේක. ඊශ්‍රායලයට තිබෙන්නේ එක වැවයි, නමුත් මුළු යුරෝපයටම එළවලු දෙනවා. අපේ රාජ්‍ය ඇමතිතුමා සභාවේ නැහැ, නමුත් යමක් කරන්න එතුමා යම් උත්සාහයක් ගන්නා බව පෙනෙනවා.

ඒ වාගේම, දැන් මේ ගරු සභාවේ ආනයන ප්‍රගතිය ගැන කථා කළා. මහ බැංකු වාර්තා වෙන්න පුළුවන්, නිලධාරින් දෙන වාර්තා වෙන්න පුළුවන්, ඒවායේ නිරවද්‍යතාව කෙසේ වෙතත් බිම පය ගහලා ඉන්න කොට අපට පෙනෙනවා අද මේ නිෂ්පාදකයා අමාරුවේ වැටිලා සිටින බව. විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් කියන දේට මාත් එකඟ වෙනවා. හරි, අපනයන ප්‍රගතිය හොඳයි කියමු කෝ. ආනයන ප්‍රගතිය ගැනයි කථා කරන්න ඕනෑ. පිට රටින් ගෙනෙන ඒවායේ වටිනාකම වැඩිවෙලා තිබෙනවා. ආනයනය වැඩි වෙලා තිබෙනවා, ඩොලර් එකේ අගය ඉහළ යනවා. ඒ නිසා මේ ජනතාවට භාණ්ඩ හා සේවා ලබා ගැනීමේදී තිබෙන දුෂ්කරතාව කොපමණද?

ගරු කථානායකතුමනි, කිරි, සහල්, මිරිස්, මාළු, කරවල, මස් කියන ආහාර දිහා බලන්න. ගරු කථානායකතුමනි, අපි 1977 වෙනකොට දේශීයව සියයට 80ක් කිරි නිෂ්පාදනය කළ බව මට මතකයි. ඒ කාලයේ ලලිත් ඇතුලත්මුදලි ඇමතිතුමා අපනයන ගම්මාන හදලා, ජර්සි වැස්සියෝ ලබා දුන්නා. එතුමා ඒ අංශයෙන් යම්කිසි දියුණුවක් කළා. අපි සියයට 80ක් දේශීය වශයෙන් කිරි නිෂ්පාදනය කළා. අද නිෂ්පාදනය සියයට 40යි, සියයට 50කින් බැහැලා. ගරු කථානායකතුමනි, හරකෙක් මිලදී ගැනීමට ගොවියාට ලක්ෂ දෙකක සහනාධාරයක් දුන්නොත්, ඔක්කෝම ඒකට විරුද්ධව කථා කරනවා. මේ රටේ කර්මාන්තවලට අදාළ සමහර තීරණ ගත්තාම, අපි අද නිලධාරින්ට බැන්නත්, ඒ සමහර සංවර්ධන නිලධාරින්ට උසාවි යන්න සිදුවෙලා තිබෙනවා. මේ කර්මාන්ත සංවර්ධනයට, කෘෂිකාර්මික නිෂ්පාදන සංවර්ධනයට, වගා සංවර්ධනයට තීරණ අරගෙන, ඒ දේශපාලනඥයන් එක්ක වැඩ කරපු සමහර නිලධාරින්ට අද උසාවි යන්න සිදුවෙලා තිබෙනවා.

දැන් බලන්න, මහ මෝල් හිමියන්ගේ සහල් ඒකාධිකාරයක් හැදිලා තිබෙනවා. දැන් අපි ගමේ කඩේට ගියාට, අපට ගමේ හාල් ගන්න නැහැ. අපිට තිබෙන්නේ හාල් පැකට් එකක් ගෙනයන්නයි. ඔවුන් මහා සහල් පරිමාණයෙන් එකතු කරනවා; ගබඩා කරනවා. ගබඩා කරලා කල් තබා ගන්න බෙහෙත් ගහනවා. ඊළඟට, පැකට් කරනවා. පැකට් කරලා ඒක කල් තබා ගන්න ඒකටත් බෙහෙත් ගහනවා. ඊට පසුව ඒවා ගබඩා කරලා තබා ගන්නවා, මිල වැඩි වෙනකම්. ඉතින් අර ගොවියා යොදවන කෘෂි රසායන ද්‍රව්‍යවලට වඩා විශාල ප්‍රමාණයක කෘෂි රසායන මේවාට එකතු වෙනවා. අපි කථා කරනවා, වස විසෙන් තොර ආහාර දෙන්න. නමුත් අපට ඒකට හැකියාවක් ලැබිලා නැහැ. රජයට එය කළමනාකරණය කිරීමේ හැකියාවක් නැහැ. අද කුඩා හාල් මෝල් ඔක්කෝම වැසී ගිහිල්ලා. ඉතින් කොහොමද කර්මාන්ත සංවර්ධනයක් වෙන්නේ? ඉස්සර ගමේ කඩේට ගියාම ගෝණිවල දමා විවිධ හාල් වර්ග තිබුණා. අද අපට ඒවා දකින්න නැහැ. මේක තමයි හාල්වල තත්ත්වය.

කිරි ගත්තොත්, ඒකත් එහෙමයි. ඉස්සර ගමේ කිරිකාරයෙක් හිටියා. මට මතකයි, මම මේ රටේ කිරි නිෂ්පාදකයන් 10,000ක් ගෙන්වා, ඒ අයට අවශ්‍ය හරක් ටික ගෙනැල්ලා දුන්නා. ගරු කථානායකතුමනි, ඔයාමඩුවේ අක්කර 12,000ක් තිබෙනවා. මේක කෘෂිකාර්මික රටක්. කල්පනා කරලා බලන්න. අපි මේ සියලු වගා බිම් -අඩු ගණනේ රජයට අයිති වගා බිම් ටිකවත්- ආරක්ෂා කරගන්න ඕනෑ. මේවා කෑලි කඩන එක, මේවා විකුණන එක නොවෙයි කරන්න ඕනෑ. මේවායේ තිබෙන්නේ කණාටු පොල් ගස් වෙන්න පුළුවන්. ඔයාමඩුව farm එකේ බැටළුවෝ 1,000ක් විතර ඉන්නවා. ඉරානයෙන් ණයට ඕනෑ තරම් බැටළුවෝ ගෙනෙන්න පුළුවන්කම තිබුණා. මම කථා කළා, බැටළුවෝ ලක්ෂයක් ගෙනෙන්න. අපි බැටළු මස් පිට රටින් ගෙනෙනවා. ඉරාන තානාපතිතුමා එක්ක කථා කරලා මස් ගෙනෙන එක නැවැත්වූවාම, ඕස්ට්‍රේලියාවේ තානාපතිතුමා ආවා මා හමු වෙන්න. ඇවිල්ලා මේ ව්‍යාපාරය ප්‍රවර්ධනය කරන්න එතුමා කථා කළා. කෝ, අපේ රටේ තානාපතිලා? ඒ අය මොකද කරන්නේ? කෝ, අපේ රටේ තානාපතිවරු?

ගරු කථානායකතුමනි, ඊළඟට, කිරිපිටි ගැන මම කියන්නට ඕනෑ, ඉන්දියාවේ තිබෙන නවසීලන්ත තානාපති කාර්යාලයේ නිලධාරින් අප හමුවන්නට පැමිණෙන බව. වස විසෙන් තොර ආහාර දෙන්න රජයේ මැදිහත්වීම අවශ්‍යයි. අපේ ගම්මිරිස් ටිකට මොකද වුණේ? ලෝකයේ හොඳම ගම්මිරිස් තිබෙන්නේ බිබිලේ. අපේ දොඩම් ගෙඩියට විනාශය ළං වුණා. අද ලෝකයේ කරන නිෂ්පාදනය වැඩි වුණත්, ඒ නිෂ්පාදන එක්ක අපට තරග කරන්න පුළුවන්. මොකද, අපේ නිෂ්පාදනයේ සුවිශේෂී ගුණයක්, රසයක් තිබෙන නිසා. ඒ වාගේම ඒවායේ ඉහළ ගුණාත්මකභාවයක් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ගරු කථානායකතුමනි, අපේ දේවලට විශේෂ ඉල්ලුමක්, විශේෂ මිලක් ලැබෙනවා. නමුත් අපි මොකද කරන්නේ? ප්‍රතිඅපනයනය කියලා පිට රටින් තොග ගණන් - bulk - ගෙනැල්ලා, අපේ ඒවාට කලවම් කරලා සල්ලි හම්බ කරනවා. එහෙම කරලා අර අහිංසක ගොවියාට ලැබෙන්න තිබුණු ආදායම, ලොකු ව්‍යාපාරිකයන් ලබා ගන්නවා.

ගරු කථානායකතුමනි, කරවල නිෂ්පාදනය අරගෙන බලන්න. අද කරවල නිෂ්පාදකයන් 3,000ක් අමාරුවේ වැටිලා ඉන්නවා. මම ධීවර ඇමතිවරයා හැටියට කටයුතු කරද්දී කිව්වා, කට්ට කරවල නිෂ්පාදනය කරන මාළුවල බද්ද අඩු කරන්න කියලා. මොකද, පිට රටින් ගෙනෙන කරවල හදන්නේ ඇසිඩ් දමලා. මේ රටේ දුප්පත් මිනිස්සු වැඩිපුර කන්නේ කරවල. අපේ ගම්වල මතයක් තිබෙනවා, කිරිදෙන අම්මලාට මෝර කරවල දුන්නාම කිරි එරෙනවා කියලා. නමුත් මෝර කරවලවල සම්පූර්ණයෙන් තිබෙන්නේ ඇසිඩ්. ඒවා සුදු පාටයි; තනිකර සුදු පාටයි. ඇසිඩ් දමලා වේලන්නේ. ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත වේලාව අවසන් වී ගෙන එනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
දිවා ආහාරයට පසුවත් මට වේලාව තිබෙනවාද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ. ඔබතුමාට විනාඩි දහයයි දුන්නේ. ඔබතුමා එයින් විනාඩි නවයක් කථා කරලා තිබෙනවා. තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
හොඳයි, ගරු කථානායකතුමනි.

දැන් අනාගත ජනාධිපති අපේක්ෂකයන් ගැන කථා කරනවා. මොන අපේක්ෂකයා ආවත් කමක් නැහැ.

අපේ කරවල නිෂ්පාදකයෝ කරවල ටික අපේ රටේ නිෂ්පාදනය කරනවා. අපේ සෞඛ්‍ය පරීක්ෂකවරයා ඒවා බලන්න යනවා. ඒවායේ යම් ප්‍රමිතියක් තිබෙනවා. නමුත්, ඒවා ගැන Customs එක කියන්නේ මොකක්ද? ඒ අය කියනවා මේකට කේත අංක නැහැ කියලා. කේත අංක දෙන එක මහා ලොකු වැඩක්ද? මේ රටේ ජනතාවගේ නිෂ්පාදනවලට නියමිත මිලක් ලබා දෙන්නේ නැතිව ග්‍රාමීය ආර්ථිකය දියුණු කරන්න අපට පුළුවන්කමක් නැහැ. ආනයනය සහ අපනයනය පිළිබඳ මහා ලොකු වැඩ කරන්න අවශ්‍ය නැහැ. අපට කරන්න තිබෙන හොඳම දේ, "සිය රට දේ - සිරි සැප දේ" කියලා අපේ දේ රැකගෙන ඉස්සරහට යන එකයි.

ගරු කථානායකතුමනි. ඉදිරියේ දී එන ජනාධිපතිවරණයේදී මා නම් සහය දෙන්නේ ග්‍රාමීය ආර්ථිකය නඟා සිටුවීම වෙනුවෙන්, දේශීය නිෂ්පාදකයාගේ ප්‍රශ්න වෙනුවෙන් විසඳුම් සහිත සැබෑ ලියවිල්ලක් තිබෙන, ඒ ලියවිල්ල ඉදිරිපත් කරන අපේක්ෂකයාටයි. ගරු කථානායකතුමනි, ජනාධිපතිවරණය සම්බන්ධයෙන් කතා කරද්දී ඔබතුමාගේ නමත් කියැවෙනවා. ඒකයි මා ඒ කාරණය කිව්වේ. එහෙම නම් අවසරයි!

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. දිවා භෝජනය සඳහා ප.ව. 1.30 දක්වා සභාවේ කටයුතු අත්හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.30ට නැවත පවත්වන ලදී.***
*அதன்படி, அமர்வு பி.ப. 1.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று.*
*Sitting accordingly suspended till 1.30 p.m. and then resumed.*

**සහකාර මහ ලේකම්**
(உதவிச் செயலாளர் நாயகம்)
(Assistant Secretary-General)
කරුණාකර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මන්ත්‍රීවරයකුගේ නමක් යෝජනා කරන්න.

**ගරු තේනුක විදානගමගේ මහතා**
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)
"ගරු මයන්ත දිසානායක මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, மாண்புமிகு மயந்த திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. MAYANTHA DISSANAYAKE *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමා.

[பி.ப. 1.31]

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சட்டத்தின்கீழான கட்டளைகள் தொடர்பான விவாதத்திலே கலந்துகொண்டு, மிக முக்கியமான ஒரு விடயத்தை நான் பதிவுசெய்ய விரும்புகின்றேன்.

தமிழர்களுடைய வரலாற்றிலே, வருடாந்தம் நடைபெறுகின்ற யாழ்ப்பாண நல்லூர் கந்தசுவாமி கோவில் திருவிழா என்பது, அவர்களுடைய ஒரு கலாசார அடையாளமாகவும் அவர்களுடைய வாழ்க்கையினுடைய ஒரு பெரிய விருப்பத்துக்குரிய நிகழ்வாகவும் தமிழர்கள் எல்லாம் ஒன்றுகூடுகின்ற பெருவிழாவாகவும் காணப்படுகின்றது. இந்த நல்லூர் ஆலயத்தினுடைய திருவிழாக் கால வரலாற்றில், யாராவது ஆலயத்துக்குள் செல்கின்றவர்களை உடலியல் ரீதியாகப் பரிசோதனை செய்து அனுப்பிய சம்பவங்கள் இதுவரை இடம்பெறவில்லை. ஆனால், இம்முறை நல்லூர் திருவிழா ஆரம்பிக்கப்பட்ட நாளிலிருந்து இன்றுவரை அங்கு செல்கின்ற பக்தர்கள், தங்களுடைய கலாசாரத்தை அடையாளமாக மையப்படுத்திச் செல்கின்ற தமிழர்கள், அங்கு சுதந்திரமாகச் செல்ல முடியாதவாறு இராணுவத்தினரால் பலவிதமான கெடுபிடிகளுக்கும் சோதனைகளுக்கும் உள்ளாக்கப்படுகிறார்கள்.

நல்லூர் கந்தசுவாமி ஆலயம் என்பது, காலணிகளோடு - சப்பாத்துக்களுடனோ, செருப்புக்களுடனோ - செல்லுகிற இடமல்ல. அந்த இடம் மிகப் புனிதமானது. மிகவும் விருப்பத்துக்குரியதாகவும் புனிதத்துக்குரியதாகவும் பேணப்படுகின்ற ஓர் இடத்திலே, இன்று சப்பாத்துக் கால்களோடும் துப்பாக்கிகளோடும் சீருடை தரித்த இராணுவத்தினர், எல்லாத் திசைகளிலிருந்தும் அங்கு செல்கின்ற மக்களைப் பரிசோதித்தலானது, அம்மக்களுக்கு ஓர் அபரிமிதமான அசௌகரியத்தை ஏற்படுத்தியிருக்கிறது. வரலாற்றில் இல்லாத ஒரு வேலையை இப்பொழுது இந்த நாட்டினுடைய இராணுவம் செய்கிறது என்பது ஏற்றுக்கொள்ள முடியாத ஒரு விடயமாகும். இவ்வாறு இராணுவத்தைச் சோதனை நடவடிக்கைகளில் ஈடுபடுமாறு ஆலய நிர்வாகமும் கேட்கவில்லை; யாழ்ப்பாண மாநகர சபையும் கேட்கவில்லை; நாங்கள் யாருமே அவ்வாறு கேட்கவில்லை. "இந்த நாட்டிலே வன்முறைகள் எல்லாம் ஒழிக்கப்பட்டுவிட்டன; இனிமேல் சஹ்ரானுடைய நடவடிக்கைகள் எதுவுமே நடைபெறாது; ISIS இனுடைய செயற்பாடுகள் எதுவும் இங்கு இல்லை; தேசிய தௌஹீத் ஜமாஅத் இயக்கம் என்பதே இல்லாமல் போய்விட்டது" என்று இங்கு பாதுகாப்பு இராஜாங்க அமைச்சர் உட்பட பல அமைச்சர்கள், அதனைவிடப் பல பாராளுமன்ற உறுப்பினர்கள் தங்களுடைய வாய்கிழியக் கத்துகிறார்கள். தென்னிலங்கையிலே அவ்வாறான எந்தக் கெடுபிடிகளும் இல்லை. சோதனைச் சாவடிகளும் இல்லை; சோதனை நடவடிக்கைகளும் இல்லை; பாடசாலைகளிலே இராணுவமும் இல்லை. ஆனால், வடக்கு மாகாணத்திலே இவ்வாறான கெடுபிடிகள் தொடரும் நிலையே காணப்படுகின்றது. இது ஏன்? என்ற ஒரு கேள்வி தமிழர்கள் மத்தியில் எழுந்திருக்கின்றது.

மிக முக்கியமாக, யாழ்ப்பாண நல்லூர் என்பது தமிழர்களுடைய ஆன்மாவோடு ஒன்றிணைந்த கலாசார அடையாளம் கொண்ட ஓர் இடமாகும். ஆனால், யாழ்ப்பாண நல்லூரில் திட்டமிட்ட முறையில் கலாசாரச் சீரழிவை ஏற்படுத்தும் வகையில் இராணுவத்தினர் செயற்படுகின்றார்கள். எனவே, இதனை உடனடியாக நிறுத்த வேண்டுமென்பதை நான் இந்த உயர் சபையினூடாக முன்வைக்கிறேன். இந்த நாட்டினுடைய அதிஉச்ச அதிகாரங்களைக்கொண்ட மேதகு ஜனாதிபதி அவர்களிடமும் இந்த நாட்டினுடைய பிரதமர் அவர்களிடமும் இந்தப் பாராளுமன்றத்தின் சபாநாயகர் உட்பட சம்பந்தப்பட்ட பாதுகாப்பு இராஜாங்க அமைச்சரிடம்கூட நான் இந்தக் கோரிக்கையினை முன்வைக்க விரும்புகிறேன். இந்த நாட்டிலே தமிழர்களுடைய பாரம்பரியமான, கலாசார அடையாளமிக்க அந்த இடத்தை உதாசீனம் செய்யாமல், அதனுடைய புனிதத் தன்மையைக் கெடுக்காமல் முதலிலே இராணுவம் அந்த இடங்களைவிட்டு வெளியேறி, புறம்பான இடங்களில் தங்களுடைய சோதனை நடவடிக்கைகளை மேற்கொள்ளலாம். ஆலயத்திற்குப் போவதற்கு பல நுழைவாயில்கள் -பல வீதிகள் உள்ளன. அந்த வீதிகளில் ஏதோவோர் இடத்தில் சோதனை நடவடிக்கைகளை செய்துகொண்டால் போதுமானது. ஆனால், அவர்கள் ஆலயத்தைச் சுற்றியுள்ள இடத்திற்குள்ளேயே அதிலும் தங்களுடைய உடலில் மேலங்கி இல்லாமல் வேட்டியோடு செல்கின்ற பக்தர்களை மிக மோசமான முறையிலே சோதனை செய்கின்ற பல படங்கள் இன்று இணையத்தளங்களிலும் சமூக வலைத்தளங்களிலும் மிகக் கூடியளவிலே பரவிக் கொண்டிருக்கின்றன. ஒரு குழந்தையோடு சென்ற தந்தையைக்கூட, அந்தக் குழந்தை பார்த்துப் பயப்படுகின்ற அளவுக்கு சோதனை நடைபெறுகிறதென்றால், இது இந்த நாட்டுக்கு தேவையானதொன்றாக நாங்கள் கருதவில்லை.

இன்று வடக்கிலே குண்டுகள் வெடிக்கவுமில்லை; இவ்வாறான வன்முறைகளும் இல்லை. 2009ஆம் ஆண்டுக்குப் பிறகு அங்கே எந்தவிதமான குண்டுச் சத்தங்களும் கேட்கவில்லை. அவ்வாறான ஒரு சூழலிலே ஏன் இராணுவத்தினர் இவ்வாறான நடவடிக்கையை மேற்கொள்கின்றார்கள் என்பதைத் தயவுசெய்து முதலிலே இந்த நாட்டினுடைய அதிஉச்ச அதிகாரத்தைக் கொண்ட பாதுகாப்பு அமைச்சரான மேதகு ஜனாதிபதி அவர்களும் பாதுகாப்பு இராஜாங்க அமைச்சராகிய நீங்களும் கவனத்திலேயெடுத்து, உடன் நடவடிக்கையாக இராணுவத்தினரை தமிழர்களுடைய கலாசார வலையமான நல்லூர் பிரதேசத்திற்குள்ளிருந்து வெளியேற்ற வேண்டுமென்பதை நாங்கள் இந்த இடத்திலே பகிரங்கமாக முன்வைக்கிறோம். இது தமிழர்களுடைய அடையாளத்தை, வாழ்வியலை, தொன்மையைச் சீரழிக்கும் வகையிலே இந்த நாட்டினுடைய படைகள் நடந்து கொள்வதாகவே அமைந்திருக்கின்றதென்பதையும் நான் இந்த இடத்திலே பதிவு செய்ய விரும்புகிறேன்.

நேற்றைய தினம், 23 வருடங்களுக்கு முன்னர் - 1996ஆம் ஆண்டு செம்மணியிலே படுகொலை செய்யப்பட்ட கிருஷாந்தியுடைய நினைவு நாளாகும். இந்த நாட்டிலே

பல்வேறுபட்ட படுகொலைகள் நடைபெற்றன. சந்திரிகா அம்மையார் அவர்கள் இந்த நாட்டின் ஜனாதிபதியாக இருந்தபொழுது - ஒரு பெண்ணே இந்த நாட்டின் தலைவராக இருந்தபொழுது - கிருஷாந்தி அவர்கள் மிக மோசமான முறையிலே படுகொலை செய்யப்பட்டார். அவர் மட்டுமல்ல, அவருடைய உறவினர்கள் உட்படப் பலர் செம்மணியிலே தாக்கப்பட்டுக் கொலை செய்யப்பட்டார்கள். இவ்வாறான சம்பவங்கள் இந்த நாட்டிலே நடைபெற்றும் இன்னும் அவர்களுடைய உறவினர்களுக்கான நியாயமான தீர்ப்புக்கள் சரியாக வழங்கப்படவில்லை. கிருசாந்தியினுடைய கொலையைத் தொடர்ந்துதான் யாழ்ப்பாணத்திலே 3,000க்கும் மேற்பட்ட இளைஞர், யுவதிகள் கொலை செய்யப்பட்டு, புதைக்கப்பட்ட விபரங்கள்கூட வெளிவந்தன. ஆனால், இன்னும் அதற்கான நீதி கிடைக்கவில்லை.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டிலே நடந்து முடிந்த பல்வேறுபட்ட இனப்படுகொலைகள் - தமிழர்கள்மீதான கொலைகள் நிறுத்தப்படவுமில்லை; அதற்கான முடிவுகள் எட்டப்படவுமில்லை. நேற்றைய தினம் இந்த நாட்டிலே வலிந்து காணாமல் ஆக்கப்பட்டவர்களின் உறவினர்கள் நடாத்திய போராட்டம் 900ஆவது நாளை எட்டியது. 901ஆவது நாளான இன்றும் அவர்கள் வலிந்து காணாமல் ஆக்கப்பட்ட தங்களுடைய உறவுகளைத் தேடிக் கொண்டிருக்கிறார்கள். இந்த அரசியல் கைதிகளின் விடுதலை சம்பந்தமாக அரசாங்கம் இன்னும் அசமந்தமான போக்கையே கடைப்பிடித்து வருகின்றது. எந்த நீதியையும் வழங்குவதற்கு இந்த அரசாங்கம் தயாரில்லை. OMP என்கிற அலுவலகம் உருவாக்கப்பட்டிருந்தாலும்கூட, அது செயலிழந்து போயிருக்கின்றது. அதாவது, காணாமல் ஆக்கப்பட் டவர்களைத் தேடிக் கண்டறிவதற்கான அலுவலகம் தன்னுடைய இயலுமையை இழந்திருக்கின்றது. இந்த நிலைகள் மாற்றப்பட்டு, நீதி கிடைக்க வேண்டுமென்பதை நாங்கள் இந்த இடத்திலே வலியுறுத்துகின்றோம்.

இறுதியாக இந்த நல்லூர் கந்தசுவாமி கோவிலைச் சுற்றி நடைபெறுகின்ற இராணுவக் கெடுபிடிகளை, இராணுவ ஆதிக்கங்களை உடன் நிறுத்தி, அந்த மக்கள் நிம்மதியாக வணங்குகின்ற அந்தக் கலாசாரச் சூழலை, இயல்பு நிலையைக் கொண்டுவருமாறு இந்த இடத்திலே மிக மிக முக்கியமாக மீண்டும் வலியுறுத்திக் கேட்டு, நிறைவுசெய்கிறேன். நன்றி.

[பி.ப. 1.38]

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා (වරාය හා නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அப்துல்லா மஹரூப் - துறைமுகங்கள், கப்பற்றுறைப் பிரதி அமைச்சர்)
(The Hon. Abdullah Mahrooff - Deputy Minister of Ports and Shipping)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று அபிவிருத்தி உபாய முறைமைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சினூடாக இங்கு சமர்ப்பிக்கப்பட்டிருக்கின்ற கட்டளைகள் தொடர்பாகப் பேசுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்காக நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இந்தக் கட்டளைகள்மீதான விவாதத்தை ஆரம்பிப்பதற்கு முன்னர் நான் ஒரு விடயத்தைக் குறிப்பிட வேண்டும். அதாவது, அண்மையில் இந்த நாட்டிலே இடம்பெற்ற சில நிகழ்வுகள் மற்றும் இந்த நாட்டில் ஆயிரம் வருடங்களுக்கு மேலாக வாழ்ந்து வருகின்ற இந்த நாட்டு முஸ்லிம்கள்மீது சுமத்தப்படுகின்ற குற்றச்சாட்டுக்கள், இந்த அமைச்சினுடைய செயற்பாடுகளைப் பாழாக்கக்கூடிய விதத்தில் சர்வதேசத் தினுடைய பார்வையைத் திரும்பியிருக்கின்றது. அதாவது, நேற்று இங்கு பேசிய கௌரவ உறுப்பினர்கள் பலர் ஒரு தனியார் பல்கலைக்கழகத்திற்கும் ஒரு foundation க்கும் இடையிலான முரண்பாடுகளை வெவ்வேறாகப் போசாமல் ஒன்றுடன் ஒன்றை இணைத்துப் பேசி, இந்த நாட்டு மக்களுக்கு ஒரு பிழையான செய்தியைக் கூற முனைந்ததை நீங்கள் அறிவீர்கள். ஆனால், உரியவர்கள் குறித்த பல்கலைக் கழகத்திற்கான அனுமதியைப் முறையாகப் பெற்றுள்ளார்கள். அவர்கள் அதற்கான ஆவணங்களை வெளிப்படுத்திய பின்னரும்கூட ஒரு சமூகத்தின்மீது பழியைச் சுமத்துவதற்காக இவ்வாறு எடுக்கப்பட்ட முயற்சிகள் இந்த அமைச்சினது அனைத்துச் செயற்பாடுகளையும் சர்வதேசத்தின் மத்தியில் பாழாக்கப் போகின்ற சந்தர்ப்பத்தை ஏற்படுத்தியிருக்கின்றது.

எங்களுடைய ஏற்றுமதி, இறக்குமதி நாங்கள் வெளிநாடுகளிலிருந்து தருவிக்கப்படுகின்ற மூலப் பொருட்களில் தங்கியிருப்பதை யாரும் மறந்துவிட முடியாது. இந்த நாட்டின் ஏற்றுமதியை ஊக்குவிப்பதிலும் இந்த நாட்டினுடைய பொருளாதார அபிவிருத்தியிலும் நேரடிப் பங்களிப்பைச் செய்கின்ற அரபு நாடுகள் மற்றும் இஸ்லாமிய நாடுகள் தொடர்பாக இங்கு முன்னுக்குப்பின் முரணாக வகையில் பேசப்படுகின்றமை குறித்து நான் சில தெளிவான கருத்துக்களைச் சொல்ல விரும்புகின்றேன். முஸ்லிம் என்பது, இஸ்லாம் மார்க்கம் என்பது, தௌஹீத் என்பது, வஹாபிசம் என்பது இஸ்லாமிய ஷரியா அடிப்படையிலே பார்க்கப்பட வேண்டியது. எப்படி பௌத்த மக்களுக்கு பௌத்த பிக்குமார் முன்னெடுக்கின்ற நடவடிக்கைகள் 'பாளி' பாஷையில் கொண்டுசெல்லப்படுகின்றதோ அல்லது தமிழ் இந்து மக்களுக்கான வணக்க வழிபாடுகள் எப்படி சமஸ்கிருத மொழியிலே முன்னெடுத்துச் செல்லப்படுகின்றதோ அதேபோன்று, முஸ்லிம்களின் மத நடவடிக்கைகள் அத்தனையும் அரபு பாஷையினை அடிப்படையாகக் கொண்டவையாகும். நாங்கள் அன்றாடம் இறைவனை வணங்குகின்ற ஐவேளைத் தொழுகை மற்றும் தொழுகைகளை எல்லா விடயங்களும் அரபு பாஷையிலேயே மேற்கொள்ளப்பட வேண்டும் என்பதை மறந்துவிடக்கூடாது. முஸ்லிம்கள் இந்த உலகத்திலே குர்ஆனை அடிப்படையாகக் கொண்டும் இறைவனின் தூதுவருடைய வழிகாட்டலின் அடிப்படையிலும் வாழ்கின்றவர்கள். முஸ்லிம்களாகிய நாங்கள் இந்த மண்ணிலே 1000 வருடங்களாக வாழ்ந்து வருகின்றோம். எந்த பௌத்த மகனுக்கோ அல்லது எந்த இந்து மகனுக்கோ அல்லது எந்த கிறிஸ்தவ மகனுக்கோ அபகீர்த்தியை ஏற்படுத்துகின்ற வகையிலே நாங்கள் செயற்படவில்லை.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක කරුණක් නිවැරැදි කරන්න ඕනෑ. කුරානය තිබෙන්නේ අරාබි භාෂාවෙන් තමයි. ගරු මන්ත්‍රීතුමනි, ඒ අරාබි අකුරු තමුන්නාන්සේලා ආගමික කටයුතු සඳහා පාවිච්චි කරනවා. බෞද්ධ දර්ශනය, බෞද්ධාගම ලියැවිලා තිබෙන්නේ පාලි භාෂාවෙන්. පාලි භාෂාව භාවිත කරන්නේ සිංහල අකුරුවලින්. එම නිසා සිංහල අකුරුවලින් තමයි පාලි භාෂාව භාවිත වෙන්නේ. ඒ නිවැරැදි කිරීම කර ගන්න කියා ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක point of Order එකක් නොවෙයි.

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)

நான் சொல்லுகின்ற விடயம் என்னவென்றால், குர்ஆன் என்பது இறை வாக்கியமாகும். அது இறைசொல்! அது மனிதனால் தயாரிக்கப்பட்டதல்ல. குர்ஆனிலே சொல்லப் பட்டிருக்கின்ற இறைசொல்லை அரபு பாஷையிலே சொல்லித்தான் ஐவேளைத் தொழுகையையும் ஏனைய தொழுகைகளையும் தொழ வேண்டும். தொழுகையின்போது அதற்குரிய வாக்கியங்களை வேற்று மொழியிலே மொழிய முடியாது. நாங்கள் தமிழ்ப் பிரதேசங்களிலே தமிழைப் பேசுகின்றோம்; சிங்களப் பிரதேசங்களிலே சிங்களத்தைப் பேசுகின்றோம்; உருது பேசுகின்ற பிரதேசங்களிலே உருதைப் பேசுகின்றோம். ஆனால், அரபு மொழி தவிர்ந்த எந்த மொழியை உச்சரித்தும் தொழுகைகளை நாங்கள் நிறைவேற்ற முடியாது. நாங்கள் இறைவனைத் தொழுவது அரபு பாஷையிலாகும். அரபு மொழியலான வாக்கியங்களைத்தான் தொழுகையில் ஓத வேண்டும் என்பது கட்டாயமாகும். இதனைப் படிப்பதற்குத்தான் மதரஸாக்கள் இருக்கின்றன. மேலும் சமாதானம், ஐக்கியம், பொறுமை, தியாகம் மற்ற சமூகத்தோடு புரிந்துணர்வோடு வாழ்கின்ற முறை எப்படி என்பது பற்றி எல்லாம் அங்கு போதிக்கப்படுகின்றது. ஆனால், அங்கு பயங்கரவாதம் போதிக்கப்படுவதில்லை. இந்த நாட்டிலே ஆயிரம் வருடங்களாகப் பல மதரஸாக்கள் செயற்பட்டு வந்திருக்கின்றன. இஸ்லாத்திலே அடிப் படைவாதம் இருக்கமுடியாது. இஸ்லாத்தில் அடிப்படைவாதம் என்று ஒன்று இல்லை. தீவிரவாதமென்பதை இஸ்லாத்துக்குள் புகுத்த முடியாது.

அண்மைய குண்டுவெடிப்புடன் சம்பந்தப்பட்ட சஹ்ரான் என்பவன் ஒரு மௌலவி அல்ல; குர்ஆனை ஓதி முடித்தவனும் அல்ல. ஆனால், ஒரு பயங்கரவாதி! அந்தப் பயங்கரவாதி சர்வதேசத்தினுடைய நிகழ்ச்சித்திட்டத்திற்கமைய, அவர் களுடைய வழிகாட்டலிலே செயற்பட்டவன். குறித்த சம்பவம் நடைபெற்று 10 நாட்களுக்குள்ளே குறித்த பயங்கரவாதிகளை எங்களுடைய சமூகம் அரச அதிகாரிகளுக்குக் காட்டிக் கொடுத்திருக்கின்றது; அந்தப் பயங்கரவாதிகளை முற்றாக அழிப்பதற்குத் துணை புரிந்திருக்கின்றது. அப்படியானால் எமது சமூகத்திலிருந்து யாராவது இந்தப் பயங்கரவாத நடவடிக்கைகளில் இறங்கியிருப்பார்களா? என்பதைப்பற்றிச் சிந்திக்க வேண்டும். இந்த நாட்டில் பயங்கரவாதம் தோன்றியபோதெல்லாம் அந்தப் பயங்கரவாதத்தை அழிப்பதற்கு இந்த நாட்டிலிருந்த அரசர்களுக்கு, மாறி மாறி ஆட்சி செய்த அரசாங்கங்களுக்கு எங்களுடைய சமூகம் உறுதுணையாக இருந்திருக்கின்றது.

இன்று இந்த நாட்டுக்கு எங்கிருந்து நாங்கள் crude oil ஐத் தருவிக்கின்றோம். ஈரானிலே, சவூதி அரேபியாவிலே மற்றும் அராபு நாடுகளிலே இருந்துதான் தருவிக்கின்றோம். ஆனால், நேற்று இங்கு பேசிய மதகுரு கூறுகின்றார், சர்வதேச இஸ்லாமிய நாடுகள் அத்தனையும் பயங்கரவாதத்தை உருவாக்குவதாக. அதுமட்டுமல்ல, சஹ்ரான் என்கின்ற பயங்கரவாதி 56 ஆயிரத்துக்கும் மேற்பட்ட பயங்கரவாதிகளை உருவாக்கியிருக்கின்றார் என்று கூறினால், 10 இலட்சம் முஸ்லிம்களையாவது இன்று விசாரணை என்ற போர்வையிலே கைது செய்து துன்புறுத்த வேண்டும். இந்த நிலைமையைத்தான் இவர்கள் ஏற்படுத்த முனைகின்றார்கள். இவ்வாறான நிலைமையை ஏற்படுத்துவதன்மூலம் வரப்போகின்ற தேர்தல்களிலே தங்களுடைய ஆதிக்கத்தைச் செலுத்த முடியும் என்று சில இனவாதிகள் சிந்திக்கின்றார்கள். ஆனால், இந்த நாட்டிலே பேசப்படுகின்ற ஒவ்வொரு சொல்லையும் பல நூற்றுக்கணக்கான அந்நிய நாட்டு அவதானிகள், தூதுவர்கள் அவதானித்துக் கொண்டிருக் கிறார்கள். நீங்கள் இந்த நாட்டினுடைய சிறுபான் மையினருக்குப் பாதுகாப்பாக இருக்க வேண்டும். இல்லாவிட்டால், எதிர்காலத்திலே இந்த நாட்டுக்குக் கிடைக்கக்கூடிய அத்தனை உதவிகளும் தடுக்கப்பட்டு, எங்களுடைய நாட்டின் பொருளாதாரம் சீரழிந்துவிடும்.

நீங்கள் ஒன்றைப் புரிந்துகொள்ள வேண்டும். முஸ்லிம் சமூகம் இந்த நாட்டினுடைய ஜனநாயகத்தைப் பாதுகாத்திருக்கின்றது. 52 நாட்கள் ஏற்படுத்தப்பட்ட ஆட்சிமாற்றத்தின்போது இந்த நாட்டினுடைய முஸ்லிம்கள் இந்த நாட்டின் சட்டத்தை, ஒழுங்கைப் பாதுகாத்ததன் காரணமாகத்தான் உச்ச நீதிமன்றமும் எங்களுடைய முடிவுக்கு ஆதரவாகத் தீர்ப்பளித்தது; இந்த நாட்டில் அமைதி ஏற்பட்டது; ஜனநாயகம் மீண்டும் மிளிரச் செய்யப்பட்டது. இனி வரப்போகின்ற தேர்தல்களில் எந்தத் தேர்தலும் ஜனாதிபதித் தேர்தலுக்கு முன்னர் வரப்போவதில்லை. இந்த நாட்டைச் சீர்மைப்படுத்தக்கூடிய, இந்த நாட்டைக் கொண்டு செல்லக்கூடிய ஒரு ஜனாதிபதியைத் தெரிவு செய்வதற்கு பெரும்பான்மை சமூகத்தினுடைய வாக்குகள் மட்டும் போதாது. இந்த நாட்டினுடைய தமிழ், முஸ்லிம், மலையக மக்களினதும் வாக்குகள் மிக முக்கியமானது. அவ்வாறெனில் சம்பந்தப்பட்டவர்கள் இந்த மக்களுடைய நம்பிக்கையைப் பெற வேண்டும்; இந்த மேலான சபையிலே இனத் துவேஷங்களைப் பேசுவதை விட்டுவிட்டு இல்லாத, பொல்லாத பொய்களைப் பேசுவதைத் தவிர்த்துவிட்டு, சமூகங்களின் உணர்வுகளை மதித்து, எல்லாச் சமூகத்தினதும் அன்பையும் பாசத்தையும் பெறக்கூடிய வகையில் செயற்பட முன்வர வேண்டும். 1947 ஆம் ஆண்டுக்குப் பிறகு ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியும் ஐக்கிய தேசியக் கட்சியும் மாறி மாறி இந்த நாட்டிலே ஆட்சி செய்தபோதெல்லாம் சிறுபான்மைச் சமூகத்தினது புரள்வு ஆட்சி மாற்றத்தை ஏற்படுத் தியிருக்கின்றது.

இன்று துரதிருஷ்டவசமாகக் கிறிஸ்தவ சமயத்தவர்கள் துன்பப்படுகின்ற வகையில் ஒரு நிகழ்ச்சித்திட்டத்தை நிறைவேற்றிய சஹ்ரான் போன்ற பயங்கரவாதிகள் இந்த நாட்டில் மேலும் உருவாகக்கூடாது என்பதில் ஏனைய சமூகத்தைவிட முஸ்லிம் சமூகம் உறுதியாகவுள்ளது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Hon. Deputy Minister, you have only two minutes left.

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)

இன்று எனது கட்சிக்குத் தலைமைதாங்குகின்ற அமைச்சர் றிஸாட் பதியுதீன் அவர்கள்மீது சுமத்தப்பட்ட குற்றச்சாட்டுக்கள் அத்தனையும் பாராளுமன்றத் தெரிகுழு முன்னிலையிலே, இந்த நாட்டினுடைய இராணுவத் தளபதி மகேஷ் சேனநாயக்க அவர்களினாலும் பொலிஸ்மா அதிபரினாலும் நிராகரிக்கப்பட்டதாகச் சொல்லப்பட்டுள்ளது. ஆகவே, கௌரவ அமைச்சர் றிஸாட் பதியுதீன் அவர்கள்மீது இந்த மேலான சபையிலே குற்றஞ்சாட்டுவதை இத்துடனாவது கைவிடவேண்டும். இந்த நாட்டிலே உள்ள ஓர் எழுச்சிமிகு மாவட்டமான திருகோணமலையிலே முஸ்லிம் சமூகத்தைச் சேர்ந்த பல்லாயிரக்கணக்கான மக்கள் கௌரவ அமைச்சர்

றிஸாட் பதியுதீன் அவர்களைக் கடந்த ஐந்து நாட்களுக்கு முன்னர் வரவேற்றார்கள். இவ்வாறு அவர் முஸ்லிம் மக்களால் வரவேற்கப்படுவதை எல்லாம் முஸ்லிம் நாடுகள் அவதானித்துக் கொண்டிருக்கின்றன.

எமது நாடு சர்வதேசத்திலுள்ள எண்ணெய் வளமிக்க நாடுகளின் உதவிகளைப் பெற்று வருகின்றது. அந்த நாடுகளிலிருந்து எங்களுடைய விவசாயிகளுக்கான பசளை போன்ற உற்பத்திப் பொருட்களை நாங்கள் இறக்குமதி செய்கின்றோம். அதேநேரம் நாங்கள் ஏற்றுமதி செய்கின்ற பொருட்களைத் தக்கவைப்பதற்கான மூலப்பொருளை அரபு நாடுகளிலிருந்து பெற்றுக் கொள்கின்றோம். எனவே, இஸ்லாமிய நாடுகளைப் பயங்கரவாத நாடுகளாக அல்லது பயங்கரவாதிகளை உருவாக்குகின்ற நாடுகளாக சிந்திக்கக் கூடாது. இன்று 'வஹாபிசம், வஹாபிசம்' என்று கூறுகின்றீர்கள். சவூதி அரசாங்கம் பஹ்த் மன்னர் காலத்தில் முஹம்மது இப்னு அப்துல் வஹாப் என்பவரின் கொள்கையைத் தன்னுடைய கோட்பாட்டிலே - அரசியல் யாப்பிலே உள்வாங்கியமை அந்த நாடு சம்பந்தப்பட்ட விடயம். அது எங்களுக்குப் பிரச்சினையல்ல.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Deputy Minister, your time is up.

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)
Sir, please give me one more minute.

இந்த நாட்டு முஸ்லிம்களாகிய நாங்கள் பௌத்த சிங்கள மக்களுடன் ஒருங்கிணைந்து வாழ்ந்து, இந்த நாட்டினுடைய ஸ்திரத்தன்மையைப் பலப்படுத்துவதற்கு முயற்சிக்கின்றபோது, அந்த மக்கள் எங்களை அரவணைத்துச் செல்ல வேண்டும் என்ற அன்பான கோரிக்கையை விடுப்பதோடு, இஸ்லாத்தில் பயங்கரவாதம் அல்லது அடிப்படைவாதம் என்று ஒன்றில்லை என்பதையும் கூறிக்கொள்ள விரும்புகின்றேன். குர்ஆன், ஹதீஸ் அடிப்படையில் இறைவனுடைய தூதருடைய வழிகாட்டலின் அடிப்படையில் சமாதானத்தை விரும் புகின்றவர்கள் நாங்கள். ஆயிரம் வருடங்களுக்கு மேலாகத் தமிழ், சிங்கள மக்களோடு ஒன்றிணைந்து வாழ்பவர்கள் நாங்கள். இன்று இந்த நாட்டில் கிறிஸ்தவ சமூகத்துக்கு ஏற்பட்ட துன்ப நிலைக்காக மனவேதனைப்படுகின்றோம். நான்கு வேதங்களுடைய கோட்பாடுகளை ஏற்றுக் கொண்டவர்கள் நாங்கள். அந்த வகையில் யேசுநாதரை, மோசஸ் - மூசா நபியை, ஏபிரகாமை ஏற்றுக்கொண்டவர்கள் நாங்கள். உங்கள் சமூகத்தோடு இணைந்து வாழ்கின்ற எங்களை நீங்கள் அரவணைத்துச் செல்ல வேண்டும்; இந்தச் சபையை அதற்காகப் பயன்படுத்த வேண்டும்.

இறுதியாக, மக்களால் தெரிவு செய்யப்பட்ட தகுந்த தலைவர்கள் இனவாதிகளைப் பின் தள்ளி, உண்மையைக்கூற முற்படுகின்றபோது, அத்தனை ஆட்சி மாற்றத்திலும் எமது சிறுபான்மைச் சமூகத்தினர் உங்களோடு நிச்சயமாகக் கைகோர்த்து நிற்பார்கள் என்ற உண்மையைக் கூறி, ஏற்றுமதி, இறக்குமதிக்குப் பொறுப்பான இந்த அமைச்சின் செயற்பாடுகளுக்கு இந்த நாட்டு முஸ்லிம்களினது ஒத்துழைப்பும் சர்வதேசத்திலுள்ள அரபு நாடுகளின் பங்களிப்பும் மிக அவசியமானது என்பதைத் தெரிவித்து, விடைபெறுகின்றேன். நன்றி.

[අ.භා.1.50]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ ගෙනෙන නියෝග තුනක් පිළිබඳව තමයි අද අප මේ ගරු සභාවේ සාකච්ඡා කරන්නේ. සාමාන්‍යයෙන් මැතිවරණයක් කිට්ටු වන කොට සහ මැතිවරණයෙන් පසු අලුත් ආණ්ඩුවක් බලයට පත් වුණාට පසුව ලංකාව අපනයනය අතින් ඉදිරියට ගෙන යෑම පිළිබඳව විටින් විට සාකච්ඡා කරනවා; අපනයනාභිමුඛ ආර්ථිකයක් - export-oriented economy එකක් - ගොඩ නැඟීම පිළිබඳව ඉතාම විචිත්‍ර, ලස්සන බලාපොරොත්තු මේ රට හමුවේ, ජනතාව හමුවේ තබනවා. නමුත්, අද ලෝකයේ අප වටේ සිටින රටවල්වල අපනයන ආදායම සහ අපගේ අපනයන ආදායම පිළිබඳව සලකා බැලුවාම අප කොතරම් දුරට පසුපසින් ද ඉන්නේ කියන කාරණය ගැන සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරන්න අපට පුළුවන්. අපනයන ක්ෂේත්‍රයේ අපට වඩා බොහෝ පිටුපසින් සිටි රටවල් අද අප පහු කරගෙන ගව් ගාණක් ඉස්සරහට ගිහිල්ලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආසියානු කලාපය 2018 අවුරුද්දේ ඇමෙරිකානු ඩොලර් බිලියන 7,000කට ආසන්න අපනයන ආදායමක් උත්පාදනය කර තිබෙනවා. එයින් තුනෙන් එකක්ම චීනය තමයි උපදවා තිබෙන්නේ. ඒ වාගේම, සිංගප්පූරුව උත්පාදනය කර තිබෙනවා, ඩොලර් බිලියන 412ක අපනයන ආදායමක්. වියට්නාමය අපටත් වඩා දරුණු යුද්ධයකට මුහුණ දීපු රටක්. වියට්නාමය ඩොලර් බිලියන 277ක්, තායිලන්තය ඩොලර් බිලියන 250ක් පමණ, මැලේසියාව ඊට ආසන්න ප්‍රමාණයක් වන ඩොලර් බිලියන 247ක්, අපට ආසන්නයේ තිබෙන ඉන්දියාව ඩොලර් බිලියන 323ක්, දකුණු කොරියාව ඩොලර් බිලියන 605ක් ආදි ලෙස තම තමන්ගේ අපනයන ආදායම් වාර්තා කරනවා. එසේ තිබියදී තමයි අපේ රට අපනයන ක්ෂේත්‍රයේ ඉතාම අඩු ආදායම් ලබන රටක් බවට පත් වෙලා තිබෙන්නේ. ආර්ථික වශයෙන් අපට වඩා පසුගාමීව සිටි රටවල් පසුගිය වසර 5 තුළදී අපනයන ක්ෂේත්‍රයේ බොහෝ වර්ධනයන් අත් පත් කරගෙන තිබෙනවා. දැන් ජනාධිපතිතුමාත් සංචාරය කරන කාම්බෝජය ගත්තොත්, පසුගිය වසර 5 දී අපනයන ක්ෂේත්‍රයේ සියයට 177ක වර්ධනයක් අත් පත් කරගෙන තිබෙනවා. ලාඕසය සියයට 116යි, ඇෆ්ගනිස්ථානය පවා සියයට 90ක වර්ධනයක් අත් පත් කරගෙන තිබෙනවා. වියට්නාමය සියයට 85යි, භූතානය සියයට 74යි, මාලදිවයිනත් අපනයන ක්ෂේත්‍රයේ සියයට 75ක වර්ධන වේගයක් අත් පත් කරගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සංඛ්‍යාලේඛන බැලුවාට පසුව පෙනෙනවා, කියන්න තරම් සැලකිය යුතු වර්ධනයක් පසුගිය කාලය පුරා අපේ රට අත් පත් කරගෙන නැති බව. අපේ රට ඩොලර් බිලියන 88ක දළ ජාතික නිෂ්පාදිතයකට උරුමකම් කියන රටක්. එයින් සාමාන්‍යයෙන් සියයට 18ක් විතර තමයි -ඩොලර් බිලියන 14කට අඩු ප්‍රමාණයක් - අපේ අපනයන ආදායම හැටියට වාර්තා වෙන්නේ. තවමත් අපි වැඩිම ආදායමක් උත්පාදනය කරන්නේ ඇඟලුම් ක්ෂේත්‍රයෙන්. එය අපේ අපනයන ආදායමෙන් සියයට 32ක් ගෙනෙනවා. තේ කර්මාන්තයෙන් ගෙනෙන්නේ අපනයන ආදායමින් සියයට 9යි. වේගයෙන් වර්ධනය කරන්න පුළුවන්, අපේ කුළු බඩු ක්ෂේත්‍රය ගෙනෙන්නේ අපනයන ආදායමින් සියයට 2යි. මෙසේ බැලුවාට පසුව, සැලසුම් සහගතව ගොඩ නැඟිය යුතුව තිබූ අපේ අපනයන ක්ෂේත්‍ර අප වර්ධනය කළා ද කියන ගැටලුව අප හමුවේ තිබෙනවා.

මම ඔබතුමාගේ අවධානයට යොමු කරවන්න කැමැතියි, මේ වන විට සුළු අපනයන භෝග ක්ෂේත්‍රයේ මතු වෙලා තිබෙන ගැටලු කිහිපයක් පිළිබඳව. මේ රටේ කුරුඳු, ගම්මිරිස්, ගොරකා, කරුංකා, කරාබුනැටි ආදී සුළු අපනයන භෝග ආශ්‍රිතව දැන්

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

බරපතළ කඩා වැටීමක් තිබෙනවා. මේවා වගා කරන ගොවියාට සාධාරණ මිලක් ලැබෙන්නේ නැහැ. පසුගිය කාලය පුරාම කුරුඳු කිලෝග්‍රෑම් එකක මිල ගත්තත් සාමාන්‍යයෙන් රුපියල් 1,200න් පහළ මිලක් තමයි වාර්තා වෙලා තිබෙන්නේ. කරුංකා ආදායම කඩාගෙන වැටිලා. මාතර දිස්ත්‍රික්කය, කළුතර දිස්ත්‍රික්කය ගත්තොත් තේ දළු කිලෝග්‍රෑම් එකක මිල රුපියල් 70ගණන්වලට, 80ගණන්වලට සීමා වෙලා තිබෙනවා. ඒ නිසා ගම්මිරිස්, කරුංකා, තේ, ගොරකා ආදී සියලු භෝග ගත්තාම ඒවායින් යැපෙන ගොවියාට බලවත් අසීරු තත්ත්වයක් තමයි ඇවිල්ලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේ කාරණය කෙරෙහිත් මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. අපේ රටේ ගම්මිරිස් නිෂ්පාදනය 2017දී මෙට්‍රික්ටොන් 29,000ක් පමණ වෙනවා. ඒ අවුරුද්දේ මේ ප්‍රමාණය සැලකිය යුතු වර්ධනයක්. අපි අපනයනය කරනවා, මෙට්‍රික්ටොන් 14,000කට ආසන්න ප්‍රමාණයක්. හැබැයි, මේ බොහෝ ක්ෂේත්‍ර දැන් කඩා වැටීමකට ලක් වෙන්න ප්‍රධාන වශයෙන් බලපා තිබෙනවා මෙන්න මේ ප්‍රතිඅපනයන ගැටලුව.

මේ ප්‍රතිඅපනයනය නිසා අපේ ගොවියාට මුහුණ දෙන්න වෙන ප්‍රධාන ප්‍රශ්න දෙකක් තිබෙනවා. අපේ රටේ ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටිවලට අපි විසින් කාලයක් තිස්සේ ලෝක වෙළෙඳ පොළේ උපයා ගත්ත කීර්තියක් තිබුණා. අපේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය පිළිබඳව ලෝක වෙළෙඳ පොළේ වටිනාකමක් තිබුණා. අපේ කුරුඳුවල තිබෙන රසයට, ගම්මිරිස්වල තිබෙන සැරට ලෝක වෙළෙඳ පොළේ විශේෂ වටිනාකමක් තිබුණා. මේ ප්‍රතිඅපනයනය නිසා මතුවන ප්‍රශ්නය තමයි, ඒ රටවලට අපනයන කරන්න තිබෙන අපේ quota එක අඩු වෙන එක. ඒ නිසා අපෙන් යවන ප්‍රමාණය අඩු වෙනවා. අපි bulk එකක් යැව්වාට ඒකේ අපේ ප්‍රමාණය අඩුයි. ඊළඟ ප්‍රශ්නය තමයි, මේවා කලවම්වීම නිසා ඇති වන වෙන ප්‍රශ්නය. මේවායේ brand එක අපේ වුණාට, නම අපේ වුණාට ඒක ඇතුළේ තිබෙන දේවල ගුණාත්මක තත්ත්වය බාලයි. අපි දැන් ප්‍රතිඅපනයනය කරනවා පමණක් නොවෙයි. අපේ රටේ ගොවියා නිෂ්පාදනය කරන ගම්මිරිස් යවනකොට සමහර මිලදී ගන්නන් අහනවා, මේවා ඇත්තටම ලංකාවේ ඒවාද, නැත්නම් වියට්නාමයේ ගම්මිරිස් කොච්චර කලවම් වෙලා තිබෙනවා කියලා. ඔබතුමා ගිහිල්ලා සොයා බැලුවොත් මාතර, මාකඳුර, දෙයියන්දර පැතිවල වෙළෙඳ පොළවල්වල අදටත් වියට්නාමයේ ගම්මිරිස් තිබෙනවා. ඒ නිසා ප්‍රතිඅපනයනය කරනවා කියලා ගෙනැල්ලා සියල්ල ප්‍රතිඅපනයනය කරනවාත් නොවෙයි, කොටසක් මෙහේ ඉතිරි වෙනවා. ඒ ටික අපේ වෙළෙඳ පොළටත් එනවා. එතරම් ප්‍රමාණයකට දැන් ඒක ව්‍යාප්ත වෙලා තිබෙන්නේ. මේ තත්ත්වයට ප්‍රධාන වශයෙන් බලපා තිබෙනවා, පසුගිය කාලයක් පුරා සමහර නිලධාරින් අල්ලාගෙන, සමහර ඇමතිවරු අල්ලාගෙන මේ ජාවාරම කරපු එක. ඔවුන්ට කිසි දඬුවමක් හම්බ වුණේ නැහැ, ඔවුන්ට නීතියක් ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ නිසාම දැන් එක පැත්තකින් ලෝක වෙළෙඳ පොළේ මේ සුළු අපනයන භෝග සඳහා අපට තිබුණු තැන අහිමි වෙලා තිබෙනවා. ඒක අපේ ගොවියාට බලපා තිබෙනවා.

මේ මිල අඩුවෙන්න බලපාලා තිබෙන ප්‍රධාන සාධකයක් තමයි මෙන්න මේ ප්‍රතිඅපනයනය පිළිබඳ ගැටලුව. මම ඔබතුමාගේ අවධානයට යොමු කරවමින් කියා සිටිනවා, ආණ්ඩුවට කරදරයක් නැතිව, ස්වයං රැකියාවක් හැටියට කුරුඳු වගාවේ නිරත වෙන ගොවියාට මේ වෙලාවේ යම් සහනයක් ලබා දීලා ඔවුන් ස්ථාවර කිරීම ආණ්ඩුවේ වගකීමක් බව. එහෙම නැත්නම් මේ වගාව කඩාගෙන වැටිලා, කර්මාන්තය කඩාගෙන වැටිලා ඔවුන් මේ වගාවෙන් අයින් වුණාට පස්සේ අපට එයින් ලැබෙන සොච්චම් ආදායමත් අඩු වෙනවා. අපි දන්නා හැටියට මෙයින් ඩොලර් මිලියන 250ක්වත් උත්පාදනය කරන්නේ නැහැ. නමුත් අපට මීට වඩා දුරකට යන්න පුළුවන්. කුරුඳු ක්ෂේත්‍රයේ ඉන්න අය යෝජනා කරන්නේ, ලෝක වෙළෙඳ පොළේ අපට ප්‍රමාණවත් පංගුවක් අත්පත් කර ගැනීම සඳහා වෙච්ච හොඳ ප්‍රචාරක ව්‍යාපෘතියක්, හොඳ marketing සැලැස්මක් අපේ පැත්තෙන් දියත් කරන්න ඕනෑ කියලායි. අපේ කුරුඳුවල තිබෙන යම් ඖෂධීය ගුණය සහ ගුණාත්මක වටිනාකම අබිබවා ගිහිල්ලා දැන් සමහර විට වියට්නාමයේ, ඉන්දියාවේ තිබෙන බාල කුරුඳු ලෝක වෙළෙඳ පොළේ ලොකු පංගුවක් අත්පත් කරගෙන තිබෙනවා. හැබැයි, අපි අඛණ්ඩව ගලාගෙන යන, අඛණ්ඩව ක්‍රියාත්මක වෙන හොඳ ප්‍රචාරක යාන්ත්‍රණයක් සකස් කළොත්, marketing සැලැස්මක් සකස් කළොත්, අපට තවමත් කුරුඳු ක්ෂේත්‍රයේදී නම් ලෝක වෙළෙඳ පොළේ යම් ප්‍රමාණයක් අත්පත් කර ගන්න පුළුවන්.

ඊළඟ කාරණාව මේකයි. මේ කුරුඳු නිෂ්පාදනය අවුරුද්දේ මාස 12ම ඒකාකාරීව ලැබෙන්නේ නැහැ. ඒ නිසාම සාමාන්‍යයෙන් කුරුඳු නිෂ්පාදනය කරන ගොවියාගේ ඒ නිෂ්පාදනය වෙළෙඳ පොළට එන්නේ එක කාලයක නිසා ඒවායේ මිල අඩු වෙනවා. ආණ්ඩුව මැදිහත් වෙලා මේ කුරුඳු ගබඩා කර ගැනීම සඳහා පහසුකම් සලසන්නට, ඒ නිෂ්පාදන එකතු කරන අයට යම් සහනයක්, ආධාරයක් ලබා දෙන්නට පුළුවන්කමක් තිබෙනවා නම් මිල ස්ථාවරව පවත්වා ගැනීමට එය වැදගත් වෙයි කියලා මම හිතනවා.

තුන්වන කාරණය මේකයි. අක්කරයකට කිලෝ 800ක් පමණ නිෂ්පාදනයක් ගන්න පුළුවන් කියලා කුරුඳු පර්යේෂණ ආයතනයෙන් කිව්වාට සාමාන්‍යයෙන් අපේ ගොවියා කිලෝ 250න්, කිලෝ 300න්, කිලෝ 350න් එහාට යන්නේ නැහැ. ඒ නිසා මේ ඵලදායිතාව වැඩි කර ගන්නේ කොහොමද, ඵලදායිතාව වැඩි කර ගැනීම සඳහා තිබෙන ක්‍රමවේද වගාවට යොදවන්නේ කොහොමද කියන එක පිළිබඳව ක්ෂේත්‍රයේ අත්දැකීම් තිබෙන ගොවියා එක්කත් සාකච්ඡා කරලා යම් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි කියලා අපි යෝජනා කරනවා. ඒක මේ වෙලාවේ තිබෙන විශේෂ අවශ්‍යතාවක්. අපට මේ ඵලදායිතාව -මේ අස්වැන්න- දෙගුණයක් දක්වා වැඩි කර ගන්න පුළුවන් නම්, මේ වෙළෙඳ පොළේ තව පංගුවක් අපට අත්පත් කර ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කලින් කිව්වා වාගේම ප්‍රතිඅපනයනය නතර කිරීම සඳහා වූ විධිමත් සැලැස්මක් ආණ්ඩුවට තිබිය යුතුයි. එහෙම නැත්නම් වෙන්නේ අපේ තිබෙන වෙළෙඳ පොළ සම්පූර්ණයෙන්ම කඩා ගෙන වැටීමයි. මේ ප්‍රශ්නය අපේ ගොවියාට බරපතළ ලෙස පැන නැඟී ඒ ගොවියා අනාථ වෙලා ඉන්න කොට ඔවුන්ට යම් ආධාර ප්‍රමාණයක්, සහනාධාර ප්‍රමාණයක් ලබා දෙන්න කටයුතු කිරීම ආණ්ඩුවක වගකීමක්. ඒ නිසා මම විශේෂයෙන්ම යෝජනා කරන්න කැමතියි, සුළු අපනයන භෝග පිළිබඳව අවධානය යොමු කරලා අපට අපනයන වෙළෙඳ පොළේ අත්පත් කර ගත හැකි පංගුව පිළිබඳ අවධානය යොමු කරන්න කියලා.

ඒ වාගේම, ප්‍රශ්නයක් ආවාට පස්සේ නිකම්ම නිකම් මැදිහත් වෙනවා වෙනුවට ඒ අදාළ ආයතන වසර පුරා ක්‍රියාත්මක වෙමින් අවශ්‍ය වැඩ කටයුතු කළ යුතුයි. අපි මේ සම්බන්ධයෙන් අය වැය යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. නමුත්, අපට පෙනෙන්නේ නැහැ, ඒ සම්බන්ධයෙන් අදාළ ආයතන වසර පුරා ක්‍රියාත්මක වෙමින් ගොවියාත් සමඟ සම්බන්ධ වෙමින් වැඩ කරන බවක්. අපේ සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමේදීත් මෙන්න මේ සුළු අපනයන භෝග කර්මාන්ත සම්බන්ධ කර ගන්න පුළුවන්. හැබැයි, එහෙම හිතපු සැලැස්මක් අපට පෙනෙන්නේ නැහැ. එම නිසා එක පැත්තකින් ග්‍රාමීය ආර්ථිකය නඟා සිටුවීම සඳහා වෙච්ච යම් යම් යෝජනා ගොවියාත් එක්ක සාකච්ඡා කරලා, ඔවුන්ට ස්ථාවර මිලක් ලබා දීලා, අනෙක් පැත්තෙන් පර්යේෂණ ආයතනවල අලුත්

පර්යේෂණ දත්ත ගොවිබිම්වලට යොමු කරමින් මේ ක්ෂේත්‍රය නඟා සිටුවීම සඳහා යම්කිසි පසුවිපරමක් සහිත ක්‍රියාවලියකට මැදිහත් වෙන්න කියලා අපි මේ අදාළ ආයතනවලට කියන්න කැමතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම මේ මාතෘකාවෙන් පොඩ්ඩක් බැහැරව, අපේ ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා කිව්ව කාරණයකට අවධානය යොමු කරන්න කැමතියි. ඊයේ Batticaloa Campus (Pvt.) Limited පිළිබඳ විවාදයේදී එතුමා යම් සඳහනක් කළා. ජනතා විමුක්ති පෙරමුණ විධියට ඊයේ ඒ යෝජනාව ඉදිරිපත් කළේ අපියි. එහි නීතිවිරෝධී ස්වභාවය පිළිබඳ අපි බොහොම පැහැදිලිව කිව්වා. ඒ ඉඩම අත්පත් කර ගැනීමේදී, එයට අවසර ලබා ගැනීමේදී, ඒ සඳහා මුදල් ගලා ඒමේදී සහ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, හිටපු නියෝජ්‍ය ඇමතිවරයකු සහ හිටපු ආණ්ඩුකාරවරයකු වන හිස්බුල්ලා මහතා එතුමා බලය පාවිච්චි කරලා කරපු මේ ක්‍රියාවලියේ තිබෙන ළබැඳියන් අතර ගැටුම - conflict of interest - ගැන අපි බොහොම පැහැදිලි කරලා දුන්නා. ඒ නිසා මේ ක්‍රියාවලියම තමන්ගේ දේශපාලන බලය සහ මුදල් බලය පාවිච්චි කරලා, නීතිය නවලා, නීතියෙන් රිංගලා කරපු ක්‍රියාවක් කියන එක අපි සාක්ෂි සහිතව ඔප්පු කරලායි තිබෙන්නේ. ඒ නිසා එතුමන්ලා ආණ්ඩුව නියෝජනය කරන මන්ත්‍රීවරු හැටියට, නීතිය හරියාකාරව ක්‍රියාත්මක කරන්න ශක්තිය දෙනවා මිසක්, එහෙම නැතිව නීතියෙන් රිංගලා, තමන්ගේ දේශපාලන බලය පාවිච්චි කරලා එවැනි දේවල් කරපු අය ආරක්ෂා කරන්න සහ ඒ අයට සුදුහුනු ගාන්න කටයුතු කිරීම වැරදියි කියන එකයි මම කියන්නේ. මොකද, වෙනත් කිසිවක් ඕනෑ නැහැ. මේ වෙනකොට නීතිපති දෙපාර්තමේන්තුව පාර්ලිමේන්තුවට, කථානායකතුමාට දන්වලා තිබෙනවා, මේ මුදල් ලැබීමේ ක්‍රමවේදය සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට ඔහුගේ ක්‍රියාවලිය නීත්‍යනුකූල නැහැ, ඒ ව්‍යවස්ථාවත් කඩ කරලායි තිබෙන්නේ කියලා. ඒ නිසා නීතිපති දෙපාර්තමේන්තුව යෝජනා කරනවා, ඔහුගේ මන්ත්‍රී ධුරය අහිතයට බලපාන පරිදි ඉවත් කරන්න පුළුවන්, එතැනින් එහාට දඩ ගහන්න පුළුවන් කියලා. ඒ නිසා ඒ පිළිබඳ අවධානය යොමු කරලා ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම මේ රටේ නීතියටත්, අධ්‍යාපන ක්‍රමවේදයටත් හිතකරයි කියලා මම කියන්න කැමතියි. බොහොම ස්තුතියි.

[பி.ப. 2.05]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

சபைக்குத் தலைமைதாங்கும் கௌரவ உறுப்பினர் அவர்களே, நன்றி! தமிழரசுக் கட்சியின் நாடாளுமன்ற உறுப்பினர் 31.07.2019இல் தனது உரையில் தெரிவித்த என் தொடர்பான அவதூறுகளுக்குப் பதிலளிக்கும் முகமாக இந்தச் சந்தர்ப்பத்தை வழங்கியமைக்கு நன்றி கூறித் தொடர்கின்றேன்.

" கொம்பு மாடு முட்டி கோபுரம் சரிவதில்லை", மல்லாந்து படுத்துக்கிடந்து காறி உமிழ்வதால் சூரியன் ஒருபோதும் அழுக்குப்படுவதும் இல்லை. அதுபோலவே, மாபெரும் அர்ப்பணங்களாலும் ஆழ்மன இலட்சிய வேட்கையினாலும் கட்டியெழுப்பப்பட்ட எமது தியாக வரலாற்றை அரசியல் காழ்ப்புணர்ச்சியில் இருந்து உருவாகும் அவதூறுகளால் ஒருபோதும் அசிங்கப்படுத்திவிட முடியாது. ஆனாலும், உண்மைகள் கண்டறியப்பட்டு எமது மக்கள் மேலும் தெளிவடைய வேண்டும் என்பதற்காகவே நான் இந்தச் சபையில் சில விடயங்களைத் தெளிவுபடுத்த விரும்புகிறேன்.

1990ஆம் ஆண்டு யாழ். தீவுப் பகுதியைப் படையினர் விடுவித்தபோது அங்கு சென்று எந்தவொரு தமிழ்க் கட்சியும் எமது மக்களுக்குப் பணியாற்ற விரும்பியிருக்கவில்லை. ஆனாலும், நாம் மட்டும் பலத்த சவால்களுக்கு மத்தியிலும் உயிர் அச்சுறுத்தல்களுக்கு மத்தியிலும் முதன்முதலாகத் தீவக மண்ணில் கால் பதித்திருந்தோம்.

பசுமை நிறைந்த எம் பாசமிகு தீவக மண் அழிவுப்போரில் சரிந்த எமது மக்களின் குருதியில் நனைந்து சிவந்தபோது கேந்திர முக்கியத்துவம் இல்லாத இடமென்று கூறி எல்லோ ராலும் கைவிடப்பட்டுத் தீவக மக்கள் தவித்திருந்தபோது, எமது மக்களின் அழுகுரல் கேட்டு நாம் அன்று தீவகம் நோக்கி சென்றிருக்காவிட்டால், இன்னும் பல மக்கள் குருதியில் அன்று சரிந்திருப்பார்கள்; இன்னும் பல தமிழ் இளைஞர்கள் அன்று காணமால் போயிருப்பார்கள்.

எங்கும் நிசப்தம்! வீதிகள் எங்கும் எமது மக்களுக்கு பரிட்சயம் இல்லாத மொழியில் படையினர் எழுப்பிய சப்தம் மட்டும் கேட்டது. வீதியில் இறங்க அச்சப்பட்டு, கதவுகள் பூட்டி எமது மக்கள் வீடுகளில் ஒளிந்திருந்தனர். அம்மா! நாங்கள் வந்திருக்கின்றோம் என்று கூறிக் கதவுகளை நாம் தட்டியபோது தமிழ் குரல் கேட்ட சந்தோச மிகுதியில் வீதியில் வந்து நம்பிக்கையுடன் உலாவத் தொடங்கினர் எமது தீவக மக்கள். அன்று நாம் தீவகத்தில் இல்லாதிருந்திருந்தால், பட்டினிச் சாவிலேயே அந்த மக்கள் இறந்திருப்பார்கள். எமது மக்களுக்கு ஒரு பிடி அரிசிகூடக் கொடுத்தறியாத் தமிழ்க் கட்சித் தலைமைகளுக்கு மத்தியில், எனது முதுகில் உணவு மூட்டைகள் சுமந்து என் தோழர்களுடன் நானும் ஒருவனாகச் சென்றிருந்தேன். பட்டினிச் சாவிலிருந்தும் அன்று தீவக மக்களைக் காத்தவர்கள் நாங்கள்! அவலங்களிலிருந்தும் மீட்டவர்கள் நாங்கள்!

இன்று எம்மீது அவதூறு பொழிவோர் அன்று எங்கே சென்றிருந்தார்கள்? 1996இல் யாழ். குடாநாட்டைப் படையினர் விடுவித்தபோது, எமது மக்கள் அவலப் பெருங்காட்டில் அந்தரித்து நின்றனர். அப்போது, நாங்கள் எஞ்சிய எமது மக்களைக் காக்க யாழ். செல்ல வேண்டும் என அன்றைய ஜனாதிபதி சந்திரிக்கா அம்மையார் அரசைக் கேட்டிருந்தோம். புலிகளையோ வேறு எவரையுமோ யாழ். மக்கள் விரும்பவில்லை என அவர் பதிலளித்து மறுத்தார்.

புலிகளை யாழ். மக்கள் விரும்பவில்லை என்றால், சிங்கத்தையும் யாழ். மக்கள் விரும்பமாட்டார்கள் என்று நான் கூறியிருந்தேன். அக்காலத்தில் யாழ். நோக்கி அமைச்சர் ஒருவர் சென்றிருந்தார். அவர்மீது தற்கொலைத் தாக்குதல் ஒன்று இடம்பெற்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please!

මේ අවස්ථාවේ කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු තුරෙයිරෙත්නසිංහම් මහතාගේ නම යෝජනා කරන්න.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

நான் கௌரவ உறுப்பினர் க. துரைரெட்ணசிங்கம் அவர்களை முன்மொழிகின்றேன்.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

*විසින් ස්ථිර කරන ලදී.*
*ஆமோதித்தார்.*
*Seconded.*

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව* ගරු මයන්ත දිසානායක මහතා *මූලාසනයෙන් ඉවත් වුයෙන්,* ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා *මූලාසනාරූඪ විය.*
*அதன்பிறகு, மாண்புமிகு மயந்த திசாநாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு க. துரைரெட்ணசிங்கம் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. MAYANTHA DISSANAYAKE *left the Chair, and* THE HON. K. THURAIRETNASINGAM *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, தொடருங்கள்.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
நன்றி.

அதில் அப்பாவி மக்களும் கொல்லப்பட்டார்கள். அப்போது பி.பி.சீ. நிருபர் ஆனந்தி என்னிடம் அது குறித்துக் கேள்வி எழுப்பியிருந்தார். படையினர் மக்களுடன் சாதாரண நேரங்களில் சகஜமாகப் பேசுவார்கள். ஆனாலும், யுத்தம் என்றோ அல்லது ஒரு தாக்குதல் என்றோ வரும்போது, பதிலுக்குத் தாம் படையினர் என்பதையே நிரூபிப்பார்கள். இதற்குச் சக தமிழ்த் தரப்பினரும் விதிவிலக்காக நடந்தவர்கள் அல்ல. "குளவிக் கூட்டுக்குக் கல்லால் எறிந்தால், குளவிகள் கொட்டும்" என்று நான் பதில் கூறியிருந்தேன்.

அந்தத் தற்கொலைத் தாக்குதலுக்குப் பின்னரே அன்றைய ஜனாதிபதி சந்திரிக்கா அம்மையாருடன் வாதாடி, நாங்கள் யாழ். குடா நாட்டிலும் கால் பதித்தோம். அவலப்பட்டு நின்ற எமது மக்கள் பெருமளவில் திரண்டு எம்மைத் தேடி வந்தனர். தாம் இதுவரை மாவீரர்களின் கல்லறைகளுக்குத் தீபம் ஏற்றியவர்கள் என்றும், ஆனாலும், எம்மிடம் இன்று நம்பிக்கை யோடு தாம் வந்திருப்பதாகவும் அவர்கள் கூறினார்கள். மனந்திறந்து பேசிய எமது மக்களை நான் ஆரத்தழுவி, அன்புகாட்டி வரவேற்றேன். அவர்கள் புலியோ அன்றி வேறெவரோ என்று பேதம் பார்க்காமல், அனைவரும் தமிழர் என்ற அடிப்படையில் அவர்களது தேவைகளை நிறைவேற்றிக் கொடுத்தேன்.

காணாமல் போனவர்களுக்கும் படுகொலை செய்யப்பட்டு, செம்மணிப் புதைகுழிகளில் புதைக்கப்பட்டவர்களுக்கும் நீதி விசாரணை வேண்டும் என்று குரல் எழுப்பினோம். காணாமல் போன எமது தமிழ் உறவுகள் 650 பேர்களின் பெயர்ப் பட்டியலைத் தயாரித்தோம். காணாமல்போனோர் பெற்றோர் பாதுகாவலர் சங்கத்தை உருவாக்கினோம். அந்த அமைப் பினூடாக வெகுஜனப் போராட்டங்களை முதன்முதலில் தொடக்கி வைத்தேன்.

படையினரின் பிரசன்னத்தின் மத்தியிலும் வெகுஜனப் போராட்டங்களை நடத்தும் துணிச்சலை எமது மக்களுக்கு முதன்முதலில் அன்றே ஊட்டியவர்கள் நாங்கள். காணாமல் போனோர் பட்டியலை ஜனாதிபதி சந்திரிக்கா அம்மை யாருக்கும் மனித உரிமைகள் ஆணைக்குழுவுக்கும் ஐக்கிய நாடுகள் சபைக்கும் சமர்ப்பித்தோம். நாடாளுமன்றத்தில் மட்டுமன்றி, சர்வதேச அரங்கிலும் குரல்கொடுத்தோம்; அதனை அம்பலப்படுத்தினோம். அதன்மூலம் காணாமல் போதல்களையும் கைதுகளையும் முடிந்தளவு கட்டுப் படுத்தினோம். அப்போது இன்று எம்மீது அவதூறு பொழிபவர்கள் எங்கே சென்றிருந்தார்கள்? 1996 செப்ரெம்பர் 07இல் படுகொலை செய்யப்பட்ட கிருசாந்தி விவகாரம் குறித்து நாமே அதை வெளியுலகிற்கு அம்பலப்படுத்தி இருந்தோம். 1998 யூலை 03ஆம் திகதி கிருசாந்தி கொலை வழக்கில் சம்பந்தப்பட்ட இராணுவச் சிப்பாய் சோமரத்தின ராஜபக்ஷ என்பவருக்கு மரண தண்டனைத் தீர்ப்பு வழங்கப்பட்டமை தொடர்பில் நாம் பெரும் பங்காற்றியிருக்கிறோம்.

அதேபோல, 1999 டிசம்பர் 28ஆம் திகதி படையினரால் பாலியல் வன்புணர்ச்சிக்கு உள்ளாக்கப்பட்டுப் படுகொலை செய்யப்பட்ட புங்குடுதீவு சாரதாம்பாள் விடயம் குறித்தும் நாடாளுமன்றத்தில் குரல் எழுப்பி அம்பலப்படுத்தியதோடு மட்டுமன்றி, அந்த இறுதிக்கிரிகையைக்கூட ஒரு கண்டன நிகழ்வாக நாமே நடத்தியும் இருந்தோம். அதுமட்டுமன்றி 17.05.1997இல் அம்பாறையில் கோணேஸ்வரி என்ற தமிழ் யுவதி படையினரால் பாலியல் வல்லுறவிற்குட்படுத்தப்பட்டுக் கொல்லப்பட்டபோதும், நாமே நாடாளுமன்றத்தில் அதைக் கண்டித்துக் குரல் எழுப்பி அம்பலப்படுத்தியிருந்தோம்.

மிருசுவில் கிராமத்தில் 2000ஆம் ஆண்டு டிசம்பர் 20ஆம் நாள் தமிழ் பச்சிளம் பிஞ்சுகள் உட்பட எமது மக்களில் எட்டுப்பேர் படையினரால் படுகொலை செய்யப்பட்டார்கள். அன்று, அந்தக் கோரப்படுகொலைச் சம்பவத்திலிருந்து தப்பி வந்த பொன்னுத்துரை மகேஸ்வரன் என்பவர் அடைக்கலம் தேடி வேறெங்கும் சென்றிருக்கவில்லை. எமது அலுவலகம் நோக்கியே அவர் ஓடி வந்திருந்தார். இன்று எம்மீது அவதூறுகள் பரப்புவோர் கூறுவது உண்மையென்றால், அன்று மிருசுவில் படுகொலையிலிருந்து தப்பித்து வந்தவர் எமது அலுவலகம் தேடி வந்திருக்கவேமாட்டார். சாட்சி சொல்ல அச்சப்பட்டு அந்த நபர் நின்றபோது, அவரைப் பாதுகாத்து வைத்திருந்து நீதிமன்றத்திற்குக்கூட நாமே பாதுகாப்பாக அழைத்துச் சென்று வந்திருக்கின்றோம். அவருக்குச் சாட்சி சொல்லும் துணிச்சலை நாம் கொடுத்திருந்தோம். இதன் காரணமாகவே சம்பந்தப்பட்ட இராணுவ அதிகாரியான சுனில் ரத்னாயக்கா என்பவருக்கு மரணதண்டனைத் தீர்ப்பும் வழங்கப்பட்டது. அதுமட்டுமன்றி யுத்த காலத்தில் கைதுசெய்யப்பட்ட பலநூறு இளைஞர் யுவதிகளைச் சட்டத்தரணி மகேஸ்வரி வேலாயுதம் அவர்களூடாக மனித கௌரவத்திற்கான மன்றம் அமைத்து இலவசச் சட்ட ஆலோசனைகள் வழங்கி அவர்களைச் சிறை மீட்டுப் பெற்றோரிடம் ஒப்படைத்தவர்களும் நாம் மட்டுமே.

சிறைக் கைதிகளை மீட்பது மட்டுமன்றி காணிச் சுவீகரிப் புக்களைத் தடுத்து நிறுத்துவது, புனர்வாழ்வு, புனரமைப்பு, வேலைவாய்ப்பு, அபிவிருத்தி, அன்றாட அவலங்களுக்கான தீர்வு, அது மட்டுமன்றி அரசியல் தீர்வு என எமது மக்களின் அனைத்து அபிலாஷைகளையும் தீர்ப்பதற்காகவே அன்றும் நாம் எமது மக்களுடன் நின்றிருந்தோம்.

எமது தலைகளுக்கு மேலாகச் ஷெல் வீச்சுக்கள் நடத்தப்பட்டபோதும், கால்களின் கீழே கண்ணிவெடிகள் புதைக்கப்பட்டிருந்தபோதும், துப்பாக்கிகளும் மனித

வெடிகுண்டுகளும் எம்மை அச்சுறுத்தியபோதும்கூட நாம் அன்று மக்கள் மத்தியில் நின்றிருந்தது அழிவு யுத்தத்தில் அவலப்பட்டு நின்ற எமது மக்களை காப்பதற்காகவே. எம்மீது அர்த்தமற்ற வகையில் அரசியல் காழ்ப்புணர்ச்சியின் பெயரால் அவதூறுகளைப் பரப்பி வரும் பொறுப்பற்ற தமிழ் அரசியல் கட்சிகள்போல், எமது மக்கள் அவலப் பெருங்காட்டில் அந்தரித்து நின்றபோது, நாமும் கொழும்பிலும் தமிழ் நாட்டிலும் வெளிநாட்டிலும் உல்லாச வாழ்க்கை நடத்திக்கொண்டு இருந்திருந்தால், இவ்வாறான பழிகளை எம்மீது எவராலும் சுமத்தியிருக்க முடியாது. வலி சுமந்த மக்களுடன் என்றும் நாம் நின்றவர்கள் என்பதாலேயே இன்று நாம் பழி சுமந்து நிற்கின்றோம். பாவம் ஒரு பக்கம்; பழி இன்னொரு பக்கம். இதுவரை எம்மீது சுமத்தப்பட்டு வந்த பல்வேறு பழிகளில் இருந்து வரலாறு எம்மை விடுவித்து வந்திருக்கிறது.

கௌரவ நாடாளுமன்ற உறுப்பினர் சிறீதரன் அவர்கள் எம்மீது சுமத்தியிருக்கும் அவதூறுகளை உண்மையென அவர் ஒப்புவிக்க முடியுமானால், வெறுமனே கூச்சலிட்டுக் கொண்டிருக்காமல், உங்களுடைய அரசு, நீங்கள் கொண்டு வந்த ஆட்சி என்று கூறும் நீங்கள், அதை வைத்து ஏன் உங்களால் எம்மீதான ஒரு நீதி விசாரணையை நடத்த முடியாமல் இருக்கின்றீர்கள்?

சில மாதங்களுக்கு முன்னர் இதே சபையில் அவர் இது தொடர்பான கருத்துக்களைக் கூறுகின்றபொழுது, அந்த விபரங்களைத் தன்னிடம் தந்தால் தான் அதற்கான விசாரணையை மேற்கொள்ளலாம், உண்மை நிலையை வெளியுலகிற்குக் கொண்டுவரலாம் என்று அமைச்சர் மனோ கணேசன் அவர்கள் கேட்டிருந்தார். ஆனால், இதுவரை என்ன நடந்தது என்பது கௌரவ அமைச்சர் மனோ கணேசன் அவர்களுக்கே வெளிச்சம்.

தமிழரின் பிரச்சினைக்குத் தீர்வு கண்டுவிட்டால் நீங்கள் வாக்குகளை அபகரித்து அரசியல் பிழைப்பு நடத்தக் காரணங்கள் இல்லாமல் போய்விடும். அதுபோலவே, எம்மீது அடிக்கடி அவதூறு பரப்பும் நீங்கள், எம்மீதான நீதி விசாரணையை நடத்தி அதற்கு நியாயத்தீர்ப்பு வழங்கப்பட்டு விட்டால், தொடர்ந்தும் உங்களால் எம்மீது அவதூறுகளைப் பரப்பக் காரணம் இல்லாமல் போய்விடும். ஆகவேதான், உங்களால் எதையும் பேசிப் பிழைப்பு நடத்த மட்டும் முடியுமே தவிர, எதையும் சாதித்துக் காட்ட வக்கற்றவர்கள் என்பதையே நீங்கள் மெய்ப்பித்து வருகிறீர்கள். உங்கள் அரசியல் பலத்தை வைத்து தமிழ் மக்களின் பிரச்சினைக்கு ஒரு தீர்வைத்தான் உங்களால் காண முடியவில்லை. அதே அரசியல் பலத்தை வைத்து அடுத்தவர்மீதான உங்கள் அவதூறுகளுக்கு ஒரு நீதி விசாரணையையாவது நீங்கள் நடத்திக்காட்டலாமே என்றுதான் உங்களிடம் சவால் விடுத்துக் கேட்கின்றேன். நான் தயாராகவே இருக்கின்றேன், நடத்துங்கள் நீதி விசாரணையை!

அடுத்தவர்கள்மீது அவதூறு பரப்பும் இவர்கள் அதற்கு ஆதாரம் கேட்டால் துணைக்கு அழைப்பது 'விக்கி லீக்ஸ்' இணையத்தையும் தமது 'பினாமி' ஊடகங்களையுமே. மேற்குலக வெளிநாட்டு இராஜதந்திரிகள் இங்கு வருவார்கள். இலங்கையில் என்ன நடக்கின்றது என்று அவர்களில் சிலர் நேரில் எங்கும் சென்று ஆராய்வதில்லை. தாம் சந்திக்கும் தமிழ் அரசியல் கட்சிகள் அவிழ்த்துவிடும் அடுத்தவர்கள்மீதான அவதூறுகளையே தாம் திரட்டும் தகவல் என்று கூறி, தத்தமது நாடுகளுக்குச் சில இராஜதந்திரிகள் அந்தத் தகவல்களை அனுப்புவார்கள். அந்தத் தகவல்களைத் திருடியே 'விக்கி லீக்ஸ்' வெளியிட்டுப் பரபரப்புக் காட்டும். ஆகவே எம்மீது சேறடித்துத் தோற்றுப்போன விக்கி லீக்ஸ் செய்தியாளர்களான தமிழ்க்கட்சித் தரகர்களுக்கு எனது ஆழ்ந்த அனுதாபத்தைத் தெரிவிக்க விரும்புகின்றேன். தமிழரின் விடுதலைக்காக சிறு இறகைக்கூட இழந்திருக்காத கூரைக் கோழிகள், இன்று புலிகளின் பெயரைச் சொல்லிப் பிழைப்பு நடத்துவது ஏன் என்று கேட்கிறேன். மனித குல நாகரீகமே வெட்கித் தலைகுனியும் வகையில் கிளிநொச்சியில் சமூகச் சீரழிவில் ஈடுபட்டுப் புலிகள் இயக்கத்தால் கைது செய்யப்பட்ட இவர், இன்று தானும் ஒரு புலி என்று கூறி மக்களுக்கு புலுடா விடலாமா என்று நான் கேட்கின்றேன்.

அண்ணன் - தங்கை, அப்பு - ஆச்சி, பாட்டன் - பூட்டி காட்டி வளர்த்த தமிழர் பண்பாட்டின் பாரம்பரியத்தையே வெட்கித் தலைகுனிய வைத்த விறகுக்கட்டை வீரன், தமிழர் பண்பாடு குறித்தும் தமிழ்த் தேசியம் குறித்தும் பேச அருகதை உள்ளவரா? என நான் கேட்கின்றேன். புலிகளின் பயிற்சிப் பாசறையிலிருந்து தப்பி வருவதற்கு அவர் அதற்குப் பரிகாரமாகத் தன்னிடம் கல்வி கற்ற மாணவச் செல்வங்களைப் பயிற்சி முகாமில் பணயம் வைத்துவிட்டு வந்திருந்தார். இது யுத்தக்குற்றம் இல்லையா? என்று கேட்கிறேன். சந்தர்ப்பம் பார்த்துப் புலிகளிடமிருந்து தப்பி வந்த அவர், பொதுமக்களிட மிருந்து சேகரித்த

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

அபகரித்து, செஞ்சிலுவைச் சங்க வாகனத்தின் ஊடாகப் படையினரின் கட்டுப்பாட்டுக்குள் நுழைந்தாரே! அந்த

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

எங்கே? அதற்கு விசாரணை இல்லையா? என்று கேட்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிந்துவிட்டது.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
ஒருபுறம் புலி முகம்! மறுபுறம் சிங்க முகம்! இரட்டை முகவராகச் செயற்பட்ட தன்னைக் கைது செய்த புலிகள் இயக்கத்தைப் பழிவாங்க, செஞ்சோலைச் சிறுவர் இல்லத்தைப் புலிகளின் பயிற்சி முகாம் என்று அரசுக்குத் தகவல் வழங்கியிருந்தார். இதற்கு நீதி விசாரணை இல்லையா? என்று கேட்கிறேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிந்துவிட்டது.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
இன்னும் ஒரு நிமிடத்தில் முடிக்கின்றேன்.

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

பலருக்கும் தெரியாத இரகசியம், 2009இல் இவர் முன்னாள் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களைத் திரை மறைவில் சந்திக்க முனைந்ததுதான். இன்றுகூடப் பேசுவது தமிழ்த் தேசியம்! திரை மறைவில் அரசுடன் நடத்துவது தேன்நிலவு!

இறுதியாக, உனது கண்களை மறைக்கும் மரக்குற்றியை அகற்றிக்கொள். பிறரது கண்களை மூடும் சிறு மரத்தூசிகள் உன் கண்களில் தெரியும். எம்மீது அவதூறு பரப்புவோருக்கு இதை நான் கூறிக்கொண்டு, இத்துடன் முடித்தாலும், தொடரும் என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
நன்றி.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
சபைக்குத் தலைமைதாங்குகின்ற கௌரவ உறுப்பினர் அவர்களே, எனக்குக் கொடுக்கப்பட்ட நேரம் 15 நிமிடங்கள். ஆனால், இப்பொழுது என்னுடைய மணிக்கூட்டில் 15 நிமிடங்களும் 13 வினாடிகளும்தான் முடிந்திருக்கின்றன - இடையில் நீங்கள் அக்கிராசனம் மாறிய நேரமும் சேர்த்து. நேரம் சம்பந்தமாகக் கடந்த முறை நான் உரிய இடத்தில் விசாரித்தபோது, இங்கு நேரம் குறிப்பதில் ஏதோ பிரச்சினை இருப்பதாக அறிந்தேன் என்பதைக் கூறிக் கொள்வதுடன், நாளைய தினம் இது சம்பந்தமாக கௌரவ சபாநாயகர் அவர்களிடம் கதைக்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
இங்கிருக்கின்ற மணிக்கூட்டின்படிதான் நாங்கள் உங்களுக்கு நேரம் ஒதுக்கித் தருவது.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
அப்படியானால் நீங்கள் இது சம்பந்தமாக உரியவர்களிடம் தெரிவித்து, இதனை உறுதிப்படுத்த வேண்டும். ஏனென்றால் 2 - 3 தரம் எனக்கு இவ்வாறு நடந்திருக்கிறது. இப்பொழுது என்னுடைய மணிக்கூட்டில் 15 நிமிடமும் 13 செக்கனும்தான் முடிந்திருக்கின்றது. சரி, இன்னுமொரு சந்தர்ப்பத்தில் அதைப்பற்றிக் கதைக்கலாம். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා.2.21]

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ වූ වැදගත් නියෝග තුනක් අද අප සම්මත කරනවා. ශ්‍රී ලංකාව කියන්නේ, අපනයන ආදායම අරමුණු කරගත් ආර්ථිකයක් සහිත රටක්. 2015දී මේ රට භාර ගන්නකොට අපට අභියෝග රැසකට මුහුණ දෙන්න සිදු වුණා. රටේ අපනයන විශාල ලෙස කඩා වැටී තිබුණා. එම අංශය දුර්වල වෙලා තිබුණා. විශේෂයෙන්ම අප ආනයන මත පමණක් යැපෙන ආර්ථිකයක උරුමකරුවන් බවට පත්වෙලා සිටියා. මුකුණුවැන්න මිටිය, කන්කුන් මිටිය පවා විදේශයෙන් ගෙන්වන, විදේශ ගැති ආනයන ආර්ථිකයක් ලෙසයි අපේ ආර්ථිකය ඒ කාලයේ හැසිරුණේ. ඒ සියලු බාධක මැද, දැවැන්ත ණය කන්දරාවක් සමඟ අපේ ආනයන අපනයන ක්‍රියාවලිය නිරන්තරයෙන්ම පාඩු ලබන තත්ත්වයකයි තිබුණේ. එවැනි ආර්ථිකයක් තමයි අප භාර ගත්තේ. අපේ රජය විශාල පරිශ්‍රමයක් දරලා, පසුගිය වසර හතරහමාරක කාල සීමාව තුළදී අපේ අපනයන දිරිමත් කිරීමට කටයුතු කළ නිසා එම ක්ෂේත්‍රය දැන් වැඩි ආදායමක් ලබා ගැනීමේ ක්‍රියාවලියට අවතීර්ණ වී සිටිනවා.

විශේෂයෙන් අප දැකපු දෙයක් තමයි, අප සමඟ ගනු දෙනු කළ, අපේ නිෂ්පාදන මිලදී ගත් බොහෝ යුරෝපීය පොහොසත් රටවල් සමඟ අපේ ඉතා හොඳ රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවක් තිබුණේ නැහැ කියන කාරණය. හැබැයි, මේ ආණ්ඩුව පත් වූ මුල් කාලයේ සිටම යුරෝපීය රටවල් සමඟ ඉතාම හොඳින් රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ගොඩනඟා ගත්තා. අපේ අපනයන සඳහා වෙළෙඳ පොළ පුළුල් කර ගනිමින්, වෙළෙඳ ගනු දෙනු මනාව කරගෙන යමින්, හොඳ රාජ්‍ය ප්‍රතිපත්ති රාමුවක් අප ක්‍රියාත්මක කරගෙන ගියා. මේ කටයුතු නිසා යුරෝපා මත්ස්‍ය තහනම ඉවත් කර ගන්න අපට හැකියාව ලැබුණා. ඒ තුළින්, අපට අහිමි වෙලා තිබුණු විශාල ආදායමක් නැවත ලබා ගැනීමේ හැකියාව ලැබුණා. ලෝකයෙන් හුදෙකලා වෙලා, ගෝත්‍රිකවාදී විධියට ගනු දෙනු කළ ඒ රාජ්‍ය පාලන සංකල්පයෙන් බැහැර වෙලා අප කටයුතු කළ නිසා, අපේ රටේ ආනයන අපනයන ක්‍රියාවලියේදී වැදගත් වන වෙළෙඳ ශේෂය යහපත් විධියට, ධනාත්මක විධියට පවත්වාගෙන යෑම සඳහා GSP Plus සහනය වාගේ දේවල් නැවත ලබා ගැනීමේ හැකියාව අපට ලැබුණාය කියන කාරණයත් මේ අවස්ථාවේ මා විශේෂයෙන් කියන්නට ඕනෑ.

අප මේ සියල්ල කළේ සුබ පැතුම්, මල් වරුසා මැද නොවෙයි. මේ ආණ්ඩුව පත් වුණු දවසේ සිට ගල් වරුසා, විරෝධතා, පෙළපාළි, උද්ඝෝෂණ, ජනතාව ඇවිස්සීම් කියන සියලු බාධක, සම්බාධක මැද, මේ රජය පිළිබඳව ලෝකය පුරා අපකීර්තිය පතුරුවා හරින කණ්ඩායමක් එක්ක ගැටෙමින් තමයි අපි අපේ අපනයන වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ වුණේ. මේ කාර්යයේදී රජයක් හැටියට අපට විශාල වශයෙන් බාධා එල්ල වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම පසුගිය අවුරුදු හතරහමාරක කාල සීමාව තුළ ස්වාභාවික ආපදා, ව්‍යසන රාශියකට මුහුණ දෙන්න අපට සිදු වුණා. දැවැන්ත ගංවතුර උවදුරුවලට මුහුණ දෙන්න අපට සිද්ධ වුණා. දිස්ත්‍රික්ක 12කට ගංවතුර එද්දී, දිස්ත්‍රික්ක 12කට දැවැන්ත නියඟයකට මුහුණ දෙන්න සිද්ධ වුණා. රටේ එක කොනක නියඟයක් පවතිද්දි, එක කොනක දැවැන්ත ගංවතුරක් ඇති වුණා. මේ නිසා, කෘෂි ආර්ථිකයක් තිබෙන අපේ රටේ කෘෂි නිෂ්පාදනය සෘණ මට්ටමකට පත් වුණා. ඒ සියලු බාධක මැද තමයි අපේ අපනයන ක්‍රියාවලියත් දිරිමත් කරමින්, අප මේ ආර්ථිකය ඉදිරියට ගෙන ආවේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සියලු කාර්යයන් කරමින් සිටින අතරතුර තමයි පාස්කු ඉරු දින ඒ බෝම්බ ප්‍රහාරය එල්ල වුණේ. එම බෝම්බ ප්‍රහාරය නිසාත් අපේ රට විශාල වශයෙන් ආපස්සට ගියා. සංචාරකයන්ගේ පැමිණීමෙන් පටන් ගත්තාම, ගමේ සිටින එළවලු, පලතුරු වෙළෙන්දාගේ ව්‍යාපාර දක්වාත්, සංචාරක ව්‍යාපාරයේ නිරත වෙලා සිටින රථ වාහන හිමියන්

ඇතුළු සියලුදෙනා දක්වාත්, කුඩා පරිමාණයේ තේ කඩයටත් සහරාන්ගේ ඒ බෝම්බය වැදුණා. ඒ සියල්ල තුළ අපේ රටේ ආර්ථිකයට විශාල වශයෙන් හානියක් සිද්ධ වුණා. ආනයන, අපනයන ක්‍රියාවලියටත් එය විශාල වශයෙන් බලපෑවාය කියන කාරණයත් මා මේ අවස්ථාවේ කියන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අපනයන වැඩි කරන්න නම් නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑ. ඒක අප කවුරුත් පිළිගන්නා කාරණයක්. නමුත්, අදටත් අප ඒ පිළිබඳව සැබෑමකට පත් වෙන්නේ නැහැ. නිෂ්පාදන කරනකොට සියලුදෙනා එකම දෙයක් නිෂ්පාදනය කරනවා. අන්තිමට ඒ නිෂ්පාදනය අළෙවි කරගත නොහැකිව, සුරක්ෂිත කරගත නොහැකිව කුණුකොල්ලයට විකිණෙනවා. නැත්නම් කුණු බක්කියට යනවා. එහෙම නැත්නම් විශාල වශයෙන් විනාශ වෙලා යනවා. අපේ නිෂ්පාදනවලින් රටක් හැටියට අපට ආදායමක් ලබා ගැනීමට හැකියාවක් නැහැ. ඒ නිසා ඒ සඳහා තිබෙන ක්‍රම සහ විධි වඩාත් දියුණු විය යුතුයි කියන එකයි මගේ අදහස. එළවලු, පලතුරු, කුළුබඩු වැනි දේවල් සම්බන්ධයෙන් කාලීනව ප්‍රතිපත්ති සැකසිය යුතුයි කියන කාරණයත් මම මේ අවස්ථාවේ මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොල් ත්‍රිකෝණය ආශ්‍රිතව ජීවත් වන පුද්ගලයකු විධියට මා දන්නවා, අද පොල් කර්මාන්තය විශාල වශයෙන් පසු බෑමකට ලක්ව තිබෙන බව. පොල් කර්මාන්තයේ මේ පසු බැසීමත් එක්ක palm oil ගෙන්වීම වැනි දේවල් අධෛර්යවත් විය යුතුයි. පොල් කර්මාන්තය රැක ගැනීමට නම්, පොල් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන කරන සියලු ක්ෂේත්‍ර ආරක්ෂා කර ගැනීමට නම්, එම ක්ෂේත්‍රය යළි නඟාසිටුවීම සඳහා කඩිනමින් විසඳුම් සෙවීම අවශ්‍ය වෙනවා. අපේ කජු වගාවටත් ඒ ඉරණම අත් වුණා. ඒ පිළිබඳවත් මම මේ අවස්ථාවේ විශේෂයෙන් මතක් කරනවා.

ඊළඟට ප්‍රමිතිය පිළිබඳව කථා කරනකොට, අපි යැවූ තේවල පොඩි ගුල්ලෙක් හිටියත් යුරෝපය ඒවා ප්‍රතික්ෂේප කරනවා. ඒ කාලයේ යුරෝපයෙන් ගෙන්වූ පාන් පිටිවල කොයි තරම් ගුල්ලෝ හිටියාද කියලා අපි දැකලා තිබෙනවා නේ. එතකොට, යුරෝපයෙන් එන ගුල්ලෝ හොඳයි. ලංකාවෙන් යන ගුල්ලෝ නරකයි. අපේ ගුල්ලා යුරෝපයට හොඳ නැත්නම්, යුරෝපයේ ගුල්ලා අපට හොඳ වෙන්නේ කොහොමද? මේ විධියේ කාරණා ගැනත් අපි කල්පනා කරලා බලන්න ඕනෑ.

රටේ ආර්ථිකය වෙනුවෙන් මේ සියලු කටයුතු කරන අතරතුර තමයි අප දැන් මැතිවරණයකට මුහුණ දෙන්න සූදානම් වෙන්නේ. ජනාධිපතිවරණය පිළිබඳව කවුරුත් කථා කරන කාලයක් මේ. ඒ සඳහා ලහි ලහියේ සූදානම් වෙන අවස්ථාවක්. ජනාධිපතිවරණය වෙනුවෙන් සමහර අය විවිධ ඇඳුම් අඳිනවා; ඇඳුම් මදිනවා; ඇඟට වඩා ලොකු ඇඳුම් අඳිනවා. ඇඟට වඩා ලොකු ඇඳුම් ඇඳගෙන ඉන්න අය, දැන් ඒ ඇඳුම් කුඩා කර ගන්න හදනවා. රට තුළ දැන් මේ වාගේ ලොකු අරගළයක් යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතියේ නැමීමක් ආපසු සිද්ධ වෙන හැටි අපි ඊයේත් දැක්කා, අදත් දැක්කා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ නායකත්වයෙන් යුක්ත කණ්ඩායමේ තමයි, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු සාලින්ද දිසානායක මැතිතුමාට නිවන් සුව ලැබේවායි කියා මා ප්‍රාර්ථනා කරනවා. ගරු සාලින්ද දිසානායක මැතිතුමා අපේ දිස්ත්‍රික්කයේ හිටපු හොඳ ජනතා නියෝජිතයෙක්. එතුමා මිය ගියා. එතුමාගේ මිය යෑමත් සමඟ කුරුණෑගල දිස්ත්‍රික්කයේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රී ධුරයක් පුරප්පාඩු වුණා. එම මන්ත්‍රී ධුරය පුරප්පාඩු වෙනකොට, ඒ සඳහා ඊළඟ සුදුස්සා හැටියට හිටියේ වාරියපොල ආසනයේ ඩී.බී. හේරත් කියන හිටපු පළාත් සභා මන්ත්‍රීවරයායි. ඒ, මගේ ආසනයට එහා පැත්තේ තිබෙන ආසනයයි. ඩී.බී. හේරත් මහතා තමයි පාර්ලිමේන්තුවට ඒමට ඊළඟ සුදුස්සා හැටියට හිටියේ. නමුත් අද වෙනකොට නීතිය නැමිලා තිබෙන ආකාරයක් අපි දකිනවා. ඒ නීතිය කරකවලා අතට අරගෙන ආපහු පොළොවේ ගහලා වාගේ තමයි අපට පෙනෙන්නේ. ජාතික ලැයිස්තුවෙන් පත් වූ, ශාන්ත බණ්ඩාර මන්ත්‍රීවරයා මේ පාර්ලිමේන්තුවේ හිටියා. මෙන්න, ශාන්ත බණ්ඩාර කියන ඒ මන්ත්‍රීවරයා හදිසියේ ඉල්ලා අස් වෙනවා! ශාන්ත බණ්ඩාර මන්ත්‍රීවරයා ඉල්ලා අස් වුණාට පසුව, ඩී.බී. හේරත් මහතාට යන්න තිබෙන පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයට දැන් මොකද වන්නේ? නීතිය නමලා, කරකවලා රංජිත් ද සොයිසා වැනි මන්ත්‍රීවරුන්ගේ කන අස්සෙන් රිංගලා ඒ මන්ත්‍රී ධුරයට කළ දේ අපි දැක්කා. පසුගිය කාලයේ මේ පාර්ලිමේන්තුව තුළ පුදුම දේවල් සිදු වෙනවා අප දැක්කා නේ. මේ පාර්ලිමේන්තුවේ අගමැතිවරු දෙදෙනෙක් ඉන්නවා අප පසුගිය කාලයේ දැක්කා. ඊළඟට, පොලිස්පතිවරු දෙදෙනෙක් ඉන්නවා දැක්කා. ජනාධිපති ලේකම්වරු සැරෙන් සැරේ අස් කරනවා දැක්කා. එහෙම කරලා අන්තිමට ඊයේ පෙරේදා ලක්ෂ හතරක පඩියක් ගන්නවා කියලා නැති කැලෑ පත්තරයක් ගහලා මන්ත්‍රීවරුන්ටත් පහර ගැසූ අවස්ථාවක් අපි දැක්කා. මේ රංජිත් ද සොයිසා වාගේ මන්ත්‍රීවරුන්ගෙන් මා අහන්නේ මේකයි. දැන් තමුන්නාන්සේලා කියනවා නේ, දෙපාර්ශ්වය එකතු වෙනවා කියලා. පොහොට්ටුවේ කණ්ඩායමයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කණ්ඩායමයි සන්ධානයක් හැටියට එකතු වෙන්න කථා කරනවා ලු. ඒත් මෙහෙම කොහොමද එකතු වෙන්නේ? එක අතකින් මල් මිටක් දීලා, අර ශාන්ත බණ්ඩාරලා වාගේ අය ඉල්ලා අස් කරවලා, ගරු සාලින්ද දිසානායක මන්ත්‍රීවරයාගේ අභාවයෙන් පුරප්පාඩු වුණු මන්ත්‍රී ධුරයත් අරගෙන මොකක්ද මේ කරන්න හදන්නේ? එක අතකින් මල් මිටක් දීලා, අනෙක් අතින් පිහියෙන් අනින, එක අතක මල් පොහොට්ටුවක් තිබෙන, අනෙක් අතේ පිහියක් තිබෙන දෙපාර්ශවයක් එකතු වෙන්නේ කොහොමද?

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පොඩි පැහැදිලි කිරීමක් කර ගන්න තිබෙනවා. අපි කවුරුත් දන්නවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලක්ෂ 4ක පඩියක් ලැබෙන්නේ නැහැ කියලා. මම දැන ගන්නට කැමැතියි, ආණ්ඩු පක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ට වෙනම ලක්ෂ 2ක දීමනාවක් ලැබෙනවාද? නැත්නම් එක්ලක්ෂ පනස්දාහක හෝ එක්ලක්ෂ අනූදාහක වෙනම දීමනාවක් ලැබෙනවාද? එහෙම මුදලක් ඔබතුමන්ලාට ලැබුණාද?

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මහින්ද රාජපක්ෂ මහත්මයා- [බාධා කිරීමක්] ගෙවන එකවත් අඩුම තරමින් අපිට ලැබෙන්නේ නැහැ. ලැබුණේ නැහැ. [බාධා කිරීමක්] මගේ කාලය, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
Sir, I rise to a point of Order.

ගරු මන්ත්‍රීතුමනි, ඒ කථාව වැරදි විධියට අර්ථ නිරූපණය කරන්න එපා. පෙරේදා කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ඇවිත්

[ගරු මහින්ද අමරවීර මහතා]

තිබෙනවා. අධීක්ෂණ මන්ත්‍රීවරුන් 60 දෙනෙකුට ලක්ෂ දෙක බැගින් දෙන්න කියලා. එයයි ජනාධිපතිතුමා ප්‍රතික්ෂේප කර තිබෙන්නේ. මන්ත්‍රීවරුන්ට ලක්ෂ තුන හතර වැටුප් ලැබෙන්නේ නැති බව අපිත් පිළිගන්නවා. දැන් කැබිනට් මණ්ඩලයට ඇවිත් තිබෙන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පඩි වැඩි කිරීමේ යෝජනාවක් නොවෙයි.

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
ලක්ෂ හතරක් ගන්නවා කියලා -

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
නැහැ. නැහැ. ඒක වැරදියි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ලක්ෂ 4ක මුදලක් ගන්නේ නැහැ. ඒක වැරදියි. [බාධා කිරීමක්] මම ඒක පිළිගන්නවා. ලක්ෂ හතරක් ගන්නේත් නැහැ. ඒක පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙනුවෙන් ආපු යෝජනාවක් හැටියටයි කථාව ගිහින් තිබෙන්නේ. ලක්ෂ 2 බැගින් මන්ත්‍රීවරුන් 60 දෙනෙකුට ගෙවීමක් කරන්න කියලා ආපු යෝජනාවක් ඒක. මම ඒ ගැන පැහැදිලි කිරීමක් තමයි කළේ.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ඒකෙන් අපට අපහාසයක් වුණා. මෙච්චර කාලයක් තමුන්නාන්සේලා අපේ ආණ්ඩුවේ ඇමතිකම් දරද්දී, අපි අතින් කාලා තමයි හරක් බැලුවේ. තමුන්නාන්සේලාට වාගේ අපට යාන වාහන නිල වාහන මොකුත් ලැබුණේ නැහැ. පසු ගිය අවුරුදු හතරහමාරක කාල සීමාව තුළත් අපි අතින් කාලා හරක් බැලුවා. [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් ඔබතුමාගේ කථාව අවසාන කරන්න.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමන්ලා මගේ කාලය ගත්තා.[බාධා කිරීමක්] Sir, I want two more minutes. -[*Interruption.*] This is my time. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අහන්නේ මන්ත්‍රී වැටුප් ගැන නොවෙයි. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මම අහන්නේ මේවා හොඳ වැඩද කියලායි. අපි කරන වැඩ හෝ ජනප්‍රියතාව මත දිස්ත්‍රික් මනාප ලැයිස්තුවේ අපි ඊළඟට ඒ මන්ත්‍රී ධුරය ලබා ගැනීමට ඉන්නවා නම්, අපට ඒකට අයිතිවාසිකමක් තිබෙනවා නම්, මේ වාගේ යටින් ගහන එක, මේවාගේ යටින් අදින එක හොඳ වැඩක් ද? එක අතකින් මල් මිටක් තියාගෙන, එක අතකින් පිහියක් තියාගෙන ඉන්න කණ්ඩායම් දෙකක් ද මේ ඉදිරි ජනාධිපතිවරණයේදී එකඟතාවකට එන්නේ? ඒ අයද මේ එකතු වෙන්න යන්නේ? දැන් පොහොට්ටුවේ- [බාධා කිරීම්] ඒක තමයි. පොහොට්ටුවේ කණ්ඩායමත් එහෙම නේ. දැන් බලන්නකෝ, තමුන්නාන්සේලාගේ කණ්ඩායමේ කොච්චර ජ්‍යෙෂ්ඨයෝ ඉන්නවා ද? ගරු කුමාර වෙල්ගම මැතිතුමා තමුන්නාන්සේලාගේ කණ්ඩායමේ මොනතරම් ජ්‍යෙෂ්ඨයෙක් ද? ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගෙන් පස්සේ, ඒ තත්ත්වය තමුන්නාන්සේලාගේ ජ්‍යෙෂ්ඨයෙකුට දෙන්න තිබුණානේ. ගරු කුමාර වෙල්ගම මන්ත්‍රීතුමා වාගේ එසේ නැත්නම් අඩුම තරමින් ගරු චමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා වාගේ කෙනෙකුට දෙන්න තිබුණානේ. පොහොට්ටුව කරන්නේත් කොළේ ඇදලා යටින් ගහන එක. තමුන්නාන්සේලාගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කරන්නේත් කොළේ ඇදලා යටින් ගහන එක. මේ වාගේ අතකින් මල් මිටක්, අතකින් පිහියක් තියාගෙන ඉන්න දෙපාර්ශ්වයක් එකතු වෙලා ජනාධිපතිවරණයට යන්නේ කොහොමද කියන එක මේ අවස්ථාවේදී අසමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 2.35]

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ ගෙනෙන මේ නියෝග අනුමත කර ගැනීමට ඉදිරිපත් කර තිබෙනවා. එම ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කර තිබෙන කරුණු සම්බන්ධව අපට ගැටලුවක් නැති වුණත්, නියෝජ්‍ය අමාත්‍ය ගරු නලින් බණ්ඩාර ජයමහ මැතිතුමා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝග ගැන මෙම පාර්ලිමේන්තුව හමුවේ විශාල ප්‍රකාශයක් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපනයන ආර්ථිකය හැම අංශයකින්ම ශක්තිමත් වෙලා තිබෙනවාය, තේ, රබර්, පොල් හැම එකකින්ම මෙපමණ, මෙපමණ වැඩි වෙලා තිබෙනවාය කියලා එතුමා සංඛ්‍යාලේඛන ඉදිරිපත් කළා. හැබැයි, ඒ කුමන ආකාරයේ සංඛ්‍යාලේඛන ඉදිරිපත් කළත් අපට දැනෙන විධියට නම් අපේ අපනයන ආර්ථිකය කඩාගෙන වැටිලා, ආනයන ආර්ථිකය ශක්තිමත් වුණු තත්ත්වයක් තමයි අද රට තුළ තිබෙන්නේ. අපේ විදේශ ආදායම් ඉතා බරපතළ ආකාරයෙන් කඩා වැටිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටට විශාල විදේශ විනිමය ප්‍රමාණයක්, විදේශ ආදායම් ප්‍රමාණයක් ගෙන ආ අපනයන භෝග කර්මාන්තය අද ඉතාම බරපතළ ලෙස පිරිහීමකට ලක් වීම පිළිබඳව මම මේ අවස්ථාවේදී කරුණු දක්වන්නට බලාපොරොත්තු වෙනවා.

අපේ රටට 1505දී පෘතුගීසින් ඒමේත්, 1692දී ලන්දේසින් ඒමේත්, 1815දී ඉංග්‍රීසින් ඒමේත් ප්‍රධානම හේතුවක් හැටියට ඉතිහාසයේ සඳහන් වෙලා තිබෙන්නේ කුළු බඩු භෝග, මුතු මැණික් සහ ඇත් දළ වැනි දේවල් හරහා ආදායම් උපදවා ගැනීමේ බලාපොරොත්තුව ඔවුන්ට තිබීමයි. ඒ නිසා තමයි මේ ජාතීන් අපේ රටට කඩාගෙන පැනලා තිබෙන්නේ. ඒ වාගේම ලන්දේසින් අපේ රට යටත් කර ගත්තාට පස්සේ කුරුඳු ගහක් කපා දැමීම මරණීය දණ්ඩනය ලැබිය හැකි වරදක් බවට ඒ දවස්වල නීතිපොත්වලට නීති ඇතුළත් කර තිබුණා. ලෝක කුරුඳු නිෂ්පාදනයෙන් සියයට 25ක තරම් ප්‍රමාණයක් නිෂ්පාදනය කර සපයන, ගුණාත්මක තත්ත්වයෙන් ඉතාම ඉහළ අපනයන භෝග නිෂ්පාදනවල පාරාදීසයක් ලෙස තමයි අපේ රට සලකන්නේ. ඒවා තමයි, කුරුඳු, ගම්මිරිස්, ගොරකා, සියඹලා, එනසාල්, සාදික්කා, වසාවාසි, කරුංකා වාගේ ද්‍රව්‍ය. හැබැයි, එදා අපරදිග ජාතීන් පවා අපේ රට යටත් කර ගන්න ප්‍රධාන හේතුවක් වූ, රටට විශාල වශයෙන් ආදායම් මාර්ග උත්පාදනය කරන මේ කර්මාන්තවල නියැලී ඉන්න ලක්ෂ 20කට අධික පිරිසක් අද ඉතාම ශෝචනීය තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. මේ අපනයන භෝග හරහා ඔවුන් ජාතික ආර්ථිකයට දැක්වූ දායකත්වය ඉමහත්.

අපි දැන් සිහිපත් කරනවා, ලලිත් ඇතුලත්මුදලි මහතා. කෘෂිකර්ම ඇමතිවරයා විධියට එදා පැවැති රජය යටතේ එතුමා කටයුතු කළ කාලයේ සුළු අපනයන භෝග නමින් හැඳින්වූ මේ භෝග අපනයන භෝග වශයෙන් නම් කළා. ඒ කියන්නේ අපනයන ආදායම් ගෙන එන භෝග බවට මෙම භෝග හඳුන්වා දීලා, ඒවා සම්බන්ධයෙන් විශාල ඇගැයීමකුත් එතුමා කළා. අපේ

රටේ රැකියා නියුක්ත වූ පිරිසෙන් -ආදායම උපද්දන පිරිසෙන්- ලක්ෂ 20කට අධික ප්‍රමාණයක් මේ කර්මාන්තවල නියැලී සිටීම නිසා ඒ අය රටට බරක් නොවී, රජයට බරක් නොවී ස්වාධීනව ස්වයං රැකියා මාර්ග හදාගෙන ජීවත් වුණා. ඒ වාගේම පෙර පැවැති රජයන් විසින් මේ අපනයන භෝග කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා අපනයන භෝග ගම්මාන හැදුවා. ඵලදායීතා වර්ධන ගම්මාන නමින් තවත් ටිකක් ආවා. ඒ සඳහා ගොවියාට ලබා දිය හැකි බොහෝ සහන මේ කර්මාන්තය නඟා සිටුවීම සඳහා විවිධ අවස්ථාවලදී ලබා දුන්නා. මට මතක් වෙනවා, අපේ රජය පැවැති පසුගිය කාලසීමාව තුළ මේ අපනයන භෝග පැළ වර්ග කෘෂිකර්ම අමාත්‍යාංශය සහ සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය මඟින් ගොවියාට නොමිලේ ලබා දුන් බව. ඒ වාගේම වගා උපදෙස් සහ පොහොර සහනාධාරත් ගොවියාට නොමිලේ ලබා දුන්නා. ඒ දේවල් නොමිලේ ලබා දීම තුළින් විශාල වශයෙන් අපනයන භෝග කර්මාන්තය මත තමන්ගේ ජීවිකාව කර ගෙන යන, ආර්ථික වශයෙන් ශක්තිමත් ගොවීන් විශාල පිරිසක් ඇතිවුණා. ඒ වාගේම ඒ හරහා යම් යම් කර්මාන්ත ඇතිවුණා. රත්නපුරය දිස්ත්‍රික්කයේ රක්වාන ආසනයේ තිබෙන වතුයායක කුරුඳු කර්මාන්තශාලාවක් ඇතිකළා; ගම්මිරිස් ආශ්‍රිත කර්මාන්ත ඇතිවුණා. විශේෂයෙන් මාතලේ වාගේ දිස්ත්‍රික්කවල සුළු අපනයන භෝග උද්‍යාන - spice gardens - ඇති කළා. ලංකාවේ තිබෙන දිස්ත්‍රික්ක 25න් වැඩි ප්‍රමාණයක කුමන හෝ අපනයන භෝගයක් වගා කරන මට්ටමකට පත්වුණා. ඒ තුළින් විශාල ආදායමක් හොයා ගත් ගොවි ජනතාව අද වනකොට බරපතළ ආකාරයට ඉතාම කනගාටුදායක තත්ත්වයකට පත්වෙලා තිබෙනවා වාගේම, අපේ ආණ්ඩුව කාලයේ එදා නොමිලේ දුන් පැළවලට අද සියයට 50ක් සහනාධාර ලබාදෙනවා කියලා මේ වර්තමාන ආණ්ඩුව ව්‍යාජයක් මවා පා තිබෙනවා. එදා රුපියල් 6.50ට තිබුණු කුරුඳු පැළය අද රුපියල් 21ක් කරලා ඒකට සියයට 50ක සහනයක් දෙනවා කියලා භාගයක් අය කරනවා. එතකොට එදා නිකම් දුන්නාටත් වඩා වැඩි ගණනකට අද අපට පැළ ලබා දීලා මේ ආණ්ඩුව කියනවා, වැඩි මුදලක සහනයක් දෙනවා කියලා. මේ ආණ්ඩුව මෙවැනි කටයුතුවලින් මහා ව්‍යාජයක් තමයි මේ කර ගෙන යන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වනකොට මා සතුව ලේඛන කිහිපයක් තිබෙනවා. වර්තමාන ප්‍රාථමික කර්මාන්ත අමාත්‍ය දයා ගමගේ මැතිතුමාගෙන් අපි කීප අවස්ථාවකදී ඇහුවා, ගම්මිරිස් පිට රටින් ගෙනෙනවා නේද? කියලා. එතුමා එය කිසි වෙලාවක පිළිගන්න සූදානම් වුණේ නැහැ. හැබැයි, 2018 පෙබරවාරි මාසයේදී ගරු ජනාධිපතිතුමා විසින්ම ප්‍රකාශ කරන්න යෙදුණා, ගම්මිරිස් ලංකාවට ගෙන ඒම අපට වහාම නතර කරන්න සිද්ධ වනවා කියලා. ඒ වෙලාවේත් එතුමා කිව්වා, අපි ගම්මිරිස් පිට රටින් ගෙනෙන්නේ නැහැ කියලා. මේ විෂය භාර ඇමතිවරයා දිගින් දිගටම රටත්, ගොවි ජනතාවත් රැවට්ටුවා. එම නිසා අද රටේ ජනතාව අතර සාධාරණ විවේචනයක් තිබෙනවා. වියට්නාමය, ඉන්දුනීසියාව වැනි රටවලින් කුළුබඩු භෝග ගෙන ඒමේ ව්‍යාපාරයට මේ ඇමතිවරු සම්බන්ධයි කියන චෝදනාව අද රටේ සාමාන්‍ය ජනතාව තුළින් ප්‍රකාශ වෙනවා. ඒකට සාක්ෂි තිබෙනවා. වලස්මුල්ල, මිද්දෙනිය වාගේ පළාත්වල වියට්නාමයෙන් ගෙන්වපු ගම්මිරිස් ටොන් දහස් ගණනින් ගොඩ ගහලා තිබෙනවා. මේවා ගෙනැල්ලා ලංකාවේ නිෂ්පාදන එක්ක කලවම් කරලා පිටරට යවන කර්මාන්තයක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා සතුව තිබෙනවා, ඒ සම්බන්ධව තිබෙන සංඛ්‍යාලේඛන. 2016 අවුරුද්දේ රජයේ බලපත්‍ර මත ලංකාවට ගම්මිරිස් මෙට්‍රික්ටොන් 498ක් ගෙනැල්ලා තිබෙනවා. 2017 අවුරුද්දේ ලංකාවට ගම්මිරිස් මෙට්‍රික්ටොන් 2,395ක් ගෙනැල්ලා තිබෙනවා. 2018 අවුරුද්දේ මෙට්‍රික්ටොන් 258ක් ගෙනැල්ලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2016, 2017, 2018 යන වසර තුනේ පමණක් ගම්මිරිස් මෙට්‍රික්ටොන් 3,153ක් විදේශ රටවලින් බලපත්‍ර සහිතව ලංකාවට ගෙනැල්ලා තිබෙනවා. ආසන්න වශයෙන් ගත්තොත් කිලෝග්‍රෑම් තුන්කෝටි පහළොස්ලක්ෂයක්, බලපත්‍ර සහිතව පිට රටින් ගෙනැල්ලා තිබෙනවා. පසු ගිය දවස්වල ජනමාධ්‍ය හරහා වාර්තා කෙරුණා, වියට්නාමය වැනි රටවලින් ගම්මිරිස් ගෙනැල්ලා මහ මුහුද මැදදී නැවෙන් නැවට පැටෙව්වා කියලා. ඒ පටවන බහාලුම්වල ගහනවා, “Origin: Sri Lanka” කියලා. එහෙම ගහලා ආපහු සැරයක් ලංකාවේ ගම්මිරිස් ලෙසින් පිට රට යැව්වා. ප්‍රතිඅපනයනය කිරීම සඳහා ගම්මිරිස් පිට රටින් ගෙන ඒමේ කටයුත්තට සම්පූර්ණයෙන්ම රජයේ බලධාරින්, රජයේ වග කිව යුත්තන් මැදිහත් වුණාය කියන චෝදනාව අද ගොවීන් බැහැර කරන්නේ නැහැ. ගොවීන් තුළ ඒ මතය මුල් බැහැගෙන තිබෙනවා. ඒ තමයි ගම්මිරිස්වල තත්ත්වය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුරුඳු කිලෝ එක රුපියල් 2,600ට ගිය අවුරුද්දේ දුන්නා. අද වන විට කුරුඳු කිලෝ එක රුපියල් 1,600ට බැහැලා. රුපියල් දාහකින් කුරුඳු කිලෝ එකක මිල අඩු වෙලා තිබෙනවා. පහත රට තේ ගොවියා හැටියට අපි තේ දළු කිලෝ එක රුපියල් 105ට දුන්නා. අද තේ දළු කිලෝ එකේ මිල රුපියල් 70 බවට පත් වෙලා තිබෙනවා. සැප්තැම්බර් මාසයේ රුපියල් 60ට තේ දළු කිලෝ එකක මිල අඩු වෙනවා කියලා යම් යම් වාර්තා අනුව ප්‍රකාශ වෙනවා.

ඊළඟට පැඟිරි. අපේ කාලයේ පැඟිරි බෝතලය රුපියල් 12,500යි. අද වෙන කොට පැඟිරි බෝතලය රුපියල් 1,200යි. රුපියල් 500ට දීපු ගොරක කිලෝ එක අද රුපියල් 80යි. රුපියල් 500ට දීපු කරුංකා කිලෝ එක අද රුපියල් 200යි. රුපියල් 750ට තිබුණු පුවක් 100, අද වන විට රුපියල් 250යි. රුපියල් 4,000ට, 5,000ට තිබුණු එනසාල් කිලෝ එක අද රුපියල් දාහයි. වර්තමාන ආණ්ඩුව විසින් පිට රටින් මේවා ආනයනය කිරීමට ලබා දුන් බලපත්‍ර සහ හොර මගඩි ක්‍රම නිසා රටේ අපනයන භෝග ගොවියාගේ ආර්ථිකය කඩාගෙන වැටිලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද මැලේසියාවෙන් රබර් කිරි ගෙන්වනවා; රබර් ෂීට් ගෙන්වනවා; දුම් ගැසූ ෂීට් ගේනවා, ක්‍රේප් රබර් ගෙනෙනවා; රබර් ඔට්ටපාලුත් ගෙන්වනවා. මේ ආණ්ඩුවේ මේ රණ්ඩු වෙන නායකයෝ තුන් - හතර දෙනා එකතුව "ජාතික ආර්ථිකයක්, විදේශ ආදායම්, අපනයන ආර්ථිකයක්, ඇති හැකි රටක්, 2025 අලුත් රටක්" විධියට විවිධ බයිලා කිව්වා. මේ කවුරු මොනවා කිවවත්, අද රටට අවශ්‍ය සියල්ල පිට රටින් ගෙනෙනවා. ලෝකයේ හොඳම තේ වගා කරපු රට හැටියට -ලෝකයේ හොඳම තේ නිෂ්පාදන කරපු රට හැටියට- අපේ රට ඉතිහාසයට එකතු වෙලා තිබුණා. අද කෙන්යාවෙන් බාල තේ ගෙනැල්ලා "ශ්‍රී ලංකා තේ" කියලා පිට රට යවන නිසා තේ කර්මාන්තයත් කඩාගෙන වැටිලා තිබෙනවා.

අද වැවිලි කර්මාන්ත ඇමතිවරයෙක් ඉන්නවා; අපනයන භෝග ඇමතිවරයෙක් ඉන්නවා; විදේශ වෙළෙඳාම සම්බන්ධයෙන් රාජ්‍ය ඇමතිතුමෙකුත් ඉන්නවා. එතුමන්ලා ඇවිල්ලා පාර්ලිමේන්තුවට සියලු සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරනවා. අද උදේත් අපේ හිතවත් නලින් බණ්ඩාර මැතිතුමා ලොකු සංඛ්‍යාලේඛන වගයක් ඉදිරිපත් කළා. හැබැයි, ඔබතුමන්ලාට කියන්න පුළුවන්ද, අපනයන භෝග සම්බන්ධව මේ ගොවි ජනතාවට අත් කරලා තිබෙන ඉතා ඛේදජනක තත්ත්වයට මේ ආණ්ඩුව නොවෙයි නම් වග කියන්නේ, මොන ආණ්ඩුවද වග කියන්න ඕනෑ කියන එක? මේ ආණ්ඩුවේ ඇමතිවරු නැත්නම් මොන ආණ්ඩුවේ ඇමතිවරුද ඒකට වග කියන්න ඕනෑ? ගම්මිරිස්වලට, කෝපිවලට, කරුංකාවලට, පුවක්වලට, ගොරකාවලට, සියඹලාවලට මිලක් දෙන්න බැරි මේ ආණ්ඩුවේ අපනයන ඇමතිවරයා ගොවීන් නොමරා මරන්නේ නැතුව වහාම ඉල්ලා අස්වෙන්න ඕනෑ. ලක්ෂ 20කට අධික ගොවි ජනතාව මහ මඟට බස්සලා, තමන්ගේ සාක්කු, යටිමඩි පුරවා ගන්න මෙවැනි ඇමතිවරුන් ඉන්න ආණ්ඩුවක් තවදුරටත් මේ රටට අවශ්‍යද කියන ප්‍රශ්නය අපි විමසිය යුතු වෙනවා.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ඔබතුමා බලාපොරොත්තු වන ඇමතිකම මොකක්ද?

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ඔබතුමාගේ ඇමතිකම නම් නොවෙයි. ඒක නම් නොවෙයි.

ආ! මම හිතුවේ, ඒක කිව්වේ අපේ හිතවත් නලින් බණ්ඩාර ඇමතිතුමා කියලා. ගරු මන්ත්‍රීතුමනි, මේක විහිළුවකට ගන්න එපා.

ගරු නලින් බණ්ඩාර මැතිතුමා ජීවත් වන කුරුණෑගල දිස්ත්‍රික්කය වුණත් අපනයන භෝගවලට බොහොම සුප්‍රසිද්ධ ආසනයක්. තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමනි, ඔබතුමාත් ජීවත් වන්නේ ඒ දිස්ත්‍රික්කයේ. එහෙම නම් ඇමති මණ්ඩලය ඇතුළේ, පාර්ලිමේන්තු කණ්ඩායම ඇතුළේ හඬක් නඟලා තමුන්නාන්සේලා ඇයි මේ සම්බන්ධයෙන් යම්කිසි පියවරක් ගන්නේ නැත්තේ? ඒ වෙන මොකවත් නිසා නොවෙයි. මේ විෂය භාරව ඉන්න ඇමතිවරුන් සහ අනෙකුත් බලධාරීන් හොර තක්කඩිකම්වලින් ගම්මිරිස් ගෙන්වන නිසා. කවුද මොහොමඩ් ඉබ්‍රාහිම්ට බලපත්‍ර දුන්නේ? බලපත්‍ර 136ක් දීලා තිබෙනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු සොයිසා මන්ත්‍රීතුමනි, ඔබතුමා දිගින් දිගටම ගම්මිරිස් ගැන කථා කළා. ඒ නිසා මම කියන්න ඕනෑ, "දින 52" කුමන්ත්‍රණයෙන් පස්සේ, අපේ අමාත්‍යාංශයට වාණිජ දෙපාර්තමේන්තුව ඇතුළත් වුණාට පස්සේ අපේ ඇමති මලික් සමරවික්‍රම මැතිතුමා ගම්මිරිස් ප්‍රතිඅපනයනය කිරීම සම්පූර්ණයෙන් නතර කරන්න කටයුතු කළ බව. දැන් ගම්මිරිස් ප්‍රතිඅපනයනය නතර කරලා තිබෙන්නේ. වෙළෙඳ පොළ මිල තීන්දු කිරීම අපට කරන්න පුළුවන් දෙයක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි. ඒක තීන්දු වෙන්නේ වෙළෙඳ පොළ ඉල්ලුම මත. නමුත්, ගම්මිරිස් ප්‍රතිඅපනයනය කිරීම දැන් ගැසට් පත්‍රයකින් සම්පූර්ණයෙන් නතර කරලා තිබෙන්නේ.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, බොහොම ස්තුතියි.

ගම්මිරිස් මිල තීරණය කිරීම සහ ගොවියා ආරක්ෂා කර ගැනීම සම්බන්ධව අපට ගත හැකි ක්‍රියා මාර්ගයක් හෝ විකල්පයක් නැහැ කියනවා නම්, මොකටද එවැනි ආණ්ඩුවක් තිබිලා? ගම්මිරිස් ගොවියා, තේ ගොවියා, රබර් ගොවියා, කුරුඳු ගොවියා සහ කැලේ තිබෙන සියඹලා ටික ගෙනෙන ගොවියා ආරක්ෂා කර ගන්නත් බැරි නම් මොකටද ආණ්ඩුවක්? තමුන්නාන්සේලා නිතරම කියනවා, "කුමන්ත්‍රණකාරී දින 52 ආණ්ඩුව" කියලා. ඒ කුමන්ත්‍රණය සම්බන්ධයෙන් තමුන්නාන්සේලා ගත්ත ක්‍රියා මාර්ගය මොකක්ද? කුමන්ත්‍රණකාරයෝ ගෙන යන්න කෝ අධිකරණයට; උසාවියට. එහෙම කළ දෙයකුත් නැහැ. හැබැයි, තවමත් ඒ ගැන කිය කියා ඉන්නවා. හැබැයි අපි අහනවා, මන්ත්‍රී ධුර 44ක් තිබුණු මනුස්සයා අගමැති කරපු එක කුමන්ත්‍රණයක් නොවෙයිද? මන්ත්‍රීවරු 44 සිටි කෙනා අගමැති වුණේ! එහෙම නම් කුමන්ත්‍රණකාරී අගමැතිවරයෙක් තමයි 2015 ජනවාරි 08 මැතිවරණයෙන් පසුව පත් වුණු රනිල් වික්‍රමසිංහ මැතිතුමාත්. එහෙම නම් එතුමාත් කුමන්ත්‍රණකාරයෙක්. ඒ නිසා ව්‍යවස්ථාවට අනුව සිද්ධ වෙච්ච දේවල් සම්බන්ධව මෙතැන කථාබහ කරනවාට වැඩිය අපි-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ අද ඉදිරිපත් කරපු නියෝග ගැන ඔබතුමන්ලා කුමන ආකාරයෙන් පාරම්බෑවත් ආණ්ඩුව ගොවි ජනතාව කබලෙන් ළිපට ඇද දාලා විනාශ කරලායි තිබෙන්නේ.

එවැනි තත්ත්වයක් තිබෙද්දි, අපේ ගරු නලින් බණ්ඩාර මැතිතුමා එතුමාගේ කථාව අවසානයේ කිව්වා, පොහොට්ටුවයි, අරගොල්ලන් සහ මේගොල්ලන් එකතු වෙලා සන්ධාන හදනවාද මොකක්ද කියලා. අපේ එක අපි බලා ගන්නම්. අපි ඉන්නේ විපක්ෂයේ. අපේ සන්ධානය අපි හදා ගන්නම්. අපේ අපේක්ෂකයා අපි ඉදිරිපත් කරන්නම්. අපි කැමැති කැමැති කට්ටිය එකතු වෙන්නම්. හැබැයි, ඔය එකට ඉන්නවාය කියන කට්ටිය, අගමැතිතුමායි, නියෝජ්‍ය නායකතුමායි, විදුලිබල ඇමතියි අනෙක් කට්ටියයි එකට ගෙනැල්ලා පුළුවන් නම් එක වේදිකාවකට නග්ගන්න. කිසිම දවසක ඒක කරන්න බැහැ. අද වනකොට එක්සත් ජාතික පක්ෂය කෑලි කෑලිවලට කැඩිලා යන තත්ත්වයක් තිබෙන්නේ. හෙට-අනිද්දා වනකොට ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කළාට පස්සේ ලංකාවේ පැරණිම දේශපාලන පක්ෂය ක්ෂණයකින් කැඩිලා, බිඳිලා විනාශ වෙලා යන හැටි අපට බලා ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙලාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

[අ.භා.2.49]

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ විවාදය පැවැත්වෙන්නේ සුළු අපනයන භෝග සම්බන්ධව. මෙම විවාදයේදී විෂයට අදාළව අදහස් ගණනාවක් ඉදිරිපත් වුණා වාගේම, විෂයට අදාළ නොවන කරුණු කීපයක් පිළිබඳවත් දිගින් දිගටම කථා කළා. ප්‍රධාන වශයෙන්ම මම කැමැතියි, මේ අමාත්‍යාංශයට අදාළ කාරණා කීපයක් පිළිබඳව අවධානය යොමු කරවන්න.

අපේ රටේ සුළු අපනයන භෝග පමණක් නොවෙයි, සියලු අපනයන වර්ධනය කර ගන්න පුළුවන් තත්ත්වයක් අපට ලැබුණේ නැහැ. පාසල් යන අවධියේ අපේ රටේ ප්‍රධාන ආදායම් මාර්ග ඇහුවාම, තේ, පොල්, රබර්, ගම්මිරිස්, කුරුඳු, කොකෝවා යනාදි වශයෙන් ලැයිස්තුවක් කියාගෙන කියා. අද ඒවා ක්‍රමානුකූලව අඩු වෙමින් යන අතර, වෙනත් අංශ ඉස්සරහට ගිහිල්ලා තිබෙනවා. සමහර වෙලාවට මේ ක්ෂේත්‍රය පිළිබඳව රජයෙනුත් දැඩි මැදිහත් වීමක් දක්වන්නේ නැති බව තමයි අපට පෙනෙන්න තිබෙන්නේ.

1977න් පස්සේ බලයට පත් වුණු ආණ්ඩුව විවෘත ආර්ථික ක්‍රමය ඇති කළා. ඒ විවෘත ආර්ථික ක්‍රමය හරහා විවිධ අයට අවස්ථාව ලබා දුන්නා, අවශ්‍ය දේත්, අනවශ්‍ය දේත් මේ රටට ගෙනෙන්න. ඒ හරහා තමයි අපේ අපනයන භෝග සම්බන්ධ ප්‍රශ්න ගණනාවකට අපට මුහුණ දෙන්න සිද්ධ වුණේ.

ඉදිරියේදීත් තව ගැටලු කිහිපයකට අපට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒ තමයි, අපේ තේවලට කසළ තේ එකතු කිරීමේ

ගැටලුව. තේවලට කසළ තේ එකතු කරන්න ඉඩ දීලා තිබෙනවා වාගේම, ඒ කටයුත්ත කරගෙනත් යනවා. ඒ වාගේම, ප්‍රතිඅපනයනයට කියලා ලංකාවට තේ ගෙන්වනවා. මේ තත්ත්වය නිසා අපේ තේවලටත් ඉදිරියේදී අනතුරුදායක තත්ත්වයක් ඇති වෙන්න පුළුවන්.

අපේ කුරුඳුවල මිල රුපියල් දහසකින් විතර අඩු වෙලා. කුරුඳු වෙනුවට cassia කියන වර්ගය රටවල් බොහොමයක පාවිච්චි කරන්න පටන් අරගෙන තිබෙනවා. සමහර වෙලාවට අපේ කුරුඳු නමින්ම ඒවා ඒ රටවලට යන බවත් අපට වාර්තා වෙනවා. ඒ cassia නිසා තමයි අපේ කුරුඳු මිලට මේ වාගේ බලපෑමක් සිද්ධ වෙන්නේ. රජය, අපේ තානාපති කාර්යාල අපේ කුරුඳු ප්‍රචලිත කිරීමට ගන්නා උත්සාහය පිළිබඳව මම නම් සෑහීමකට පත් වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම, තව ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඒ අතරින් එකක් තමයි, පොල් සම්බන්ධව තිබෙන ප්‍රශ්නය. අනෙක් ඒවාට අතිරේකව දැන් පොල් මිල සම්බන්ධව තිබෙන ගැටලුව මම කියන්න කැමැතියි. කාලයක් අපේ පොල් ආශ්‍රිත දේවල් සම්බන්ධයෙන් දෙවැනි තැනටයි අපනයනය සිද්ධ වුණේ. ඒ තත්ත්වයට තිබුණු අපේ ඒ වෙළෙඳ පොළ දැන් නැති වෙලා. අපේ ඒ අපනයනය හරියට සිද්ධ වෙන්නේ නැහැ. අපට ප්‍රමාණවත් විදේශ විනිමය ප්‍රමාණයක් ගෙන්වා ගන්නා වැඩ පිළිවෙළක් නැහැ. රජය නිසි වේලාවට, නිසි විධියට ඒවාට මැදිහත් වෙන්නේ නැහැ. එක වතාවක් පිට රටින් පොල් ගෙනෙන තත්ත්වයට පත් වුණා. පොල් නැව් ගණනක් ගෙනැල්ලා, මේ රටට ගෙනෙන්න ඉඩ දෙන්නේ නැතිව ඒ පොල් ටික ආපහු යවන්න සිද්ධ වුණා. ඒ වාගේම, පසුගිය කාලයේ පොල් හිඟයක් ඇති වුණා. ඒ අවස්ථාවේත් පොල් ආනයනය කරන්න, එහෙම නැත්නම් kernel විධියට සැකසූ පොල් ගෙනෙන්න අවසර දුන්නා. ඒ වාගේම, ඒ වෙලාවේ පොල් අපනයනය කිරීම නැවැත්තුවා; DC විධියට අපනයනය කරන එක නැවැත්තුවා. හැබැයි, දැන් පොල් අස්වැන්න වැඩි වෙලා මිල අඩු වෙනකොට, ඒවා නැවතත් ප්‍රකෘති තත්ත්වයට පත් කරන්න රජයේ මැදිහත්වීමක් තිබෙනවාද කියන එක මම අහන්න කැමැතියි. මේ වාගේ සිද්ධියක් ඇති වුණාම තමයි රජයක් ඕනෑ වෙන්නේ. පොල් ඉන්දන එක, පොල් ටික කඩාගන්න එක මිනිස්සු කරගන්නවා. නමුත්, මිනිසුන්ට මේ වාගේ ප්‍රශ්නයක් ඇති වුණාම පොල් මිල යම් මට්ටමකට ගෙනෙන්න, සාධාරණ මිලක් ඒ මිනිසුන්ට ලබා දෙන්න රජයේ හරියාකාර මැදිහත්වීමක් කොතරම්දුරට තිබෙනවාද? රජය මැදිහත් වෙන්නේ ඒවාට නොවෙයි. පොල්වලට ආදේශ මේ රටට ගෙන්වන ඒවාට රජය මැදිහත් වෙනවා. එක කාලයක් පොල් තෙල් පිට රටින් ගෙනාවා. අපි පොල් තෙල් පිට රට යැවූ රටක්. ඒ වාගේම එළවලු තෙල් ආදී විවිධ තෙල් වර්ග රාශියක් දැන් මේ රටට ගෙනෙනවා. වෙළෙඳ පොළේ තිබෙන මේ තෙල්වල සත්ව තෙල් තිබෙන බව අපට දැනගන්න තිබෙනවා. එළවලු තෙල් කියලා තමයි ගෙනෙන්නේ. එළවලු තෙල් කියලා ගෙනෙන මේ තෙල් වර්ගවලට ඌරු තෙලුත් මිශ්‍ර වෙලා තිබෙනවාය කියලා අපට දැනගන්න තිබෙනවා; අපට තොරතුරු ලැබෙනවා. මේවායේ ප්‍රමිතිය හොයන්නේ කවුද? කඩවල්වල විවිධ නම්වලින් තෙල් වර්ග විකුණන්න තිබෙනවා. මේවායේ තත්ත්වය, ගුණාත්මකභාවය සොයන්නට මේවායේ ප්‍රමිතිය හොයන ආයතනවලට තිබෙන ශක්තිය මොකක්ද? එහෙම සොයා බැලීමක් හරියට සිද්ධ වෙනවාද? පොල් තෙල් කියලා, අනෙකුත් තෙල් පොල් තෙල් එක්ක කලවම් කරලා විකුණන බව අපි දන්නවා. එහෙමනම් මොකක්ද කරන්න ඕනෑ? මේ වෙලාවේ වහාම එළවලු තෙල්වලට තිබෙන බද්ද වැඩි කරන්න ඕනෑ. ඒකට තමයි රජයක් ඕනෑ. ඒකෙන් රජයට ආදායමකුත් ගන්නත් පුළුවන්. ඒවායේ යම් පාලනයක් ඇති කරන්න ඕනෑ. හොඳ, ගුණාත්මක, ප්‍රමිතියෙන් යුත් තෙල් වර්ග තමයි, එහෙම ගෙනෙනවා නම් ගෙනෙන්න ඉඩ දෙන්න ඕනෑ. නමුත් ඒ පිළිබඳව කිසිදු සොයා බැලීමක් සිද්ධ වන බව අපට පෙනෙන්නට නැහැ.

ඒ වාගේම, 1977න් පසුව අපේ නිෂ්පාදන ආර්ථිකය පිළිබඳව අවධානයක් යොමු කළේ නැහැ. ඒක සම්පූර්ණ කඩා වැටුණා. අපි, අපට අවශ්‍ය දේවල් නිෂ්පාදනය කරගෙන පරිභෝජනය කරපු රටක්. 1977ට පෙර, අපට අවශ්‍ය ආහාර - පානවලින් සියයට අනූවකට වැඩි ප්‍රමාණයක් අපේ රටේම නිෂ්පාදනය කරගෙන අතිරේක ආහාර ප්‍රමාණයක් පිට රට යැව්වා. නමුත්, මොකක්ද 1977න් පසුව සිද්ධ වුණේ? ලංකාවේ ගොවිතැනට, එහෙම නැත්නම් කෘෂි කර්මාන්තයට වඩා කර්මාන්ත ක්ෂේත්‍රය හොඳයි, වෙනත් සේවා ක්ෂේත්‍රවලට අපි යන්න ඕනෑ කියලා මේ කෘෂිකර්ම ක්ෂේත්‍රය අමතක කළා. මේ අය දිරි ගැන්වූයේ නැහැ. සුළු අපනයන, එහෙම නැත්නම් අපනයන තත්ත්වයෙන් හෝ ලංකාවට අවශ්‍ය දේවල් නිෂ්පාදනය කර ගැනීම පිළිබඳව රාජ්‍ය මැදිහත් වීමක් හරියාකාරව සිදු වුණේ නැහැ. එක ආණ්ඩුවක් විතරක් නොවෙයි, අපේ ආණ්ඩුයි, අනෙක් ඔක්කොම ආණ්ඩුයි ඒ සම්බන්ධයෙන් වගකීම දරන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විවෘත ආර්ථිකය හඳුන්වා දුන්නා. එයට මානුෂික මුහුණුවරක් ගෙනෙනවාය කියලා අපි එය දිගටම පවත්වාගෙන ගියා. නමුත් මොකක්ද සිද්ධවෙලා තිබෙන්නේ? අවසානයේදී අපට අවශ්‍ය ආහාර අපට පිට රටින් ගෙන්වන්න සිද්ධවෙලා තිබෙනවා. කෘෂිකර්ම අමාත්‍යවරයා විධියට මා මේ පාර්ලිමේන්තුවේදී කිව්වා, අපට වවාගෙන කන්න පුළුවන් දේවල් පිට රටින් ගෙනෙන්න කොපමණ මුදලක් වියදම් කරනවාද කියලා. ඒ වියදම් කිරීම පිළිබඳව නැවත කියන්න මා වෙලාව ගන්නේ නැහැ. ඒවා ගෙන්වන එක පාලනය කරනව, නතර කරන්න, ඒවා මේ රටේ නිෂ්පාදනය කරන්න කොපමණ උනන්දුවක් දක්වා තිබෙනවාද කියන එක පිළිබඳව අප විමසා බලන්න ඕනෑ. අපේ රටේ බොහෝ දේවල් අපනයනය කරන්න අවස්ථාව තිබෙනවා. ඒවා ප්‍රචලිත කරන්න, ගොවීන් දිරි ගන්වන්න, ඒ අයට වෙළෙඳ පොළක් සොයා දෙන්න රජය කොපමණ උනන්දුවක් දක්වනවාද කියන එක පිළිබඳව අපි කල්පනා කරලා බලන්න ඕනෑ. මේ රටේ ගොවියාට වගා කරන්න කියලා දෙන්න ඕනෑ නැහැ; ඒ ගොල්ලෝ වගා කරනවා. ඒ ගොල්ලන්ට ඕනෑ, හොඳ මිලක්, විශ්වාසයක් හා රජයේ මැදිහත් වීමක්. මාස ගණනක් තමයි කෘෂිකර්ම අමාත්‍යවරයා විධියට මා සිටියේ. මා ඒ කාලය තුළ ගොවියාට ඒ විශ්වාසය ඇති කළා. ලංකා ඉතිහාසයේ වැඩිම වී අස්වැන්න පසුගිය කන්නයේ ලැබුණා.

අපි උඳුවලින් ස්වයංපෝෂිත වන මට්ටමට පැමිණියා. අපි වවුනියාව ප්‍රදේශයේ උඳු කලාපයක් ඇති කළා. ඒ කලාපයේ අක්කර 16,000ක අලුතින් උඳු වගා කෙරෙව්වා. පුරන් කුඹුරු අක්කර 28,000ක් වගා කෙරෙව්වා. මෑත කාලයේ ලැබුණු වැඩිම බඩ ඉරිඟු අස්වැන්න ඒ කන්නය තුළ ලබාගන්න පුළුවන්කම ලැබුණා. අපි ගම් ඇතුළේ නැවත වගා කරන්න පටන් ගත්තා. පලතුරු පැළ බෙදා දීලා ඒවා වගා කිරීම ප්‍රචලිත කරන්න පටන් ගත්තා. නමුත් දැන් ඒ වැඩසටහන් කඩා කප්පල්වෙලා තිබෙනවා. ඒවා පිළිබඳව අවධානයක් නැහැ. නැවත පිට රටින් ගෙන්වන බලාපොරොත්තුවෙන් ඒ සියලු කටයුතු නොකරන බව තමයි අපට පෙනෙන්නේ. ඒ පිළිබඳව රාජ්‍ය මැදිහත්වීම ඉතාම පහළ මට්ටමකට පත්වෙලා තිබෙනවාය කියන එකත් අපි සඳහන් කරන්න ඕනෑ. මේවායේ ප්‍රතිඵල තමයි අද මේ රටේ ජනතාව භුක්ති විඳින්නේ. දැන් මිනිසුන්ට ආදායමක් ලැබෙන්නේ නැහැ, මිනිසුන්ට ජීවත් වෙන්න බැහැ. මේ යන විධියට ගියොත් තව අවුරුදු දෙකක් පමණ යනකොට මිනිසුන්ට කන්න නැතුවයි පාරට බහින්න වෙන්නේ. අපි ඒ පිළිබඳව හිතලා නැහැ. ඒ වෙනුවට සමෘද්ධි සහනාධාරය ලක්ෂ 6කට දීලා වැඩක් වෙන්නේ නැහැ. ඒකෙන් පිරිමහන්න බැහැ. ඒ සඳහා රුපියල් ලක්ෂ 30,000ක් - රුපියල් බිලියන 3ක්, එහෙම නැත්නම් රුපියල් මිලියන 3,000ක්- වියදම් කරලා ප්‍රචාරක දැන්වීම් පළ කළාය කියලා මිනිසුන්ගේ බඩ පිරෙන්නේ නැහැ. දේශපාලනඥයන්ගේ මුහුණුවලින් පත්‍රවල පිටු පිරෙව්වාය කියලා මිනිසුන්ගේ බඩ පිරෙන්නේ නැහැ. රූපවාහිනියේ ප්‍රචාරක දැන්වීම් පළ කළාය කියලා මිනිසුන්ගේ බඩ පිරෙන්නේ නැහැ. ඒ සඳහා වැඩ පිළිවෙළක් ඕනෑ. මිනිසුන්ගේ

[ගරු මහින්ද අමරවීර මහතා]

දුප්පත්කම නැති කරන්න වැඩ පිළිවෙළක් ඕනෑ. බඩගින්නේ ඉන්න මනුෂ්‍යයාට මාළු කූරියෙක් දෙන එක නොවෙයි කරන්න ඕනෑ, බිලී පිත්තක් දෙන එකයි. ඒ කටයුත්ත කරන්නේ නැහැ. ඒ මිනිසුන්ගේ දුප්පත්කම විකුණාගෙන කන්නයි හදන්නේ. ඒ මිනිසුන්ට සමෘද්ධි සහනාධාරය දුන්නාට කමක් නැහැ. සමෘද්ධි සහනාධාරය දෙන්න ඕනෑ අය ඉන්නවා. ඒ අයට රුපියල් 15,000ක් දුන්නත් කමක් නැහැ. නමුත් ඒකෙන් දේශපාලන වාසියක් ගන්න හිතාගෙන නිකම් බෙදනවා නම්, ඒකෙන් රටට යහපතක් වෙන්නේ නැහැ. එය ක්‍රමානුකූලව පිළිවෙළකට කළ යුතු කාර්යයක්. ඒ මිනිසුන්ට දෙන්න ඕනෑ දියුණු වෙන්න වෙනත් විකල්ප ක්‍රියාමාර්ග. තමන්ගේ ඉඩම සංවර්ධනය කරගෙන මුළු ඉඩමේම වගා කරගන්න සහ ඒ සඳහා වන නිෂ්පාදන ක්‍රමවලට ඒ ගොල්ලන් සම්බන්ධ කර ගන්න ඕනෑ. ඒ සඳහායි ආධාර කරන්න ඕනෑ. ඒ සඳහා රුපියල් 1,500ක් හෝ රුපියල් 3,000ක් නොවෙයි, රුපියල් ලක්ෂය බැගින් හෝ දීලා ඒ කටයුත්ත කරන්න පුළුවන් වුණා නම්, මේ රටේ නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කරගෙන මේ රට ඉදිරියට ගෙන යන්න පුළුවන් වෙනවා. නමුත් එවැනි වැඩ පිළිවෙළක් අපට පෙනෙන්නේ නැහැ. ඒ නිසායි මා කිව්වේ, අවුරුදු 2ක් යනකොට මිනිසුන්ට කන්න නැතුව පාරට බහින්න සිද්ධ වෙනවා කියලා. මිනිසුන්ට ජීවත් වෙන්න විධියක් නැතිවෙනවා. මිනිසුන්ගේ මූලික අවශ්‍යතාවත් සම්පූර්ණ කර ගන්න හැකියාවක් ලැබෙන්නේ නැහැයි කියන එකත් මා පැහැදිලිව සඳහන් කරන්න කැමැතියි.

ඒ විතරක් නෙවෙයි. ගම්මිරිස්වලට අත් වූ ඉරණම පිළිබඳවත් දැන් යම් යම් ආකාරයෙන් පැහැදිලි කරලා දුන්නා. 2016 වර්ෂයේ ගෙන්වූ ප්‍රමාණය වාගේ පස් ගුණයක් 2017 වර්ෂයේ ගෙන්වූවා. 2018 වනකොට ඒ ප්‍රමාණය අඩු වුණා. ඒ ප්‍රමාණය අඩු වෙන්නේ ගෙන්වන්නේ නැතුව නොවෙයි. ඒ කාර්යය ඒ ආකාරයටම සිද්ධ වෙනවා. හැබැයි වැඩි ප්‍රමාණයක් ගණන් හිලවුවලට ඇතුළත් වෙන්නේ නැහැ. දැන් ප්‍රතිඅපනයනය කරන්නය කියලා ගම්මිරිස් ගෙනැවිත් තිබෙනවා. ප්‍රතිඅපනයනය කරන්න ගෙනාපු ගම්මිරිස් කොළඹ මැනිං මාර්කට් එකෙන් ගන්න පුළුවන්. එහෙම වෙන්නේ කොහොමද? මේ තුළ සම්පූර්ණ හොර ජාවාරමක් තමයි තිබෙන්නේ. ලංකාවේ තමයි හොඳම ගම්මිරිස් තිබෙන්නේ. ලංකාවේ ගම්මිරිස් ඇටයක සැර ගන්න වියට්නාමයේ නැත්නම් වෙනත් රටකින් ගෙනෙන ගම්මිරිස් ඇට තුනක් විතර යොදන්න වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවශ්‍ය වුණොත් රතන ස්වාමින් වහන්සේගේ වේලාවෙන් යම් ප්‍රමාණයක් ගන්න පුළුවන්. මොකද, උන්වහන්සේ අද විවාදයට සම්බන්ධ වෙන එකක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා සඳහන් කරමින් සිටියේ ලංකාවේ ගම්මිරිස් ඇටයක තියෙන ගුණය, රසය ගන්න වෙනත් රටක ගම්මිරිස් ඇට තුනක් විතර යොදන්න වෙනවා කියන කාරණයයි. ඒ නිසා තමයි ලංකාවේ ගම්මිරිස්වලට මිලක් තිබුණේ. එතකොට පිටරට යවනවා නම්, ලංකාවේ ගම්මිරිස් තමයි යවන්න ඕනෑ. එහෙම නැතිව පිටරටින් ගෙන්වල බාල ගම්මිරිස් නොවෙයි. නමුත් මොකක්ද කළේ? මේ බාල ගම්මිරිස් ලංකාවට ගෙනාවා. මේවා ගෙනාවේ සාමාන්‍ය විධියට නොවෙයි. ජාවාරමකින් ගෙනාවේ. ලංකාවට ගේන්නේම නැතුව ලංකාවේ නමින් ඉන්දියාවට ඒ ගම්මිරිස් ගියා. වියට්නාමයෙන් ඉන්දියාවට ගම්මිරිස් ගෙනෙනකොට ලොකු බද්දක් තියෙනවා. ලංකාව හරහා යනකොට ඒ බද්ද නැහැ. නැවේදී ඒ ගම්මිරිස් ටික මාරු වුණා. මේ ජාවාරමට කවුද සම්බන්ධ වුණේ? නැවේදී තමයි "Sri Lanka" කියන seal එක ගහන්නේ. මේවා ලංකාවේ දෙයක් විධියට තමයි යවන්නේ. එතකොට ලංකාවේ ගම්මිරිස් ගොවියාට තිබුණු අවස්ථාව ජාවාරම්කාරයන්ගේ අතට ගියා. මෙකට ව්‍යාපාරිකයන් කිහිප දෙනෙක්, ඒ වාගේම රේගුවේත් සම්බන්ධයක් තියෙනවා. මෙකට රාජ්‍ය ඉහළ මැදිහත්වීමක් අනිවාර්යයෙන්ම ඇති කියලා අපි හිතනවා. අපට ඒක තවම සොයා ගන්න බැරි වුණා. මා දන්නා විධියට රහස් පොලීසිය මේ පිළිබඳව පුළුල් පරීක්ෂණයක් කරනවා. ලංකාවේ නමින් වියට්නාමයේ ගම්මිරිස් ලංකාවේ බදු සහන ලබාගෙන වෙනත් රටකට යවනවා නම් එය මොන තරම් බේදවාචකයක්ද? මේ ජාවාරම් සොයාගන්න තවම බැරි වෙලා තිබෙනවා. ඒ පිළිබඳවයි අපේ අවධානය යොමු කරන්න වෙන්නේ. ඒ වාගේම මේ ජාවාරම් කරන සල්ලි යොදවන්නේ මොනවාටද? මේ ගන්න සල්ලි ත්‍රස්තවාදයටත් යොදවපු බව අපි දන්නවා. සහරාන්ගේ කල්ලිය මේ සල්ලි යොදාගෙන තිබෙනවා. මේවායේ පිටුපස ඒ අයත් ඉන්න බව අපට සහතික වෙමින් තිබෙනවා. ඒ නිසා රජය මීට වැඩිය මේ පිළිබඳව අවධානය යොමු කරන්නට ඕනෑ. රජය මේ දේවල් රටට ගෙන්වන්නේ රේගුව හරහා. නමුත් ඒ හරහා ලොකු වංචාවක් සිද්ධ වෙනවා.

මේ කන්නය උඳුවලින් ස්වයංපෝෂිත වෙලා තියෙනවා. ඒ නිසා දැන් උඳු ගෙනෙන්න අවශ්‍ය නැහැ. මා දන්නා විධියට උඳු ගෙනෙන එක නැවැත්වීම සඳහා රුපියල් 200කට වැඩි tax එකක් දාලා තිබෙනවා. නමුත් උඳු ගෙනෙනවා. ඒ ගෙනෙන්නේ පරිප්පුවලට අය කරන බද්දට. පරිප්පු ගෙනෙනකොට බද්ද රුපියල් අටයි. හැබැයි, අපි දන්නා විධියට අත යට රුපියල් 50ක විතර ගණනක් දීලා උඳු ගේනවා. ඒ නිසා ආණ්ඩුවටත් ලාභයක් නැහැ, ගොවියාටත් මහා විනාශයක් ඇති වෙන්නේ.

මම හැම දාම කියනවා වාගේ මේ රට හදන්න නම් ආයතන තුනක් සුද්ද කර ගන්න වෙනවා. එකක් තමයි රේගුව. ඊළඟට, සුරාබදු දෙපාර්තමේන්තුව. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හරියට කළමනාකරණය කළොත් බදු ගහලා මිනිසුන්ගේ බොටු මිරිකන්න ඕනෑ වෙන්නේ නැහැ. මේවායින් පුළුවන් මේ රට ගොඩනගන වැඩ පිළිවෙළට විශාල සල්ලි ප්‍රමාණයක් සොයා ගන්න. නමුත් ඒක සොයා ගන්න රජයට යම් වැඩ පිළිවෙළක් තිබෙනවාද කියන එක පිළිබඳව තමයි අපි සාකච්ඡා කළ යුතු වෙන්නේ.

අද මුස්ලිම් කොංග්‍රසයේ මන්ත්‍රීවරයෙක් කථා කරමින් දිගින් දිගටම ප්‍රහාරයක් එල්ල කළා, අපේ නීති රීති සම්බන්ධව සහ මුස්ලිම් අයට තිබෙන අයිතිවාසිකම් පිළිබඳව. මම ඒ ගැන යමක් කියලා මගේ කථාව අවසාන කරන්න බලාපොරොත්තු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ජාතිවාදී නැහැ. ජාතිවාදීත්වය මේ රටට අවශ්‍ය වෙන්නෙත් නැහැ. හැබැයි, මේ රටට එක දෙයක් ඕනෑ. ඒ තමයි එක නීති පද්ධතියක්. මේ රටට එක නීතියක් ඕනෑ. එක රටකට එක නීතියක් නැත්නම් ඒ රට දියුණු කරන්න ලේසි වෙන්නේ නැහැ. ගැටුම් නැති කර ගන්න ලේසි වෙන්නේ නැහැ. අපේ රටට එක නීති පද්ධතියක් ඕනෑ. ඒකට විරුද්ධව කවුරුහරි දේශපාලනඥයන් කථා කරනවා නම්, ඒකෙන් ඇති වෙන්නේ නැවත නැවත ගැටීමක් මිසක් සහයෝගතාවක් නොවෙයි කියන එක මා විශ්වාස කරනවා. මිනිසුන්ට නොවෙයි දේශපාලනඥයන්ට තමයි ඕනෑ වෙලා තියෙන්නේ, වෙන වෙනම නීති හදාගන්න. ජනතාව වෙනුවෙන් කථා කරනවා කියලා ඇවිල්ලා මේ පාර්ලිමේන්තුවේ කථා කරන්නේ, ඒ වාගේම වෙන වෙන තැන්වල අදහස් දක්වන්නේ, එක රටක එක නීතියක් හදන වැඩ පිළිවෙළට විරෝධතාව පළ කරන්නේ මුස්ලිම් මිනිස්සුවත්,

දෙමළ මිනිස්සුවත් නොවෙයි, මේ දේශපාලනඥයන්. කල්ලිවාදය, ජාතිවාදය විකුණාගෙන කන්න පුළුවන් කණ්ඩායම දේශපාලනඥයන් බවට අද පත් වෙලා තිබෙනවා. අපි විරුද්ධ පක්ෂයේ හිටියත් සම්පූර්ණ සහයෝගය දීලා, සම්පූර්ණයෙන් මැදිහත් වෙලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කණ්ඩායම විධියට යෝජනාවලියක් ඉදිරිපත් කරලා මේ වනවිට වැඩ පිළිවෙළක් සකස් කරගෙන යනවා. ඒ තමයි මේ රට තුළ එක නීතියක් හදන වැඩ පිළිවෙළ. උඩරට නීතියවත්, තේසවලාමේ නීතියවත්, වකුෆ් නීතියවත්, මුස්ලිම් නීතියවත් කියලා වෙන් කර ගන්න අවශ්‍ය නැහැ. රටේ එකම නීතියක් තිබෙන්නට ඕනෑ. එතකොට එකම ජන කොටසක් විධියටයි යන්නේ. කසාද බඳිනවා නම් එකම වයසක් තිබෙන්නට ඕනෑ. අධ්‍යාපනයට එකම ක්‍රමවේදයක් තිබෙන්නට ඕනෑ. කිසිම ආගම් ඇදහීමක් වෙනස් කරන්න අපට වුවමනා නැහැ. මේ රටේ ඒ අවශ්‍යතාව සම්පූර්ණ වෙලා තිබෙනවා. ඒ පිළිබඳව ගැටලුවක් ඇති වෙන්නේ නැහැ. ඒ නිසා, රට ඉස්සරහට ගෙන යන ඕනෑම වැඩ පිළිවෙළකට අපි සහයෝගය දී කටයුතු කරනවාය කියන කාරණය සඳහන් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

அடுத்து, கௌரவ வடிவேல் சுரேஷ் அவர்கள், உங்களுக்கு 12 நிமிடங்கள்!

[பி.ப. 3.07]

**ගරු වඩිවේල් සුරේෂ් මහතා (වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வடிவேல் சுரேஷ்- பெருந்தோட்டக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Vadivel Suresh - State Minister of Plantation Industries)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சினல் முன்வைக்கப்பட்டுள்ள கட்டளைகள்மீதான விவாதத்திலே மலையக மக்களுடைய பிரதிநிதியென்ற வகையிலே நானும் கலந்து கொள்ள ஒருசில நிமிடங்கள் ஒதுக்கியமைக்கு உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்ள விரும்புகின்றேன். இந்த நாட்டின் ஏற்றுமதி என்று கூறும்போது, அது பலதரப்பட்ட விடயங்களை உள்ளடக்கி யிருந்தாலும்கூட, மலையகத்தைச் சார்ந்தவன் என்ற வகையிலே விசேடமாக தேயிலை ஏற்றுமதி சம்பந்தமான விடயம்தான் எனது சிந்தனைக்கு, ஞாபகத்திற்கு வருகின்றது. இந்த நாட்டுக்கு "Ceylon Tea" என்கின்ற விலாசத்தைப் பெற்றுக்கொடுத்தவர்கள் மலையக மக்கள் என்பது நம் அனைவருக்கும் தெரியும். இது பற்றிப் பலமுறை இந்த உயரிய சபையிலே நாங்கள் தெரிவித்திருக்கின்றோம். ஆகவே, இந்த நாட்டினுடைய பொருளாதாரத்திற்குப் பாரிய பங்களிப்பு வழங்குகின்ற மலையக மக்களை ஞாபகப்படுத்தாமல் இந்த சபையிலே ஏற்றுமதி சம்பந்தமாகப் பேசுவது அவ்வளவு நல்லதாக அமையாது என்று நான் நினைக்கின்றேன்.

விசேடமாக அரசியல் மற்றும் ஏனைய கலாசாரங்கள், இனவாதப் பிரச்சினைகள் என்று இன்னோரன்ன பல விடயங்கள் இந்த நாட்டிலே இடம்பெற்றுக் கொண்டிருக்கின்ற இந்தச் சந்தர்ப்பத்திலே, எதிர்வரும் 2020ஆம் ஆண்டு இந்த நாட்டினுடைய மக்கள் சரித்திர முக்கியத்துவம்வாய்ந்த பல தேர்தல்களுக்கு முகம்கொடுக்க எதிர்பார்த்துக் கொண்டிருக் கின்ற சூழ்நிலையில், இங்கு பல துறைகளிலும் காரசாரமாக விவாதம் நடைபெற்றுக் கொண்டிருக்கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மலையக மக்களுடைய எதிர்பார்ப்பு அந்த மக்களுடைய உட்கட்டமைப்பு வசதிகளில் இந்த அரசாங்கம் என்றுமில்லாத வாறு பங்களிப்புச் செய்கின்றது என்பதில் எந்தவிதமான சந்தேகமும் கிடையாது. அதை யாரும் இல்லையென்று கூறிவிடமுடியாது. மலையகத்தினுடைய அபிவிருத்தி சம்பந்தமாக ஒதுக்கியிருக்கின்ற நிதி குறித்து இந்த அரசாங் கத்திற்கு நாங்கள் நன்றி கூறக் கடமைப்பட்டிருக்கின்றோம். இன்றைய ஐக்கிய தேசியக் கட்சி அரசாங்கத்தினுடைய காலகட்டத்திலே எமக்கு பாரிய அபிவிருத்தி, பெருமளவு அங்கீகாரம், பெருமளவு சுதந்திரம், பெருமளவு உரிமை கிடைத்திருக்கின்றது. இந்த நிலையில், எதிர்வரும் காலங்களிலே சர்வதேச மாற்றத்திற்கு ஏற்றவாறு, இந்த நாட்டினுடைய மாற்றத்திற்கு ஏற்றவாறு மலையக மக்களுடைய வாழ்விலும் மாற்றம் ஏற்பட வேண்டும். மலையக சமூகத்தினுடைய கல்வி மறுமலர்ச்சி சம்பந்தமாக இன்று ஒரு மாற்றத்தை ஏற்படுத்துவதற்கு அந்தச் சமூகம் இன்று தயாராகிக் கொண்டிருக்கின்றது. இன்று இந்த நவீன யுகத்துக்கு ஏற்ற வகையிலே மலையகச் சமூகத்தில் மாற்றம் ஏற்படக்கூடிய சூழ்நிலையிருக்கின்றது. பெருந்தோட்டத் தொழிலாளர்கள் என்று மட்டுப்படுத்தப்பட்டிருந்த இந்த மலையகச் சமூகம் இன்று பல்வேறு துறைகளில் வெற்றிகண்டு கொண்டிருக்கின்றது. விசேடமாக மலையகத்தைச் சேர்ந்த பல மாணவர்களுக்குப் பல்கலைக்கழக அனுமதி கிடைத்திருக் கின்றது. இம்முறை பதுளை மாவட்டத்திலே, லுணுகலை இராமகிருஷ்ணா பாடசாலையிலிருந்து ஒரு மாணவி வைத்தியத்துறைக்கும்கூட தேர்ந்தெடுக்கப்பட்டிருப்பதை மலையகப் பிரதிநிதிகள் என்ற வகையில் நாங்கள் பெருமை யாகக் கொள்கின்றோம். ஆகவே, இன்று மலையகத்துக்குத் தனியான பல்கலைக்கழகம் அமைக்கப்பட வேண்டும்.

மலையக மக்களுடைய விலாச மாற்றம் என்று கூறுவது அவர்கள் தனிவீட்டில் தங்கியிருப்பது மட்டும் அல்ல. அதேநேரம் தனிவீடு அமைப்பது சம்பந்தமான இந்திய அரசாங்கத்தின் உதவியும் எங்கள் அரசாங்கத்தின் முழுமையான பங்களிப்பும் மிகவும் மகிழ்ச்சிகரமானதாக, வரவேற்கத்தக்கதாக இருந்தாலும்கூட, அவர்களுடைய விலாச மாற்றத்தைப் பொறுத்த வரையில், அவர்களுடைய காணியுரிமை, வீட்டுரிமையானது கட்டங்கட்டமாகவே நிறைவேறிக் கொண்டிருக்கின்றது. அன்றைய கால கட்டத்திலே வெள்ளையர்கள் மலையக மக்களுக்கு ஒரு விலாசம் கொடுத்திருந்தார்கள். தோட்டங்களிலே மேற்பிரிவுக் குரிய தேயிலைத் தோட்டத்தைக் கண்காணிப்பதற்கு இருக்கின்ற மக்களுடைய குடியிருப்புக்கள் மேற்பிரிவென்றும், நடுப் பகுதியிலிருக்கின்ற தேயிலைத் தோட்டங்களைக் கண்காணிப்பதற்கு இருக்கின்ற மக்களுடைய குடியிருப்புக்கள் நடுப்பிரிவு எனவும் அல்லது மத்திய பிரிவு என்றும் கீழ்ப் பிரதேசத்திலுள்ள தேயிலைத் தோட்டங்களைக் கண்காணிப் பதற்கு இருக்கின்ற மக்களின் குடியிருப்புக்கள் இருக்கின்ற பகுதி கீழ்ப் பிரிவு என்றும் அதாவது, upper division, lower division, middle division என்றும் தேயிலைத் தொழிற்சாலை யிலே வேலை செய்பவர்களுடைய குடியிருப்புக்கள் இருக்கின்ற பிரதேசம் தொழிற்சாலைப் பிரிவு என்றும் அதேபோன்று, தோட்ட அதிகாரிகளுடைய bungalow இலே வேலை செய்யும் தொழிலாளர்களின் குடியிருப்புக்கள் இருக்கின்ற பிரதேசம் bungalow division என்றும் விலாசத்தைக் கொண்டிருந்தது. இன்று அந்த விலாசத்தை மாற்றியமைத்து, அவர்களுக்குச் சரியான அங்கீகாரத்தையும் கொடுத்து, நவீன யுகத்துக்கு மலையக மக்கள் தயார்படுத்தப் பட்டுக் கொண்டிருக்கின்ற சூழ்நிலையில், பல சவால்களுக்கும் அவர்கள் முகங்கொடுக்க வேண்டியிருக்கின்றது.

[ගරු වඩිවේල් සුරේෂ් මහතා]

இன்று கம்பெரலிய வேலைத்திட்டத்தின்மூலம் பல கோடி ரூபாய் நிதி மலையகப் பெருந்தோட்டப் பகுதிகளிலுள்ள பிரதேச செயலகங்களுக்கு வழங்கப்படுகின்றது. ஆனால், அங்கு சில அரச அதிகாரிகள் திட்டமிட்டுச் சில இன்னோ ரன்ன காரணங்களைக் காட்டிச் செயற்பட்டு, சில அபிவிருத்தி வேலைத்திட்டங்கள் ஆமை வேகத்தில் சென்று கொண்டிருப் பதையும் நாங்கள் இங்கு கூறிவைக்காமலிருக்க முடியாது. இதற்குத்தான் நான் எப்போதுமே கூறுவேன் "ஆண்டவன் வரம் கொடுத்தாலும் பூசாரி வரம் கொடுப்பதில்லை" என்று. இந்த வகையிலேதான் குறித்த செயற்பாடுகள் இன்று நடைபெற்றுக்கொண்டிருக்கின்றன.

பெருந்தோட்டங்களில் இருக்கின்ற கட்டுப்பாடுகள் தொடர்பில் பெருந்தோட்ட இராஜாங்க அமைச்சர் என்ற வகையிலே இந்த உயரிய சபையிலே மிகவும் பொறுப்புடன் சில விடயங்களைக் கூறிவைக்க விரும்புகின்றேன். இன்று இந்த 25 தோட்டக் கம்பனிகளுக்குத் பெருந்தோட்டங்கள் குத்தகைக்குக் கொடுக்கப்பட்டிருக்கின்றது. PMMD - Plantation Management Monitoring Division என்கின்ற அதன் மேற்பார்வைக் குழு இன்று நேரடியாக என்னுடைய கட்டுப்பாட்டின்கீழ் வருகின்றது. அதேநேரம் இன்றைக்குச் சில விசேட பிரிவுகளை நான் உருவாக்கியிருக்கின்றேன். இதனுடைய பெறுபேறுகள் வருவதற்குச் சில காலங்கள் எடுக்கலாம். பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சிலே இயங்குகின்ற மேற்பார்வைக் குழுவிலே அமைச்சரவை அங்கீகாரத்தோடு பெருந்தோட்டத்துறை சார்ந்த படித்த இளைஞர், யுவதிகளை இணைத்து, சில முக்கிய பதவிகளைக் கொடுத்துள்ளேன். இந்த மேற்பார்வைக் குழுவுக்குரிய அதிகாரி பதவிகளை வழங்குவதற்கும் அமைச்சரவை அங்கீகாரம் கொடுத்திருக்கின்றது. அதற்கப்பால், எங்களுடைய மக்களுக்கு விழிப்புணர்வு ஏற்படுத்துவதற்கு விழிப்புணர்வு பற்றிய செயற்பாடுகளை மேற்கொள்வதற்கும் அமைச்சரவை அங்கீகாரம் கொடுத்திருக்கின்றது. பெருந்தோட்டக் கைத்தொழில் இராஜாங்க அமைச்சர் பதவியை நான் ஏற்று ஒரு குறுகிய காலப் பகுதிதான் - வெறுமனே 5 மாதங்கள்தான். இந்த ஐந்து மாத காலகட்டத்திலே சமூக அக்கறையோடு சமூக வேலைத்திட்டங்களில் நாங்கள் செயற்பட்டுக் கொண்டிருக்கும்போது, அமைச்சரவையில் அங்கீகாரம் பெற்ற விடயங்களை நடைமுறைப்படுத்தும்போது சில கால அவகாசங்கள் தேவைப்படுவதையும் நான் இங்கு கூறி வைக்காமல் இருக்கமுடியாது. அபிவிருத்திக்கான நிதி பற்றிய விடயங்களாக இருக்கலாம், ஏனைய விடயங்களாக இருக்கலாம், நாங்கள் இவற்றைச் செயற்படுத்தும்போது சில அதிகாரிகளின் செயற்பாடுகளினால் சில பின்னடைவுகளைக் காணக்கூடியதாக இருக்கின்றது.

அதேமாதிரி, தோட்டக் கம்பனிகளினுடைய செயற்பாடு களைப் பொறுத்த வரையில் சம்பந்தப்பட்டவர்கள் பல வருட காலமாகப் பழக்கி வைத்திருந்த முறை வேறு. ஆனால், வடிவேல் சுரேஷ் பெருந்தோட்டக் கைத்தொழில் இராஜாங்க அமைச்சரான பிறகு அதில் நான் மாற்றத்தை ஏற்படுத்தியிருக்கின்றேன். அதாவது, இன்று பெருந்தோட்டத் தொழிலாளர்கள்மீது கம்பனிகள் இலகுவில் வழக்குப் பதிய முடியாது. முன்னர் எந்த விடயங்களை எடுத்தாலும், தோட்டத் தொழிலாளர்களின்மீது வழக்குப் பதிவு செய்யப்பட்டது. ஆனால், இன்றைக்கு அந்த விடயத்தை எனது முழுமையான கட்டுப்பாட்டின்கீழ் கொண்டு வந்திருக்கின்றேன். அதாவது தோட்டத் தொழிலாளர்களுக்கு எதிராகத் தோட்ட நிர்வாகம் வழக்குப் பதிவு செய்ய வேண்டுமென்றால், பெருந்தோட்டக் கைத்தொழில் இராஜாங்க அமைச்சுடன் கலந்துரையாடிய பின்னர்தான் பதிய வேண்டும். நியாயமான விடயங்களைத் தவிர தோட்டத் தொழிலாளர்களுக்கு எதிராக வழங்குத் தாக்கல் செய்ய முடியாது. ஏற்கெனவே பதிவு செய்யப்பட்டிருந்த 2,000க்கும் அதிகமான குறித்த வழக்குகளை வாபஸ்பெறச் செய்திருக்கின்றேன்.

மலையகம், எங்களுடைய பூர்வீகம்! பெருந்தோட்ட மக்களுக்கு 07 பேர்ச்சுக்குக் காணி உறுதிப்பத்திரம் வழங்கப்படுகின்றது என்றால் அது வீட்டுக்கு மட்டும்தான். ஏற்கெனவே அந்த மக்கள் அங்கே வாழ்ந்த வீட்டின் பின் தோட்டமும் சரி, முன்தோட்டமும் சரி அதாவது எங்களுடைய பாட்டனார் காலத்திலிருந்து அவர்கள் மரக்கறிப் பயிர்செய்கை செய்து வந்த காணிகளை, ஏனைய விவசாயம் செய்து வந்த காணிகளை, கால்நடை வளர்ப்புக்காக - புல் வளர்ப்புக்காக ஒதுக்கப்பட்டிருந்த காணிகளை நாங்கள் மீளளிப்பதற்குத் தயாரில்லை என்பதை பெருந்தோட்டக் கம்பனிகளுக்கு நான் தெளிவாகத் தெரிவித்திருக்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் 03 நிமிடங்கள் இருக்கின்றன.

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)
நன்றி, ஐயா!

ஆனால், காலம் காலமாக எமது மக்கள் அனுபவித்து வந்த எந்தவொரு காணித்துண்டையும் எந்தக் காரணம் கொண்டும் மீளளிப்பதற்கு நாங்கள் தயாராக இல்லை என்பதை நான் மீண்டும் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

தோட்டங்களில் வேலை செய்கின்றவர்களுக்கு மாத்திரம்தான் வீடமைப்புத் திட்டங்கள் என்று சில கம்பனிகள் தெரிவித்திருந்தாலும்கூட மலையகத்தில் அந்த மக்கள் ஐந்து பரம்பரையாக வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். இந்த நிலையில் அங்கு ஆசிரியப் பதவிகளில் இருக்கின்றவர்களு ஆசிரியர் கிராமங்களை அமைக்கவேண்டிய சுழ்நிலை இருக்கின்றது., அங்கு ஏனைய அரசாங்க உத்தியோகத்தர் களும் இருக்கின்றார்கள். எங்களுடைய பூர்வீகம் மலையகம் என்ற வகையிலே, விசேடமாக ஒன்றைக் கூறிக்கொள்ள விரும்புகின்றேன். தோட்டச் சேவையாளர்களுக்கு - தோட்ட உத்தியோகத்தர்களுக்கும்கூட10 பேர்ச் காணி என்ற விடயம் சம்பந்தமான அங்கீகாரம் இன்று கிடைக்கப் பெற்றிருக்கின்றது. அதையும் நாங்கள் நடைமுறைப்படுத்த இருக்கின்றோம். பெருந்தோட்டங்களிலே, காரியாலயங் களிலே, தொழிற்சாலைகளிலே வேலை செய்கின்றவர் களுக்கும் மற்றும் தேயிலை மலையிலே வேலை செய்கின்ற தோட்டச் சேவையாளர்களுக்கும் காணி வழங்குவதற்குரிய ஏற்பாடுகளை நாங்கள் செய்திருக்கின்றோம். எங்கள் மக்களுக்கு 07 பேர்ச்சஸ் காணி வீட்டுக்கு மட்டும்தான் வழங்கப்படுகின்றது. ஆனால், ஏனைய காணிகளை - எங்களுடைய மக்கள் பரம்பரை பரம்பரையாக பாவித்து வந்த காணிகளை எக்காரணம் கொண்டும் எந்தத் தோட்டத் தொழிலாளியும் மீண்டும் தோட்டங்களுக்குக் கையளிக்க வேண்டிய தேவை ஏற்படாது என்பதை இந்த உயரிய சபையிலே மீண்டும் மீண்டும் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

ஆகவே, எங்களுடைய மலையக இளைஞர்களுடைய பாதுகாப்பு, அவர்களுடைய சுதந்திரம், வாழ்வாதாரம், அதேபோன்று மலையகத்தினுடைய கல்வி போன்றவற்றில் ஒரு பாரிய மறுமலர்ச்சி, ஒரு புரட்சி ஏற்படக்கூடிய அத்திவாரங்களையும் நாங்கள் இட்டுக் கொண்டிருக்க வேண்டும். "அருகிலுள்ள பாடசாலை நல்ல பாடசாலை" - "ළඟම පාසල හොඳම පාසල"என்ற வேலைத்திட்டத்தின்கீழ் இன்றைக்குப் பல கோடி ரூபாய் நிதிச் செலவிலே பாடசாலைகள் கட்டப்பட்டு, அதற்குரிய வளங்கள் வழங்கப் படுவதுடன், ஏனைய நடவடிக்கைகளும் மேற்கொள்ளப்பட்டு வருகின்றன. இவ்வாறு பல வகையான வேலைத்திட்டங்களை எல்லாம் நாங்கள் செய்து கொண்டிருக்கும்போது, 13ஆவது அரசியலமைப்புத் திருத்தத்தின் பின் மாகாண சபையும் அதேபோன்று அரசாங்கமும் சேர்ந்து செயற்படுத்தும் வேலைத்திட்டங்களுடன் தொடர்புபட்ட திறப்பு விழாக்களிலும் மற்றும் ஏனைய செயற்பாடுகளிலும், சிலர் தங்களுடைய அரசியல் வங்குரோத்து நிலைமையினால் போட்டி போடுகின்றார்கள். அம்மி மிதித்து, அருந்ததி பார்த்து, 10 மாதங்கள் சுமந்து, பிள்ளை பெற்றவுடன் பெயர் வைப்பதற்கு யார் சரி வந்துவிடுவார்கள். இவ்வாறான நடவடிக்கைதான் இன்று நடக்கின்றது. குறித்த ஒவ்வொரு வேலைத் திட்டத்தினதும் ஆரம்பம் எங்கு இருக்கின்றது? மலையக இரத்தம்! மலையக மக்கள்! எங்கள் தொப்புள்கொடி உறவுகளினால் உருவாக்கப்பட்ட, எங்களால் அறிமுகப் படுத்தப்பட்ட சில விடயங்கள் நடைமுறையிலே சாத்தியப் படக்கூடிய சூழ்நிலையில், பல்வேறு மாறுபட்ட, தவறான பிரச்சாரங்கள் இடம்பெற்றுக் கொண்டிருக்கின்றன என்பது பற்றியும் இந்தச் சந்தர்ப்பத்திலே கூறிக் கொண்டு, வாய்ப்புக்கு நன்றி தெரிவித்து, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

[අ.භා.3.19]

**ගරු විජිත බේරුගොඩ මහතා**
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයට අදාළව, අපනයන සංවර්ධන පනත යටතේ ඉදිරිපත් කර ඇති නියෝග පිළිබඳව සාකච්ඡා කරන මේ මොහොතේ, අපේ රටේ ආර්ථිකය පිළිබඳව කථා කරන්නයි මා බලාපොරොත්තු වන්නේ.

ආණ්ඩුව බොහෝ වෙලාවට කියන්නේ, මේ රටේ ආර්ථිකය නිෂ්පාදන ආර්ථිකයක් බවට පත් කරන බවයි. හැබැයි එය නිෂ්පාදන ආර්ථිකයක් නොවෙයි, යැපුම් ආර්ථිකයක් බවටයි පත් කර තිබෙන්නේ. මේ රට අපනයන ආර්ථිකයක් බවට පත් කරනවා කියලා තවත් පැත්තකින් කියනවා. හැබැයි, ආනයන භාණ්ඩ මත යැපෙන, ආනයන භාණ්ඩ පරිභෝජනය කරන ආර්ථිකයක් බවටයි එය පත් කර තිබෙන්නේ. මේ රට කර්මාන්ත සංවර්ධනය කරන රටක් බවට පත් කරනවා කියලා ඊළඟට කියනවා. එහෙම කිව්වාට, තිබුණු කර්මාන්තත් අඩපණ කරන ප්‍රතිපත්ති ගෙනෙන තත්ත්වයකටයි මේ ආණ්ඩුව පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා, සමස්ත ආර්ථිකයම අක්‍රිය කළ, නන්නත්තාර කළ ආණ්ඩුවක් විධියට තමයි අපට මේ ආණ්ඩුව හඳුන්වන්න වෙන්නේ.

කර්මාන්ත අංශයේ වර්ධනය, අපනයන ආදායම වැඩි වීම තුළ මේ රටේ ආර්ථික ව්‍යුහයේ ඇති වූ වෙනස්කම් පිළිබඳව නලින් බණ්ඩාර නියෝජ්‍ය අමාත්‍යතුමා කථා කළා. හැබැයි, අද මේ රටේ අපනයන ආදායමට වෙලා තිබෙන්නේ මොකක්ද කියලා ඕනෑම කෙනෙකුට පෙනෙනවා. සමස්තයක් විධියට බැලුවාම, රටේ අපනයන ආදායම ඩොලර් බිලියන 11ක් වන කොට, ආනයන වියදම ඩොලර් බිලියන 22ක් වෙලා තිබෙනවා. එතකොට අපනයන ආදායම ප්‍රමාණවත් නැහැ, මේ රටට අත්‍යවශ්‍ය කරන ආනයන භාණ්ඩ ගෙන්වන්නවත්. ඉතින් කොහොමද තමුන්නාන්සේලා අපනයන ප්‍රවර්ධනය ගැන කථා කරන්නේ?

සමහර වෙලාවට මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන අණපනත්, නියෝග ආදිය දෙස බැලුවාම අපට තේරෙන්නේ මොකක්ද? මේ රටේ නිෂ්පාදනය කරන්න පුළුවන් භාණ්ඩ - පළතුරු වෙන්න පුළුවන්, එළවලු වෙන්න පුළුවන්, කාර්මික භාණ්ඩ නිෂ්පාදන වෙන්න පුළුවන්- පිට රටින් ගෙන්වනවා. ඒවාට බදු සහන දෙනවා. එවිට පිට රට නිෂ්පාදනය කරන භාණ්ඩ මේ රටේ වෙළෙඳ පොළේ පිරී ඉතිරී ගියාම ඒවා අඩු මිලට පාරිභෝගිකයාට මිලදී ගන්න පුළුවන්. එතකොට අපේ රටේ නිෂ්පාදන කර්මාන්ත, ළඳරු කර්මාන්ත සියල්ලම බිඳ වැටෙනවා. අනෙක් පැත්තෙන්, අපනයනාභිමුඛ කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ගෙන්වන කොට ඒවායේ බදු ප්‍රමාණ වැඩි කරනවා; බදු සංශෝධනය කරනවා. ඒ තුළින් මේ රටේ කර්මාන්ත අංශය දුර්වල වෙනවා. ඒකෙන් මොකද වෙන්නේ? අප විදේශවලින් උපයන වත්කම් ප්‍රමාණය අඩු වෙනවා. මේ විධියට මේ රටේ ආර්ථිකය අඩපණ වන දේවල් තමයි මේ ආණ්ඩුව කරන්නේ.

සුළු අපනයන භෝගවල -විශේෂයෙන් අපේ සාම්ප්‍රදායික අපනයන භෝගවල- කඩා වැටීම සම්බන්ධයෙන් අපට දැන් අමුතුවෙන් කථා කරන්න දෙයක් නැහැ. තේ, රබර්, පොල්වලට අද ආර්ථික ව්‍යුහයේ තිබෙන තැන අඩු වෙලා තිබෙනවා. ආණ්ඩුවක් විධියට තමුන්නාන්සේලා ඒ සාම්ප්‍රදායික අපනයන භෝගවලට දක්වන අවධානය අඩු කර තිබෙනවා. ඒ නිසා භාණ්ඩ සාධාරණ මිලකට අළෙවි කර ගැනීමට බැරිවෙලා තිබෙනවා. අඩුම තරමින් අද ඒ අපනයන භාණ්ඩ සඳහා යන නිෂ්පාදන වියදමවත් උපයා ගන්න බැරිවෙලා තිබෙනවා. හැබැයි, අපි විශ්වාස කළා වාණිජ භෝග අපනයනයේදී, - සුළු අපනයන භෝග අපනයනයේදී - සුළු අපනයන භෝග නිෂ්පාදකයන්ට සාධාරණ මිලක් ලැබෙයි කියලා. විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ සුළු අපනයන භෝග අතර කුරුඳු, ගම්මිරිස්, කරාබුනැටි, සාදික්කා, තල, කොකෝවා, කෝපි, බුලත්, පුවක් සහ කජු තිබෙන බව. මේ සුළු අපනයන භෝගවලට අද වෙළඳ පොළේ වටිනාකමක්, මිලක් නැහැ. අද ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය කියලා අමාත්‍යාංශයක් නිර්මාණය කරලා තිබෙනවා. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය තිබෙනවා. හැබැයි, මේවායේ ඉන්න නිලධාරින්වත්, අමාත්‍යවරුන්වත්, රජයවත් මේ පිළිබඳව අවධානය යොමු කරන්නේ නැහැ. මේ රටට විදේශ විනිමය උපයන්නට පුළුවන්, විදේශ විනිමය උල්පත් තමයි මේ විනාශ කරලා දමන්න හදන්නේ.

අපි විශේෂයෙන් ගම්මිරිස් වගාව ගැන කථා කරන්නට ඕනෑ. අද ගම්මිරිස් වගාවෙන් මිනිස්සු ඈත් වෙනවා. ගම්මිරිස් වගා කරන ගොවියා අධෛර්යවත්වෙලා එයින් ඉවත්වෙලා තිබෙනවා. අද ගම්මිරිස්වලට මිලක් ලැබෙනවාද? නැහැ. මීට කලින් වියළි ගම්මිරිස් කිලෝවක් රුපියල් 1,500කට අළෙවි කළා නම්, අද රුපියල් 500කටවත් අළෙවි කර ගන්නට බැහැ. සමහර වෙලාවට මේවා අළෙවි කර ගන්න වෙළඳ පොළට ගෙනියන ගොවියෝ ඒ ගම්මිරිස් ටික ආපහු ගෙදර ගෙනෙනවා. කලින් අමු ගම්මිරිස් කිලෝව රුපියල් 500ට විකුණන්නට පුළුවන්කම තිබුණා. හැබැයි, දැන් රුපියල් 140ටවත් ගන්නේ නැහැ. අඩුම තරමින් ගම්මිරිස් අස්වැන්න නෙළන්න යන වියදමවත් පියවා ගන්න ගොවියාට බැරිවෙලා තිබෙනවා. එතකොට ගොවියා කොහොමද මේ වගාව නඩත්තු කරන්නේ; පොහොර දමන්නේ? එම නිසා ගොවියෝ ගම්මිරිස් වගාවෙන් ඈත් වෙනවා. එතකොට මොකද වෙන්නේ? අපනයන කර්මාන්ත, සුළු අපනයන භෝග, වාණිජ අපනයන භෝග අපනයනය කරන්නට තිබෙන හැකියාව අඩු වෙනවා. අද ව්‍යාපාර සුළු පිරිසක් අතරට ගිහිල්ලා, අතරමැදියන් විසින් ගසා කන තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. හැබැයි, ආණ්ඩුව මේකට මැදිහත් වෙන්නේ නැහැ. කර්මාන්ත සංවර්ධනය කරන්නට, අපනයන භෝග සංවර්ධනය කරන්නට තිබෙන බාධක ඉවත්

[ගරු විජිත බේරුගොඩ මහතා]

කරලා, ඒකට මැදිහත් වෙන්නට තමයි ආණ්ඩුවක් තිබෙන්නේ. නමුත් එහෙම මැදිහත් වෙන්නේ නැහැ.

ගම්මිරිස් වගාව විතරක් නොව අද කුරුඳු වගාවට මොකක්ද වෙලා තිබෙන්නේ? කුරුඳු වගාවටත් ඒ විපතම අත්වෙලා තිබෙනවා. සියලු වර්ගවල සුළු අපනයන භෝග වගා කරන ගොවියෝ -කුරුඳු වගා කරන ගොවියා වෙන්න පුළුවන්, ගොරකා වගා කරන ගොවියා වෙන්න පුළුවන් - ඒවායින් ඈත් වෙනවා. ඒ හේතුවෙන් ඒ නිෂ්පාදන කර්මාන්ත අධෛර්යවත් වෙනකොට, සාම්ප්‍රදායික නොවන සුළු අපනයන භෝගවලින් විදේශවලින් ලැබෙන්නට තිබෙන මුදල අපට අහිමි වෙනවා.

අද ජාත්‍යන්තර වශයෙන් ගම්මිරිස්වලට තිබුණු තැන අහිමිවෙලා තිබෙනවා. ප්‍රතිඅපනයනයේ මුවාවෙන් අමාත්‍යවරුන් පවා මේ හොර ජාවාරම්වලට සම්බන්ධවෙලා අපේ රටේ නම කැත කරලා තමයි තිබෙන්නේ; මේ රටේ කීර්තිනාමය සවුත්තු කරලා තමයි තිබෙන්නේ. මේ රටේ අපනයන භෝගවලට තිබුණු ඉල්ලුම, ඒ විශේෂත්වය නැති කරලා තිබෙනවා. අපේ රටේ ගම්මිරිස්වල වටිනාකම වචනවලට පරිවර්තනය කරන්නට බැහැ. අපේ ගම්මිරිස්වල පිළිකා නසන ඖෂධීය ගුණය තිබෙනවා. ඒ වාගේම, සැර ගතිය, සුවඳ ඇතුළු ගුණාත්මක බව බොහොම ඉහළයි. ඒ නිසා තමයි ලෝකයේ විශාල ඉල්ලුමක් තිබෙන්නේ. අඩු ගුණාත්මක තත්ත්වයෙන් යුතු ගම්මිරිස් ගෙනැල්ලා කලවම් කරලා ප්‍රති අපනයනය කළාම අපේ ගම්මිරිස්වලට තිබෙන කීර්තිනාමය අඩු වෙනවා, ඉල්ලුම අඩු වෙනවා; ගොවියෝ වළ පල්ලට යනවා. මේක තමයි සැබෑ තත්ත්වය.

සුළු අපනයන භෝගවලට විතරක් නොව අනෙක් පැත්තෙන් මේ රටට විදේශ විනිමය උපයන කර්මාන්තකරුවන්ට ඇතිවෙලා තිබෙන තත්ත්වයත් විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ. කර්මාන්තකරුවන්ට ඒ කර්මාන්ත දිගටම කරගෙන යන්නට ආණ්ඩුවෙන් සානුබල සපයනවා අඩුයි. ඉස්සර සියයට 28ක ආදායම් බද්දක් අය කරනකොට, සියයට 18යි කර්මාන්තකරුවන්ගෙන් ආදායම් බද්ද විධියට අය කළේ. හැබැයි, මේ වෙනකොට ඒ සහනය අපනයන කර්මාන්තකරුවාගෙන් ඉවත්වෙලා තිබෙනවා. මේ නිසා අපනයන කර්මාන්තකරුවන් අපනයනය සඳහා කාර්මික නිෂ්පාදනවලට යොමු වන ප්‍රවණතාව අඩු වෙනවා. ආණ්ඩුව මේ ගැන සොයන්නේ බලන්නේ නැහැ.

අනෙක් පැත්තෙන් මොකක්ද කරලා තිබෙන්නේ? අපනයන කර්මාන්තකරුවන්ට බැංකුවලින් ණයක් ලබාදීමේදී 2014ට කලින් සියයට 7ක පොලියට තමයි ලබා දුන්නේ. මේවා තමයි ආණ්ඩුවක් කරන්නට ඕනෑ. 2018 අවුරුද්දේ ඉඳලා මේ ආණ්ඩුව උත්සාහ කරනවා ඒ සියයට 7 පොලිය සියයට 14 දක්වා වැඩි කරන්නට. කර්මාන්තකරුවන්ට ලක්ෂ 100ක ණයක් ගන්න ඕනෑ නම්, සියයට 14ක පොලියකට තමයි ඒ ණය ගන්න වෙන්නේ. ලක්ෂ 100ක් ගත්තොත්, ලක්ෂ 14ක් පොලිය ගෙවන්න ඕනෑ. ඒ වාගේම සේවක නඩත්තු, කර්මාන්තය නවීකරණය කරන්න අවශ්‍ය දේවල්, අමු ද්‍රව්‍ය කියන මේ සියල්ල යොදවා අපනයනය සඳහා කාර්මික භාණ්ඩ නිෂ්පාදනය කිරීමේදී මේ කර්මාන්තකරුවන්ට සහනයක් ලැබෙන්නේ නැහැ. එතකොට කර්මාන්තවල නිෂ්පාදනය අඩු වෙනවා. ඒ නිසා විශේෂයෙන්ම කර්මාන්තකරුවෝ අධෛර්යවත් වෙනවා.

අනෙක් පැත්තෙන් වැට් එක සියයට 11 සිට සියයට 15 දක්වා වැඩි කළා. කර්මාන්තකරුවෝ ඒකෙන් පවා අසරණභාවයට පත් වෙනවා. ඒ අය නිෂ්පාදනය කරන භාණ්ඩවලටත් සියයට 15ක් වැට් එක අය කරනවා. එතකොට කර්මාන්තකරුවන්ට කරන්න වෙන්නේ නිෂ්පාදනය කරන භාණ්ඩ අළෙවි කරලා, සියයට 15ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවන එකයි. මේ මාසයේ ගෙවිය යුතු බද්ද -වැට් එක- ලබන මාසයේ 15 වෙනකොට ඒ ගිණුමකට දමන්න ඕනෑ. හැබැයි, පැය ගණනක් පරක්කු වුණත් සියයට 10ක දඩ මුදලක් ගෙවන්න සිද්ධ වෙනවා. මේ නිසා කර්මාන්තකරුවන් අධෛර්යයට පත් වෙනවා. ඒ නිසා කර්මාන්ත සංවර්ධනය කරන්න, අපනයන භාණ්ඩ නිෂ්පාදනය වැඩි කරලා වැඩිපුර විදේශ විනිමය උපයන්න මේ ආණ්ඩුවට අරමුණක් තිබෙනවා නම්, අදහසක් තිබෙනවා නම් මේවාට සානුබල දෙන්න ඕනෑ. කර්මාන්තකරුවන් අධෛර්යවත් කරන, සුළු අපනයන භෝග නිෂ්පාදකයන් අධෛර්යවත් කරන, රටේ කෘෂි නිෂ්පාදන අංශයේ කටයුතු කරන ගොවීන් අධෛර්යවත් කරන ක්‍රියාමාර්ගවලට ආණ්ඩුව එළඹෙනවා කියන්නේ, ආණ්ඩුව ජනතාවගෙන් පළිගන්න හදනවා වාගේ වැඩක්.

මේ රටේ පුරවැසියන්ට විශේෂයෙන් ඔවුන්ගේ හැකියාව අනුව නිෂ්පාදනය කරන්න පුළුවන් දේවල්වලට උපදෙස් දෙන එක, ඒ වාගේම ඒවාට සානුබල සපයන එක සහ නිෂ්පාදන සහනාධාර දෙන එක ආණ්ඩුවක් වශයෙන් කළ යුතු දෙයක්; ආණ්ඩුවේ වගකීමක්. හැබැයි, ඒක පැහැර හැරලා දැන් යන්නේ වෙන ගමනක්. ඒ නිසා මේ ආණ්ඩුවට ගමනක් නැහැ කියන කාරණය අපි මතක් කරනවා. අද මේ ඉදිරිපත් කරපු නියෝග තුන ක්‍රියාත්මක කිරීමේදී, මේ රටේ අපනයන ආදායම වර්ධනය වෙන්නේ නැහැ කියා අප විශ්වාස කරනවා. ඒ වාගේම විදේශ විනිමය ප්‍රමාණවත් තරම් උපයා ගැනීමේ නොහැකියාවක් තිබෙනවා. ඒ නිසා මේ ආණ්ඩුව එක අතකින් ආර්ථිකය නන්නත්තාර කරනවා වාගේම, මේ රටේ අපනයනකරුවන්, අපනයන භාණ්ඩ නිෂ්පාදකයන් නන්නත්තාර කරනවා. අනෙක් පැත්තෙන් මේ රටේ කර්මාන්තකරුවන් නන්නත්තාර කරනවා. සම්පූර්ණයෙන් මුළු රටම නන්නත්තාර කරලා, මේ ආර්ථිකය හතර ගාතෙන් ඇද වැටෙන විධියට කටයුතු කළ ආණ්ඩුවක් විධියට මේ ආණ්ඩුවට ගමනක් නැහැ. ඒ නිසා හොඳම දේ මේ ආණ්ඩුව ගෙදර යන එකයි. ඉදිරි ජනාධිපතිවරණයේදී මේ ආණ්ඩුවට මදි නොකියන්න මේ රටේ ජනතාව සලකයි කියලා අපි විශ්වාස කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා.3.30]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මධ්‍යම පළාත නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට මගේ විශේෂ උනන්දුවක් තිබෙනවා, අපේ සුළු අපනයන භෝග ගැන කටයුතු කරන්න. විශේෂයෙන්ම කරාබු, සාදික්කා, කෝපි, කොකෝවා වැනි නිෂ්පාදන හුඟක් දුරට තිබෙන්නේ අපේ මධ්‍යම පළාතේයි. එක කාලයක, විශේෂයෙන්ම පසුගිය රජය කාලයේ ඉතා හොඳ මිලක් මේ නිෂ්පාදනවලට ලැබුණු බව මම කියන්නට ඕනෑ. එදා අපට ලෝක වෙළෙඳ පොළට යන්න පුළුවන් වුණා, ඒ සුළු ගොවීන්ට සැලකිය යුතු ආදායමක් ලැබුණා. ඒ තුළින් ගම්බද පිබිදීමක් ඇති වුණා, වැඩි වැඩියෙන් කරාබු, සාදික්කා වවන්න පටන් ගත්තා. රබර් කර්මාන්තය නම් මැදරට එච්චර දියුණු වුණේ නැහැ. හැබැයි, මොණරාගල පැත්තේ ඒවායේ නව පැළ කිරීම් සිද්ධ වුණා. නමුත් අදත් විවිධ හේතු නිසා ඒ ගොවීන් විශාල අර්බුදයකට මුහුණ දෙනවා. මේ ප්‍රශ්නය අපි සුළු කොට තකන්න හොඳ නැහැ. මොකද, ඒ සුළු අපනයන භෝගවල පවතින අර්බුදය අපේ ආර්ථිකයේ තිබෙන පළල් අර්බුදයේ එක් කොටසක් නිසා. පසුගිය සති දෙකකට විතර ඉස්සෙල්ලා හොවාර්ඩ් නිකලස් කියන ඉතාම හොඳ අර්ථ ශාස්ත්‍රඥයා -එතුමා ඉස්සර ලංකාවේ හිටපු අර්ථ ශාස්ත්‍රඥයෙක්- අපේ අපනයන ක්ෂේත්‍රය ගැන ඉතාම වැදගත් දේශනයක් කළා. එතුමා මොකක්ද කියන්නේ? ඒ වාගේම අපේ මහ බැංකුව මොකද කියන්නේ? අපේ සම්පූර්ණ ආර්ථික වටිනාකමට කෘෂි ආර්ථිකයෙන් ලැබෙන පරිත්‍යාගය අඩු බවයි.

දවසින් දවස, වර්ෂයෙන් වර්ෂය කෘෂිකර්ම ක්ෂේත්‍රයට හිමි වෙලා තිබෙන ඉපැයීමේ හැකියාව අනුපාතිකව ගත්තොත් අඩුයි කියලායි මම කියන්නේ. සමහර විට ඒ ක්ෂේත්‍රය තුළ වැඩි වීමක් වෙන්න පුළුවන්. නමුත් අනුපාතික වශයෙන් වර්ෂයෙන් වර්ෂය ඒ ප්‍රමාණය අඩු වනවා. මේකෙන් අපට ගන්න පුළුවන් පාඩම මොකක්ද? පළමුවැනි දේ මේකයි. අපි මේ සුළු අපනයන බෝග රැක ගන්නේ කොහොමද?

අද තේ ගැන කථා කළොත් ලොකු අර්බුදයක් තිබෙන බව අපි දන්නවා. මොකද, කලින් විධියට ලෝක අවශ්‍යතාවෙන් සුළු ප්‍රමාණයක් තමයි අපේ රටේ නිෂ්පාදනය කරන්නේ. ලෝක ආර්ථික සහ වෙළෙඳ කටයුතු අනුව ඒ වාගේ සුළු ප්‍රමාණයක් වෙළෙඳාම් කිරීමේ දුෂ්කරතා අද තිබෙනවා. මොකද, ගෝලීයකරණය හා වාණිජකරණය තුළ මේ භාණ්ඩ වෙළෙඳ පොළට ඇතුළු වෙන්න නම් ඒ භාණ්ඩවල එක්තරා පරිමාණයක් - scale - තිබෙන්න ඕනෑ. අපට පැහැදිලිව කියන්න පුළුවන් දෙයක් තමයි තේ නිෂ්පාදනය. තේ සම්බන්ධයෙන් අද ලෝකයේ ලොකු විවාදයක් තිබෙනවා. එක කොටසක් කියනවා, ලංකාවේ හොඳ වටිනා තේ තිබෙනවා. හොඳ නමක් තිබෙනවා. සිංහල අකුරින් යන තේ විතරක් අපි පිට කරන්න ඕනෑ කියලා. තව කට්ටියක් කියනවා, අපි ඩුබායි, මැලේසියාව, සිංගප්පූරුව වාගේ පිටරටවල ලාභ දේ ගෙනැල්ලා, මිශ්‍ර කරලා, ඒවා වෙළෙඳ පොළට දාන්න ඕනෑ කියලා. මොකද, සුළු ප්‍රමාණයක් නිෂ්පාදනය කරනවා නම් ඒකට ඉහළ මිලක් ගන්න ඕනෑ. ඒ මිල අද ලෝකය දෙන්න කැමතිද කියන ප්‍රශ්නය තමයි තිබෙන්නේ. තේ වාගේ දෙයක් ඒ කාලයේ ඉඳලා බීපු අයට අමතරව වෙනත් විශාල ජන සංඛ්‍යාවක් අද ඒවා බොන්න පටන් ගෙන තිබෙනවා. එතකොට මිල ප්‍රශ්නය එනවා. මෙහි යටින් තිබෙන ප්‍රශ්නය මොකක්ද? අපේ අපනයන බෝගවල තත්ත්වය හොඳයි; නම හොඳයි; මිනිස්සු ගන්න කැමැතියි. නමුත් ජාත්‍යන්තරව සලකා බලන කොට අද අපේ මිල වැඩියි; අපේ රබර්වල මිල වැඩියි; අපේ තේවල මිල වැඩියි; අපේ අපනයන භෝගවල මිල වැඩියි. එතකොට වෙන්නේ මොකක්ද? අපි අපේ අපනයන ඉලක්කවලට යන්න නම් වෙන තැන්වලින් ලාභෙට ගෙනැල්ලා, මිශ්‍ර කරලා විකුණන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ දෙකෙන් මොකක්ද කරන්නේ කියන තීන්දුව තවම රජය අරගෙන නැහැ. අපි ඉහළම මට්ටමේ වෙළෙඳ පොළකට ගිහිල්ලා සීමිත ආදායමක් ගන්නවාද, එහෙම නැත්නම් අපේ රටේ නම පාවිච්චි කරලා, ආනයනය කරන ලාභ බඩුත් එක්ක මිශ්‍ර කරලා විකුණනවාද කියන ප්‍රශ්නයට තවම පිළිතුරක් ලබා දීලා නැහැ. අන්න ඒ කාරණයට අපි අවධානය යොමු කරන්න ඕනෑ. අවිනිශ්චිත, විනයක් නැති තත්ත්වයක් තුළ කසළ තේ -වෙනත් රටවල්වලින් ගෙනෙන බාල බඩු- සමඟ මිශ්‍ර කරලා එළියට දානවා. මගේ හිතවත් සරත් ෆොන්සේකා මන්ත්‍රීතුමාත් මේ කාරණය නිතර කියනවා. මේවා සැලකිය යුතු විධියට මිශ්‍ර කරලා, හොඳ නමකින් විකුණන ඒවා නොවෙයි. හොර වැඩ ගොඩක් ක්‍රියාත්මක වනවා. කවුරු හෝ මේවා ගැන හොයා බලලා, මේවාට විරුද්ධව කටයුතු කිරීම ඉතා අවශ්‍යයි. විශේෂයෙන්ම මේ කසළ ව්‍යාපාරය එක්ක ත්‍රස්තවාදී ප්‍රශ්නය හුඟක් දුරට සම්බන්ධයි කියලා බොහෝ දෙනෙකු දන්නේ නැහැ. මේ මුදල් කොහේද යන්නේ කියලා මිනිස්සු හොයලා නැහැ. මාවනැල්ල, ගම්පොළ, උඩුනුවර ආදී ත්‍රස්තවාදී කොටස් හිටපු හුඟක් තැන්වල තමයි මේ කසළ තේ ව්‍යාපාරයත් ක්‍රියාත්මක වෙන්නේ. දේශපාලනඥයනුත් ඒකට සම්බන්ධ වෙලා ඉන්නවා. අපේ උඩරට පළාත්වල සමහර ප්‍රසිද්ධ දේශපාලනඥයනුත් මේ කසළ තේ ව්‍යාපාරයට සම්බන්ධ වෙලා කටයුතු කරන බව මට කියන්න පුළුවන්. ඒ නිසා අපි දැඩිව ඒවා ගැන කටයුතු කරන්න ඕනෑ.

අවසාන ප්‍රශ්නය මෙයයි. අපේ අපනයන ක්ෂේත්‍රය හැම දාම "කෘෂිකර්මය, කෘෂිකර්මය" කියලා කරන්න බැහැ. අලුත් නිෂ්පාදනවලට අපි යන්න ඕනෑ. විශේෂයෙන් නිකලස් මහත්මයාගේ කථාවේ පැහැදිලි කරන ආකාරයට නව තාක්ෂණික ලෝකය එනම් කොම්පියුටර් ලෝකය, නිෂ්පාදන ලෝකය තුළින් තමයි අපේ අපනයනය වැඩි කරන්න පුළුවන් වෙන්නේ. විශේෂයෙන්ම මැලේසියාව, සිංගප්පූරුව වැනි ආසියානු රටවල්වල ඒ සාම්ප්‍රදායික වගා යම්කිසි විධියකින් දියුණු කරන ගමන්ම, ඒවා මතම රැඳෙන්නේ නැතිව, ඊට වඩා නව අපනයන ක්‍රම, නව කාර්මික නිෂ්පාදන ක්‍රම සහිත නව ලෝකයකට යනවා. ඒ විධියට තමයි අපේ අපනයන ආදායමත් වැඩි කර ගන්න පුළුවන් වෙන්නේ. එහෙම නැතිව හැම දාම අපි මේ කෘෂිකර්මය මතම අපේ අපනයන ආදායම බලාපොරොත්තු වුණොත් ඒක සාර්ථක වන දෙයක් නොවෙයි කියලා මම හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා අවසාන වශයෙන් කියන්නේ මෙයයි. අපේ අපනයන කෘෂි බෝග සම්බන්ධයෙන් තිබෙන දූෂණ නැති කරන්න අපි කටයුතු කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යාපනය ප්‍රදේශය බලන්න. මේ වතාවේ මේ රටේ අඹ කොච්චර නිෂ්පාදනය වුණාද, කොච්චර අපතේ ගියාද? අද ඉන්දියාවේ ලොකු ප්‍රශ්නයක්. මොකද, වාර්තාගත අඹ නිෂ්පාදනයක් ඒ රටේ තිබෙනවා. නමුත්, ඒවා විකුණන්න ක්‍රමයක් හදලා නැහැ. අපේ රටේත් විශේෂයෙන්ම අඹ, බෙලි, දොඩම්, දිවුල් ආදි පලතුරු අංශය ගැන කිසිම උනන්දුවක් දක්වා නැහැ. අඹ ගෙඩියවත් හරියට වෙළඳාම් කරගන්න බැහැ, පැපොල් ගෙඩියවත් හරියාකාරව වෙළඳාම් කරගන්න බැහැ, වට්ටක්කා ගෙඩියවත් හරියාකාරව වෙළඳාම් කරගන්න බැහැ. එහෙම නම්, අපි ගොවියාට සහයෝගය දෙනවා කියලා කිව්වාට අපි කොහොමද ඒ කියන දේවල් ක්‍රියාත්මක කරන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් ලොකු ප්‍රශ්නයක් තමයි සතුන්ගෙන් වන හානි. අද නිෂ්පාදනය කෙරෙහි නොයෙක් සතුන්ගේ -විශේෂයෙන් වඳුරන්, රිළවුන්, ඉත්තෑවන් ආදි සතුන්ගේ- ක්‍රියාකාරකම් බලපානවා. අද කවුරුවත් මේ ප්‍රශ්නය දිහා බලා විසඳුමක් දෙන්නේ නැහැ. මේක සංකීර්ණ ප්‍රශ්නයක්. මේක, ඒ බෝගය පිළිබඳ ප්‍රශ්නයක් විතරක් නොවෙයි. මෙය අපේ ආර්ථික සැලැස්ම මොකක්ද, මේ රටේ විනය මොකක්ද, නීති රීති ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියන දේවල් සමඟ ද සම්බන්ධ බව කියමින්, අප මේ ගැන නැවත වරක් කල්පනා කරලා විමර්ශනය කරන්න ඕනෑ බවත් කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

அடுத்ததாக, கௌரவ வேலு குமார் அவர்கள். உங்களுக்கு 12 நிமிடங்கள்!

[பி.ப. 3.39]

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

கௌரவ சபைக்குத் தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சட்டத்தின் கீழான மூன்று கட்டளைகள் தொடர்பிலான இந்த விவாதத்திலே சில கருத்துக்களை முன்வைப்பதற்கான சந்தர்ப்பம் தந்தமைக்கு உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். குறிப்பாக, இலங்கையினுடைய ஏற்றுமதி தொடர்பில் பார்க்கின்றபோது இலங்கையினுடைய ஏற்றுமதிக்கும் இறக்குமதிக்கும் இடையிலான இடைவெளி தொடர்ச்சியாக அதிகரித்துக்கொண்டு செல்கின்ற ஒரு துர்ப்பாக்கிய நிலைமையே காணப்படுகின்றது. இதில் விசேடமாக நாங்கள் ஒரு விடயத்தைக் குறிப்பிட வேண்டும். அதாவது, இலங்கையினுடைய வரலாற்றிலே இந்தக் காலப்பகுதி முழுவதையும் எடுத்துநோக்குகின்றபோது, ஏற்றுமதி வருமானத்திலே கணிசமான இடத்தை அல்லது

[ගරු වේලු කුමාර් මහතා]

முதன்மையான இடத்தை தேயிலைப் பயிர்ச் செய்கை பெற்றிருக்கின்றது. அதேவேளை சிறு வாசனைத் திரவியங் களின் ஏற்றுமதி இன்னுமொரு வகையிலே தனித்துவ மானதாக இருந்திருக்கின்றது.

இலங்கையினுடைய தேயிலைத் தோட்டங்களையும் தேயிலை உற்பத்தியையும் பற்றிப் பேசுகின்றபோது, ஆரம்ப காலகட்டத்திலே தனியார் உடைமைகளாகவும் அதேபோல தனிப்பட்ட கம்பனிகளின் உடைமைகளாகவும் இருந்தவை 1970க்குப் பிற்பட்ட காலப்பகுதியில் பல்வேறு காரணங்களை முன்னிறுத்தி அரச உடைமையாக மாற்றப்பட்டன. 70 களில் அரச உடைமையாக மாற்றப்பட்டதிலிருந்து இன்றைய நாள் வரைக்கும் தேயிலைப் பெருந்தோட்டங்களாக இருக்கலாம், தனிப்பட்டவர்களிடம் இருக்கக்கூடிய தேயிலைத் தோட்டங் களாக இருக்கலாம், தேயிலைக் கைத்தொழில் தொடர்பாக இலங்கையின் எந்தவோர் அரசுக்கும் ஒரு நிலையான கொள்கை காணப்பட்டவில்லை. அதன் காரணமாக, இலங்கையின் முதன்மை ஏற்றுமதி வருமானத்தைப் பெற்றுத் தந்த இலங்கையின் அடையாளமான "Ceylon Tea" உற்பத்தியானது படிப்படியாகக் குறைந்து வந்துள்ளதுள்ள துடன், இலங்கையின் ஏற்றுமதி வருமானத்திலும் அதனது பங்கு படிப்படியாகக் குறைந்து வந்திருக்கின்றமையையும் காணக்கூடியதாக இருக்கின்றது. இது குறித்து அரசினால் காலத்திற்கு காலம் தற்காலிகமான பல்வேறுபட்ட மாற்று நடவடிக்கைகள் முன்வைக்கப்பட்டாலும், அவை ஆட்சியிலிருக் கக்கூடிய கட்சியினது அல்லது பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சராக இருக்கக்கூடிய தனிப்பட்டவரது அபிலாஷைக் குரியவையாக இருந்தனவே ஒழிய, இலங்கை என்ற இந்த நாட்டுக்குள் ஏற்றுமதி வருமானத்தை அதிகரிப்பதற்கு இந்தத் தேயிலைத் தோட்டங்களை - தேயிலைப் பயிர்ச் செய்கையைக் கட்டியெழுப்புவது தொடர்பான கொள்கை ரீதியான அடிப்படைத் தீர்மானமொன்று இந்த நாட்டிலே தொடர்ச்சி யாக முன்னெடுக்கப்படவில்லை. ஆகவே, அதன் காரணமாக இந்தத் தொழிற்றுறையானது இலக்கற்ற பல்வேறு மாற்று நிலைகளை நோக்கிச் சென்று கொண்டிருப்பதை அவதானிக் கக்கூடியதாக இருந்தது. குறிப்பாக, தேயிலைத் தோட்டங்களினது கணிசமான பகுதிகள் இன்று மரங்கள் வளர்ப்பதற்காக ஒதுக்கப்பட்டு, தேயிலைச் பயிர்ச்செய்கை கைவிடப்பட்டதாகக் காணப்படுகின்றது. இன்னும் ஒரு கணிசமான பகுதியானது இறப்பர் தோட்டங்களாக மாற்றப் படுவதையும் காணக்கூடியதாக இருக்கின்றது. அதேபோல, தெற்கிலே தேயிலைத் தோட்டங்களானது முள்ளுத் தேங்காய் உற்பத்திப் பயிர்ச் செய்கைக்காக மாற்றப்படுவதையும் காணக்கூடியதாக இருக்கின்றது. ஆகவே, இவையெல்லாம் இந்தத் துறையில் ஓர் இலக்கற்ற பயணம் இடம்பெறுகின்றது என்பதையே எடுத்துக்காட்டுகின்றது.

இலங்கையினுடைய தேயிலை உற்பத்தி ஏற்றுமதிகளை எடுத்து நோக்குகின்றபோது, இந்தச் சபையிலே பெரும்பாலும் பேசப்படுகின்ற அல்லது பல்வேறுபட்ட பிரச்சினைகளுக்கும் உள்ளாகியிருக்கக்கூடிய பெருந்தோட்டக் கம்பனிகளினால் நிருவகிக்கப்படுகின்ற பெருந்தோட்டங்களைப் பொறுத்த வரையில் அவை இன்றைய கால கட்டத்தில் மொத்த உற்பத்தியிலே 28% சதவீதம் வரையான குறைந்தபட்ச உற்பத்தியைத் தருவதாகவே இருக்கின்றது. மிகுதி 70%க்கும் அதிகமான உற்பத்தி சிறு தோட்ட உற்பத்தியாளர்களினால் மேற்கொள்ளப்படுவதைக் காணக்கூடியதாக இருக்கின்றது. ஆகவே, இவற்றை நல்ல முறையில் ஆராய்ந்து பார்க்கின்ற போது, தற்போதிருக்கக்கூடிய Regional Plantation Companies எனப்படுகின்ற பெருந்தோட்டக் கம்பனிகளாக இருக்கலாம், அரச பெருந்தோட்ட யாக்கம், அதேபோல மக்கள் பெருந்தோட்ட அபிவிருத்தி சபை, Elkaduwa Plantations Limited போன்ற அரச தாபனங்களாக இருக்கலாம் - ஒட்டுமொத்தத்தில் இவை அனைத்தும் தோல்வி கண்ட நிறுவனங்களாகவே காணப்படுகின்றன. ஆகவே, ஓர் அரசாக அல்லது ஒரு நாடாக இந்த நாட்டினுடைய ஏற்றுமதியைக் கட்டியெழுப்புவதற்கு, இந்த நாட்டுக்கான அந்நியச் செலாவணியை அதிகரித்துக் கொள்வதற்கு அடிப்படையாக இருக்கக்கூடியதான கையிலிருக்கின்ற இந்தத் தேயிலை உற்பத்தித் துறையைப் பாதுகாத்துக்கொள்ள வேண்டிய தேவையிருக்கின்றது

எனக்கு முதலில் உரையாற்றிய கௌரவ உறுப்பினர் சரத் அமுனுகம அவர்கள் குறிப்பிட்டதுபோல, இன்றைய நவீன யுகத்தோடு பூகோளச் சந்தையை நோக்கி நகருகின்றபோது, பல்வேறு நவீனத்துவமான உற்பத்திகளை நோக்கியும் நகர வேண்டியுள்ளது. அதேபோல தற்போதிருக்கின்ற உற்பத்தி களிலும் நவீனத்துவங்களை ஏற்படுத்த வேண்டியிருக்கின்றது. ஆகவே, இன்றைய கால கட்டத்திலே பிராதன ஏற்றுமதிப் பயிராக இருக்கின்ற தேயிலை உற்பத்தி அதேபோல சிறு வாசனைத் திரவியங்களது பயிர்ச் செய்கைகளை நவீனமயப் படுத்த வேண்டும். இவை எங்களது பாரம்பரியமான உற்பத்திகளாக இருந்தாலும் அதிலே நவீன தொழில் நுட்பத்தை மற்றும் நவீனத்துவங்களை அதேபோல நவீன முகாமை முறைகளை அறிமுகப்படுத்தி அந்த உற்பத்தியை முன்னேற்ற வேண்டிய தேவையிருக்கின்றது. ஆனால், இன்று நடைபெறுவது அதுவல்ல. இந்த விடயத்தை வைத்துக் காலத்திற்குக் காலம் தங்களுடைய அரசியல் தேவைகளை, அரசியல் நாடகங்களை அரங்கேற்றிக் கொள்வதனையே தொடச்சியாக இருக்கக்கூடிய சகல அரசுகளும் செய்து கொண்டிருக்கின்றன.

இந்தப் பெருந்தோட்ட துறையில் இருக்கின்ற ஊழியர் களின் அடிப்படைச் சம்பளம் தொடர்பிலே இந்த அரசு முன்வைத்திருக்கும் 50 ரூபாய் கொடுப்பனவு தொடர்பாக கௌரவ பிரதமர் அவர்களினது நிலைப்பாடு ஒன்றாகவும், பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரினது நிலைப்பாடு இன்னொன்றாகவும் இருந்து கொண்டு, இந்தத் துறையை ஒரு விளையாட்டுத்தனமாகக் கையாளுகின்ற ஒரு தன்மையை இன்று காணக்கூடியதாக இருக்கின்றது. ஆகவே, இந்த நாட்டினுடைய பிரதான ஏற்றுமதியின் இதயமாக இருக்கக் கூடிய இந்தத் துறைக்கு இந்த நிலைமை ஏற்பட்டிருப்ப தென்பது, இந்த நாட்டினது எதிர்காலம் தொடர்பாக ஒரு திட்டமிட்ட அடிப்படையில் அல்லது தூரநோக்குடனான செயற்பாடொன்று அற்ற தன்மையைச் சம்பந்தப்பட்ட சகலரும் வெளிப்படுத்தியிருக்கின்றார்கள் என்பதையே எடுத்துக்காட்டு கின்றது என்பதை இங்கு வருத்தத்துடன் எடுத்துக் கூற வேண்டியிருக்கின்றது. இந்தச் சூழ்நிலைகளைப் பார்க்கின்ற போது இந்தத் தோட்டங்களை நவீனத்துவத்திற்கு மாற்றிய மைக்க வேண்டியிருக்கின்றது. அரசு எவ்வாறு தனியாரிட மிருந்து தோட்டங்களை சுவீகரித்துக் கொண்டதோ, பின்னர், அரசால் அதை நடத்த முடியாமல் எவ்வாறு பல்வேறு காரணங்களுக்காகத் தனியாரிடம் ஒப்படைத்தது. தற்போது அதனையும் தாண்டி ஒரு பரிணாம ரீதியான மாற்றத்திற்கு நாங்கள் நகரவேண்டியிருக்கின்றது.

தேயிலைத் தோட்டத் துறையிலே சிறு தோட்டங்களே வெற்றியளித்திருக்கின்றது என்பதை நடைமுறையிலே எங்களுக்குக் காணக்கூடியதாக இருக்கின்றது. ஆகவே, கண்ணெதிரே தெரிகின்ற முறைமை இருக்கின்றபோதிலும்,

ஒரு நேர்த்தியான முடிவு எடுக்கக்கூடியதாக இருந்தபோதும், ஒரு மாயையாக அல்லது இந்த மக்கள் இந்தியாவிலிருந்து வந்தவர்கள் என்ற அடிப்படையிலே அல்லது இன்னும் இந்தத் தோட்டங்களில் இருப்பது தமிழர்கள் என்ற அடிப்படையிலே இவ்வாறான வர்க்க பேதங்களைப் பார்த்துக் கொண்டு தீர்மானங்களுக்குச் போவதன் காரணமாகச் சரியான தீர்மானங்களை எடுக்கமுடியாமல் இருக்கின்றது. அதனை விடுத்து இந்த நாட்டின் நலன்கருதி ஒரு தீர்மானத்திற்கு வருவோமாக இருந்தால், இந்தப் பெருந்தோட்டங்கள் அனைத்தும் அந்தத் தோட்டங்களிலே வாழக்கூடிய, தேயிலைப் பயிர்ச் செய்கை தொடர்பான சிறப்புத் தேர்ச்சி பெற்றவர்களாக இருக்கக்கூடிய அந்த மக்களுக்குச் சிறு தோட்டங்களாகப் பகிரப்பட வேண்டும். அவ்வாறு சிறு தோட்டங்களாகப் பகிர்ந்தளிக்கின்றபோது சிறு தோட்டப் பயிர்ச் செய்கையின் மூலம் உச்ச விளைச்சலை பெறக்கூடிய ஒரு நிலைமையை அடையக்கூடியதாக இருக்கும். இதனை நோக்கி நகர்ந்தால் மட்டுமே இந்த நாட்டிலே இந்தக் கைத்தொழில் மீதமாகும். அவ்வாறு இல்லாத நிலையிலே இன்னும் 15, 20 ஆண்டுகள் செல்லுகின்றபோது இந்தத் தொழிற்துறை சார்ந்தவர்களைத் தேடிக் கண்டுபிடிக்க முடியாத நிலைமை ஏற்படும். ஒரு தொழிற்துறையிலே இருக்கின்றவர்களுடைய வாழ்வாதாரம், அவர்களுடைய வாழ்க்கை நிலைமைகளை முன்னேற்றிக் கொள்ளக்கூடிய ஒரு வருமான நிலைமை அதற்குள் காணப்பட வேண்டும். ஆகவே, பல்வேறு காரணங்களைக் காட்டி வருமானம் இல்லை என்ற அடிப்படையிலே தொழிலாளர்களை முடக்குவதன் மூலம் இந்தத் துறையைக் கட்டிக்காத்துக் கொண்டுவர முடியாது. அந்தக் காலகட்டம் இன்று உடைத்தெறியப்பட்டிருக்கின்றது. ஆகவே, பெருந்தோட்டக் கைத்தொழில்துறை அமைச்சராக இருக்கலாம், அரசாக இருக்கலாம், இந்தத் தொழிற்றுறையில் நவீன முறைமையை நோக்கி நகர்ந்து தோட்டத் தொழிலாளர்களை சிறு தோட்ட உடமையாளர்களாக மாற்றியமைப்பதற்கான பொறிமுறையை ஏற்படுத்த வேண்டியிருக்கின்றது.

இந்த நாட்டினது சட்டத்தை அல்லது நாட்டிலே இருக்கக்கூடிய நீதி நிலைமைகளைப் பொறுத்த வரையில், எங்களுடைய நாட்டிலே தொடர்ச்சியாக இருக்கின்ற ஒரு பாரிய பிரச்சினை, பல்வேறு தரப்பினர் தங்களுக்குள்ள அதிகாரங்களைக் கொண்டு சட்டத்தைக் கையிலே எடுத்துச் செயற்படுவதாகும். இங்கே குறிப்பிட்டதுபோல மிளகு ஏற்றுமதியிலே ஏற்படுத்தப்பட்ட மறு ஏற்றுமதியாக இருக்கலாம் அல்லது தேயிலையில் கலப்படம் செய்து விற்பனை செய்கின்ற விடயமாக இருக்கலாம், அவை தவிர்க்கப்பட வேண்டும். தேயிலைக் கலப்படத்தைப் பொறுத்த வரையில் பாவனைக்கு உகந்தது அல்ல என்று தொழிற்சாலைகளில் இருந்து கழிவாக அகற்றப்படுகின்ற தேயிலையானது 'டை' கலக்கப்பட்டு சிறு அளவிலான நல்ல தேயிலையோடு கலப்படம் செய்யப்படுவதன் காரணமாக "Ceylon Tea" என்ற தரத்தை, அடையாளத்தை நாங்கள் இழந்து நிற்கின்ற நிலைமை ஏற்படுகின்றது. இலங்கையிலே தேயிலையுடைய தரம் தொடர்பான நிர்ணய சபை இருக்கின்றது. ஏற்றுமதிக்கு முன்னதான பரிசோதனைகள் நடைபெறுகின்றன. இவ்வாறான பல்வேறு படிமுறைகள் இருந்தாலுங்கூட, அவற்றை எல்லாம் தாண்டி இத்தகைய தரக்குறைவான கழிவுத் தேயிலை ஏற்றுமதிக்குள்ளாகி வருகின்றதென்றால், சட்ட ஒழுங்கு முறையானது சரியாகக் கடைப்பிடிக்கப்படாமல் பல்வேறு ரீதியான அரசியல் அதிகாரங்கள் அதற்குள் உள்வாங்கப்படுவதுதான் அதற்குக் காரணமாக இருக்கின்றது என்பதனை நாங்கள் இங்கு ஞாபகப்படுத்த வேண்டும்.

இந்தத் தொழிற்றுறையைச் சேர்ந்த தொழிலாளர்களுடைய வாழ்க்கை நிலையை முன்னேற்றுவதற்குரிய பல்வேறு அடிப்படைகளை எடுக்கின்றபோது இந்தத் தொழிற்றுறையை பாதுகாத்துக் கொள்ளக்கூடியதாக இருக்கும். எனவே, மலையகம் முழுவதும் தேயிலைத் தொழிற்றுறையிலே சம்பந்தப்பட்டிருக்கக்கூடிய பெருந்தோட்டக் கம்பனிகள் - அரச பெருந்தோட்டங்கள் தொடர்பில் மறுபரிசீலனை செய்து, இந்தத் தொழிற்றுறையை ஒரு நவீன முறைமைக்குள், அதுவும் அங்கு வாழ்கின்ற மக்களை உள்வாங்குகின்ற முறைமைக்குள் கொண்டு செல்ல வேண்டும். அதாவது அந்த மக்களைச் சிறு தோட்ட உரிமையாளர்களாக ஆக்கக்கூடிய ஒரு முறைமையை நோக்கி நகர வேண்டிய தேவையிருக்கின்றது என்பதை வலியுறுத்தி, விடைபெறுகின்றேன். நன்றி.

[අ.භා.3.52]

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ ඉදිරිපත් කරන නියෝග පිළිබඳ අදහස් දැක්වීමට අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි. ඕනෑම රටක් ඩොලරයට සාපේක්ෂව කීයක් ගෙවනවාද කියලා තීරණය කිරීමේ දී විශේෂයෙන්ම අපනයනයත් ප්‍රධාන තැනක් ගන්නවා. ඕනෑම රටක්, ඕනෑම රජයක් උත්සාහ කරන්නේ රටේ අපනයනය වැඩි කරන්නත්, ආනයනය අඩු කරන්නත් බව අපි දන්නවා. හැබැයි මේ ආණ්ඩුව බලයට පත් වූ දවසේ ඉඳන්ම අපි දැක්ක දෙයක් තමයි, අපනයනය එන්න එන්නම වළ පල්ලට ගියාය කියන එක. හැබැයි ආනයනය වැඩි වූ බව පෙනෙනවා. අපනයනයට බදු පනවලා, ආනයනය කරන භාණ්ඩ සඳහා තිබෙන බදු එන්න එන්නම අඩු වෙන තත්ත්වයක් තමයි අපි දකින්නේ.

අද ගෙනැවිත් තිබෙන නියෝගවලට අදාළ ගැසට් එක අනුවත් අපට පැහැදිලිව පෙනෙන්නට තිබෙනවා, මේක අපනයනය සංවර්ධනය කරන්න ගෙනාපු ගැසට් එකක් නොවෙයි කියලා. මේක ඇත්තටම ආනයනය වැඩි කරන්න ගෙනාපු එකක්. අද බිත්තර සහ බිත්තර කහ මදවලට තිබුණු සියයට 30ක සෙස් බද්ද එක පාරටම අයින් කරලා දමනවා. මෙහෙම අයින් කරලා දැමීම තුළින් රටේ කුකුළු ව්‍යාපාරය කරන, එහෙම නැත්නම් බිත්තර නිෂ්පාදනය කරන අයට තමයි සෘජුවම පහර වදින්නේ. ඒ අනුව ආනයනය වැඩි කිරීමේ නියෝගයක් තමයි මේ ගෙනැල්ලා තිබෙන්නේ. ඒ වාගේම, ඇපල් ඇතුළු ආනයනය කරන පලතුරුවලට තිබෙන බදු සම්පූර්ණයෙන් අයින් කරලා දමනවා.

අද රටේ අඳගොවියාට, අපේ පලතුරු ගොවියාට ලැබෙන ආදායම නවත්වන එක තමයි මේ ආණ්ඩුවේ ප්‍රධාන වගකීම වෙලා තිබෙන්නේ. අද අපනයනය සංවර්ධනය කරනවා වෙනුවට, ආනයනය සංවර්ධනය කිරීමක් කරනවා කියලා තමයි අපට පෙනෙන්නේ. හැබැයි, නලින් බණ්ඩාර නියෝජ්‍ය අමාත්‍යතුමා කථා කරනකොට කිව්වා, අවුරුදු තුනක කාලයක් තුළ සියයට 9.63ක වර්ධනයක් සිදුවුණා කියලා. මම හිතන්නේ, එතුමා ආනයනය සහ අපනයනය පටලවාගෙන තිබෙනවා කියලායි. අපනයනයේ නම් කිසිම වැඩිවීමක් නැහැ. හැබැයි ආනයනයේ නම් සියයට 14ක වැඩිවීමක් පැහැදිලිව පෙනෙනවා. ඔබතුමන්ලාගේම මහ බැංකු වාර්තාවට අනුව 2014 වර්ෂය වෙනකොට අපේ රටේ ආනයන වියදම ඩොලර් බිලියන 19කට ආසන්න ප්‍රමාණයක තමයි තිබෙන්නේ. හැබැයි මේ ආණ්ඩුව බලයට පත්වෙලා, 2018 වර්ෂය වෙනකොට ඒ වියදම ඩොලර් බිලියන 22කට වැඩිවෙලා තිබෙනවා.

2005 වර්ෂයේ මහින්ද රාජපක්ෂ මැතිතුමා බලයට එන්න කලින් අවුරුද්දේ අපනයන ආදායම තිබුණේ ඩොලර් බිලියන

[ගරු ඩී. වී. චානක මහතා]

05ක් පමණයි. ඩොලර් බිලියන 5ක පමණ තිබුණු අපනයන ආදායම 2014 වර්ෂය වෙද්දී ඩොලර් බිලියන 11 දක්වා වැඩි වෙනවා. අඩු ගණනේ වාර්ෂිකව මිලියන 500කින්වත් අපනයන ආදායම වැඩි වුණා. 2014 වෙද්දී මේ රටේ අපනයන ආදායම බිලියන 11යි. හැබැයි, 2018 වර්ෂය වෙද්දීත් අපේ රටේ අපනයන ආදායම බිලියන එකොළහමයි තිබෙන්නේ. ඒ නිසා පසුගිය අවුරුදු හතර තුළ කිසිම වර්ධනයක් මේ අපනයනය තුළින් අපි දකින්නේ නැහැ.

එදා අපට යුරෝපය තහනම් වුණා; අපේ රට සමඟ අනෙක් රටවල් තරහ වුණා. එදා මේ උදවිය අපට කිව්වා, ඒ නිසා තමයි මේ ආණ්ඩුවට අපනයනය කරන්න බැරි වුණේ කියලා. හැබැයි, එදා අපනයනයෙන් ලබපු බිලියන 11ක ආදායම නම් තවමත් ලබන්නේ, ඔබතුමන්ලා ලබා ගත්ත GSP Plus සහනයෙන් ගත්ත වැඩක් කෝ? එදා GSP Plus නැති වෙනකොට, එදා තිබුණු ආණ්ඩුව වෙනත් වෙළෙඳ පොළවල් සොයාගෙන ගියා; වෙනත් රටවල් සොයාගෙන ගියා; වෙනත් markets සොයාගෙන ගියා. එහෙම කරලා කොහොම හරි ඒ අපනයනය කළා. හැබැයි, එදා තිබුණු ඒ අපනයන වර්ධනයත් අන්තිමට මේ ආණ්ඩුව නැති කළා. මේකට හොඳම උදාහරණයක් මම පෙන්වන්නම්. 2014 වර්ෂය වෙනකොට දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව අපනයනය තිබුණේ සියයට 14යි. හැබැයි අද දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව සියයට 13ක් දක්වා අපනයනය අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම, 2014 වර්ෂය වෙනකොට වෙළෙඳ ශේෂය තිබුණේ සෘණ බිලියන 08යි. අද ඒක වැඩිවෙලා තිබෙනවා, සෘණ බිලියන 10ක් දක්වා. තුෂාර ඉඳුනිල් මැතිතුමා කථා කරද්දී කිව්වා, වෙළෙඳ ශේෂය දැන් ධනාත්මක වෙලා කියලා. මම දන්නේ නැහැ, එතුමා ඒක කියන්නේ මොන වාර්තාවකින් අරගෙනද කියලා. මොකද, මහ බැංකු වාර්තාවට අනුව නම් මේ ශේෂය සෘණ ඩොලර් බිලියන 10ක් හැටියටයි තිබෙන්නේ. අද ආනයනය වැඩියි. අපනයනය තමයි අඩුවෙලා තිබෙන්නේ. හැබැයි මෙතුමන්ලා නැවත වතාවක් රට නොමඟ යවන්න උත්සාහ කරනවා. ආර්ථිකය විනාශ කරපු මෙතුමන්ලා නැවත වතාවක් රට ආපස්සට ගෙනයන්න උත්සාහ කරනවා.

ඊළඟට, අද කුඩා භෝග අපනයනය ඉතාම අසීරු තත්ත්වයකට වැටිලා තිබෙන බව අපි දන්නවා. දැන් අපේ දිස්ත්‍රික්කයේ ගම්මිරිස් ගොවියා ඉතාම අසීරු තත්ත්වයට පත් වෙලායි ඉන්නේ. 2014 වර්ෂයේදී ලංකාවේ ගම්මිරිස් කිලෝවකට රුපියල් 1,400ක් ගෙව්වා. නමුත්, අද ගෙවන්නේ රුපියල් 400යි, 450යි. එදා වත්තක ගම්මිරිස් කැඩුණේ උපරිම වශයෙන් අවුරුද්දකට එක පාරයි. සමහර වතුවල අවුරුදු දෙකකට සැරයයි ගම්මිරිස් කැඩුණේ. එදා රුපියල් ලක්ෂ 10ට, 15ට බදු දීපු ගම්මිරිස් වගා කළ ඉඩම අද රුපියල් ලක්ෂ 2කට වත් බදු දෙන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේකට ප්‍රධාන හේතුව මොකක්ද? අද මේ ආණ්ඩුවේ ඇමතිවරුන්ගේ මැදිහත්වීමෙන් වියට්නාමයෙන් ගෙනෙන ගම්මිරිස් ප්‍රති අපනයනය කරනවා. ප්‍රති අපනයනය කිරීම විතරක් නොවෙයි, ප්‍රශ්නය. ප්‍රති අපනයනය කිරීමේ දී ඒ ගම්මිරිස්වල ගහන්නේ "Made in Sri Lanka" කියලායි. ලංකාවේ ගම්මිරිස් විධියට තමයි වියට්නාමයේ ගම්මිරිස් ටික පිටරටවලට යන්නේ. ඒ නිසා තමයි අද ගම්මිරිස් මිල පහළ ගියේ. ලංකාවේ තමයි හොඳම ගම්මිරිස් තිබෙන්නේ. හැබැයි, අද ඒ ගම්මිරිස්වල ගුණාත්මකභාවය, එහෙම නැත්නම් එහි තිබෙන සැර අඩු කරලා, අන්තිමේ දී අද අපේ ගම්මිරිස් මිල කඩාගෙන වැටිලා තිබෙනවා.

ගම්මිරිස් මිල විතරක් නොවෙයි කඩා වැටුණේ. ලංකාවේ කවදාවත් මිල කඩා වැටුණේ නැති බෝගයක් තිබෙනවා නම්, ඒ කුරුඳු. හැබැයි, එදා රුපියල් 4,000ට තිබුණු කුරුඳු කිලෝව අද රුපියල් 2,500ට වත් විකුණාගන්න බැරි තත්ත්වයක් ඇති වෙලා. එදා රුපියල් 4,000ට දීපු කුරුඳු කිලෝව අද රුපියල් 2,500 දක්වා අඩු වෙලා තිබෙනවා. එදා රුපියල් 500ට දීපු ගොරක කිලෝව අද රුපියල් 175 දක්වා අඩු වෙලා තිබෙනවා. එදා රුපියල් 4,500ට දීපු පැඟිරි කිලෝව අද රුපියල් 2,500 දක්වා අඩු වෙලා තිබෙනවා. එදා රුපියල් 500ට දීපු රබර් කිලෝව අද රුපියල් 250 දක්වා අඩු වෙලා තිබෙනවා. අපනයනය කරන මේ සියලු භෝග නිෂ්පාදනවල කඩා වැටීමක් තමයි අද තිබෙන්නේ. ඒ නිසා තමයි අද ලක්ෂ 6කට සමෘද්ධිය දෙන්න මෙතුමන්ලාට සිද්ධ වෙලා තිබෙන්නේ.

නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, "එදා සිරියාවතීගේ ගෙදරට සමෘද්ධි සහනාධාරය දුන්නා. හැබැයි, සුමනාවතී අක්කාගේ ගෙදරට සමෘද්ධි සහනාධාරය දුන්නේ නැහැ" කියලා. ඒ නිසා තමයි එතුමන්ලා ලක්ෂ 6කට සමෘද්ධිය දුන්නේ කියලා එතුමා කිව්වා. එදා සිරියාවතී අක්කාට සමෘද්ධිය දෙන කොට සුමනාවතී අක්කාට සමෘද්ධිය ඕනෑ වුණේ නැත්තේ, එදා ඇයගේ ගෙදර ගම්මිරිස් ටික හොඳින් වගා කළ නිසායි, රබර් හොඳින් වගා කළ නිසායි, කුරුඳු හොඳින් වගා කළ නිසායි. එහෙම නැත්නම්, ඒ ගෙදර තාත්තාට රැකියාවක් තිබුණා. එහෙම නැත්නම් පුතාට රැකියාවක් තිබුණා. ඒක නිසා තමයි ඇයට සමෘද්ධි සහනාධාරය දෙන්න ඕනෑ වුණේ නැත්තේ. හැබැයි, මෙතුමන්ලා 482,000කට තිබුණු රැකියාත් අහිමි කළා. අනෙක් පැත්තෙන්, ගම්මිරිස් මිල කඩාගෙන වැටුණා; රබර් මිල කඩාගෙන වැටුණා. සියලු භෝගවල මිල ගණන් කඩාගෙන වැටුණා. ඉතින්, ලක්ෂ 6කට සමෘද්ධිය දෙන එක සාධාරණයි. මෙතුමන්ලා හිතන්නේ ඒක ලොකු දක්ෂතාවක් කියලායි. ඒක පුද්ගල ආදායම මසකට රුපියල් 6,000කට වඩා අඩු මට්ටමකට ගෙනැල්ලා සමෘද්ධි සහනාධාරය දෙන එක ඉතා දක්ෂතාවක් විධියට තමයි මෙතුමන්ලා දකින්නේ. හැබැයි, රටේ දුප්පත්භාවය එන්න එන්නම වැඩි කරලා තිබෙනවා; දරිද්‍රතාව වැඩි කරලා තිබෙනවා. ඒවායේ ප්‍රතිඵල මොනවාද? ඒ නිසා තමයි අද ජනතාවට කන්නවත් නැති තත්ත්වයක් උදා වෙලා තිබෙන්නේ. ඔවුන්ට වේල් තුන කන්න විධියක් නැහැ, ළමයින් ඉස්කෝලේ යවන්න විධියක් නැහැ.

හැබැයි, මේ මොන ප්‍රශ්නය තිබුණත් ඔබතුමන්ලා දැන් උත්සාහ කරන්නේ වෙනත් දෙයකටයි. දැන් කියනවා, ජනාධිපතිවරණයට අලුත් අපේක්ෂකයෙක් ඉදිරිපත් කරනවා ලු. මෙතුමන්ලා දැන් "ප්‍රජාතන්ත්‍රවාදී ජාතික පෙරමුණ" කියලා පක්ෂයක් හදන්න සූදානම් වෙනවා. පසුගිය අවුරුදු හතරහමාරක කාලය තුළ ඔය කියන ප්‍රජාතන්ත්‍රවාදය තිබුණේ කොහේද? ප්‍රජාතන්ත්‍රවාදයේ හදවත තමයි, ඡන්ද අයිතිය. තමුන්නාන්සේලා ප්‍රාදේශීය සභා මැතිවරණය කල් දැම්මා. පළාත් සභා මැතිවරණය කල් දැම්මා. දැන් ජනාධිපතිවරණයත් කල් දමන්න උත්සාහ කරනවා. ප්‍රජාතන්ත්‍රවාදයේ හදවත කියන ඡන්ද අයිතිය නැත්නම්, ප්‍රජාතන්ත්‍රවාදයක් තිබෙන්නේ කොහොමද? පක්ෂයට එහෙම නමක් දමලා බොරුවක් නේ මේ කරන්නේ. පසුගිය අවුරුදු හතරහමාරක කාලය පුරාම ප්‍රජාතන්ත්‍රවාදී අයිතියට ඉඩ දුන්නේ නැහැ. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා, මේ ජනාධිපතිවරණය හෝ ජනතාවට ලබා දෙන්න කියලා. ජනතාවට ඡන්ද අයිතිය ලබා දෙන්නේ නැත්නම් ජනතාවගේ මතය ලෝකයට, රටට කියන්නේ කොහොමද? ඒ නිසා මේ රටේ ආණ්ඩුව කරන තමුන්නාන්සේලාගෙන් අප ඉල්ලා සිටිනවා, මේ ඡන්ද අයිතිය ජනතාවට ලබා දෙන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීවරුන්ට රුපියල් ලක්ෂ හතරක් ලැබෙනවා කියලා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා චෝදනාවක් කළා. හැබැයි, ඒ ලක්ෂ හතර හම්බ වුණේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට නම් නොවෙයි. "දින 52 ආණ්ඩුව" එන්න කලින් එතුමන්ලාට රුපියල් ලක්ෂ හතරහමාරක් හම්බවුණා. පඩිය රුපියල් ලක්ෂ දෙකහමාරක් ලැබෙනකොට, තවත් රුපියල් ලක්ෂ 2ක් දීමනා වශයෙන් ලැබුණා. දින 52 ආණ්ඩුවෙන් මොනවාද

වුණේ කියලා ඇහුවොත්, මා තමුන්නාන්සේලාට කියන්න කැමතියි, ඒ ලක්ෂ හතරහමාර ගණනේ පඩි ගත්ත එක නැවතුණේ දින 52 ආණ්ඩුව නිසා බව. හැබැයි, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට එය දුන්නේ නැහැ. ජනාධිපතිතුමාට ඒක කියන්න අමතක වුණා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට තමයි ඒ විධියට ලක්ෂ හතරහමාර ගණනේ දුන්නේ. ඒකම තමයි ඔය නැවතත් යෝජනාවක් ලෙස ගෙනාවේ, ලක්ෂ දෙක ගණනේ වැඩි කරන්න කියලා. ඒ නිසා මම ජනාධිපතිතුමාට කියනවා, එය ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ට දීපු එකක් මිසක්, විපක්ෂයේ අයට දීපු එකක් නොවන බව. එතුමන්ලා එය නැවත ගන්න උත්සාහ කරනවා. මේ රටේ බදු බර දෙගුණයක් කරලා, බිලියන ගණනින් තිබුණු ඒවා ට්‍රිලියන ගණන් කරලා, අනිකුත් සියලු ඒවාත් වැඩි කරලා තිබියදී මන්ත්‍රීවරුන්ගේ පඩි වැඩි කර ගන්නේ නැතිව, ජනතා සේවයට කැප වෙන්න කියලා මා ඉල්ලා සිටිනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 10ක්වත් දෙන්න. මොකද, අද මේ ගරු සභාවේ කවුරුවත් නැහැ. කථා කරන්න ඉන්නේ මම විතරයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

හොඳයි, ඔබතුමා කථා කරන්න.

[අ.භා. 4.03]

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු පක්ෂයේ එක මන්ත්‍රීවරයෙක්වත් මේ ගරු සභාවේ නැහැ. ගෙදරදීවත් අප තනියම කථා කරන්නේ නැහැ නේ. පාර්ලිමේන්තුවේ මේ ගරු සභාවේදී ආණ්ඩු පක්ෂයේ එකම මන්ත්‍රීවරයෙක්වත් නැතිව කථා කරන්න සිද්ධ වීම ගැන මා කනගාටු වෙනවා.

අදට නියමිත මාතෘකාවට පිවිසෙන්න කලින්, ඉම්රාන් මහ්රූෆ් මන්ත්‍රීතුමාගේ කථාවට මා පිළිතුරක් දෙන්න ඕනෑ. මහ්රූෆ් මන්ත්‍රීතුමා මුස්ලිම් අන්තවාදය ගැන කථා කරලා කිව්වා, එතුමාගේ පක්ෂ නායකතුමාට චෝදනා කරන්න එපා කියලා. මහ්රූෆ් මන්ත්‍රීතුමාටත්, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ අනෙකුත් මන්ත්‍රීවරුන්ටත් මා කියන්නේ මේකයි. අප කාටවත් චෝදනා කරන්නේ නැහැ. අපි කියන්නේ අප්‍රේල් 21වන දා වූ සිදුවීම ගැන හොඳ පරීක්ෂණයක් කරන්න කියලායි. පාර්ලිමේන්තුවේ තිබෙන විශේෂ කාරක සභාව වාගේ එකක් නොවෙයි, වෙනම ස්වාධීන පරීක්ෂණයක් කරලා ඒ වරදකරුවන් නීතිය ඉදිරියට ගෙනෙන්න කියන එක විතරයි මා කියන්නේ. මේ දේවල් දිගටම ඇදගෙන යන්න අපට අවශ්‍ය නැහැ.

ජනතා විමුක්ති පෙරමුණේ නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාත් හොඳ කථාවක් කළා. අනෙක් රටවල් ඒ රටවල අපනයන වැඩි කරගෙන තිබෙන්නේ කොහොමද කියලා එතුමා කිව්වා. සිංගප්පූරුව ඩොලර් බිලියන 412ක ආදායමක්, තායිලන්තය ඩොලර් බිලියන 250ක පමණ ආදායමක්, වියට්නාමය ඩොලර් බිලියන 277ක ආදායමක් අපනයන තුළින් ලබනවා, නමුත් ලංකාව තවම ඩොලර් බිලියන 11ක පමණ අපනයන ආදායමක් තමයි ලබන්නේ කියලා එතුමා කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මතක හැටියට 1994දී වියට්නාමයයි, ලංකාවයි කියන රටවල් දෙකම ඩොලර් බිලියන 2.4ක පමණ අපනයන ආදායමක් තමයි ලැබුවේ. නමුත් අද වන විට වියට්නාමය ඩොලර් බිලියන 300කට ආසන්න අපනයන ආදායමක් ලබනවා. මෙහිදී අප තේරුම් ගතයුතු කාරණයක් තිබෙනවා. වියට්නාමය කරන්නේ මොකක්ද? ප්‍රතිඅපනයනයයි. ප්‍රතිඅපනයනය හැර වෙන අපනයනයක් ඒ රටට නැහැ. එම නිසා, අපේ අපනයන වර්ධනය කරගැනීමේ අවශ්‍යතාව තිබෙනවා නම් විශේෂයෙන්ම ප්‍රතිඅපනයනයත් අනිවාර්යයෙන්ම දියුණු කළ යුතුයි. මොකද, අද ලෝකයේ යම් කිසි විධියක වෙනස්වීමක් වෙලා තිබෙන නිසා. අද අපනයනය මූලිකවම වැඩිවෙලා තිබෙන්නේ supply-chain management කියන සංකල්පයත් එක්කයි. අද Apple phone එකක් ගත්තොත්, ඒ Apple phone එක නිෂ්පාදනය කරන්නේ එක රටක විතරක් නොවෙයි. Apple phone එකේ කොටස් රටවල් 30ක, 40ක නිෂ්පාදනය කරලා, පසුව ඒක සම්පූර්ණයෙන් හදන්නේ වෙනත් රටක. අනෙක් භාණ්ඩ දිහා බැලුවත්, විවිධ කොටස් එක් එක් රටවල නිෂ්පාදනය කරලා තවත් රටක තමයි assemble කරන්නේ. ඒ නිසා අපි අනිවාර්යයෙන්ම මේ supply-chain management එකට ඇතුළු වෙන්න අවශ්‍යයි. එහෙම නොවුණොත් අපේ අපනයන වර්ධනය කර ගන්න බැරි වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සරත් අමුණුගම මන්ත්‍රීතුමා පැහැදිලි කර දුන්නා, කෘෂිකර්මයත් එක්කම අපේ අපනයනය දියුණු කරන්න බැහැ කියලා. ඒක ඇත්ත. මාත් ඒක පිළිගන්නවා. විශේෂයෙන්ම තාක්ෂණයත් එක්කම අපි අපනයනයට යන්න ඕනෑ. තාක්ෂණයත් එක්ක අපනයනය දියුණු වූ රටවල් දිහා බැලුවොත්, tech exports as a percentage of manufacturing exports දිහා බැලුවොත්, සිංගප්පූරුව වාගේ රටක නම් සියයට 49ක්, සියයට 50ක් වැනි ප්‍රමාණයක් තාක්ෂණයත් එක්ක පවතින අපනයන තමයි manufacturing goodsවල තිබෙන්නේ. මලයාසියාවේ එය සියයට 28ක් විතර තිබෙනවා. චීනයේ සියයට 24ක් තිබෙනවා. ඇමෙරිකාව, නෝර්වේ වැනි රටවල සියයට 20ක් වාගේ තිබෙනවා. ලංකාව අරගෙන බැලුවොත්, සියයට 1ක වාගේ ප්‍රමාණයක් තමයි තිබෙන්නේ. එම නිසා, අනිවාර්යයෙන්ම තාක්ෂණය ගෙනැල්ලා අපේ අපනයන වර්ධනය කර ගන්න අවශ්‍යයි කියන එක තමයි මා විශ්වාස කරන්නේ.

අනෙක් කාරණය මේකයි. අද අපේ ගරු මන්ත්‍රීවරු වියට්නාමය ගැන කථා කළා, කාම්බෝජය ගැන කථා කළා. ඒ රටවල් අපනයනය වැඩි කර තිබෙන්නේ කොහොමද කියලා බැලුවොත්, අපට පැහැදිලිව කියන්න පුළුවන්, FDIs, එහෙම නැත්නම් ජාත්‍යන්තර ආයෝජනත් එක්ක තමයි ඔවුන්ගේ අපනයන වැඩි කරගෙන තිබෙන්නේ කියලා. ලංකාවේ අපනයනය වැඩි කර ගන්න නම්, ජාත්‍යන්තර ආයෝජනත් අනිවාර්යයෙන්ම වැඩි කරගැනීම අවශ්‍යයි. ජාත්‍යන්තර ආයෝජන වැඩි කරන්න නම්, කාරණා දෙක තුනක් සපුරාගත යුතුයි. ඒ මූලික කාරණයක් තමයි දේශපාලන ස්ථාවරත්වය. ආයෝජකයෝ එන්න නම්, අනිවාර්යයෙන්ම රට තුළ දේශපාලන ස්ථාවරත්වයක් තිබෙන්නට ඕනෑ. හැබැයි, මේ යහ පාලන ආණ්ඩුවට "ගොනාගෙයි, මීමාගෙයි" ආණ්ඩුව කියලා කියනවා. ඉතින්, ඒ වාගේ ආණ්ඩුවක් තුළ දේශපාලන ස්ථාවරත්වයක් අපි දැක්කේ නැහැ.

ඊළඟ කාරණය මේකයි. කවුරු හෝ ආයෝජකයෙක් ලංකාව වාගේ රටකට ආවොත්, බිස්නස් කරන්න සුදුසු පසු බිමක්, ease of

[ගරු තාරක බාලසූරිය මහතා]

doing business, අපි ලෑස්ති කරලා දෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2014 වර්ෂයත් සමඟ සංසන්දනය කර බලනවිට Ease of Doing Business Index එකේ අපේ පසුබෑමක් තිබෙන බව අපට පෙනෙනවා. ඒ විතරක් නොවෙයි, 2014 වසර සමඟ සංසන්දනය කරනකොට දූෂණය පිළිබඳව බලන Corruption Perceptions Index එකේත් පසුබෑමක් තිබෙනවා. මෙවැනි පසුබෑමක් තිබෙනකොට ආයෝජකයෝ මේ රටට එයිද කියන එක පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප විශේෂයෙන්ම තාක්ෂණික අංශය දියුණු කරන්න අවශ්‍යයි. අද "Daily Mirror" පුවත් පතේ article එකක් පළවෙලා තිබෙනවා. ඒකේ කියා තිබෙනවා, විශේෂයෙන් තාක්ෂණික අංශයේ රැකියා 12,000ක වාගේ පුරප්පාඩු ප්‍රමාණයක් තිබෙනවා කියලා. අපි දන්නවා, මීට අවුරුදු 5කට, 10කට කලින් ලංකාවේ තොරතුරු තාක්ෂණ අංශයේ අපනයන ආදායම වුණේ ඇමෙරිකානු ඩොලර් මිලියන 100ක් බව. අද මිලියන 1,000ක වාගේ අපනයන ආදායමක් තිබෙනවා. හැබැයි, රැකියා 12,000ක් වාගේ ප්‍රමාණයක පුරප්පාඩු තිබෙනවා. එම නිසා, රජය යම් කිසි සැලැස්මක් හදලා තොරතුරු තාක්ෂණ අංශයේ යෙදී සිටින ප්‍රමාණය වැඩි කිරීමේ වුවමනාවක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපට minerals වාගේ ස්වාභාවික සම්පත් තිබෙනවා. අපි ඒවා ගැන වැඩි අවධානයක් යොමු කරලා නැහැ. ලංකාවේ titanium තිබෙනවා. ලෝකයේ හොඳම graphite වර්ගයක් තමයි ලංකාවේ තිබෙන්නේ. ඒ graphiteවලින් graphene නිෂ්පාදනය කරනවා. බොහෝ වෙලාවට electric carsවල batteries හදන්න graphene තමයි පාවිච්චි කරන්නේ. අද graphene කිලෝග්‍රෑම් එකක මිල ඇමෙරිකානු ඩොලර් 10,000ක් විතර වෙනවා. හැබැයි, graphite කිලෝග්‍රෑම් එකක් ඇමෙරිකානු ඩොලර් තුනකට, හතරකට තමයි යන්නේ. එම නිසා තාක්ෂණය ගෙනැත් graphite, grapheneවලට පරිවර්තනය කරලා පිටරට යැව්වොත්, විශාල මුදල් ප්‍රමාණයක් අපට සොයා ගන්න පුළුවන්. ඒ වාගේම ටයිටේනියම් වාගේ දේවල් අපට ලංකාවේ නිෂ්පාදනය කරන්න පුළුවන් කියලා මම විශ්වාස කරනවා. නමුත් ඒවා කරන්න මේ රජය විශාල උනන්දුවක් දක්වලා නැහැ. මේකට මූලික හේතුව වශයෙන් අපි දකින්නේ මේ රජයට සැලැස්මක් නැතිකමයි. බලයට පත් වුණාට පසුව අගමැතිතුමා කරනවා කිව්වේ මොකක්ද? Megapolis එකක් හදලා, කෘෂිකර්මය සම්පූර්ණයෙන්ම නැති කරලා, අපේ කෑගල්ල වාගේ ප්‍රදේශවල ඉන්න තරුණයන් megapolis එකට ගෙනැත්, පිටරටින් factories ගෙනැත්, ඒ factories හරහා නිෂ්පාදන ආර්ථිකයක් ගෙනෙනවා කිව්වා. හැබැයි, ඒක upset වුණේ ඒ සංකල්පය තිබුණාට, ආයෝජකයන් කවුරුවත් ලංකාවට ආවේ නැති නිසායි. ඒ නිසා තමයි මේ සැලැස්ම හරි ගියේ නැත්තේ. ඒ නිසා මේ සැලැස්ම ලංකාවට ගැළපෙන සැලැස්මක්ද කියලා අපි මෙතැනදී ප්‍රශ්න කරන්න ඕනෑ.

අද ප්‍රති අපනයනය හරහා ගම්මිරිස් ගොවීන් වැනි උදවියට යම් කිසි පහරක් ගහලා තිබෙනවා. අද අපේ ඩී.වී. චානක මන්ත්‍රීතුමා පැවසූ අන්දමට මෙම ගැසට් එකේ තිබෙන්නේ මොකක්ද? මෙම ගැසට් එකෙන් සෙස් බද්දක් ඉවත් කරනවා. ලංකාවට ඇපල් ගෙනෙනකොට අය කරන සෙස් බද්ද ඉවත් කරනවා, ලංකාවට දොඩම් ගෙනෙනකොට අය කරන සෙස් බද්ද ඉවත් කරනවා. එතකොට අපේ සාම්ප්‍රදායික පලතුරුවලට මොකක්ද වෙන්නේ? පැපොල් නිෂ්පාදනය කරන එක්කෙනාට මොකක්ද වෙන්නේ? ඒ නිසා මේ පිළිබඳව අපි මීට වඩා බුද්ධිමත් තීන්දු ගැනීමේ අවශ්‍යතාවක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් නෙල්ලි ගෙඩියක දොඩම් ගෙඩි දෙකක තිබෙන විටමින් 'සී' තිබෙනවා ලු. අපි අපේ ලංකාවේ වැවෙන පලතුරු කන්න ජනතාව උනන්දු කරන්නේ නැත්තේ ඇයි? සෙස් බද්ද අඩු කරලා ලංකාවට ඇපල් ගෙනැත් මේ ආර්ථිකය ගොඩ ගන්න පුළුවන්ද කියලා අපට මේ අවස්ථාවේ ප්‍රශ්න කරන්න වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි මොන මොන ක්ෂේත්‍රවලද අපනයන කටයුතු පුළුල් කළ යුත්තේ කියලා අපට අපනයන ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ. තොරතුරු තාක්ෂණ අංශයේ අපනයන ආදායම, Rs. 1 billion නොව Rs. 10 billion බවට අපට ලේසියෙන්ම පත් කර ගැනීමට පුළුවන්. එහෙම කරන්න සැලැසුමක් සහ දේශපාලන ශක්තියක් තිබෙන්න ඕනෑ. අද මෙම ආණ්ඩුව කෙරෙහි විශේෂයෙන් ව්‍යාපාර අංශයේ යෙදී සිටින උදවියට විශ්වාසයක් නැහැ. මේ රට ගොඩ ගැනීමට අප කළ යුතු වන්නේ පුළුවන් තරම් ඉක්මනින් මැතිවරණයට ගිහින්, අලුත් ආණ්ඩුවක් හදලා, ඉන් පසුව ව්‍යාපාරිකයන්ට යම් කිසි විශ්වාසයක් ඇති කිරීමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම තව කරුණක් සඳහන් කරන්න ඕනෑ. අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කියලා තිබෙනවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලක්ෂ හතරක පඩියක් ලැබෙනවා කියලා. මට නම් ජීවිතේට එහෙම පඩියක් ලැබිලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපට ලක්ෂ හතරක පඩියක් කවදාවත් ලැබී නැති බව මම මෙතැනදී පැහැදිලිව කියන්න ඕනෑ. ආණ්ඩු පක්ෂයේ සිටින මන්ත්‍රීවරුන්ට නොවැම්බර් මාසය වනතුරු අතිරේකව ලක්ෂ දෙකක් දුන්නා කියලා මම හිතනවා. ඒ නිසා අතිගරු ජනාධිපතිතුමා මෙය පැහැදිලි කළොත් හොඳයි. එහෙම නැත්නම්, පාර්ලිමේන්තුවේ සිටින සමහර මැති ඇමතිවරුන් කුඩු ගහනවා කියලා රන්ජන් රාමනායක මැතිතුමා කළ චෝදනාව සියලුදෙනාට එල්ල වුණා වාගේ, මේ ප්‍රකාශයත් පොදුවේ හැම කෙනාටම වැදෙනවා. ඒ නිසා මේ කාරණය පැහැදිලි කළොත් හොඳයි කියලා මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුති කරමින් මා නිහඬ වෙනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

Sir, on behalf of the Minister of Development Strategies and International Trade, I move,

"That the Order made by the Minister of Development Strategies and International Trade under Section 14(1) of the Sri Lanka Export Development Act, No. 40 of 1979 relating to Cess and published in the Gazette Extraordinary No. 2113/4 of 05th March 2019, which was presented on 27.06.2019, be approved.

(Cabinet approval signified.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## III

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

Sir, on behalf of the Minister of Development Strategies and International Trade, I move,

"That the Order made by the Minister of Development Strategies and International Trade under Section 14(1) of the Sri Lanka Export Development Act, No. 40 of 1979 relating to Cess and published in the Gazette Extraordinary No. 2117/46 of 04th April 2019, which was presented on 26.07.2019, be approved.

(Cabinet approval signified.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 4.14ට, 2019 අගෝස්තු 09වන සිකුරාදා පූ.භා. 10.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 4.14 மணிக்கு பாராளுமன்றம், 2019 ஓகஸ்ட் 09, வெள்ளிக்கிழமை மு. ப. 10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 4.14 p.m. until 10.30 a.m. on Friday, 09th August, 2019.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.